මහාචාර්ය පියදාස අතුකෝරල
උපහාර ලිපි සංග්‍රහය

Prof. Piyadasa Athukorala Felicitation Volume

දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය



මහාචාර්ය පියදාස අතුකෝරල උපහාර ලිපි සංග්‍රහය

Prof. Piyadasa Athukorala Felicitation Volume

දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මහාචාර්ය පියදාස අතුකෝරල උපහාර ලිපි සංග්‍රහය

© නිශාන්ත හෙට්ටිආරච්චි සහ ශාන්ත කුමාර ගම්ලත්

පළමු මුද්‍රණය - 2020

ISBN 978-624-5360-04-8

අක්ෂර සංයෝජනය - නිලන්ත දිමුතු බණ්ඩාර

ප්‍රකාශනය - දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මුද්‍රණය - සඳුනි ඕෆ්සෙට් ප්‍රින්ටර්ස් (පුද්ගලික) සමාගම
අංක 4/1, සරසවි උයන බඩුගබඩාව පාර,
පේරාදෙණිය.

පෙරවදන

දේශපාලන විද්‍යා ක්ෂේත්‍රයේ අද්විතීය මෙහෙවරක නියුක්ත වූ මහාචාර්ය පියදාස අතුකෝරලයන්ගේ විශිෂ්ඨ ශාස්ත්‍රීය සේවය සමරනුවස් චිරාගත සම්ප්‍රදායානුගතව උපහාර ලේඛන සංග්‍රහයක් සම්පාදනය කිරීමට අදහස් කරන ලද්දේ හුදු පුද්ගලාභිවාදන කාර්යක් උදෙසා නොව, ඔහුගේ නිහඬ හා ගාම්භීර සේවය ඇගයීම් වස් ය. ඒ සඳහා විවිධ විෂය ක්ෂේත්‍ර නියෝජනය කරන විද්වතුන්ගේ ශාස්ත්‍රීය ලිපි පෙළකින් ඔහුට උපහාර දැක්වීම අදහස් කරන ලදි. එකි ශාස්ත්‍රීය මෙහෙවර මඟින් වර්තමාන සහ අනාගත ශාස්ත්‍රවත්තයින්ගේ ඥානය සංවර්ධනය කරනු පිණිසය. මෙය වූ කලී මහාචාර්ය පියදාස අතුකෝරලයන්ගේ සන්තුෂ්ඨියට අතිශයින්ම ඉවහල් වන බව අපගේ දැඩි විශ්වාසයයි.

දශක හතරක කාල පරිච්ඡේදයක් තිස්සේ මානව සමාජයට ඥානය ලබාදීම සඳහා මෙම විද්වතාණන් විසින් ඉෂ්ඨ කරනු ලැබූ මෙහෙවර වඩාත් ඇගයීමට ලක් වන්නේ දේශපාලන විද්‍යා ක්ෂේත්‍රයෙහි පර්යේෂණ මඟින් කරන ලද ශාස්ත්‍රීය සම්ප්‍රදානයෙනි. දේශපාලන හා සමාජ න්‍යාය, දේශපාලන සමාජ විද්‍යාව සහ දේශපාලන අර්ථ ශාස්ත්‍රය යන විෂයන්හි පර්යේෂණ ගණනාවක් කළ හෙතෙම ඒ අරභයා පර්යේෂණ කෘතින් සහ පත්‍රිකා ගණනාවක් පළකර තිබේ. එපමණක් නොව සිංහල පාඨක සමාජයේ නිම් වළලු පුළුල් කිරීම උදෙසා ඉංග්‍රීසි භාෂාවෙන් පළ වූ සම්භාව්‍ය කෘතින් ගණනාවක් සිංහලයට නැඟීමට දායක වී තිබේ. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පීඨයේ පීඨාධිපතිවරයා ලෙසින් වාර දෙකක් කටයුතු කළ හෙතෙම එබදු පරිපාලන කටයුතුවල නිරතව සිටිය දී පවා සිය ශාස්ත්‍රීය මෙහෙවර අනලස්ව සිදුකර තිබේ.

මහාචාර්ය පියදාස අතුකෝරලයන් වෙනුවෙන් උපහාර ලිපි සංග්‍රහයක් පල කිරීමට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය කටයුතු යොදා ඇති බව දන්වා ඒ සඳහා ලිපි සම්පාදනය කරන මෙන් කරන ලද ඉල්ලීමට විද්වතුන්ගෙන් ලැබුනේ ඉහළ ප්‍රතිචාරයකි. ඇතැම් විද්වතුන් ලිපි සම්පාදනයෙන් පමණක් නොව උපහාර ලිපි සංග්‍රහයේ අන්තර්ගතය පිළිබඳ අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීමෙන් ද සහාය නොදැක්වූවා නම් මෙහි නිමාව මෙතරම් උසස් මට්ටමකට පත් නොවන්නට ඉඩ තිබිණි. ඒ වෙනුවෙන් විශේෂයෙන් ම මහාචාර්ය උපුල් අබේරත්න, මහාචාර්ය ටෙනිසන් පෙරේරා සහ මහාචාර්ය මාලක රණතිලක යන

විද්වතුන්ට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා අධ්‍යයනාංශයේ ප්‍රණාමය හිමි වේ.

මේ උපහාර ලිපි සංග්‍රහයෙහි මහාචාර්ය පියදාස අතුකෝරලයන්ගේ ශාස්ත්‍රීය සේවය පිළිබඳ විමර්ශනය කෙරෙන ලිපියක් මෙන්ම තදානුබද්ධ ක්ෂේත්‍ර පිළිබඳ විමර්ශනය කෙරෙන ශාස්ත්‍රීය ලිපි ද අන්තර්ගත වේ. මෙම ලිපි සංග්‍රහයේ පුළුල් පරාසයක් ඔස්සේ වත්මන් පරපුර නියෝජනය කරන විද්වතුන්ගේ ශාස්ත්‍රීය විමර්ශන අන්තර්ගත කර තිබේ. ඇතැම් විද්වත්හු ඉංග්‍රීසි භාෂාවෙන් ද ඇතැම් හු සිංහල භාෂාවෙන් ද සිය පර්යේෂණ ලිපි ඉදිරිපත් කර තිබේ.

පියදාස අතුකෝරල උපහාර ලිපි සංග්‍රහය සඳහා ලිපි සම්පාදනය සහ විමර්ශනයෙන් දායක වූ සියලුම ලේඛක-ලේඛිකාවන්ට සංස්කාරවරුන්ගේ කෘතවේදිතාව පිරිනැමේ. සංස්කරණයෙහිලා ග්‍රන්ථයේ සමරූපිතාවයක් පවත්වාගෙන යාම අපේක්ෂිත වුවද ඒ ඒ ලේඛකයින්ගේ ලේඛන ශෛලිය කිසිදු වෙනසක් නොකළෙමු. මෙම ලිපි සංග්‍රහයෙහි පරිගණක අක්ෂර සංයෝජනය සහ කංචුක නිර්මාණය කළ නිලන්ත දිමුතු බණ්ඩාර සොහොයුරාට කෘතඥතාවය හිමි වේ. මේ කෘතිය මුද්‍රණයකිරීමේ වගකීම භාරගත් පේරාදෙණිය සඳුනි මුද්‍රණ සමාගමේ අධ්‍යක්ෂතුමා ඇතුළු කාර්යමණ්ඩලයට සංස්කාරකවරුන්ගේ ස්තුතිය පිරිනැමේ.

පියදාස අතුකෝරල උපහාර ලිපි සංග්‍රහය පල කිරීමට අනුමැතිය ලබා දීමෙන් දේශපාලන විද්‍යා අධ්‍යයනාංශයේ අංශාධිපති සහාය මහාචාර්ය ටෙරන්ස් පුරසිංහ මහතාට ද, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ හිටපු පීඨාධිපති මහාචාර්ය සරත් චන්ද්‍රකුමාර මහතාට ද, විශ්වවිද්‍යාලයකින් මෙවැනි ජාතික මෙහෙවරක් ඉටුකිරීමට අවශ්‍ය සියලු පහසුකම් නොපිරිහෙලා සපයාදුන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ හිටපු උප කුලපති වර්තමාන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවේ සභාපති ජ්‍යේෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග මහතාට ද, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වර්තමාන උප කුලපති ජ්‍යේෂ්ඨ මහාචාර්ය සුදන්ත ලියනගේ මහතාට ද, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ වර්තමාන පීඨාධිපති මහාචාර්ය ශිරාන්ත හීන්කෙන්ද මහතාට ද, මේ කාර්යෙහි ලා දැක් වූ සහාය හා මග පෙන්වීම සම්බන්ධයෙන් සංස්කාරකවරුන්ගේ ප්‍රණාමය හිමි වේ.

නිශාන්ත හෙට්ටිආරච්චි

ශාන්ත කුමාර ගම්ලත්

විමර්ශක මණ්ඩලය

මාලනි ඇඳගම
සම්මානිත මහාචාර්ය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

බී. ටෙනිසන් පෙරේරා
සම්මානිත මහාචාර්ය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

ඩී. පී. එස්. චන්ද්‍රකුමාර
මහාචාර්ය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මහින්ද සෝමතිලක
ඉතිහාසය පිළිබඳ මහාචාර්ය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

උපුල් අබේරත්න
දේශපාලන විද්‍යාව පිළිබඳ මහාචාර්ය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

යපාරත්න වීරසේකර
මහාචාර්ය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

එන්. ඒ විමලසේන
මහාචාර්ය
පේරාදේණිය විශ්වවිද්‍යාලය

අංකුඹුරේ ගෙදර අමරසිංහ
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
කැළණිය විශ්වවිද්‍යාලය

බී. ඒ. එස්. සී කුමාර
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

කේ. බී.ජී. ශාන්ත කුමාර ගම්ලත්
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

නිශාන්ත හෙට්ටිආරච්චි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

ලිපි සම්පාදනය

උපුල් අබේරත්න

බී. ඒ. (ගෞරව), එම්. ෆිල්. (පේරාදෙණිය), පී. එච්. ඩී. (බැංගලෝර්), පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයා ය.

අතුල විතානවසම්

බී. ඒ. (ගෞරව), එම්. ඒ. (පේරාදෙණිය), පී. එච්. ඩී. (පේරාදෙණිය), පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාරයවරයෙකි.

ඕ. ජී. දයාරත්න බණ්ඩා

බී. ඒ. (ගෞරව), එම්. ෆිල් (පේරාදෙණිය), පී. එච්. ඩී. (එන්. යූ. එස්.), පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්යවරයෙකි.

අයි. ඒ. ජේ. ඉඹුලාන ආරච්චි

බී. ඒ. (ගෞරව), එම්. ෆිල් (පේරාදෙණිය), පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සහ කැළණිය විශ්වවිද්‍යාලයේ හිටපු සහකාර කථිකාචාරයවරියකි.

එම්. බී. රණතිලක

බී. ඒ. (ගෞරව), එම්. ෆිල් (පේරාදෙණිය), පී. එච්. ඩී. (කගොෂිමා), පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්යවරයෙකි.

නිශාන්ත හෙට්ටිආරච්චි

බී. ඒ. (ගෞරව), එම්. ෆිල් (පේරාදෙණිය), ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාරයවරයෙකි.

එස්. බාස්කරන්

බී. ඒ. (ගෞරව), එම්. ෆිල් (පේරාදෙණිය), පී. එච්. ඩී. (ලියෝනිං), පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාරයවරයෙකි.

එම්. කේ. නදීකා දමයන්ති

බී. ඒ. (ගෞරව), එම්. ෆිල් (පේරාදෙණිය), කැළණිය විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියකි.

යූ. එල්. එම්. ඩී. පෙරේරා

බී. ඒ. (ගෞරව), කැළණිය විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා අධ්‍යයනාංශයේ කථිකාචාර්යවරියකි.

නාමලි කුමාරි හඳගම

බී. ඒ. (ගෞරව), එම්. ෆිල් (පේරාදෙණිය), පී. එච්. ඩී. (කැළණිය), පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දර්ශන අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියකි.

ආර්. කේ. එම්. ට්‍රිලිෂියා ඉන්ද්‍රාණි

බී. ඒ. (ගෞරව), එම්. ඒ. (ශ්‍රී ජයවර්ධනපුර), ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉතිහාසය අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියකි.

එන්. ඒ. විමලසේන

බී. ඒ. (ගෞරව), එම්. ෆිල් (පේරාදෙණිය), පී. එච්. ඩී. (කැළණිය), පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉතිහාසය අධ්‍යයනාංශයේ මහාචාර්යවරයෙකි.

අංකුඹුරේ ගෙදර අමරසිංහ

බී. ඒ. (ගෞරව), එම්. ෆිල් (පේරාදෙණිය), පී. එච්. ඩී. (කැළණිය), කැළණිය විශ්වවිද්‍යාලයේ භූගෝල විද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකි.

ආර්. එන්. ගමාච්චිගේ

බී. ඒ. (ගෞරව), එම්. ෆිල් (ශ්‍රී ජයවර්ධනපුර), ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ භූගෝල විද්‍යා අධ්‍යයනාංශයේ කථිකාචාර්යවරයෙකි.

ටී. එම්. එස්. පී. කේ. තෙන්නකෝන්

බී. ඒ. (ගෞරව), පී. එච්. ඩී. (චේල්ස්.), ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ භූගෝල විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්යවරියකි.

ශාන්ත කුමාර ගම්ලත්

බී. ඒ. (ගෞරව), එම්. ඒ. (කොළඹ), පී. එච්. ඩී. (එම්. යූ, එස්. ටී.), ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා අධ්‍යනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකි.

පටුන

01 **දේශපාලන අර්ථ ශාස්ත්‍රය සහ දේශපාලන අධ්‍යයනය** 1 -8

නිශාන්ත හෙට්ටිආරච්චි සහ ශාන්ත කුමාර ගම්ලත්

02 **සේවා සම්මානිත මහාචාර්ය පියදාස අතුකෝරල දේශපාලන අර්ථ ශාස්ත්‍රය පිළිබඳ ප්‍රමාණිකයෙක්** 9 - 18

උපුල් අබේරත්න

03 **අම්පාර දිස්ත්‍රික්කයේ ජනවාර්ගික දේශපාලනය හා සිවිල් යුද්ධයේ ස්වභාවය** 19 - 40

අතුල විතානවසම්

04 **ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ නිමැවුම් කර්මාන්ත වර්ධනය සඳහා බලපාන සාධක (කුලියාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - නැගෙනහිර කලාපය ඇසුරින්)** 41 - 72

ඕ. ජී. දයාරත්න බණ්ඩා සහ අයි. ඒ. ජේ. ඉඹුලානආරච්චි

05 **ශ්‍රී ලංකාවේ දේශීය සහල් මිල තීරණය වීම කෙරෙහි බලපාන සාධක** 73 - 106

එම්. බී. රණතිලක සහ අයි. ඒ. ජේ. ඉඹුලාන අරච්චි

06 **The Rising Powers in Indian Ocean and Their Rivalry (A Study of China and India)** 107 - 148

Nishantha Hettiarachchi

07 **Challanges of the Reconcillation in Post – War Sri Lanka - An Analysis on the Approaches of the Report of Lesson Learnt and Reconciliation Commission** 149 - 184

S.Baskaran

08 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේදී පළාත් පාලන ආයතනවල කාර්යභාරය සහ මහජන තෘප්තිමත්භාවය (දොම්පේ ප්‍රාදේශීය සභාව ඇසුරින්) 185 - 214

එම්. කේ. නදීකා දමයන්ති

09 ශ්‍රී ලංකාවේ මහජන මතය නිර්මාණය කිරීමෙහිලා සමාජ මාධ්‍යයන් ලෙස ෆේස්බුක්හි/ මුහුණු පොතෙහි බලපෑම (2015 ජනාධිපතිවරණය ඇසුරින්) 215 - 236

යූ. එල්. එම්. ඩී. පෙරේරා

10 ආචාර ධර්මීය න්‍යායන් සහ නිර්දේශයන් විශ්වසාධාරණකරණීය විය යුතුය. 237 - 246

නාමලි කුමාරි හඳගම

11 ගල්ඔය සංවර්ධන යෝජනා ක්‍රමයේ ආරම්භය හා ජනපද ව්‍යාප්තිය 247 - 252

ආර්. කේ. එම්. ට්‍රිලිෂියා ඉන්ද්‍රාණි

12 **Some Social Groups and Ranks in Mid Medical Period in Sri Lanka** 253- 280

N. A. Wimalasena

13 **Quatiity of Social Waste Generation in Sri Lanka – 2017** 281 - 290

Ankumbura Gedara Amarasinghe

14 **New Direction of Sri Lankan population in the Context of Global Demographic Trends.** 291 - 306

R. N. Gamachchige and T.M.S.P.K. Thennakoon

15 **Power Politics and Politiciazation of Buddhist in Priests in Pre and Post Independence in Sri Lanka** 307 - 342

K. G. B. Shantha Kumara Gamlath.

දේශපාලන අර්ථ ශාස්ත්‍රය සහ දේශපාලන අධ්‍යයනය

දේශපාලන අර්ථ ශාස්ත්‍රයෙහි හදාරනු ලබන්නේ ආර්ථිකය කෙරෙහි දේශපාලනය කරනු ලබන බලපෑම හා දේශපාලනය හැඩගැස්වීමෙහිලා ආර්ථික සාධක බලපානු ලබන ආකාරය ගැනය. වර්තමාන ශාස්ත්‍රාලීය විශ්වවිද්‍යාල අශ්‍රිතව දක්නට ලැබෙන ඒ ඒ ශික්ෂණ මාර්ග දෙපාර්තමේන්තුකරණයට ලක්වීම නිසා ආර්ථික විද්‍යාඥයාට දේශපාලනය ගැනත් දේශපාලන විද්‍යාඥයාට ආර්ථිකය ගැනත් මනා අවබෝධයක් නොමැති නිසා ආර්ථිකය හා දේශපාලනය අතර පවතින නොබිඳිය හැකි බැඳීම් අවබෝධ කරගැනීමට ඇති අවස්ථාව අහිමි කරගෙන ඇත. ආර්ථික විද්‍යා විද්‍යාර්ථයාට හා දේශපාලන විද්‍යා විද්‍යාර්ථයාට එකට මුන ගැසීමට මං පෙත් විවිර කරදෙන්නේ දේශපාලන අර්ථ ශාස්ත්‍රයෙනි.

දේශපාලන අර්ථ ශාස්ත්‍රය යනු දේශපාලනය සහ ආර්ථිකය අතර පවත්නා සම්බන්ධතාවය අධ්‍යයනය කරන සමාජ විද්‍යාවයි. දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශයේ විස්තර කර ඇති ආකාරයට දේශපාලනය සහ ආර්ථිකය අතර දක්නට ඇත්තේ ප්‍රතිලෝම සම්බන්ධතාවයකි. එහි අර්ථය වන්නේ දේශපාලනය ආර්ථිකයට බලපෑම් කිරීමත්, ආර්ථිකය දේශපාලනයට බලපෑම් කිරීමත් ය. එබැවින් දේශපාලනය අර්ථ ශාස්ත්‍රය ශාස්ත්‍රීය විෂයක් ලෙස සැලකීමේ දී දේශපාලනය හා ආර්ථිකය අතර පවත්නා මෙම සම්බන්ධතාවය අධ්‍යයනය කිරීම අත්‍යාවශ්‍ය වේ.

දේශපාලන අර්ථ ශාස්ත්‍රය පිළිබඳ අධ්‍යයනයන් බටහිර දේශපාලන චින්තනය තුළ ආරම්භ වී වර්ධනය වූ සම්ප්‍රදානයකි. දේශපාලන අර්ථ ශාස්ත්‍රය යන යෙදුම මුල්වරට භාවිතා කළේ ෂොන් ෂාක් රූසෝ විසින් 1775 දී ලියනු ලැබූ දේශපාලන අර්ථ ශාස්ත්‍රය පිළිබඳ කථිකාවක් (A Discourse on Political Economy) නමැති ලියවිල්ලේ ය. එමගින් රූසෝ ආර්ථිකය යන යෙදුම විමර්ශනය කොට ගෘහස්ථ ආර්ථිකය සහ දේශපාලන ආර්ථිකය යන යෙදුම් දෙක වෙන්ව දැක්වීය. පසුකාලීන ඇඩම් ස්මිත් විසින් ද දේශපාලන ආර්ථික න්‍යායේ බොහෝ සංවර්ධනයන් සිදු කළ අතර ඔහුගේ සුප්‍රසිද්ධ ''ජාතීන්ගේ ධනය'' කෘතියේ දේශපාලන ආර්ථික න්‍යාය පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණයක් සිදුකර ඇත.

මේ අයුරින් දේශපාලන ආර්ථික ප්‍රවේශයෙහි ඇති වැදගත්කම රිකාඩෝ, මෝල්තස් වැනි ධනේශ්වර සම්භාව්‍ය ආර්ථික විද්‍යාඥයින්ගේ අදහස් මඟින් ද ඉස්මතු විය. එහෙත් දේශපාලන ආර්ථික න්‍යාය පිළිබඳ කැපී පෙනෙන දායකත්වයක් සපයා ඇත්තේ කාල්මාක්ස් විසිනි. දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය වර්තමානයේ දී සම්පූර්ණයෙන් ම අනන්‍ය වී තිබෙන්නේ මාක්ස්වාදී න්‍යාය සමඟය. කාල් මාක්ස් ධනේෂ්වර ආර්ථික විද්‍යාඥයින් විසින් ඉදිරිපත් කළ දේශපාලන අර්ථ ශාස්ත්‍රය පිළිබඳ සාම්ප්‍රදායික ප්‍රවේශය මුළුමනින්ම වෙනස් කළේය. ඔහු ඓතිහාසික භෞතිකවාදය මත පදනම් ව සමාජ සැකැස්ම (Social Formation) විස්තර කළේය. මාක්ස්ට අනුව සමාජ සැකැස්ම ආර්ථික පදනම (Economic Base) සහ උපරි ව්‍යුහය (Superstructure) යනුවෙන් ස්ථර දෙකකින් යුක්ත විය. මූලික වශයෙන් 19 වන ශත වර්ෂයේ සෙසු ආර්ථික විද්‍යාඥයින් විසින් නොකළ ආකාරයේ ගැඹුරු හැදෑරීමක් කරමින් දේශපාලන ආර්ථිකය පිළිබඳ න්‍යාය වර්ධනය කිරීම ඔහුගෙන් සිදු වූ වැදගත්ම සේවාව විය.

මෑත කාලයේ දී දේශපාලන අර්ථ ශාස්ත්‍රය ස්වාධීන අධ්‍යයන ශික්ෂණයක් ලෙස වර්ධනය වුවත්, කලකට ඉහත දී ආර්ථික විද්‍යාව සහ දේශපාලන විද්‍යාව සමඟ සමීප සම්බන්ධතාවයක් පැවතුනි. කෙසේ වෙතත් දේශපාලන අර්ථ ශාස්ත්‍රය ආර්ථික විද්‍යාවට සහ දේශපාලන විද්‍යාවට ඉතා සමීප උප විෂයකි. දේශපාලන අර්ථ ශාස්ත්‍රය අධ්‍යයන ශික්ෂණයක් ලෙස දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු අවධියේ සිට යුරෝපා සහ ඇමරිකානු විශ්වවිද්‍යාලවල උපාධි පාඨමාලාවන්හි ඇතුළත් විය. ශ්‍රී ලංකාවේ ද එය 1980 දශකය මැද භාගයේ සිට ඇතැම් විශ්ව විද්‍යාලයන්හි ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුවල උපාධි පාඨමාලාවලට ඇතුළත් විය. මහාචාර්ය පියදාස අතුකෝරලයන් ද ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සේවයට එක් වීමෙන් පසුව දේශපාලන විද්‍යා උපාධි පාඨමාලාවේ මූලික විෂයක් ලෙස දේශපාලන අර්ථ ශාස්ත්‍රය ඇතුළත් කිරීමට ක්‍රියා කළේය. ඒ අනුව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා දෙපාර්තමේන්තුව ස්ථාපනය කිරීමෙන් පසු එහි උපාධි පාඨමාලාවේ මූලික විෂයක් ලෙස දේශපාලන අර්ථ ශාස්ත්‍රය හඳුන්වාදීමේ ගෞරවය ඔහුට හිමි වේ.

මෙම කෘතියේ ලේඛකයින් 16 ගේ ලිපි ඇතුළත් වේ. එම ලිපි දේශපාලන විද්‍යාව, ආර්ථික විද්‍යාව, දර්ශනය, ඉතිහාසය සහ භූගෝල විද්‍යාව යන අධ්‍යයන ශික්ෂණයන්ට අදාළ වේ. සමස්ථයක් ලෙස එම ලිපි මඟින් දේශපාලන අර්ථ ශාස්ත්‍රය සියුම් ලෙසකින් නිරූපණය කරනු ලැබේ. 20 වන ශතවර්ෂයේ අග භාගයේ සිට

ක්‍රමයෙන් වර්ධනය වූ ජනවාර්ගික දේශපාලනය හා සිවිල් යුද්ධය නැමති තේමාව ශ්‍රී ලංකාව තුළ මෙන්ම ඉන් පිටත ද පර්යේෂකයින්ගේ නොමද අවධානයට ලක් වූ පර්යේෂණ ක්ෂේත්‍රයක් විය. ආචාර්ය අතුල විතානවසම් විසින් සම්පාදිත ''අම්පාර දිස්ත්‍රික්කයේ ජනවාර්ගික දේශපාලනය සහ සිවිල් යුද්ධයේ ස්වභාවය'' නැමති ලිපිය යථෝක්ථ විෂය අරඹයා සිදුකළ වැදගත් පර්යේෂණයකි. එම ලිපිය පළ කිරීම මඟින් කතුවරයා යන්න දරන ලද්දේ ජනවාර්ගික දේශපාලනය අම්පාර දිස්ත්‍රික්කය පිහිටුවීම කෙරෙහි බලපෑ ආකාරයත්, අම්පාර දිස්ත්‍රික්කයේ ජනාවර්ගික දේශපාලනය සිවිල් යුද්ධයේ තීව්‍රතාවයට බලපෑ ආකාරයත් විමර්ශනය කිරීමයි. මෙම ලිපිය කොටස් දෙකකින් යුක්ත වන අතර පළමු කොටසින් අම්පාර දිස්ත්‍රික්කය නිර්මාණය වීම කෙරෙහි ජනවාර්ගික දේශපාලනය බලපෑ ආකාරයත්, දෙවන කොටසින් 1980 දශකයේ මැද භාගයේ සිට අම්පාර දිස්ත්‍රික්කය තුළ සිවිල් යුද්ධය ක්‍රමයෙන් වර්ධනය වූ ආකාරයත්, එහි සුවිශේෂී ලක්ෂණ මොනවා ද යන්නත් විමර්ශනයට ලක් කෙරේ. කතුවරයා සිය ලිපිය මඟින් වැදගත් නිගමන කිහිපයකට එළඹ තිබේ. අම්පාර දිස්ත්‍රික්කය ස්ථාපනය සම්බන්ධයෙන් ජනවාර්ගික දේශපාලනය දැඩිව බලපෑ බව නිගමනය කරන ලදී. එමගින් පාලකයින් අපේක්ෂා කළේ නැගෙනහිර පළාත තුළ සිංහල ආධිපත්‍යය තහවුරු කිරීම විය. අනිත් අතට අම්පාර දිස්ත්‍රික්කය තුළ සිංහල, දෙමළ සහ මුස්ලිම් ජනවාර්ගිකයන් අතර පවත්නා තියුණු තරගය එහි දේශපාලනයේ ප්‍රමුඛ වූ බවත් අවසාන වශයෙන් දිස්ත්‍රික්කයේ ජන සංයුතියේ විවිධත්වය සහ විෂම භූගෝලීය රටාව සිවිල් යුද්ධය පැවති සමයේ එල්.ටී.ටී.ඊ. සංවිධානයට විශේෂ වාසි ගෙනදුන් ආකාරයෙන් පෙන්වා දී ඇත.

මහාචාර්ය ඕ.ජී. දයාරත්න බණ්ඩා සහ අයි.ඒ.ජේ. ඉඹුලාන ආරච්චි යන අය විසින් සම්පාදිත ''ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ කර්මාන්ත වර්ධනය උදෙසා බලපාන සාධක : කුලියාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය (නැගෙනහිර කලාපය) ඇසුරින්'' නැමැති අධ්‍යයනය මඟින් මැදි ආදායම් ලබන රටක් ලෙස ශ්‍රී ලංකාවේ අර්ථිකයට නිමැවුම් කර්මාන්ත වෙසෙසින්ම කුඩා නිමැවුම් කර්මාන්ත සිදු කරනු ලබන දායකත්වය සාකච්ඡා කර ඇත. මෙම අධ්‍යයනය සඳහා දත්ත සපයා ගැනීමට සරල සසම්භාවී ක්‍රමවේදය භාවිතා කර කුලියාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නැගෙනහිර කලාපයේ කුඩා පරිමාණ නිමැවුම් ආයතන 60 ක නියැදියක් ඇසුරින් සිදුකර තිබේ. පර්යේෂණයේ ප්‍රතිඵල අනුව කුලියාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ කුඩා පරිමාණ නිමැවුම් කර්මාන්තවල වර්ධනය උදෙසා බලපෑ සාධක ගණනාවක් හඳුනාගත් අතර ආයතනයේ වයස, කළමනාකරුවන්ගේ අධ්‍යාපන

මට්ටම, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, පුහුණුව යනාදී සාධකයන්හි වැදගත්කම පර්යේෂණය මඟින් අනාවරණය කර ඇත.

''ශ්‍රී ලංකාවේ සහල් මිල තීරණය වීම කෙරෙහි බලපාන සාධක'' නැමැති මාතෘකාව යටතේ මහාචාර්ය එම්.බී. රණතිලක සහ අයි.ඒ.ජේ. ඉඹුලාන ආරච්චි විසින් ලියන ලද ලිපිය මඟින් මෑත කාලීනව දේශීය සහල් මිල නිරන්තරයෙන් උච්චාවචනයන්ට ලක්වන ආකාරය විමර්ශනයට ලක් කෙරෙන අතර ඊට බලපෑ කාලගුණික හා දේශගුණික වෙනස්වීම්, අස්වනු නෙලන වාරයන්හි විවිධත්වය අනුව සිදුවන අපේක්ෂිත විචලනයන් මෙන්ම අනපේක්ෂිත මිල කම්පනයන් මඟින් ඇති කරන බලපෑම විස්තර කර ඇත. කතුවරුන් සිය පර්යේෂණය සඳහා යථෝක්ථ විෂය අරඹයා ගෝලීය මට්ටමින් සිදු කළ ආනුභාවික අධ්‍යයන ගණනාවක් විශ්ලේෂණය කරන අතර ඒවා ඔස්සේ දේශීය සහල් මිල තීරණය වීම කෙරෙහි බලපාන සාධක පිළිබඳ විග්‍රහයක් ඉදිරිපත් කර ඇත.

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය නිශාන්ත හෙට්ටිආරච්චි විසින් ලියන ලද ''The Rising power in Indian Ocean and Their Rivalry : A study of China and India'' ලිපිය මඟින් පශ්චාත් සීතල යුද්ධ අවධියේ ලෝක දේශපාලනයේ ඉතා වැදගත් ප්‍රවණතාවයක් සාකච්ඡාවට ලක් කර ඇත. මෙම අධ්‍යයනයේ පරමාර්ථය බහු ධ්‍රැවීය ලෝක ක්‍රමයක් තුළ ලෝක දේශපාලනයේ ප්‍රමුඛ රැගුම්කරුවන් බවට පත්ව ඇති චීනය සහ ඉන්දියාව අතර පවත්නා මතභේදාත්මක කරුණු විශ්ලේෂණය කිරීමක් විය. කතුවරයා සිය ලිපිය මඟින් වැදගත් නිගමන කිහිපයකට එලඹෙන අතර සාම්ප්‍රදායික එදිරිවාදිකම් එලෙස පවතිද්දී ඇතැම් ක්ෂේත්‍රයන්හි චීනය සහ ඉන්දියාව සහයෝගයෙන් කටයුතු කිරීම ඉන්දු - චීන සම්බන්ධතාවන්හී කැපීපෙනෙන ලක්ෂණයක් බව පෙන්වා දී ඇත.

ජනවාර්ගික ගැටුම් කෙළවර කිරීම සහ කල් පවත්නා සාමයක් ගොඩනැගීම මෑතකාලීන බොහෝ පර්යේෂණයන්ට ලක් වූ තේමාවකි. ආචාර්ය එස්.බාස්කරන් "Challenges of the reconciliation in post-war Sri Lanka; An analysis on the approaches of the report of Lesson Learnt and Reconciliation Commission" යන මාතෘකාව යටතේ ලියන ලද ලිපිය මඟින් දශක තුනකට වැඩි කාලයක් පැවති ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ගැටුම යුද්ධමය වශයෙන් කෙළවර කිරීමෙන් පසු ශ්‍රී ලංකා රජය විසින් කල් පවත්නා සාමයක් ගොඩනැගීම සඳහා ඉදිරිපත් කළ උගත් පාඩම්

හා ප්‍රතිසංවිධාන කොමිසන් සභා වාර්තාවේ ඇතුළත් නිර්දේශයන් ප්‍රායෝගික වශයෙන් ක්‍රියාත්මක නොවීමට බලපෑ හේතු විවරණය කරයි. කතුවරයා කොමිසන් සභා වාර්තාවේ සඳහන් ප්‍රධාන නිර්දේශයන් හය (6) පිළිබඳ ඇගයීමක් කරන අතර ඒවා ක්‍රියාත්මක කිරීමට බාධාකාරී වූ පසුබිම විස්තර කර ඇත. විශේෂයෙන්ම ශ්‍රී ලංකා රජය වාර්තාවේ නිර්දේශ ක්‍රියාවට නැගීම අරඹයා දක්වා ඇත්තේ අවම ප්‍රයත්නයක් බව ලිපිය මඟින් දක්වා ඇත.

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේ දී පළාත් පාලන ආයතනවල කාර්යභාරය සහ මහජන තෘප්තිමත්භාවය, දොම්පේ ප්‍රාදේශීය සභාව ඇසුරින් යන තේමාව යටතේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය නදීකා දමයන්ති ලියන ලද ලිපිය මඟින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ දී පළාත් පාලන ආයතන විසින් සිදුකරන ක්‍රියාකාරකම් සහ එම ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ දී පළාත් පාලන ආයතනවල භූමිකාව සම්බන්ධයෙන් මහජන තෘප්තිමත්භාවය කෙබඳු ස්වරූපයක් ගන්නේ ද යන්න විමර්ශනය කරයි. මෙම අධ්‍යයනයෙන් අනාවරණය වූ අන්දමට පවතින නීතිරීති හා ප්‍රතිපත්තිවලට සම්පූර්ණයෙන් අනුගත වන අන්දමට ක්‍රියාවට නොනැගුනත් ප්‍රදේශයේ කසල කළමනාකරණය අරඹයා ප්‍රාදේශීය සභාව සැලකිය යුතු කාර්යභාරයක් සිදු කරනු ලබයි. පර්යේෂනයට ලක් කළ ප්‍රදේශයේ බහුතරයක් ප්‍රතිචාරීන් ප්‍රාදේශිය සභාවේ කසල කළමනාකරණය වැඩ සටහන සම්බන්ධයෙන් තෘප්තිමත්ව සිටින බව අනාවරණය කරයි. එහෙත් ප්‍රතිචාරකයින්ගෙන් යම් පිරිසක් කසල කළමනාකරණ වැඩ සටහන පිළිබඳව අතෘප්තිමත් භාවය දක්වා ඇත. තවද පළාත් පාලන ආයතන විසින් ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙල සම්බන්ධයෙන් ජනතාවගෙන් සැලකිය යුතු කොටසකට අවබෝධයක් නොමැති අතර ඇතැම් කරුණු සම්බන්ධයෙන් ඇත්තේ වැරදි වැටහීමකි.

කතිකාචාර්ය යූ.එල්.එච්.ඩී. පෙරේරා විසින් සම්පාදිත ''ශ්‍රී ලංකාවේ මහජන මතය නිර්මාණය කිරීමෙහිලා සමාජ මාධ්‍යයක් ලෙස මුහුණපොතෙහි බලපෑම 2015 ජනාධිපතිවරණය ඇසුරින්'' යන තේමාව යටතේ ඉදිරිපත් කළ ලිපිය මඟින් 2015 ජනාධිපතිවරණයට තරග කළ ප්‍රධාන අපේක්ෂකයින් දෙදෙනා මහජන මතය නිර්මාණය කිරීම සඳහා මුහුණු පොත යොදාගත් ආකාරය විශ්ලේෂණය කර ඇත. මෙම ලිපිය මඟින් ප්‍රථමයෙන් මහජන මතය සංකල්පය හඳුනා ගැනීමට උත්සුක වන පර්යේෂිකාව ඒ අරඹයා මුහුණ පොතෙහි ඇති කාලීන වැදගත්කම ජාත්‍යන්තර

අත්දැකීම් ඇසුරින් විවරණය කර ඇත. තවද, එමගින් 2015 ජනාධිපතිවරණයේ දී තරග කළ ප්‍රතිවාදී අපේක්ෂකයින් දෙදෙනා අතුරින් මෛත්‍රීපාල සිරිසේන මහතාගේ පාර්ශවය වඩාත් උපායශීලිව මුහුණුපොත ජනාධිපතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය සඳහා භාවිතා කර ඇති බව නිගමනය කර ඇත.

ආචාර්ය නාමලී කුමාරි හදගම ගේ මාතෘකාව වන ''ආචාර ධර්මීය න්‍යායන් සහ නිර්දේශයන් විශ්වාසාධරණීකරණය විය යුතුය'' යන්න මඟින් පැහැදිලිව ඉස්මතු කරන ලද්දේ ආචාර ධර්මීය න්‍යායන් සහ නිර්දේශයන් ගොඩ නැගීමේ දී සැලකිලිමත් විය යුතු වැදගත්ම කරුණක් ලෙස එම න්‍යායන් හා නිර්දේශයන් විශ්වසාධරණීකරණයට ලක්කළ හැකි නිර්දේශයන් හෝ න්‍යායන් විය යුතු බවයි. මෙම තත්ත්වය එසේ විමර්ශනයක් සිදුකළ දාර්ශනිකයන් තහවුරු කළ ප්‍රබල මතයක් බව පැවසේ. මෙම ලිපිය ආචාර ධර්ම න්‍යායන් ගොඩ නැගීම සහ නිර්දේශයන් සිදු කිරීම සදාචාර දාර්ශනිකයන් විසින් සිදුකළ සුවිශේෂ දාර්ශනික කාර්යයක් බවත් පසුගිය සියවස් ගණනාවක් මුළුල්ලේ ඔවුන් විසින් ජීවිතයේ පැවැත්ම පිළිබඳවත්, අර්ථය පිළිබඳවත් සිදුකළ විමර්ශනයන් ඒ සඳහා පදනම් වී ඇති බවත් පෙන්වා දී ඇත.

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආර්.කේ.එම්. ට්‍රිලිෂියා ඉන්ද්‍රාණි ''ගල්ඔය සංවර්ධන යෝජනා ක්‍රමයේ ආරම්භය සහ ජනපද ව්‍යාප්තිය'' යන මාතෘකාව යටතේ ලියන ලද ලිපිය මඟින් ගල්ඔය බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමයේ ආරම්භයට පසුබිම් වූ ඓතිහාසික කරුණු විමර්ශනය කරයි. බ්‍රිතාන්‍ය පාලන සමයේ අවසාන භාගයේ ඇරඹි ශ්‍රී ලංකාවේ පළමු බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය වන එමගින් ප්‍රදේශය තුළ නව ජනපදකරණයක් බිහි වූ ආකාරය විස්තර කර ඇත. එසේම එම අධ්‍යයනය මඟින් පශ්චාත් නිදහස් යුගයේ බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කළ ආකාරයත් ඒ අරඹයා වූ දේශපාලන නායකත්වයේ දෘඪතර කැපවීමත් විග්‍රහ කර ඇත.

මහාචාර්ය එන්.ඒ. විමලසේන විසින් සම්පාදිත ''Some Social Groups and Ranks in Mid-Medieval Period of Sri Lanka'' ලිපිය මඟින් වියලි කලාපයේ වාරි ශිෂ්ඨාචාරය බිඳ වැටීමෙන් පසු සමහර සමාජ කණ්ඩායම් හා නිලයන් විකාශනය වූ ආකාරය සාකච්ඡා කර ඇත. කතුවරයා සිය අධ්‍යයනය මඟින් අනාවරණය කරන්නේ මධ්‍යකාලීන යුගයේ මැද භාගයේ සිට සිදු වූ දකුණු ඉන්දියානු ආක්‍රමණ විශාල

බලපෑමක් කළ බවයි. තවද කතුවරයා මෙම අධ්‍යයනය සඳහා ඓතිහාසික හා පුරා විද්‍යාත්මක අධ්‍යයන පදනම් කරගෙන ඇත.

වර්තමානයේ දී ශ්‍රී ලංකාව විවිධ පාරිසරික ව්‍යසනයන්ට ලක් වී ඇත. ඒ අතර අපද්‍රව්‍ය පිළිබඳ ගැටළුව ප්‍රමුඛ පාරිසරික ගැටලුවකි. ආචාර්ය අංකුඹුරේ ගෙදර අමරසිංහ විසින් සම්පාදිත "Quantity of Solid Waste Generation in Sri Lanka-2017" නැමැති ලිපිය මඟින් පළාත් පාලන ආයතන මඟින් සිදු කෙරෙන ඝන අපද්‍රව්‍ය කළමනාකරණය විස්තර කර ඇත. කතුවරයා සිය අධ්‍යයනය මඟින් පළාත් පාලන ආයතනයන්හි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලියේ පවත්නා ප්‍රධාන ගැටලුව අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතීන්වල පවත්නා දෝෂයක් බව සඳහන් කර ඇත.

ලෝක ජනගහනය සීඝ්‍රයෙන් වර්ධනය වීම බහුවිධ ගැටළු ඇති කෙරෙන තත්වයකි. එම ජනගහනය වර්ධනයේ හඳුනාගත හැකි ප්‍රවණතා අධ්‍යයනය කිරීම කාලීන අවශ්‍යතාවයකි. මහාචාර්ය ටී.එම්.එස්.පී.කේ. තෙන්නකෝන් සහ කථිකාචාර්ය ආර්.එන්. ගමාච්චිගේ විසින් සම්පාදිත "New direction of Sri Lanka Population in the Contert of Global Demographic Trends" නැමැති ලිපිය මඟින් ගෝලීය ප්‍රජා විද්‍යාත්මක ප්‍රවණතා ශ්‍රී ලංකාවේ ජනගහනය වර්ධනයේ නව දිශානතීන්ට බලපෑ ආකාරය විග්‍රහ කර ඇත. කතුවරුන් සිය අධ්‍යයනය මඟින් ප්‍රජා විද්‍යාත්මක ප්‍රවණතා ගණනාවක් හඳුනාගෙන ඇති අතර ජනගහනයේ වයස්ගත පිරිස් ක්‍රමයෙන් වර්ධනය වීම වැදගත් ප්‍රවණතාවයකි.

ආචාර්ය ශාන්ත කුමාර ගම්ලත්ගේ "Power Politics and Politicization of Buddhist Priests in Pre-and Post Independence in Sri Lanka" නැමති අධ්‍යයනය මඟින් නිදහසට පෙර හා පසු අවධියේ බෞද්ධ භික්ෂූන් දේශපාලනීකරණය වීම කෙරෙහි බලපෑ සාධක විශ්ලේෂණය කර ඇත. කතුවරයා සිය ලිපිය මඟින් නිදහසට පෙර අවධියේ ආරම්භ වී නිදහසින් පසු අවධියේ දී බෞද්ධ භික්ෂූන් අනුක්‍රමයෙන් බුද්ධාගමේ මූලික ඉගැන්වීම් වලින් බැහැරව බල දේශපාලනය කෙරෙහි නැඹුරු වූ ආකාරය පැහැදිලි කර ඇත. තවද භික්ෂූන් දේශපාලනීකරණය වීම කෙරෙහි බලපෑ සාධකයන් අතර නිදහසින් පසු බලයට පැමිණි පාලකයින් අනුමගමනය කළ සිංහල, බෞද්ධ ජාතිකවාදයට නැඹුරු ප්‍රතිපත්තීන් ප්‍රමුඛ වූ බව නිගමනය කර ඇත.

මෙම උපහාර ලිපි සංග්‍රහයේ බොහෝ ලිපි මඟින් හඳුනාගෙන ඇති පරිදි මහාචාර්ය අතුකෝරල දේශපාලන විද්‍යාව නැමැති අධ්‍යයන ශික්ෂණය නංවාලීමට හා වර්ධනය කිරීමට විශ්ව විද්‍යාල පද්ධතියට බොහෝ සේවයක් සිදුකර තිබේ. මහාචාර්ය අතුකෝරල දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස දේශපාලන විද්‍යා දෙපාර්තමේන්තුව අද පවතින තත්ත්වයට හැඩ ගැන්වීය. දේශපාලන විද්‍යාව හා ඒ බැඳුනු විවිධ උප විෂයයන් ගණනාවක් ඔස්සේ දැනුමැති උපාධිධාරීන් දහස් ගණනක් බිහි කිරීමට දායක විය. උපාධි හා පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා ඔහුගේ දායකත්වය වෙනත් විශ්ව විද්‍යාලවල සිසුන්ට ද ඔහුගේ ඉගැන්වීම්වලින් ප්‍රයෝජන ලැබුණු ආකාරය අමතක කළ නොහැක. මහාචාර්ය අතුකෝරල කැළණිය විශ්ව විද්‍යාලයේ බාහිර මහාචාර්යවරයෙකු ලෙස කටයුතු කළේය. එමෙන්ම නයිජීරියාවේ ගොන්බේ රාජ්‍ය විශ්වවිද්‍යාලයේ බාහිර මහාචාර්යවරයෙකු ලෙස කටයුතු කළේය. ඔහුගේ සුවිශාල ඉගැන්වීමේ අත්දැකීම් සහ පර්යේෂණ හැකියාවන් සැලකිල්ලට ගෙන අනාගතයේ දී තෘතියික අධ්‍යාපනය සහ ජාතික සංවර්ධනය ප්‍රතිපත්ති සඳහා විශාල දායකත්වයක් ලබාදෙනු ඇත.

මහාචාර්ය පියදාස අතුකෝරල දේශපාලන අර්ථ ශාස්ත්‍රය සහ දේශපාලන විද්‍යා අධ්‍යයනය සඳහා ලබා දී ඇති සුවිශාල දායකත්වය වෙනුවෙන් උපහාරයක් ලෙස ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය විසින් මෙම උපහාර ලිපි සංග්‍රහය සම්පාදනය කොට ප්‍රකාශයට පත් කරනු ලැබේ.

නිශාන්ත හෙට්ටිආරච්චි,
ශාන්ත කුමාර ගම්ලත්
සංස්කාරවරුන්

සේවා සම්මානිත මහාචාර්ය පියදාස අතුකෝරල - දේශපාලන අර්ථ ශාස්ත්‍රය පිළිබඳ ප්‍රාමාණිකයෙක්

උපුල් අබේරත්න

මහාචාර්ය පියදාස අතුකෝරල මට මුණ ගැසුනේ රුහුණු විශ්වවිද්‍යාලයේ ආධුනික කථිකාචාර්යවරයෙකු වශයෙන් කටයුතු කළ අවධියේදීය. කොළඹ කේන්ද්‍රීය ශාස්ත්‍රාලයක වැඩ කරනු රුචි වූ මා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ පවත්වා ගෙන ගිය දේශපාලන විද්‍යාව විෂය මාලාවට සම්බන්ධ ආධුනික කථිකාචාර්ය තනතුර සඳහා 2000 වසරේදී අයදුම් කළෙමි. එවකට ආර්ථික විද්‍යා අධ්‍යනාංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කළ පියදාස අතුකෝරල ඔබ ස්ථිර කථිකාචාර්ය ධුරයක් ලබා ගෙන තිබියදී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට පැමිණෙන්නේ මන්දැයි බුහුටි ලෙස ප්‍රශ්න කළේය. මා දුන් පිළිතුර වූයේ අගනුවර ආශ්‍රිත ශාස්ත්‍රාලයකට පැමිණීම මා අරමුණ බවය. එවිට අතුකෝරල මහදුරුතුමා නව විශ්වවිද්‍යාලවලට ගොස් වැඩ කිරීමේ අවශ්‍යතාවයත් එයින් ආධුනිකයකුට ලැබෙන නිර්මාණශීලි ආලෝකයත් පැහැදිලි කරදී පවතින්නේ තාවකාලික කථිකාචාර්ය අබෑර්තුවක් වන හෙයින් ඔබව බඳවා ගැනීමේ හැකියාවක් නොමැති බව සෘජුව පැවසීය. මහාචාර්ය අතුකෝරල හා මා අතර කුලුපග සම්බන්ධතාවය ගොඩනැගුනේ එදා සිටය.

මහාචාර්ය අතුකෝරලගේ ඉහත සඳහන් කරුණු පැහැදිලි කිරීම හා මා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට බඳවා ගැනීමට හැකියාවක් නොමැති යැයි සෘජුව කීමෙන් වර්තමානයේ බොහෝ සරසවි ඇදුරන් සතු නොවන, එහෙත්, විශ්ව විද්‍යාල ආචාර්යවරයෙකු සතු විය යුතු ශ්‍රේෂ්ඨ ඇගයුම් දෙකක් විශද කරයි. එනම් ශාස්ත්‍රීය ඒකාග්‍රතාව හා අවංකභාවයයි. මේ ගුණාංග දෙක තවදුරටත් විස්තාරනය කළ හැකිය. විශ්වවිද්‍යාල ආචාර්යවරයෙකු සමාජ ප්‍රශ්න විශ්ලේෂණය කළ යුත්තේ ශාස්ත්‍රවන්ත ඥානයට අනුව මිස තම පෞද්ගලික දේශපාලනික විජිගීසාවන්ට අනුව නොවේය යන්න පළමුවැන්නයි. දෙවැන්න වන්නේ සත්‍යයම මිස අසත්‍යක් ප්‍රකාශ නොකළ යුතු බවයි. මේ උත්තරීතර ශාස්ත්‍රීය සාරධර්ම නියෝජනය කළ හා අනුගමනය කළ විරල ගණයේ විද්වතකු වශයෙන් මහාචාර්ය පියදාස අතුකෝරල හැඳින්වීම සත්‍යලෙසින්ම යෝග්‍යය වේ.

දකුණු ලක ගාලු දිසාවේ බෙන්තර වලල්ලාවිට කෝරලයේ පිටිගල හත්තකදී උපන් පියදාස අතුකෝරල තම ප්‍රාථමික අධ්‍යාපනය හැදෑරුවේ හත්තක මහා විද්‍යාලයෙන් හා පිටිගල මහා විද්‍යාලයෙනි. එසේම ද්විතීය අධ්‍යාපනය ලබන්නට යෙදුනේ කොළඹ දිස්ත්‍රික්කයේ කලපලුවාව මහ විද්‍යාලයෙනි. 1974 වර්ෂයේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ඇතුළත්ව ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය පංති සාමාර්ථයක් ද සහිතව සමත් වූ ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආධුනික සහකාර කථිකාචාර්යවරයෙකු ලෙස සේවයට බැඳුනේ 1979 වර්ෂයේදීය. ඒ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශටය. එවකට විද්‍යෝදය විශ්වවිද්‍යාලය වශයෙන් හැඳින් වූ වර්තමාන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා අධ්‍යාපනය අඩපනව ගොස් තිබුණි. විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ ආරම්භක අවධියේ ආචාර්ය කේ.පී. මුබර්ජි යටතේ දේශපාලන විද්‍යා අධ්‍යාපනය පැවතියත් කාලයාගේ ඇවෑමෙන් විෂය පිළිබඳ අධ්‍යයන කටයුතු අඩපනව ගොස් පැවතුණි. පියදාස අතුකෝරල තරුණ ආචාර්යවරයා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සේවයට බැඳෙන විට මව් දෙපාර්තමේන්තුව වූ ආර්ථික විද්‍යා අධ්‍යනාංශයේ මහාචාර්යවරයා වූයේ සිරිසේන තිලකරත්නයි. මහාචාර්ය සිරිසේන තිලකරත්න මේ තරුණ කථිකාචාර්යවරයාට ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පාඨමාලාව සඳහා විෂය නිර්දේශ සකස් කිරීමේ භාරධුර වගකීමත්, ඉගැන්වීමේ කටයුතු සිදු කිරීමත් යන වගකීම් දෙකම පැවරුවේය. එහිදී නිර්මාණශීලි වූ පියදාස අතුකෝරල දේශපාලන අර්ථ ශාස්ත්‍රයද ඇතුළත්ව සාමාන්‍ය උපාධි පාඨමාලාවන් සකස් කරන ලදි. දේශපාලන අර්ථ ශාස්ත්‍රය එකී උපාධි පාඨමාලාවට ඇතුළත් කිරීම නිර්මාණශීලි හා කාලීන අවශ්‍යතාව පිරිමසාලීමක් ද විය. තවද, එවකට විශේෂ උපාධි පාඨමාලාවක් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙහි නොතිබූ හෙයින් විශේෂ උපාධි පාඨමාලාව හැදෑරීමට කැමති දක්ෂ සිසුන්ට ඒ සඳහා ඉඩ ප්‍රස්ථා පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමඟ කථිකා කොට ඇති කර දීමට ඔහු ක්‍රියා කළේය.

ස්වකීය ශාස්ත්‍රීය සම්ප්‍රදානය නව පත්වීම බාරගත් දා සිටම ආරම්භ කළ පියදාස අතුකෝරල 1985 වර්ෂයේදී ස්වකීය - මව් ශාස්ත්‍රාලය වූ පේරාදෙණි විශ්වවිද්‍යාලයෙන් දේශපාලන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය හිමි කර ගත්තේය. තදන්තරව ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දෙවන ශ්‍රේණියට උසස්වීමක් ලැබූ ඔහු ස්වකීය ශාස්ත්‍ර ඥානයේ නිම් වළලු පුළුල් කරගනු වස් එක්සත් රාජධානියේ ඇබර්ඩීන් විශ්වවිද්‍යාලයට ගොස් තම දර්ශනසූරි උපාධිය සම්පූර්ණ කරනු ලැබුවේ 2002 වර්ෂයේදීය. මේ අතර වාරයේදී තම වෘත්තීය ජීවිතයේ හිනිපෙත්තටම නැගීමට

අවශ්‍ය කරන ශාස්ත්‍රීය හා වෘත්තීය සුදුසුකම් සපුරාගත් ඔහු පිළිවෙලින් 1993 වර්ෂයේදී ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පළමු ශ්‍රේණියට ද 2008 වර්ෂයේදී දේශපාලන විද්‍යාව පිළිබඳ මහාචාර්ය ධූරයට ද 2013 වර්ෂයේදී දේශපාලන විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ධුරයට ද උසස් වීම් හිමිකර ගත්තේය. මහාචාර්යවරයෙකු ලෙස පුරා වර්ෂ 10 කට වැඩි කාලයක් සේවය කළ පියදාස අතුකෝරළ 2018 වර්ෂයේදී ස්වකීය විශ්වවිද්‍යාල සේවාවෙන් ඉසබු ලැබීය. මහාචාර්ය පියදාස අතුකෝරල ශාස්ත්‍රීය ලෝකයටත්, ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයටත්, ජාතික හා ජාත්‍යන්තර සංවර්ධනයටත් කරනු ලැබූ සේවාව සලකා බැලූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සේවා සම්මානිත මහාචාර්ය ධූරයෙන්, එම වර්ෂයේදීම පිරිනමා සම්මාණයට පාත්‍ර කළේය.

මහාචාර්ය පියදාස අතුකෝරල ස්වකීය ඥානය හා කුශලතාවය ආයතනික සංවර්ධනයට මතු නොව ජාතික හා ජාත්‍යන්තර සංවර්ධනයටද ශාස්ත්‍රවන්තයකු සතු අවංකභාවය හා ශාස්ත්‍රීය ඒකාග්‍රතාවයකින් යුතුව ප්‍රදානය කළ විරල ගණයේ විශ්ව විද්‍යාල ප්‍රජාවේ නියෝජිතයකු ලෙස මම සලකමි. ස්වකීය වෘත්තිය ජීවිතයේදී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සෙනෙට් සභිකයකු හා පාලක මණ්ඩල සාමාජිකයකු ලෙස ශාස්ත්‍රීය ගැටලු හා පරිපාලන ගැටලු මැදිහත් සිතින් බලා අගතිගාමීත්වයෙන් තොරව නිරාකරණය කිරීමට ඉදිරිපත් වූ බවට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ විද්වත්තු එකලාව එකඟ වෙති. නිල බලයෙන් පත් වූ මණ්ඩලවල පමණක් නොව නාමයෝජනා සම්මතයෙන් පත් කරනු ලැබූ මණ්ඩලවලදී ද ඔහු සෘජුව හා අවංකව කටයුතු කර තිබේ. ඔහුගේ ශාස්ත්‍රීය සම්ප්‍රදානය සැලකිල්ලට ගත් නයිජීරියාවේ ගොම්බේ රාජ්‍ය විශ්වවිද්‍යාලයෙත් කැළණිය විශ්ව විද්‍යාලයත් ඔහුට අරාධිත මහාචාර්ය තනතුරු ප්‍රදානය කොට තිබේ. ස්වකීය විශ්වවිද්‍යාල ජීවිත කාලය තුළදී අධ්‍යයනාංශ ප්‍රධානියෙකු පීඨාධිපතිවරයෙකු හා විවිධ අධ්‍යයන ඒකකවල අධ්‍යක්ෂවරයකු හා වැඩ බලන උප කුලපතිවරයෙකු වශයෙන් ද ස්වකීය දායකත්වය සපයා තිබේ. දේශීය හා ජාත්‍යන්තර සම්මන්ත්‍රණවලටත් සහභාගී වූ ඔහු ඉදිරිපත් කර තිබූ පර්යේෂණ පත්‍රිකා දේශපාලන විද්‍යාවේ හා දේශපාලන අර්ථ ශාස්ත්‍රයේ විවිධ ඉසව් ස්පර්ශ කරමින් විශ්ලේෂණයට භාජනය කොට තිබේ.

මහාචාර්ය පියදාස අතුකෝරලගේ පර්යේෂණ පත්‍රිකා හා පොත් පත් නිරීක්ෂණය කරන්නකුට පැහැදිලි වන කරුණක් වන්නේ ඔහු ස්වකීය ශාස්ත්‍රීය ගවේෂණය සඳහා සමාජ සුභසාධන ප්‍රතිපත්ති, ලිබරල් ආර්ථික ප්‍රතිපත්ති, ආණ්ඩුක්‍රම

ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ, ජනවාර්ගික ප්‍රශ්නය, ආර්ථික සම්පත් බෙදී යාම හා ආර්ථික ප්‍රතිපත්තිවල දෘෂ්ටිවාදය යන ඉසව් තේමා කරගෙන තිබෙන බවය. මේ සියලු ලිපි ලේඛනවල දැක ගත හැකි ඉතා වැදගත් ලක්ෂණය වන්නේ දේශපාලන අර්ථ ශාස්ත්‍රීය එළඹුමකින් මේ ගැටළු විස්තර කිරීමට හා විශ්ලේෂණය කිරීමට ඔහු දරන උත්සාහයයි.

දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය

දේශපාලන අර්ථ ශාස්ත්‍රය යනු දේශපාලනික හා ආර්ථික සංසිද්ධීන් අතර අන්තර් සම්බන්ධතා හදාරනු ලබන සාමාජීය විද්‍යා විෂය ධාරාවක් ලෙස හඳුන්වාදිය හැකිය. දේශපාලනය හා ආර්ථිකය අතර සම්බන්ධතාවය ඒක දිශානතික නැත. එක් දිශාවකට ගමන් කරන්නේ නැත. එනම් දේශපාලනය ආර්ථිකයට බලපාන්නා සේම ආර්ථිකය ද දේශපාලනයට බලපාන්නේය. මෙම සංකීර්ණ සම්බන්ධතාවය අවබෝධ කර ගැනීමට නම් අවම වශයෙන් අප සමාජය (පංතිය හා පංති නොවන සමාජීය හැඩ ගැසීම්) හා රාජ්‍යයන් අතර සම්බන්ධතාවය හැදෑරිය යුතුය. සමාජීය සම්බන්ධතා හා රාජ්‍ය අතර පවතින සම්බන්ධතා එනම් සමාජය රාජ්‍යයට බලපාන්නේ කෙසේදැයි හා රාජ්‍යය සමාජයට කෙසේ බලපාන්නේ දැයි හදාරනු ලබන විෂය, දේශපාලන සමාජ විද්‍යාව යනුවෙන් හැඳින්වේ. අනික් අතට ආර්ථිකය රාජ්‍යයටත්, රාජ්‍යය ආර්ථිකයටත් කරනු ලබන බලපෑම හදාරනු ලබන්නේ දේශපාලන අර්ථ ශාස්ත්‍රයෙනි. මහාචාර්ය පියදාස අතුකෝරල විසින් රචිත ශාස්ත්‍රීය ලිපි ලේඛන සුපරීක්ෂාවෙන් හදාරන්නෙකුට පැහැදිලි වන කරුණක් වන්නේ ඔහු වරෙක දේශපාලන සමාජ විද්‍යාඥයකුත් තවත් වරක දේශපාලන අර්ථ ශාස්ත්‍රඥයකුත් එක විට වන බවය. එනම් ඔහුගේ ලියකියවිලි තුළ සියුම් හුයක් සේ දේශපාලන අර්ථ ශාස්ත්‍රයත් දේශපාලන සමාජ විද්‍යාවත් දක්නට ලැබේ.

ශ්‍රී ලංකීය දේශපාලන විද්‍යා අධ්‍යයන ඉතිහාසයේ එක් වකවානුවක් මහාචාර්ය පියදාස අතුකෝරල නියෝජනය කරයි. ශ්‍රී ලංකීය සරසවි ඉතිහාසයේ දේශපාලන අධ්‍යයනය විවිධ අවධාරණයන් සහිතව ආරම්භ වූ බව දැක ගත හැකිය. දේශපාලන ඉගැන්වීම ආරම්භකළ මුල් අවධියේදී එහි අවධාරණය නෛතික හා සංස්ථාමය රාමු කට්ටුවක් තුළ හැදෑරීමට සීමාව පැවතුන බව මුකර්ජී වැනි විද්වතුන්ගේ පාඨමාලා විමර්ශනයේදී පැහැදිලි වේ. අනතුරුව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය තුළ ආර්ථික විද්‍යාවේ උප විෂය

ක්ෂේත්‍රයක් වශයෙන් ආරම්භ වූ දේශපාලන විද්‍යාව හැදෑරීම පසුව වෙනම අධ්‍යයනාංශයක් බවට පත්වන්නේ 1978 වර්ෂයේදීය. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේදී දේශපාලන විද්‍යාවේ නව ඉසව් ස්වකීය විෂය ක්ෂේත්‍රය තුළට ඇතුළත් කර ගනිමින් නවීන පාඨමාලා හඳුන්වාදීම සිදුව තිබේ. ඒ යටතේ රාජ්‍ය පරිපාලන විද්‍යාව, රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ හැදෑරීම, ජාත්‍යන්තර සම්බන්ධතා ගැටුම් නිරාකරණය, මානව අයිතිවාසිකම් යනාදි නව ඉසව් ශාස්ත්‍රීය ගවේෂණයට පාත්‍ර කර තිබේ.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ස්වකීය උපාධි ලබාගත් විද්වත්හු පසුකාලීනව ලංකාවේ විවිධ විශ්වවිද්‍යාල වලට බැඳී දේශපාලන විද්‍යාවේ විෂය පරිපථයේ නව නිම්වළලු ග්‍රහණය කර ගනිමින් ඒවා ස්වකීය පාඨමාලාවලට ඇතුළත් කර ගැනීමට කටයුතු කර තිබේ. වර්තමානයේදී දේශපාලන විද්‍යාව පේරාදෙණිය කොළඹ, ශ්‍රී ජයවර්ධනපුර, කැළණිය, රුහුණු, යාපනය, නැගෙනහිර හා අග්නිදිග යන විශ්වවිද්‍යාලවල උගන්වනු ලැබේ. ඇතැම් විටක දේශපාලන විද්‍යාවේ උප විෂය ක්ෂේත්‍රයක් වූ රාජ්‍ය පරිපාලනය පිළිබඳ වෙනම දෙපාර්තමේන්තුද පිහිටුවා තිබේ.

දේශපාලන විද්‍යාව යනු අත්‍යවශ්‍යයෙන්ම ප්‍රතිමාණිය ශික්ෂණ මාර්ගයකි. දේශපාලන විද්‍යාවට හුදු අනුභවික විද්‍යාවන් බවට පත් විය නොහැක. මන්ද යත් දේශපාලන විද්‍යාවේ කේන්ද්‍රීය අවධාරණය වන්නේ දේශපාලනය වන හෙයිනි. දේශපාලනය යනු අප සාමුහිකව ක්‍රියාකර වඩාත් හොඳ සමාජ හා පාලන ක්‍රමයක් ගොඩනගා ගැනීමට යත්න දරන සමාජ අවකාශය වේ. එහෙයින් දේශපාලන විද්‍යාඥයෙකුට යමක් විස්තර කිරීමෙන් හා විග්‍රහ කිරීමෙන් නතර විය නොහැකිය. එයට අත්‍යවශ්‍යයෙන්ම වඩා හොඳ සමාජයක් ගොඩ නැගිය හැක්කේ කෙසේද යන ප්‍රතිමාණිය ගැටලුව සමග පොර බැඳීමට සිදු වේ.

නූතන සමාජ විද්‍යාවන් ආරම්භ වූයේ පුනරුදය හා ප්‍රබුද්ධත්වය යන ව්‍යාපාරවල ආභාෂය ලබමිනි. පුනරුද ව්‍යාපාරයේ හා ප්‍රබුද්ධත්ව ව්‍යාපාරයේ අදහස් මගින් මැවුම්කාර දෙවියකු හා සමාජය පිළිබඳ අදහස ප්‍රතික්ෂේප කරනු ලැබීය. ප්‍රබුද්ධත්ව ව්‍යාපාරයෙන් සිදු වූ මේ විපරිවර්තනයෙහි පැතිකඩ දෙකක් තිබේ. භරයාත්මකව හෝ අන්තර්ගතය අතින් ගත් විට මිනිසා හා සමාජය පිළිබඳ දේව ධර්මවාදී අදහස් ඔවුහු ප්‍රතික්ෂේප කරති. ඒ අතරම මූලික මානව ස්වභාවය පිළිබඳ උපකල්පනය රඳවා ගත් දේශපාලන සමාජ විද්‍යාවෙහි සහ දේශපාලන අර්ථ ශාස්ත්‍රයේ පුරෝගාමී චින්තකයින් ලෙස සැලකෙන තෝමස්, හොබ්ස්, ජෝන් ලොක්, රූසෝ වැනි අයගේ අදහස් ඊට නිදසුන්ය. සමාජයේ වැරදි සිදු වන්නේ ඇයි ද? යන

ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට යත්ත දරු මොවුහු එයට හේතුවන්නේ මූලික මානව ස්වභාවය යැයි වරෙක සිතුහ. තවත් විටක තවත් අයෙක් මානව දුෂ්චර්යාව යනු සමාජීය සංස්ථාවල ප්‍රතිඵලයක් ලෙස ඇති වන්නේ යැයි කල්පනා කළහ. මේ බලවේග දෙක විසින් නූතන සමාජ විද්‍යාවන්ගේ පදනම සකස් කොට තිබේ. කෙසේ වූවත් දේශපාලනය ද ඇතුළත් සමාජීය විද්‍යාවන්හි කේන්ද්‍රීය ප්‍රතිමානය වුයේ මානව හිතවාදී විද්‍යාවන් ගොඩ නැගීමය. මෙම මානව හිතවාදී ජීව ගුණය පසුගිය කාලාන්තරය මුළුල්ලේ සමාජයීය විද්‍යාවන් වසා ගනු ලැබූ යථානුභූතවාදී හා අනුභවිකවාදී අවධාරණය මගින් ඉවත් කොට තිබේ. උදාහරණයක් ලෙස දුගීකම පිළිබඳව ලංකාවේ ආනුභූතිකවාදී විද්වතුන් විසින් කරනු ලැබූ අධ්‍යයන පෙන්වා දිය හැකිය.ඒවා සංඛ්‍යානමය සූත්‍රගතකිරීම් හා උපන්‍යාංශ තහවුරු කිරීම හෝ නිෂේධනයට පමණක් සීමා වී ඇත. එයින් දුප්පත්කම ඇති වන්නේ කෙසේද? ඊට කළ යුත්තේ කුමක් ද යන ගැටළු ආමන්ත්‍රණය කිරීමක් සිදු නොවේ. මෙහිදී ඩෙවිඩ් හියුම්ගේ අගනා කියමනක් උපුටා දැක්වීම මැනවැයි සිතේ.

> ''සියලුම විද්‍යාවන්ට ඉතා පුලුල් හෝ පටු වූ ආකාරයට මානව ස්වභාවය සමග සම්බන්ධතාවයක් තිබේ.... ගණිතය, ස්වාභාවික දර්ශනය හා ස්වභාවික ආගම යන මේවා යම් පමණකට රදා පවතින්නේ මිනිසා පිළිබඳ විද්‍යාවක් මතය. මන්ද යත් ඒවා මානව ප්‍රජානනය මත රදා පවතී. ඒවායේ වැදගත්කම තීරණය කරන්නේ මිනිසුන්ය.''

කෙසේ වූවත් සමාජීය විද්‍යාවන්හි මානව කේන්ද්‍රීයභාවය කාලයාගේ ඇවෑමෙන් එම සමාජීය විද්‍යාවන්ගෙන් බැහැරව තිබේ. ප්‍රතිමාණිය නොවන ආකාරයට කරනු ලබන හැදෑරීම් හා ඒවායේ ප්‍රතිඵල මානව සමාජය රැගෙන ගොස් තිබෙන්නේ අපදාභිමුක හා ආපදාහරිත සමාජයකටය. මිහිපිටින් මානව වර්ගයා අතුගා දැමිය හැකි ආයුධ නිෂ්පාදනය කිරීමට විද්‍යාව හා තාක්ෂණය සමත්ව ඇතිමුත් ඔස්ට්‍රේලියාවේ හෝ කැලිෆෝනියාවේ ඇතිවන ලැව් ගින්නක් නිවා දැමීමට අවශ්‍ය උපකරණ හා හැකියාව අත්කර ගැනීම සඳහා නවීන විද්‍යාව හා තාක්ෂණය යොදා ගෙන නොමැත. න්‍යෂ්ටික අවිවලින් හා ආගමික මූලධර්මවාදීන් බිහිව තිබෙන සමාජයක මානව වර්ගයාගේ විනාශය කුමන අවස්ථාවල දී කුමන ආකාරයට සිදුවේ දැයි කිව නොහැක.

මහාචාර්ය පියදාස අතුකෝරලගේ රචනාවල මේ මූලික මානව සංවේදීතාවය දක්නට ලැබේ. සමහර විටක එයට හේතුවන්නට ඇත්තේ ඔහු තුළ සදහටම

ක්‍රියාත්මක වන දේශපාලන අර්ථ ශාස්ත්‍රීය එළඹුමේ ප්‍රතිමාණ විය හැකිය. 2007 වර්ෂයේදී Japanese Journel of Political Science හි පළවූ The role of international donor agencies in the Politics of Sri Lanka යන ලිපිය මෙයට කදිම උදාහරණයකි. Vidyodaya Economics හි The IMF- World Bank and Social Welfare Policies in Sri Lanka ලිපිය ජාත්‍යන්තර මූල්‍ය කාටල එනම් ලෝක බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමාජ සුභසාධන ප්‍රතිපත්ති කෙරෙහි කරනු ලබන බලපෑම විශ්ලේෂණය කරයි. එම ලිපියෙන් ඔහු ග්‍රහණය කරන්නේ ගෝලීය මට්ටමේ ආයතන දේශීය සමාජයේ ප්‍රතිපත්ති ක්‍රියාවලිය කෙරෙහි කරනු ලබන සංකීර්ණ බලපෑම පිළිබඳවයි. මහාචාර්ය අතුකෝරල විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රඥයකුගෙන් බලාපොරොත්තු වන දැනුම නිෂ්පාදන කිරීම හා දැනුම පිරිපහදු කිරීම පමණක් නොව දැනුම බෙදා හැරීමටද කටයුතු කර තිබේ. ඔහු විසින් ලංකාවේ සිංහල පාඨක සමාජයේ තුලනාත්මක ආණ්ඩුක්‍රමය හා දේශපාලනය හැදෑරීමට රුචි එහෙත් ඒකභාෂිකයන්ට ප්‍රවේශ නොමැති වැදගත් කෘතියක් සිංහලයට නැගීමට දායක වී තිබේ. එනම් විෂ්ණු භග්වාන්ගේ World Constitutions යන කෘතිය ලෝක ආණ්ඩු ක්‍රම මැයෙන් සිංහලයට පරිවර්තනය කිරීමට දෙන ලද දායකත්වයයි. එයින් ඔහු ස්වකීය භාෂාන්තර ප්‍රාගුණ්‍යතාවය කදිමට භාවිතයට ගනිමින් සිංහල පාඨක සමාජයේ දැනුම පෝෂණය කිරීමේ හා දැනුම බෙදා හැරීමේ ලා මහගු දායකත්වයක් සපයා තිබේ. මෙම කෘතිය මහාචාර්ය පියදාස අතුකෝරලගේ ශාස්ත්‍රීය සම්ප්‍රදානයේ වැදගත් දායකත්වයක් ලෙස පෙන්නුම් කළ හැකිය.

මහාචාර්ය පියදාස අතුකෝරලගෙන් විශ්වවිද්‍යාල වර්ධනයට සිදු වූ විශාල දායකත්වයක් ලෙස 2009 වසරේ මානව ශාස්ත්‍ර හා සමාජයීය විද්‍යා පීඨය තුළ ස්ථාපිත කරන ලද දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය පෙන්නුම් කළ හැකිය. මේ සඳහා වූ මූලික අඩිතාලම 2006, 2007 වර්ෂය තුළ දී ආර්ථික විද්‍යා අධ්‍යයනාංශ ප්‍රධාන ලෙස විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කරන ලද යෝජනාවලියයි. මෙම යෝජනාවලිය විශ්වවිද්‍යාලයේ සනාථන සභාව සහ පාලක සභාව අනුමත කොට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව වෙත ඉදිරිපත් කරන්නට යෙදුනි. මෙම යෝජනාවලිය විශ්වවිද්‍යාල කොමිසන් සභාවේ සාකච්ඡාවට භාජනය කරන අවස්ථාව වන විට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවේ සමාජීය විද්‍යාව සහ මානව ශාස්ත්‍ර පිළිබඳ ස්ථාවර කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීමේ අවස්ථාව මහාචාර්ය අතුකෝරල මහතාට උදා වූයේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා

සමාජ විද්‍යා පීඨයේ පීඨාධිපති ලෙසයි. මේ අනුව ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සඳහා දේශපාලන විද්‍යාව පිළිබඳ නව අධ්‍යයනාංශයක් ස්ථාපිත කිරීමේ නියමුවා බවට ඔහු පත්ව තිබේ. ඔහු ඒ සඳහා ආර්ථික විද්‍යා අධ්‍යායනංශ ප්‍රධානිය ලෙස කටයුතු කළ 2006-2007 වසර තුළ දී අවශ්‍ය කරන යෝජනා සකස් කොට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් අනුමත කරවා ගැනීමට ක්‍රියා කළේය. ඒ සඳහා ඔහු පරිපාලන හා ශාස්ත්‍රීය නායකත්වය සැපයූවා පමණක් නොව අධ්‍යයනාංශයේ තිරසාරභාවය සඳහා අවශ්‍ය පියවර ද ගත්තේය. ඔහු දශක 4 ක විහිදුනු විශ්ව විද්‍යාල සේවා කාලය තුළ වැඩ බලන උපකුලපතිවරයා වශයෙන් දෙවරකුත්, විශ්ව විද්‍යාලයේ දුරස්ථ අධ්‍යාපන වැඩ සටහනේ සම්බන්ධීකාරකවරයා ලෙස වසර දෙකකුත්, එසේම විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය විනය පාලකවරයා ලෙසත් කටයුතු කර තිබේ. ඊට අමතරව ස්වකීය විශ්ව විද්‍යාලයේ ආචාර්ය සමිති සම්මේලනයේ සභාපතිවරයා ලෙසත් කටයුතු කර තිබේ. තවද ඔහු ඉතා වැදගත් ජාතික කර්තව්‍යයක් වන අ.පොෂ.ස. (උසස් පෙළ) විභාගයේ සමපාලක පරීක්ෂකවරයකු ලෙස කිහිප අවස්ථාවක ස්වකීය දැනුම හා ඥානය ජාතික සංවර්ධනය උදෙසා ලබා දුන්නේය. මෙතෙක් අප සාකච්ඡා කළේ මහාචාර්ය පියදාස අතුකෝරලගේ ශාස්ත්‍රීය හා පරිපාලන දායකත්වයයි. ඔහු සතු මානව ගුණාංග පිළිබඳව යමක් සටහන් නොකළ හොත් ඔහු පිළිබඳ ලියැවෙන මේ උපහාර ලිපි සංග්‍රහය අපරිපූර්ණ එකක් වනු ඇත.

ඔහු පෞද්ගලික ජීවිතයේදී අතිශය සාර්ථක තැනැත්තෙකි. ඔහුගේ ප්‍රිය බිරිඳ මානෙල් අතුකෝරල මහත්මිය ලංකා බැංකුවේ කළමනාකරුවෙකු ලෙස සේවය කොට විශ්‍රාම සුවයෙන් පසු වුවද ඇය සාහිත්‍ය කලාවට ලැඳි ලේඛිකාවකි. එම දෙපල මානව වර්ගයාට වැඩදායි දරුවන් දෙදෙනකු සමාජයට දායාද කර තිබේ. ඔවුන් දෙපලගේ දියණිය වන රුවිනි අතුකෝරාල මහත්මිය වෛද්‍යවරයෙකු ලෙස නවසීලන්තයේ ඕක්ලන්ඩ් නගරයේ ජීවත් වන අතර පුත් ඌෂාන් අතුකෝරල පරිසරක ඉන්ජිනේරුවකු වශයෙන් ඕස්ට්‍රේලියාවේ මෙල්බොන් නුවර ජීවත් වේ. ඔහුගේ නිවස ආගන්තුකයින්ට දේවත්වයෙන් සලකන ස්ථානයකි. මානව සුන්දරත්වය එහි තිබේ. මේ සියල්ලට වඩා මහාචාර්ය පියදාස අතුකෝරලගේ මා දකින විශේෂත්වය වන්නේ 1970 දශකයේ විශ්වවිද්‍යාල ආචාර්ය වරුන්ට මුල් භාගයේදී ඇරඹී වර්තමානයේ කුට ප්‍රාප්තියට පත්ව ඇති දේශපාලන තන්ත්‍රයේ ග්‍රහණයෙන් මිදී සිටීමට දරා ඇති වෑයමකි. 1970 දශකයේ දී විශ්ව විද්‍යාල ආචාර්යවරු දේශපාලන තන්ත්‍රයෙන් පිරිනමන තනතුරු බාර ගැනීම ආරම්භ වූ අතර වර්තමානයේ එහි උච්චස්ථානයට ළඟා වී ඇත. මෙය වනාහි විශ්වවිද්‍යාල

උගතුන්ගෙන් බලාපොරොත්තු වන නිදහස් හා සෛවරී සත්‍යම මිස අසත්‍ය කථා නොකරන බවට වූ ශාස්ත්‍රීය ප්‍රතිමාණය සෝදා පාලුවට පත් කර ගැනීමකි. මහාචාර්ය පියදාස අතුකෝරලට දේශපාන රුචි අරුචිකම් තිබුණ ද පදවි තානාන්තර බලාපොරොත්තුවෙන් අසත්‍යය හා අයුක්තිය සාධාරණීකරණය කිරීමට ඔහු කිසිදා කටයුතු කර නොමැති බව ඔහු විසින් ජනමාධ්‍ය සමග කරන ලද සාකච්ඡා හා පුවත්පත්වලට සපයන ලද ලිපි සාක්ෂි දරයි. පියදාස අතුකෝරල දැන් ඉසඹු ලැබ නිදහසේ පොත පත කියවමින් තවදුරටත් ශාස්ත්‍රීය ගවේෂණයෙහි යෙදී සිටිති. විශ්වවිද්‍යාල පද්ධතියේ සේවයේ නියුක්ත අප සියලු දෙනාට පියදාස අතුකෝරලගේ චරිතයෙන් උකහා ගත හැකි දේ බොහෝ ය. එය කිරීමට කාලය යැයි ශ්‍රී ලංකික විශ්වවිද්‍යාල ප්‍රජාවේ සගයින්ට යෝජනා කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. ''විද්වාත් සර්වත්‍රප්‍රජ්‍යානේ'' යැයි විශ්ණු ෂර්මන් පංචතන්ත්‍රයේදී සඳහන් කළේ පියදාස අතුකෝරල විද්වතු වන හෙයින්, සෑම තැනම බුහුමනට පාත්‍ර වේ. ඔහුට නිදුක් නිරෝගී වාසනාව ලැබේවා යැයි ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

උපුල් අබේරත්න
දේශපාලන විද්‍යාව පිළිබඳ මහාචාර්ය
දේශපාලන අධ්‍යයනාංශය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය.

අම්පාර දිස්ත්‍රික්කයේ ජනවාර්ගික දේශපාලනය සහ සිවිල් යුද්ධයේ ස්වභාවය

අතුල විතානවසම්

සංක්ෂිප්තය

මෙම ලිපිය අම්පාර දිස්ත්‍රික්කයේ ජනවාර්ගික දේශපාලනයෙහි විශේෂිත ස්වභාවය මෙන් ම එම දිස්ත්‍රික්කයේ පැවැති සිවිල් යුද්ධයේ විශේෂිත ස්වභාවය හඳුනා ගැනීම විෂය කොට ගත්තකි. මෙම ලිපියෙහි අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ ජනවාර්ගික දේශපාලනය අම්පාර දිස්ත්‍රික්කය පිහිටුවීම කෙරෙහි බලපෑ ආකාරයත් අම්පාර දිස්ත්‍රික්කයේ පවතින ජනවාර්ගික දේශපාලනය සිවිල් යුද්ධයේ ස්වභාවය කෙරෙහි සිදුකළ බලපෑමත් විමර්ශනයට ලක් කිරීම ය. එබැවින් මෙම ලිපියෙන් අම්පාර දිස්ත්‍රික්කයේ ජනවාර්ගික දේශපාලනයේ ඓතිහාසික මූලයන් හඳුනා ගැනීමට යත්න දැරිණි. තව ද, අම්පාර දිස්ත්‍රික්කයේ පවතින ජනවාර්ගික දේශපාලනය සහ සිවිල් යුද්ධය අතර පැවති අන්‍යෝන්‍ය සම්බන්ධයේ ස්වභාවය හඳුනා ගැනීමට උත්සාහ කෙරිණි. මෙම අධ්‍යයනයෙන් පැහැදිලි වූයේ අම්පාර දිස්ත්‍රික්කය පිහිටුවීම සහ ජනවාර්ගික දේශපාලනය අතර සමීප සම්බන්ධතාවයක් පැවති බවයි. ජනවාර්ගික දේශපාලනය අම්පාර දිස්ත්‍රික්කය පිහිටුවීම කෙරෙහි මෙන් ම අම්පාර දිස්ත්‍රික්කයේ ස්වභාවය ජනවාර්ගික දේශපාලනය කෙරෙහි ද දැඩිව බලපාන බව මෙම අධ්‍යනයෙන් හඳුනා ගැනීමට හැකි විය. අම්පාර දිස්ත්‍රික්කය පිහිටුවන ලද්දේ දෙමළ සහ මුස්ලිම් ජනවාර්ගික දේශපාලනයට එරෙහිව එම පළාත තුල පැවැති සිංහල ජනවාර්ගික ආධිපත්‍ය ස්ථාපිත කොට තහවුරු කර ගැනීම සඳහා ය යන්න අධ්‍යනයෙන් අනාවරණය කර ගැනීමට හැකි විය. තව ද, අම්පාර දිස්ත්‍රික්කය පිහිටුවීමෙන් පසුව එහි හිමිකාරිත්වය සම්බන්ධයෙන් සිංහල, දෙමළ සහ මුස්ලිම් ජනවාර්ගික කණ්ඩායම් අතර ඇතිවන තරගය එහි ජනවාර්ගික දේශපාලනයේ එක් ප්‍රධාන ලක්ෂණයක් බවට පත්ව ඇති බව හඳුනා ගැනීමට ද හැකි විය. එමෙන් ම අම්පාර දිස්ත්‍රික්කයේ ජනසංයුතියේ සහ ජනව්‍යාප්ති රටාවේ පවතින සුවිශේෂී ලක්ෂණ සහ එම දිස්ත්‍රික්කයේ පවතින භූගෝලීය ලක්ෂණ සිවිල් යුද්ධයේ දී එල්. ටී. ටී. ඊ. සංවිධානයට රාජ්‍ය සන්නද්ධ හමුදාවලට වඩා වැඩි වාසිදායක තත්වයක් අත්කර දුන් බව අනාවරණය කරගැනීමට හැකි විය. අවසාන වශයෙන් එල්. ටී. ටී. ඊ. සංවිධානය හෝ රාජ්‍ය ආරක්ෂක හමුදා හෝ යන දෙකෙන් එකක තනි ආධිපත්‍ය

යටතේ පැවැති ප්‍රදේශ මෙන් නොව මෙම පාර්ශ්ව දෙකෙහිම පාලනය යටතේ පැවැති ප්‍රදේශයක් වීම නිසා අම්පාර දිස්ත්‍රික්කයේ වාසය කරන ජනතාවට සිවිල් යුද්ධය ඉතා දැඩි ලෙසින් බලපෑම් කල බව ද මෙම අධ්‍යනයෙන් හඳුනා ගැනීමට හැකි විය.

ගැට පද :- සිවිල් යුද්ධය, ජනවාර්ගික දේශපාලනය, එල්.ටී.ටී.ඊ. සංවිධානය, රාජ්‍යයේ ආරක්ෂක හමුදා, සන්නද්ධ ක්‍රියාකාරකම්

හැඳින්වීම

මෙම ලිපියෙහි අරමුණ අම්පාර දිස්ත්‍රික්කයේ ජනවාර්ගික දේශපාලනයෙහි විශේෂිත ස්වභාවය සහ එම දිස්ත්‍රික්කයෙහි පැවති සිවිල් යුද්ධයේ ස්වභාවය පිළිබඳව විශ්ලේෂණාත්මක විමර්ශනයක් සිදු කිරීම ය. මේ අනුව මෙම ලිපිය ප්‍රධාන කොටස් දෙකකින් සමන්විත වෙයි. අම්පාර දිස්ත්‍රික්කයේ ජනවාර්ගික දේශපාලනය විමසා බලන පළමු කොටස යටතේ අවධානයට ලක් කෙරෙන මූලික කරුණු කිහිපයක් වෙයි. පළමුව, අම්පාර දිස්ත්‍රික්කය නිර්මාණය කෙරෙහි ජනවාර්ගික දේශපාලනය කවර ආකාරයේ බලපෑමක් සිදු කර තිබේ ද? යන්න හඳුනා ගැනීමට මෙහි දී යත්න දරයි. දෙවනුව, අම්පාර දිස්ත්‍රික්කයේ ජනවාර්ගික දේශපාලනය ක්‍රියාත්මක වූයේ කෙසේ ද එහි පැවති සුවිශේෂ ගති ලක්ෂණ මොනවාද යන්න විමර්ශනයට ලක් කෙරේ.

මෙහි දෙවන කොටසින් උත්සාහ දරන්නේ 1980 දශකයේ මැද භාගයේ දී ශ්‍රී ලංකාවේ පැවති සිවිල් යුද්ධය අම්පාර දිස්ත්‍රික්කය තුල ආරම්භ වී වර්ධනය වූයේ කෙසේ ද ? එහි පැවති විශේෂිත ගති ලක්ෂණ මොනවා ද? යන්න විමර්ශනයට ලක් කිරීමට ය. අම්පාර දිස්ත්‍රික්කයෙහි පවතින භූගෝලීය පිහිටීම සහ එහි ජනසංයුතික රටාව සිවිල් යුද්ධය කෙරෙහි කවර ආකාරයේ බලපෑමක් සිදු කලේ ද යන්න මෙහි විශේෂයෙන් විමර්ශනයට ලක් කෙරේ.

අම්පාර දිස්ත්‍රික්කයේ ජනවාර්ගික දේශපාලනය

අම්පාර දිස්ත්‍රික්කයෙහි ක්‍රියාත්මක වන දේශපාලනය ජනවාර්ගික විඥාණයන් සමග ඉතා තදින් බද්ධ වූවකි. මෙය, අම්පාර දිස්ත්‍රික්කය පිහිටුවන අවස්ථාව දක්වා ගමන් කරයි. අම්පාර දිස්ත්‍රික්කය නිර්මාණය වූයේ ඇතැම් දමිළ සහ මුස්ලිම් නායකයන්ගේ දැඩි විරෝධය මධ්‍යයේ ය.නිදහසින් පසු සිංහල ආණ්ඩු විසින් වියළි කලාපයේ ගොවි ජනපද ව්‍යාපාර ඇති කරමින් තිබෙන පසුබිමක දමිළ දේශපාලන නායකයන් අම්පාර දිස්ත්‍රික්කය පිහිටුවීමේ වැඩ පිළිවෙල දකින ලද්දේ ඔවුන්ගේ පාරම්පරික දෙමළ නිජභූමිය තුල සිංහල ආධිපත්‍ය නව මුහුණුවරකින් ස්ථාපිත කිරීමක් ලෙස ය (Hansard 1961). මෙවැනි සැකයක් ඇති කරගැනීමට තුඩුදුන් හේතු කිහිපයකි. එනම් පළමු, ගල්ඔය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ දකුණු ප්‍රදේශයට අයත් ජනශූන්‍ය ප්‍රදේශවල පිට පළාත්වලින් සිංහලයන් පදිංචි කරවීමත් දෙවනුව, එම ප්‍රදේශ ද ඇතුලත් විශාල කොටසක් තුල අම්පාර නමින් නව පරිපාලන දිස්ත්‍රික්කයක් පිහිටුවීමත් තෙවනුව, නව දිස්ත්‍රික්කයෙහි පරිපාලන මධ්‍යස්ථානය වන කච්චේරිය දෙමළ භාෂාව කථා කරන ජනතාව බහුල වශයෙන් වාසය කරන ප්‍රදේශ වලින් බැහැර සිංහල ජනපදිකයන් වාසය කරන උහන ප්‍රදේශයේ පිහිටුවීමට මුලින් සැළසුම් කිරීමත් මේ කෙරෙහි බලපෑවේ ය. මීට අමතරව ආණ්ඩුව මෙම දිස්ත්‍රික්කය පිහිටුවීම අරභයා කඩිමුඩියේ ක්‍රියාකරමින් සිටි ආකාරය ද දමිළ දේශපාලන නායකයන්ගේ සැකය තවදුරටත් වැඩි කිරීමට හේතු විය. සැබැවින්ම අම්පාර දිස්ත්‍රික්කය පිහිටුවීමට අදාල පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව තුල සාකච්ඡාවට ලක් කරන ලද්දේ පුළුල් විවාදයකින් තොරව ය. මේ පනත සාකච්ඡාවට ගන්නා විට නැගෙනහිර පළාතේ පාර්ලිමේන්තු මන්ත්‍රිවරු තිදෙනෙක් විදේශ ගතව සිටි තත්වය තුල නැගෙනහිර පළාතේ නියෝජිතයන් පිරිසකට ඒ පිළිබඳ පුළුල් ලෙසින් තම අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබුනේ නැත. උහන පරිපාලන මධ්‍යස්ථානය කරගනිමින් නව දිස්ත්‍රික්කය පිහිටුවීමේ වැඩපිළිවෙලට පෙඩරල් පක්ෂයේ මන්ත්‍රීවරු මෙන්ම ඇතැම් මුස්ලිම් නියෝජිතයන් ද විරෝධතාව පළ කළහ.(Hansard 1961). ස්ථාපිත කිරීමට යන නව දිස්ත්‍රික්කයේ පරිපාලන මධ්‍යස්ථානය මුස්ලිම් ජනතාව බහුල වශයෙන් ජීවත්වන කල්මුණේ හෝ අක්කරපත්තුව යන ප්‍රදේශවලින් එකක පිහිටුවන ලෙස මුස්ලිම් නියෝජිතයන් කළ ඉල්ලීම ආණ්ඩුවට සැළකිල්ලට ගත්තේ නැත. ගල්ඔය ජනපදය පදනම් කරගනිමින් අම්පාර දිස්ත්‍රික්කය පිහිටුවීම පිළිබඳව ආණ්ඩුවේ තර්කය වූයේ ගල්ඔය සංවර්ධන

මණ්ඩලය මගින් පාලනය වන ජනතාවට සිවිල් පාලනයක් ලබාදීම අත්‍යවශ්‍ය වන බවයි. කෙසේ වුවද, මඩකලපුව දිස්ත්‍රික්කයේ කොටසක් වෙන් කොට අම්පාර දිස්ත්‍රික්කය පිහිටුවීම මගින් මඩකලපුව දිස්ත්‍රික්කය තුල දෙමළ ජනතාවගේ දේශපාලන ශක්තිය අඩු කිරීමට හේතු වූ අතර තව අතකින් සිංහල ජනතාවට සේවය කිරීමේ මූලික අරමුණ සහිත නව සිවිල් පරිපාලන මධ්‍යස්ථානයක් නැගෙනහිර පළාතට එකතු විය.

අම්පාර දිස්ත්‍රික්කය පිහිටුවීමෙන් පසු නැගෙනහිර පලාත තුල එතෙක් පැවති සිංහල සහ දෙමළ ජනවාර්ගික දේශපාලනය වඩාත් තියුණු ස්වරූපයකින් අම්පාර දිස්ත්‍රික්කයට ඇතුළු විය. එතැන් පටන් අම්පාර දිස්ත්‍රික්කය හා බැඳුණු ජනවාර්ගික දේශපාලනය භ්‍රමණය වීමට පටන් ගන්නේ එක් ප්‍රධාන ප්‍රශ්නයක් මුල් කරගෙන ය. එනම් අම්පාර දිස්ත්‍රික්කයේ දේශපාලන ආධිපත්‍ය කාට හිමිවිය යුතු ද යන ප්‍රශ්නයයි. අම්පාර දිස්ත්‍රික්කයේ ජනවාර්ගික දේශපාලනයේ නාභිය සකස් ව ඇත්තේ සිංහල, දෙමළ සහ මුස්ලිම් ජන කණ්ඩායම් තුන මේ සම්බන්ධයෙන් ගෙන යන අරගලය මගිනි. දෙමළ දේශපාලන නායකයන්ට අනුව, අම්පාර දිස්ත්‍රික්කය ඔවුන්ගේ සම්ප්‍රදායික දෙමළ නිජභූමි සංකල්පයට ඇතුල්වන කලාපයේ පිහිටි දිස්ත්‍රික්කයකි (Wilson 1994). එබැවින් එම දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් ඔවුනට විශේෂ උනන්දුවක් පවතී. සිංහල නායකයන්ට අනුව, අම්පාර දිස්ත්‍රික්කය ස්ථාපිත කරන ලද්දේ ප්‍රධාන වශයෙන්ම ගල්ඔය ව්‍යාපාරය යටතේ දිවයිනේ විවිධ ප්‍රදේශවලින් පදිංචි කරන ලද සිංහලයන් මුල් කරගෙන ය. මේ කරුණට අමතරව ඓතිහාසික වශයෙන් සිංහල බෞද්ධයන්ට වැදගත්වන තවත් කරුණක් ද පවතී. එනම් අම්පාර දිස්ත්‍රික්කය ඓතිහාසික වශයෙන් සිංහල බෞද්ධ සංස්කෘතික උරුමයන් රැසකට ම හිමිකම් කීමයි[1] මුස්ලිම්වරුන්ට අනුව, ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අතුරින් අනෙකුත් ජනවර්ගසමග ගත්විට වැඩි ම මුස්ලිම් ජනගහනයක් ඇති එකම දිස්ත්‍රික්කය වන්නේ අම්පාර දිස්ත්‍රික්කයයි (Ameerdeen 2006). මේ අනුව අම්පාර දිස්ත්‍රික්කයේ ආධිපත්‍ය ඔවුනට හිමිවිය යුතු බව ඔවුහු කල්පනා කරති. අම්පාර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ පරිපාලන

[1]මේ පිළිබඳව 'ඓතිහාසික දිගාමඩුල්ල' කෘතියේ මෙසේ සඳහන් වේ "ඓතිහාසික දිගාමඩුල්ලේ ඇති වැදගත් පුරාවස්තු ප්‍රමාණය අති විශාල ය. වෙහෙර, විහාර, පිළිම ආදියෙහි නටබුන් ද අපමණ ය. ... දිගාමඩුල්ල දනව්වේ අතීත ශ්‍රී විභූතිය පෙන්වන ස්ථාන අතුරින් දීඝවාපිය, බුද්ධංගල, රජගල, පියංගල, සමන්ගල, පබ්බතගිරිය ... ඉතා වැදගත් වේ" (උඩවත්ත 2013: 30).

මධ්‍යස්ථානය මුස්ලිම් ප්‍රදේශයක පිහිටුවීමට යෝජනා කිරීම මෙහි ආරම්භය ලෙස සැලකිය හැකිය.

අම්පාර දිස්ත්‍රික්කය පිහිටුවීමෙන් පසුව සිංහල නායකයන් එම දිස්ත්‍රික්කය සළකන ලද්දේ නැගෙනහිර දමිළ පළාත තුල පවතින සිංහලයන්ගේ එකම දිස්ත්‍රික්කය වශයෙනි. රටේ බල දේශපාලන ආධිපත්‍ය සිංහල නායකයන් අත තිබීම නිසාම ඔවුහු අම්පාර දිස්ත්‍රික්කය තුල සිංහල ආධිපත්‍ය පවත්වා ගැනීමේ විශේෂ උනන්දුවකින් ක්‍රියා කරති. ආණ්ඩු බලය දරනු ලබන්නේ රටේ ප්‍රධාන පක්ෂ දෙකෙන් කුමන පක්ෂය වුව ද මෙම පක්ෂ මූලික වශයෙන්ම සිංහල පක්ෂ වීම නිසාත් එහි මතවාදී ආධිපත්‍ය සිංහල, බෞද්ධ මතවාදයට අනුව සැකසී ඇති නිසාත් බලයට පත්වන ආණ්ඩු අම්පාර දිස්ත්‍රික්කය තුල සිංහල ආධිපත්‍ය පවත්වා ගැනීමට උනන්දු වෙති. 1970 බලයට පත් සමගි පෙරමුණ ආණ්ඩුව 1975 වසරේදී සිංහලයන් බහුලව ජීවත්වන මොනරාගල දිස්ත්‍රික්කයට අයත් ව තිබූ බින්තැන්න පත්තුවෙන් කොටසක් අම්පාර දිස්ත්‍රික්කයට ඈඳ ගැනීම (උඩවත්ත 2013:11), 1977 බලයට පත් වූ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව විසින් ඉපැරණි සිංහල, බෞද්ධ ශිෂ්ටාචාරයට ඇති බැඳීම යළි අවධාරණයට ගනිමින් අම්පාර දිස්ත්‍රික්කය දිගාමඩුල්ල මැතිවරණ දිස්ත්‍රික්කය වශයෙන් ඡන්ද කොට්ඨාශ සීමා නිර්ණය කිරීමේ කොමිසම ලවා නම් කරවා ගැනීම සහ 1980 දශකයේ අවසාන කාලය වනතුරුත් ජන ශූන්‍ය ප්‍රදේශයක් වශයෙන් පැවති දෙහි අන්තකණ්ඩිය මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සිංහලයන්ගෙන් ජනාවාස කිරීම තුලින් අම්පාර දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් සිංහල ආණ්ඩු නායකයන් ඇති උන්නදුව පෙන්නුම් කෙරේ.

අම්පාර දිස්ත්‍රික්කය ඇතුළත් නැගෙනහිර පළාතේ දමිළ දේශපාලනය සම්බන්ධයෙන් මුල් කාලය තුල ක්‍රියාකාරී වූයේ පෙඩරල් පක්ෂයයි[2] එම පක්ෂය අම්පාර දිස්ත්‍රික්කය පිහිටුවීමට පෙර සිටම උතුරු නැගෙනහිර පලාත් ඇතුළුව රටේ දෙමළ ජනතාව වෙනුවෙන් දියත් කරන ලද වැඩසටහන් අම්පාර දිස්ත්‍රික්කය කෙරෙහි ද වඩාත් බලපෑම් සහගත විය. පෙඩරල් පක්ෂයට එහි ආරම්භක අවධියේ දී දෙමල ජනතාව කෙරෙහි ශක්තිමත් බලපෑමක් කිරීමට හැකියාවක් නොතිබුණ ද 1956 න් පසු කාලය තුල ශ්‍රී ලංකාවේ පාලන තන්ත්‍රය සිංහලකරණයට ලක් කිරීමත් සමග අම්පාර දිස්ත්‍රික්කයේ වාසය කරන දමිළ ජනතාව ඇතුළුව රටේ දමිළ ජනතාව

[2]වැඩි විස්තර සඳහා බලන්න (Wilson 1994).

වෙත වඩ වඩාත් ආයාචනය කිරීමට එයට අවස්ථාව ලැබුණි. එම පක්ෂයේ දේශපාලන සටන් පාඨ වලට අම්පාර දිස්ත්‍රික්කය ඇතුළු නැගෙනහිර පළාතේ දමිළ අයිතීන් කෙරෙහි සිංහල පාලකයන්ගෙන් වෙන අහිතකර බලපෑම ප්‍රධාන තේමාව බවට පත් කරගෙන තිබුණි. වියළි කලාපය තුල විශේෂයෙන් නැගෙනහිර පළාත තුල පිටතින් කැඳවා ගෙන එන ලද ගොවියන් පදිංචි කරවීම ඔවුන් දකින ලද්දේ රාජ්‍ය අනුග්‍රහය ඇතිව සිංහලයන් විසින් සම්ප්‍රදායික දමිළ ප්‍රදේශ බලෙන් අත්පත් කරගැනීමක් ලෙස ය. මෙලෙස පදිංචි කිරීමේ ප්‍රතිලාභ සිංහලයන් වෙත ඉතා විශාල ලෙස ගලා යන්නේ ය යන චෝදනාව ද ඔවුන් තුල පැවතුනි. ගල්ඔය වැනි සමෘද්ධිමත් දෙමළ කෘෂිකාර්මික පළාත් සිංහලයන් පදිංචි කරමින් සිටින්නේ ය යන චෝදනාව 1956 මැතිවරණයේ දීත් ඉන් පසු මැතිවරණවලදීත් චෙල්වනායගම් විසින් ඉදිරිපත් කරන ලදි (Bandarage 2009:47). ජනපදකරණ වැඩපිලිවෙළට අකුල් හෙළීමට හෝ එය වැළැක්වීමට පෙඩරල් පක්ෂයට හැකියාවක් නොතිබුන ද දෙමළ නිජබිම් සංකල්පය පදනම් කර ගනිමින් දෙමළ ජනවාර්ගික විඥානයක් ඇති කිරීමට යම් උත්සාහයක් පෙඩරල් පක්ෂය විසින් දරන ලදි (Wilson 1994). නැගෙනහිර පළාතේ දෙමළ ප්‍රජාවගේ වාස භූමි තුලට සිංහල ජනපදිකයන් ගෙන ඒමට එරෙහිව ක්‍රියා කිරීම තුල චෙල්වනායගම් වැනි යාපන දෙමළ දේශපාලන නායකයන් කෙරෙහිඅම්පාර ඇතුළු නැගෙනහිර දෙමළ ජනතාව වඩ වඩාත් සමීප විය (Wilson 1988:104). වර්ධනය වෙමින්පැවති මෙම තත්වයෙන් වාසි ලබා ගැනීම සඳහා නැගෙනහිර පළාත තුල පෙඩරල් පක්ෂය ශාඛා සමිති ජාලයක් පිහිටුවන ලදි. පක්ෂ ක්‍රියාකාරිත්වය බිම් මට්ටම ශක්තිමත් කිරීම දිරිමත් කෙරිණි. ඒ අතර නැගෙනහිර පළාත තුල දේශපාලනික වශයෙන් ක්‍රියාත්මක වූ ප්‍රවීනයන්ට ඉහළ තනතුරු ප්‍රදානය කෙරිණි (Wilson 1988:104). නැගෙනහිර පළාත තුල ඇති වෙමින් පැවති මේ ප්‍රබෝධය තුල අම්පාර දිස්ත්‍රික්කයේ දමිළ ප්‍රදේශවල ගොවියන්, ගුරුවරුන්, ධීවරයන්, පාසැල් ගුරුවරුන්, ඉංග්‍රීසී උගත් දෙමළ බුද්ධිමතුන් පෙඩරල් පක්ෂයේ ශක්තිමත් පදනම බවට පත් විය.

1970 දශකයේ මුල් අවධියේ සිට දිවයිනේ උතුරු නැගෙනහිර ප්‍රදේශවල දෙමල දේශපාලනය රැඩිකල්කරණයට ලක්වීමේ අනිවාර්ය ප්‍රතිඵලය වූයේ අම්පාර දිස්ත්‍රික්කයේ තිරුක්කෝවිල්, නාවිදන්වලි, ආලියඩිවෙම්බු යන ප්‍රදේශවල තරුණ දමිළ පිරිස් ද දේශපාලනික වශයෙන් රැඩිකල්කරණයට ලක් වීමට පටන් ගැනීම ය. මෙය පෙඩරල් පක්ෂය රැඩිකල්කරණයට ලක් වීමේ ප්‍රතිඵලයක් ලෙස හැඳින්විය හැකි

ය. 1960 දශකයේ අවසාන කාලය සහ 1970 දශකයේ මුල් අවධිය තුල ශ්‍රී ලංකාවේ දේශපාලන ආර්ථිකයෙහි ඇති වූ වෙනස්කම් මේ කෙරෙහි බලපෑවේ ය. ආර්ථික ලිබරල්කරණය තුල රටේ ආර්ථික වෘද්ධියේ වර්ධනයක් සිදු වුව ද, එවායෙහි ප්‍රතිලාභ සියළු ජන කොටස්වලට සමානව ගලා ගියේ නැත. බොහෝ අධ්‍යයන මගින් පෙන්වා දුන් අන්දමට දෙමළ ජන කොටස්වලට මෙම ප්‍රතිලාභ සාධාරණ ලෙසින් නොලැබුණි. (Jana 2010:35). ආයෝජන සම්බන්ධයෙන් ගත්විට අම්පාර දිස්ත්‍රික්කයේ කිසිඳු දමිළ ප්‍රදේශයක රජයේ කර්මාන්ත ශාලාවක් හෝ ව්‍යාපෘතියක් ආරම්භ වූයේ නැත. මෙම තත්වය අම්පාර දිස්ත්‍රික්කයේ දෙමළ තරුණයන් ඒ වන විටත් ගොඩ නැගෙමින් දමිළ සටන්කාමී සංවිධානයන් වෙත ආකර්ෂණය කර ගැනීමට පදනම සපයන ලදි. 1980 දශකයේ මුල් කාලය තුල උතුරු නැගෙනහිර වර්ධනය වූ දෙමළ සටන්කාමී සංවිධාන ගණනාවක් අම්පාර දිස්ත්‍රික්කයේ දමිළ ප්‍රදේශ දක්වා ව්‍යාප්ත විය. එල්.ටී.ටී.ඊ, ඊ.පී.ආර්.එල්.එෆ්, ඊරෝස්, ටෙලෝ, ප්ලොට් යනාදී දෙමළ සටන්කාමී සංවිධාන විය (ඩික්ෂිට් 1998). 1990 දශකය ආරම්භයේ දී එල්.ටී.ටී.ඊ සංවිධානය සෙසු සංවිධාන පරදවා සෙසු ප්‍රදේශවල මෙන් අම්පාර දිස්ත්‍රික්කයේ දෙමළ ප්‍රදේශවල තහවුරු වනතුරු මෙම සංවිධාන අම්පාර දිස්ත්‍රික්කයේ දෙමළ දේශපාලනය තුල බලවත්ව පැවතුණි.

අතීතයේ සිට දමිළ දේශපාලන නායකයන් දමිළ ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම අරබයා වාර්ගික පක්ෂ සහ සංවිධාන පිහිටුවා ගනිමින් සටන්කාමී ලෙස ක්‍රියාකල ද, මුස්ලිම්වරු එලෙස ක්‍රියාත්මක් කිරීමට කැමැත්තක් නොදැක් වූ බවට James Jupp විසින් කරන විග්‍රහය (1978: 151) අම්පාර දිස්ත්‍රික්කයට ද අදාළ ය. 1986 දී මුස්ලිම් කොන්ග්‍රසය නමින් නව පක්ෂයක් අම්පාර දිස්ත්‍රික්කය මුල්කර ගනිමින් මතු වනතුරු දිවයිනේ සෙසු ප්‍රදේශවල දී මෙන් අම්පාර දිස්ත්‍රික්කයේ මුස්ලිම්වරුන් දේශපාලනික වශයෙන් ඒකරාශී වී සිටියේ එක්සත් ජාතික පක්ෂය, උතුරේ ද්‍රවිඩ පක්ෂ සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වටා ය. ඔවුන් මුල සිටම දේශපාලනය තුල ක්‍රියාත්මක වූයේ උපයෝගීතා ප්‍රවේශයක් ඔස්සේ ය. අවස්ථාවට උචිත පරිදි පක්ෂ මාරු කිරීමත් ඇතැම් අවස්ථාවල ස්වාධීන අපේක්ෂකයන් වශයෙන් ඉදිරිපත් වීමත් අම්පාර දිස්ත්‍රික්කයේ මුස්ලිම් දේශපාලනය තුල සාමාන්‍ය ලක්ෂණයක් බවට පත්ව තිබුණි. නිදසුනක් වශයෙන් එම්.එස්. කාරියප්පර් කල්මුණේ ඡන්ද කොට්ඨාශය වෙනුවෙන් 1952 මහමැතිවරණය සඳහා තරග කලේ ස්වාධීන අපේක්ෂකයෙකු ලෙස ය. 1956 මහමැතිවරණයට ඔහු තරග කලේ පෙඩරල්

පක්ෂයෙනි. ඉන් පසුව 1960 මාර්තු මාසයේ සහ ජූලි මාසයේ පැවති මහමැතිවරණවලට ලංකා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයෙන් තරග වැදුණි. 1965 මැතිවරණයේ දී ස්වාධීන අපේක්ෂකයෙකු ලෙසින් ද, 1970 මහමැතිවරණයේ දී එක්සත් ජාතික පක්ෂයෙන් ද තරග වැදුණි (Jupp 1975: 153). මෙලෙස වෙනත් කිසිදු ජනවාර්ගික කණ්ඩායමකට වඩා වැඩි වේගයකින් පක්ෂ මාරු කිරීමට උනන්දුවක් දැක්වීම මුස්ලිම් දේශපාලනයේ සුලභ කරුණක් විය. අම්පාර දිස්ත්‍රික්කයේ මුස්ලිම් නායකයන් පක්ෂ මාරු කරන විට එම දිස්ත්‍රික්කයේ මුස්ලිම් ජනතාව ද ඊට අනුගත විය. එම්. එස්. කාරියප්පර්, එම්. එම්. මුස්තාපා, අබ්දුල් මජිඩ් වැනි මුස්ලිම් නායකයන් කවර දේශපාලන පක්ෂයෙන් ඉදිරිපත් වුව ද ඔවුන්ට මැතිවරණවල දී පහසු ජයග්‍රහණ අත්කර ගැනීමට තිබුණු හැකියාව තුලින් මෙය පැහැදිලි වුණි. මුස්ලිමුන් ඔවුන්ගේ සුරක්ෂිතභාවය සහ යහපත අරබයා ඕනෑම කෙනෙකු සමග කටයුතු කල හැකි නම්‍යශීලි ජන කොටසක් බවට James Jupp විසින් කරන ලද විග්‍රහය (James Jupp 1978) අම්පාර මුස්ලිම් ජනතාවට හොඳින් ගැලපුණි.

මෙලෙස සිංහල සහ දෙමළ පක්ෂ වටා ගොනු වෙමින් දශක ගණනාවක් දේශපාලනික වශයෙන් ක්‍රියාකාරිව සිටි මුස්ලිමුන්ට සිවිල් යුද්ධය හේතු කොටගෙන ඔවුන්ගේම ආරක්ෂාව පතා දේශපාලනමය වශයෙන් වෙනම සංවිධානය වීමට බල කෙරිණි. එම්.එච්.එම් අෂ්රොප් ගේ නායකත්වයෙන් 1986 දී මුස්ලිම් කොංග්‍රසය පිහිටුවා ගන්නා ලද්දේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ පැන නැගීම මගින් කොළඹ මුල් කරගත් සම්ප්‍රදායික මුස්ලිම් දේශපාලන නායකත්වය අභියෝගයට ලක් කරනු ලැබිණි. සැබැවින්ම ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසය බිහිවීම තුලින් සිදු වූයේ එතෙක් කොළඹ කේන්ද්‍ර කරගනිමින් ක්‍රියාත්මක වූ මුස්ලිම් දේශපාලන නායකත්වය ග්‍රාමීය අම්පාරට විතැන් වීමය. මෙය මුස්ලිම් දේශපාලනයේ බල තුලනය කැපී පෙනෙන ආකාරයෙන් වෙනස් වීමකි. මුස්ලිම් කොන්ග්‍රසය අම්පාර දිස්ත්‍රික්කයේ මුස්ලිමුන් සමග පවතින අවියෝජනීය සම්බන්ධය කවරාකාර එකක් ද යන්න මෙහිදී වටහා ගැනීම වැදගත් ය. පළමුව, ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය බිහිවූයේ පෙරටුගාමී බස්නාහිර පළාතෙන් නොව පසුගාමී නැගෙනහිර පළාතේ මුස්ලිම් ප්‍රජාව බහුලව වාසය කරන අම්පාර දිස්ත්‍රික්කයෙනි. දෙවනුව, මුස්ලිම් කොංග්‍රසයේ නිර්මාතෘවරයා වශයෙන් සැලකෙන එම්.එච්.එම් අෂ්රොප් අම්පාර දිස්ත්‍රික්කයේ කල්මුණේ පදිංචිකරුවෙකි. තෙවනුව, ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය ශ්‍රී ලංකාවේ සියළු මුස්ලිමුන්ට ආමන්ත්‍රණය කරන පක්ෂයක් වුව ද, එහි බලකොටුව

(stronghold) වශයෙන් සළකනු ලබන්නේ අම්පාර දිස්ත්‍රික්කයයි. ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය පිහිටුවා ගැනීමෙන් පසුව අම්පාර දිස්ත්‍රික්කයේ මුස්ලිම්වරුන්ගේ දේශපාලන ශක්තිය කැපී පෙනෙන ලෙසින් වර්ධනය විය. මේ කෙරෙහි සුළු ජන කණ්ඩායමක් වශයෙන් සිටින මුස්ලිම් ප්‍රජාවට, ප්‍රධාන ජනවාර්ගික කණ්ඩායමෙන් විය හැකි හානිකර තත්වයන්ගෙන් ආරක්ෂා වීමට පැවති වුවමනාව බලපාන ලදි. ඔවුන්ගේ දේශපාලන ශක්තිය වර්ධනය වීම කෙරෙහි 1978 ව්‍යවස්ථාවෙන් හඳුන්වා දෙන ලද සමානුපාතික නියෝජන ක්‍රමය මගින් ලැබුණු අනුබලය ද විශාලය (Bandarage 2009:93). මේ ක්‍රමය යටතේ මුස්ලිම් කොන්ග්‍රසයට සැළකිය යුතු මන්ත්‍රීධූර සංඛ්‍යාවක් ලබා ගැනීමට තිබෙන හැකියාව තුල ප්‍රධාන දේශපාලන පක්ෂ සමග අසාමාන්‍ය ආකාරයෙන් කේවල් කිරීමේ හැකියාව ලැබුණි. අම්පාර දිස්ත්‍රික්කය තුල මුස්ලිම් දේශපාලනයේ මෑත කාලීන වර්ධනයත් සමග එක් අතකින් මුස්ලිම් - දෙමළ ප්‍රතිවිරෝධතා මෙන්ම සිංහල - මුස්ලිම් ප්‍රතිවිරෝධතා වර්ධනය වී ඇති අතර තවත් අතකින් ජනවාර්ගික කණ්ඩාම් අතර ප්‍රාදේශික ආර්ථික සංවර්ධනය, රාජ්‍ය සම්පත් වෙන් කිරීම පිළිබඳ අසමානතා, නිළබලතන්ත්‍රය ජනවාර්ගීකරණයට ලක් වීම, අසමාන ලෙස සැළකීම වැනි දේශපාලන, ආර්ථික ගැටළු හා සමාජ ගැටළු ඉදිරියට පැමිණෙමින් ඇත. උතුරු නැගෙනහිර පළාත්වල සිවිල් යුද්ධය ආරම්භ වූයේ මෙවැනි පසුබිමක් තුල ය.

අම්පාර දිස්ත්‍රික්කයේ පැවති සිවිල් යුද්ධයේ ස්වභාවය

ද්‍රවිඩ බෙදුම්වාදී සන්නද්ධ ක්‍රියාකාරකම් අම්පාර දිස්ත්‍රික්කය තුළ 1980 දශකයේ මැදභාගයේ සිට ආරම්භ වුව ද, එල්. ටී. ටී. ඊ සංවිධානයේ සන්නද්ධ ක්‍රියාකාරකම් දරුණු සිවිල් යුද්ධ තත්වයකට පත්වීම ආරම්භ වන්නේ 1990 සිට ය. මේ වන විට ඉන්දියන් සාම සාධක හමුදාව (IPKF) නැගෙනහිර පළාතෙන් පිටමං ව සිටීමත් එල්.ටී.ටී.ඊ සංවිධානයට එරෙහිව සටන් වැදුණු ද්‍රවිඩ සන්නද්ධ කණ්ඩායම් ගණනාවක් ම එල්.ටී.ටී.ඊ සංවිධානයෙන් පරාජයට පත්වීමත් හේතු කොට ගෙන එල්.ටී.ටී.ඊ සංවිධානයට අම්පාර දිස්ත්‍රික්කය තුල තර්ජනයෙන් තොර නායකත්වයක් පවත්වා ගැනීමට හැකියාව ලැබුණි. එබැවින් එල්.ටී.ටී.ඊ සංවිධානය අම්පාර දිස්ත්‍රික්කය තුල රාජ්‍ය විරෝධී එකම සන්නද්ධ කණ්ඩායම බවට පත් විය. එල්.ටී.ටී.ඊ සංවිධානය තුල දක්නට ලැබුණු සෑම ගුණාංගයක් ම අම්පාර දිස්ත්‍රික්කයේ එල්.ටී.ටී.ඊ සංවිධානයේ ක්‍රියාකාරිත්වය තුලින් ප්‍රකට කෙරිණි. එනම් කුමන හෝ පීඩනයක් ඉදිරියේ වුවද, ඊලාම් රාජ්‍යයක් පිහිටුවීම සඳහා වූ කැපවීම, තනි අදහසක නොසැලී

එල්බ සිටීමේ ගතිය, උපක්‍රමශීලි දක්ෂතා සහ නැවත නැවතත් ප්‍රචණ්ඩ ක්‍රියා වෙත ඇදීයාමේ ස්වභාවය, අධිකාරි බලපෑම්වල ප්‍රචණ්ඩකාරි ස්වභාවය යනාදියයි (Moorcraft 2012). මේ අනුව සිවිල් යුද්ධය අත්නෑර තබා ගැනීමට එල්.ටී.ටී.ඊ සංවිධානය තුල කැපවීම අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය නායකයන් තුලින් ද ප්‍රකට කෙරිණි. මෙහිදී අම්පාර දිස්ත්‍රික්කයේ භූගෝලීය පිහිටීම සහ එහි ජන සංයුතික රටාව එල්.ටී.ටී.ඊ සංවිධානයේ ප්‍රාදේශීය ක්‍රියාකාරකම් වලට විශේෂයෙන් වැදගත් විය. පළමුව, අම්පාර දිස්ත්‍රික්කය උතුරින් බහුතර දමිළ ජනගහනයක් සහිත මඩකලපුව දිස්ත්‍රික්කයට මායිම් ව තිබීම මෙන්ම ඉන් ඔබ්බට යාපනය දක්වා මුහුදු තීරයට මායිම් වන ලෙස පිහිටි ප්‍රදේශ දමිළ ප්‍රදේශ වීම හේතු කොට ගෙන උතුරුකරය සමග ගොඩ බිමෙන් මෙන්ම මුහුදු මාර්ගවලින් ද ආරක්ෂිත හා විශ්වාසනීය සම්බන්ධතාවයක් ගොඩ නගා ගැනීම පහසු කෙරිණි. දෙවනුව, අම්පාර දිස්ත්‍රික්කය, නැගෙනහිර පළාත හැරුණු විට දකුණු පළාත, ඌව පළාත, මධ්‍යම පළාත සහ උතුරුමැද පළාත යන පළාත් පහක් මායිම් කරගත් දිස්ත්‍රික්කයක් වීම හේතු කොට ගෙන රටේ පළාත්වලින් 50%කට වැඩි ප්‍රමාණයක් සමග සෘජුව සම්බන්ධකම් පවත්වා ගැනීමට හැකියාව සහිත දිස්ත්‍රික්කයක් විය. තෙවනුව, අම්පාර දිස්ත්‍රික්කයේ පිහිටි අක්කරපත්තු නගරය කොළඹ, මහනුවර, මාතර යනාදි රටේ වැදගත් ස්ථාන හා නගර ආරක්ෂිත මහා මාර්ග පද්ධතියක් මගින් සම්බන්ධ කරන ස්ථානයක් (a gate way) විය. සිව්වනුව, අම්පාර දිස්ත්‍රික්කයේ මුළු භූමි ප්‍රමාණයෙන් බාගයකට ආසන්න (45% ක) ප්‍රමාණයක් කැළෑ බිම්වලින් ආවරණය වීම එල්.ටී.ටී.ඊ සංවිධානයේ රහසිගත ක්‍රියාකාරකම් වලට උපකාරි විය. එම සංවිධානයේ කඳවුරු, පුහුණු කිරීමේ මධ්‍යස්ථාන සහ කාර්යාල පවත්වා ගෙන යන ලද්දේ මෙම කැළැබිම් ප්‍රදේශ වලය. නිදසුන් වශයෙන් එල්.ටී.ටී.ඊ සංවිධානයේ අම්පාර දිස්ත්‍රික් ප්‍රධාන මූලස්ථානය සහ ප්‍රධාන පුහුණු කඳවුර පිහිටුවා තිබුනේ රූපස්කුලම් කැලෑවෙන් වටවුනු කන්චිකුඩි ආරුවල ය. එම ප්‍රදේශය තිරුක්කෝවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශයට අයත් වේ. මෙම පුහුණු කඳවුර සහ මූලස්ථානය සිවිල් යුද්ධයේ ආරම්භයේ සිට එහි අවසානය දක්වා එල්.ටී.ටී.ඊ සංවිධානයේ අම්පාර දිස්ත්‍රික් ප්‍රධාන මධ්‍යස්ථානය වශයෙන් අඛණ්ඩව ම පවත්වා ගෙන යන ලදි. ඉහත සඳහන් කරුණුවලට අමතරව, අම්පාර දිස්ත්‍රික්කයේ ජන සංයුතියේ සහ ජන ව්‍යාප්ති රටාවේ ස්වභාවය ද එල්.ටී.ටී.ඊ සංවිධානයට වාසිදායක විය. ජන සංයුතියට අනුව, අම්පාර දිස්ත්‍රික්කයේ ජනගහනයෙන් 62% ක් පමණ වන බහුතරය දමිළ බස කතා කරන්නන් වීමත් එම ජන කොටසෙනුත් බහුතරය මුස්ලිම් ජාතිකයන් වීමත් හේතුවෙන් එල්.ටී.ටී.ඊ සංවිධානයේ සන්නද්ධ

ක්‍රියාකාරකම් වලට හොඳ ආවරණයක් සැළසුණි. ජන ව්‍යාප්ති රටාවට අනුව, දමිළ ජනතාව සහ මුස්ලිම් ජනතාව ඉතා විශාල වශයෙන් පදිංචිව සිටින්නේ අම්පාර දිස්ත්‍රික්කයේ වෙරළබඩ ප්‍රදේශ වලය. මෙම ජන කොටස් දෙක වෙරළබඩ ප්‍රදේශයෙහි පදිංචිව සිටින ආකාරයෙහි ද එක්තරා රටාවක් පවතී. තිරුක්කෝවිල් සිට මඩකලපුව දිස්ත්‍රික් මායිම දක්වා මුහුදුකරයේ මුස්ලිම් සහ දමිළ ප්‍රදේශ පවතින්නේ පිළිවෙලින් එකිනෙකට මාරුවෙන ආකාරයට ය.

අම්පාර දිස්ත්‍රික්කයේ තම්බිලුවිල් සිට මරදමුනි දක්වා වෙරළ බඩ ප්‍රදේශයේ දමිළ සහ මුස්ලිම් ප්‍රදේශ පිළිවෙලින් පිහිටා තිබෙන ආකාරය

ප්‍රදේශය	බහුතර ජනවර්ගය
තම්බිලුවිල්	දෙමළ
අක්කරපත්තුව	මුස්ලිම්
තිරායිකේනි	දෙමළ
ඔලුවිල්	මුස්ලිම්
අට්ටපලම්	දෙමළ
නින්දවූර්	මුස්ලිම්
කාරතිව්	දෙමළ
ෂායින්දමරුදු	මුස්ලිම්
කල්මුණේ	දෙමළ/මුස්ලිම්
එාන්ඩිඉරිප්පු	දෙමළ
ඔරදමුනි	මුස්ලිම්

මූලාශ්‍රය : කර්තෘ විසින් අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රදේශ නිරීක්ෂණ මත සකස් ලද්දකි.

එල්.ටී.ටී.ඊ සංවිධානය මුස්ලිමුන් සමග ගැටුම් ඇතිකර ගැනීමට පෙර මේ ජන ව්‍යාප්ති රටාවෙන් විශාල ලෙස එල්.ටී.ටී.ඊ සංවිධානයට වාසි අත්කර ගැනීමට හැකියාව ලැබුණි. සැබැවින් ම මෙම ජන ව්‍යාප්ති රටාව එල්.ටී.ටී.ඊ සංවිධානයේ සන්නද්ධ ක්‍රියාකාරකම්වලට මනා රැකවරණයක් විය.

එල්.ටී.ටී.ඊ සංවිධානයට අම්පාර දිස්ත්‍රික්කය තුල පැවති වාසිදායක තත්වයන් හේතුවෙන් එම සංවිධානයේ යුද ශක්තිය අඛණ්ඩව පවත්වා ගෙන යාමට එයට හැකියාව ලැබුණි. සිවිල් යුද්ධයේ මුල් අවධිය තුල අම්පාර දිස්ත්‍රික්කයේ එල්.ටී.ටී.ඊ සංවිධානයේ සන්නද්ධ කේඩරය සමන්විත වූයේ දමිළ තරුණයන්ට අතිරේකව එම දිස්ත්‍රික්කයේ පදිංචි මුස්ලිම් තරුණයන්ගෙනි. මෙම පිරිසට යුද පුහුණුව ලබා දෙන

ලද්දේත් ඔවුන්ගේ යුද හැකියාවන් නවීන තාක්ෂණික මෙවලම් මගින් යාවත් කාලීන කලෙත් කන්චිකුඩි ආරුවල පිහිටි එල්.ටී.ටී.ඊ මූලස්ථානයෙනි.

සන්නද්ධ අරගලයේ මුල් කාලය තුල අම්පාර දිස්ත්‍රික්කයේ ඉන්දියන් හමුදාව රැඳී සිටි ප්‍රදේශවල මහා ප්‍රචණ්ඩකාරී ක්‍රියා සිදු කිරීමට එල්.ටී.ටී.ඊ සංවිධානයට නොහැකි වුව ද, හැකි සෑම අවස්ථාවකදී ම කුමන හෝ ප්‍රචණ්ඩකාරී ක්‍රියාවක් සිදු කිරීම ඔවුන්ගේ යුද උපක්‍රමවල එක් අංගයක් බවට පත්ව තිබුණි. මේ සඳහා පහසු ඉලක්ක බවට පත් වූයේ අනාරක්ෂිත සිංහල මායිම් ගම්මානයන් ය (ඩික්සිට් 1998: 312). මේ හැර දමිළ සහ මුස්ලිම් ව්‍යාපාරිකයන්ගෙන් කප්පම් ගැනීම, සිංහල මායිම් ගම්මානවල පදිංචිව සිටින ඇතැම් ගම්වැසියන්ගේ දේපළ මංකොල්ල කෑම, මායිම් ගම් අසළ කුඹුරුවල සහ හේන්වල ගොවිතැන් කළ සිංහල හා මුස්ලිම් ගොවියන් පැහැර ගෙන ගොස් ඝාතනය කිරීම, මාර්ගවල බිම් බෝම්බ ඇටවීම් මගින් සිවිල් වැසියන් ඝාතනය කිරීම එල්.ටී.ටී.ඊ සංවිධානයේ දෛනික අංග බවට පත්ව තිබුණි.

ඉන්දියන් හමුදාව 1990 වසරේ දී අම්පාර දිස්ත්‍රික්කයෙන් නික්ම යෑමෙන් සති දෙකක් ගත වෙන්නටත් පෙර එල්.ටී.ටී.ඊ සංවිධානය විසින් එම දිස්ත්‍රික්කයේ දමිළ ප්‍රදේශවල බලය මුළුමනින් ම සියතට ගනු ලැබිණි. ඉන්දියන් හමුදාව විසින් එල්.ටී.ටී.ඊ සංවිධානයට එරෙහිව දියත් කරන ලද සන්නද්ධ මෙහෙයුම් අභිමුඛයේ වුව ද තවදුරටත් අපරාජිතව පැවතෙන්නට හැකි වීම සහ සන්නද්ධ අරගලයක් දියත් කිරීමට එල්.ටී.ටී.ඊ සංවිධානය තුල පැවැති හැකියාව හේතු කොට ගෙන අම්පාර දිස්ත්‍රික්කයේ ද්‍රවිඩ ජනතාව විසින් එම සංවිධානය ඒ වන විට වීරත්වයට පත් කරගෙන තිබුණි. එසේ වුව ද, එල්.ටී.ටී.ඊ සංවිධානය මුස්ලිම් ජනතාවට එරෙහිව සටන් වැදීම හේතුවෙන් නැගෙනහිර පළාතේ අනෙකුත් ප්‍රදේශවල මෙන් අම්පාර දිස්ත්‍රික්කයේ මුස්ලිම් ජනතාව ද එම සංවිධානයට සහාය දීමෙන් වැළකුණි. එබැවින් එම සංවිධානයට අළුතින් මුස්ලිම් තරුණයන් බන්දවා ගැනීම අසීරු විය.

1990 වසරේ මැද භාගය වන විට ශ්‍රී ලංකා හමුදාවට එරෙහිව සටන් කිරීමට තරම් ශක්තිමත් ය යන හැඟීම එල්.ටී.ටී.ඊ සංවිධානයට තිබුණි. මෙම හැඟීම අම්පාර දිස්ත්‍රික්කය තුල රජයේ ආරක්ෂක හමුදාවන්ට සහ පොලීසියට එරෙහිව සන්නද්ධ ක්‍රියාකාරකම් වර්ධනය වීමට හේතු විය. එල්.ටී.ටී.ඊ සංවිධානය විසින් උතුරු නැගෙනහිර පළාත්වල බොහෝ ප්‍රදේශවල සිදු කරමින් සිටි ආකාරයටම අම්පාර දිස්ත්‍රික්කයෙහි ද හමුදා සහ පොලිස් ස්ථාන තම අණසක යටතට ගැනීම ආරම්භ

කෙරිණි. එල්.ටී.ටී.ඊ සටන්කාමීන් විසින් පුළුකුණාව හමුදා කඳවුර වැනි මඩකලපුව දිස්ත්‍රික්කයට මායිම්ව හුදකලාව පිහිටි හමුදා කඳවුරු ගණනාවකට ම විටින් විට ප්‍රහාර එල්ල කරන ලදි. එමෙන්ම මුහුදු බඩ ප්‍රදේශවල පිහිටි සහ මුහුදු බඩ ප්‍රදේශවලට ආසන්න දමිළ සහ මුස්ලිම් ප්‍රදේශවල පිහිටි පොලිස් ස්ථාන ගණනාවක්ම තම යටතට ගන්නා ලදි. මෙයින් ඉතාම බිහිසුණු සිද්ධිය වූයේ එල්.ටී.ටී.ඊ සටන්කාමීන් විශාල පිරිසක් එක විට කල්මුණේ පොලිස් බල ප්‍රදේශය තුල පිහිටි පොලිස් ස්ථානවලට එකවර පැමිණ ඒවායේ සේවය කරමින් සිටි පොලිස් නිළධාරීන් 324 දෙනෙකු අවි ආයුධ සහිතව තම බාරයට ගැනීම ය. පසුව ඔවුන්ව රහසිගත ආකාරයෙන් ඝාතනය කර තිබුණි. මේ අතර එල්.ටී.ටී.ඊ සාමාජිකයන් දිස්ත්‍රික්කයේ සිංහල ගම්මානවලට රහසිගතව වැදෙමින් මිනිසුන් පැහැරගෙන ගොස් ඝාතනය කිරීමටත් රාත්‍රී කාලයේ ගම්වලට පැමිණ ගම්වැසියන් සමූහ වශයෙන් ඝාතනය කිරීමටත් පටන් ගෙන තිබුණි.

එල්.ටී.ටී.ඊ සංවිධානය විසින් දියත් කරමින් සිටි මෙවැනි ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් අම්පාර දිස්ත්‍රික්කයේ බොහෝ ප්‍රදේශවල රාජ්‍ය පාලන කටයුතු මෙන්ම මිනිසුන්ගේ එදිනෙදා ජන ජීවිතය අඩාල වන්නට විය. බිඳ වැටෙමින් පැවති රාජ්‍ය යාන්ත්‍රණය නැවත යථා තත්වයට පත් කොට සාමාන්‍ය ජන ජීවිතය නැවත ස්ථාපිත කිරීමට නම් අම්පාර දිස්ත්‍රික්කයෙහි ආරක්ෂාව කෙරෙහි විශේෂ අවධානයක් දැක්වීම අත්‍යවශ්‍ය කරුණක් බවට පත්ව තිබුණි. මේ අරබයා කොළඹ සිට පොලිස් සහ හමුදා භට පිරිස් විශාල වශයෙන් අම්පාර ඇතුළු නැගෙනහිර පළාතට පිටත්කර හැරිණි. හමුදා කඳවුරු, හමුදා පුහුණු කඳවුරු, මාර්ග බාධක, මුර කපොලු, සෝදිසි මෙහෙයුම් මධ්‍යස්ථාන අම්පාර දිස්ත්‍රික්කය පුරා අඵතින් ඉදි කෙරිණි. පිහිටුවන ලද හමුදා කඳවුරුවලින් සමහරක් ස්ථීර පදනමින් පිහිටුවන ලද ඒවා වන විට තවත් සමහරක් තාවකාලික පදනමින් පිහිටුවන ලද ඒවා විය. තාවකාලික පදනමින් පිහිටුවන ලද හමුදා කඳවුරු සඳහා ඇතැම් අවස්ථාවල රජයේ ගොඩනැගිලි පවරා ගන්නා ලදි. උදාහරණයක් වශයෙන් තිරුක්කෝවිල් දිස්ත්‍රික් මූලික රෝහලෙන් කොටසක් හමුදා කඳවුරක් පිහිටුවීම සඳහා යොදා ගන්නා ලදි. අම්පාර දිස්ත්‍රික්කයෙහි පිහිටි මේ සියළු හමුදා කඳවුරු සහ හමුදා සේනාංක ඇතුළුව මුළු නැගෙනහිර පළාතෙහිම ආරක්ෂක කටයුතු වැලිකන්දෙහි පිහිටුවන ලද 23 වන සේනාංක මූලස්ථානයට බාර කරනු ලැබිණි. මේ අතර අම්පාර දිස්ත්‍රික්කයෙහි ප්‍රධාන හමුදා කඳවුර බවට පත්ව තිබුනේ අම්පාර නගරයට කිලෝ මීටර් 4 ක් දුරින් පිහිටි කොන්ඩෙයිවෙඩ්ඩුවාන් හමුදා කඳවුරයි. මෙය පුහුණු කඳවුරකින් ද සමන්විත විය.

මෙලෙස ශක්තිමත් කරන ලද රජයේ ආරක්ෂක හමුදාවල අවසාන අරමුණ වූයේ එල්.ටී.ටී.ඊ සංවිධානය යුධමය වශයෙන් පරාජයට පත් කිරීම සහ රජයේ අධිකාරිබලය එම ප්‍රදේශවල නැවත ස්ථාපිත කිරීමය. මෙය, සාමාන්‍ය ජන ජීවිතය ස්ථාපිත කොට සාමාන්‍ය පරිසරයක් ඇති කිරීම සඳහා අත්‍යවශ්‍ය කොන්දේසියක් බවට පත්ව තිබුණි. මේ වන විට හදිසි අවස්ථා බලතලවලට අමතරව, 1978 ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සහ වගකීමෙන් ආරක්ෂා කිරීමේ පනත යටතේ ප්‍රචණ්ඩ ක්‍රියා මර්ධනය කිරීම සඳහා ශක්තිමත් බලතල ආරක්ෂා හමුදාවලට ලැබී තිබුණි. එල්.ටී.ටී.ඊ සංවිධානය විසින් අම්පාර දිස්ත්‍රික්කය තුල දියත් කරමින් සිටි ප්‍රචණ්ඩ ක්‍රියා මර්ධනය කිරීම සඳහා සම්ප්‍රදායික සන්නද්ධ බලකායන්ට (පාබල හමුදාව, ගුවන් හමුදාව, නාවික හමුදාව සහ පොලීසියට) අතිරේකව නව සන්නද්ධ බලකායන් ද යොදා ගැණිනි. නව සන්නද්ධ බලකායන්ට ක්ෂණික විහිදුම් බලකාය, කොමාන්ඩෝ බලකාය සහ විශේෂ කාර්ය බලකායන් අයත් විය. මෙම බලකායන් උතුරු නැගෙනහිර පළාත්වල බෙදුම්වාදී ත්‍රස්තවාදී ක්‍රියා පැතිරෙත්ම එම ත්‍රස්තවාදී ක්‍රියා මර්ධනය කිරීම පිණිස 1983 න් පසුව සම්ප්‍රදායික සන්නද්ධ අංශවලට එකතු කරන ලද බලකායන් විය. මෙම නව සන්නද්ධ බලකායන් අතුරින් යුද්ධය පැවති කාල පරිච්ඡේදය තුල නැගෙනහිර පළාත තුල මෙන්ම විශේෂයෙන් අම්පාර දිස්ත්‍රික්කය තුල ත්‍රස්ත ක්‍රියා මර්ධනය කිරීමේ වගකීම ප්‍රධාන වශයෙන් පැවරී තිබුනේ විශේෂ කාර්ය බලකාය වෙත ය. පකිස්ථානයේ හිටපු ජනාධිපතිවරයෙකු වූ සියා උල් හක් ගේ උපදෙස් මත හමුදාව සහ පොලිසිය අතරට තුන්වන බලකායක් නොමැති අඩුව පිරවීම සඳහා පිහිටුවන ලද විශේෂ කාර්ය බලකාය, පොලිස් විශේෂ බලකාය වශයෙන් නිර්මාණය කරන ලදි (Moorcraft 2012: 73). මෙය, නිර්මාණය කරන ලද්දේ ප්‍රති ත්‍රස්තවාදය (counter – terrorism) සහ ප්‍රති කැරැළි (counter - insurgency) දියත් කිරීම සඳහා ය. විශේෂ කාර්ය බලකාය හමුදාවක් වශයෙන් නොව මූලික වශයෙන් පොලීසියක් වශයෙන් අදහස් කරන ලද නමුදු වැඩි කාලයක් යාමට පෙර අර්ධ හමුදාමය (para military) කාර්යයන් ක්‍රියාවට නංවන ලදි (Moorcraft 2012: 73). පාබල හමුදාව විසින් භාවිතා කරන අවි ආයුද (infantry weapons) සහ කැළෑ යුද උපායන් ඔවුන් හොඳින් ප්‍රගුණ කර තිබීම අම්පාර වැනි පළාතක යුද මෙහෙයුම්වලදී විශේෂයෙන් ප්‍රයෝජනවත් විය. මේ වන විට අම්පාර දිස්ත්‍රික්කයෙහි ගම් වැසියන්ගේ ආරක්ෂාව සඳහා යොදා ගන්නා ලද තවත් ආරක්ෂක බලකායක් වූයේ ග්‍රාම ආරක්ෂක බලකායයි. අම්පාර දිස්ත්‍රික්කයේ එල්.ටී.ටී.ඊ ප්‍රචණ්ඩ ක්‍රියා ආරම්භ වීමත් සමග, ආණ්ඩුව විසින් තර්ජිත ගම්මානවල ජීවත් වන සිංහල

ගම්වැසියන්ට තුවක්කු ලබා දීම මගින් ස්වේඡා භට පිරිසක් ලෙස මුල් ම ග්‍රාම ආරක්ෂක භට කණ්ඩායම පිහිටුවන ලදි.මුල සිටම ඔවුන් වෙත නිළ වශයෙන් ම පැවරී තිබුණු කාර්ය වූයේ පන්සල් සහ පාසැල් ඇතුළුව ගම් වැසියන්ගේ ජීවිත හා දේපළ ආරක්ෂා කිරීම යි. එමගින් අරමුණු කළේ එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් ගම්වැසියන් සිය ගම් බිම් අතහැර යෑම වළක්වා ගැනීම ය. මෙය, විශේෂයෙන්ම ගල්ඔය සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ පිට පළාත්වලින් පිරිස් ගෙනවිත් බහුල වශයෙන් පදිංචි කරවන ලද අම්පාර දිස්ත්‍රික්කය වැනි දිස්ත්‍රික්කවලට බෙහෙවින් වැදගත් විය. ජනපදිකයන් වීම නිසාම පාරම්පරික වශයෙන් එම ප්‍රදේශ තුල හොඳින් ස්ථාපිත නොවීමත් ඔවුන්ගේ අක්මුල් තවදුරටත් ඔවුන්ගේ මුල් ගම් සමග ඉතා තදින් බද්ධව තිබීමත් හේතුවෙන් ජීවිත තර්ජන වැනි ඉතා සංවේදී තත්වයන්හිදී ගම් අතහැර යාමේ විශේෂ නැමියාවක් පැවතුණි. මෙවැන්නක් ඇති වුවහොත් එය ගොවිජනපද පිහිටුවීමෙන් අපේක්ෂිත අරමුණු ආපස්සට හැරවීමක් වනු ඇත. එබැවින් ත්‍රස්තවාදී තර්ජන පැවති ගෝනගල, මධ්‍යම කඳවුර, ගලපිටගල, කොත්මලේ කොළණිය යනාදි මඩකලපුව දිස්ත්‍රික්කයට මායිම් වූ ජනපද ගම්මාන මෙන්ම ත්‍රස්තවාදී තර්ජන පැවති ටැම්පිටිය, බක්කි ඇල්ල, නුගේලන්ද, සේනාගම, සුහදගම, රජගම, වෙහෙරගම, බුද්ධංගල වැනි මඩකලපුව දිස්ත්‍රික්කයට මායිම් වන පුරාණ ගම් ද දිස්ත්‍රික්කය ඇතුලත පිහිටි බෝගමුයාය, බණ්ඩාරදූව, ලාතුගල, බොක්කේ බැද්ද, කහටගස්යාය යනාදි ගම්මාන ද ත්‍රස්තවාදී ක්‍රියාවලින් ආරක්ෂා කිරීම මෙම බලකායට විශේෂ වගකීමක් ලෙසින් පැවරිණි. ඒ අරබයා ග්‍රාමාරක්ෂක භටයන් හට නිළ ඇඳුම් සමග තුවක්කු ලබා දී තිබුණු අතර ප්‍රදේශයේ පොලිස් ස්ථානය විසින් දෙනු ලබන නියෝගවලට වලට ඔවුන් යටත් කරන ලදි. යුද්ධය තියුණු අතට හැරෙත් ම ඔවුන් වෙත හමුදාව විසින් සති දෙකේ සිට හතර දක්වා මූලික පුහුණුවක් ද ඉන් අනතුරුව ස්වයංක්‍රීය තුවක්කු ද ලබා දෙන ලදි. 2006 වසරේ දී ග්‍රාමාරක්ෂක භටයන් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරන ලද අතර ඉන් පසුව සිවිල් ආරක්ෂක බලකාය ලෙසින් එය නම් කරනු ලැබිණ. යුද්ධයේ අවසන් අදියර වන විට මුළු සිවිල් ආරක්ෂක භටයන් සංඛ්‍යාව 41,500 ක් පමණ වූ අතර ඉන් 5000 ක් පමණ සේවය කරන ලද්දේ අම්පාර දිස්ත්‍රික්කය තුළය. මෙම සිවිල් ආරක්ෂක භටයන්ගෙන් 4500 ක් පමණ සිංහල ගම්වැසියන්ගෙන් බඳවා ගෙන තිබුණු අතර 500 ක් පමණ මුස්ලිම් වැසියන්ගෙන් බඳවා ගෙන තිබුණි.

1990 දශකයේ මැදභාගයේ සිට යුද්ධය තියුණු අතට හැරෙත්ම අම්පාර දිස්ත්‍රික්කයේ විනයාගපුරම්, සාගාමම්, කාන්චිරන්කුඩා, කන්චිකුඩි ආරු,

තන්ගවේලායුදපුරම්, තාන්ඩියඩි, සන්ගමන්කිරාමම් යනාදි දමිළ ප්‍රදේශවල ආයුද අතැති ව එල්.ටී.ටී.ඊ සටන්කාමීන් හැසිරීම සාමාන්‍ය අංගයක් බවට පත් ව තිබුණි. සිවිල් යුද්ධය පැවති කාලය තුල අම්පාර දිස්ත්‍රික්කයෙන් එල්.ටී.ටී.ඊ සංවිධානයට බැඳී සිටි සාමාජිකයන් සංඛ්‍යාව කොපමණක් ද යන්න නිශ්චිත ලෙසින් අනාවරණය කරගැනීමට නොහැකි වුවත් අම්පාර දිස්ත්‍රික්කයේ දමිළ ජනතාව විසින් පුංචි යාපනය ලෙසින් හඳුන්වන ලද විනායාගපුරම් ග්‍රාමයේ 2000 ක පමණ තරුණ පිරිසක් එල්.ටී.ටී.ඊ සංවිධානයට පූර්ණ කාලීන පදනමින් බැඳී තිබුණි. අර්ධකාලීන පදනමින් එල්.ටී.ටී.ඊ සංවිධානයට බැඳී සිටි පිරිසක් ද අම්පාර දිස්ත්‍රික්කයේ දමිළ තරුණයන් අතර විය. මොවුහු දිවා කාලයේ මුස්ලිම් ප්‍රදේශවල කුළී වැඩ කර රාත්‍රී කාලයේ දී එල්.ටී.ටී.ඊ සංවිධානයේ සන්නද්ධ ක්‍රියාකාරකම් වල නිරත වූ අය වූහ. එල්.ටී.ටී.ඊ සංවිධානය වෙනුවෙන් දහවල් කාලයේ ඔත්තු බැලීම සහ රාත්‍රී කාලයේ ගම්වැසියන් ඝාතනය කිරීම බොහෝ විට සිදු කරන ලද්දේ මෙම පිරිස විසිනි.

බෙදුම්වාදී සන්නද්ධ ක්‍රියාකාරකම් වර්ධනය වන විට රජයේ ආරක්ෂක භටයන් විසින් අම්පාර දිස්ත්‍රික්කයේ සිංහල සහ මුස්ලිම් ප්‍රදේශවල දිවා- රාත්‍රී කාලවල මෙහෙයුම් කටයුතු සිදු කිරීමත් දමිළ ප්‍රදේශවල දිවා කාලයේ දී පමණක් මෙහෙයුම් කටයුතු සිදු කිරීමත් සාමන්‍ය අංගයක් බවට පත් ව තිබුණි. ග්‍රාම ආරක්ෂක බලකායන් ගම් මට්ටමින් පුළුල් කිරීමත් සමග සිංහල ගම්වැසියන් අත ගිණි අවි ගැවසීම ද සාමාන්‍ය අංගයක් බවට පත් විය. එල්.ටී.ටී.ටී බෙදුම්වාදී ත්‍රස්තවාදයට එරෙහිව රජයේ හමුදා යාන්ත්‍රණය අම්පාර දිස්ත්‍රික්කයේ ගම්මානවලට ඇතුළුවීමත් එහි කඳවුරු බැඳ ගැනීමත් සමග අම්පාර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පදනම ඉතා වේගයෙන් හමුදාකරණයට ලක්වන්නට විය. සියළු කාරණාවලට ඉදිරියෙන් ආරක්ෂාව පිළිබඳ කරුණ ප්‍රමුඛම අංගය බවට පත් විය. මෙම සන්දර්භය තුල පුද්ගලයන්ව සැක කර ප්‍රශ්න කිරීම, පුද්ගලයන් පරීක්ෂා කිරීම, පුද්ගලයන් අත් අඩංගුවට ගැනීම්, හදිසි වැටලීම් මගින් පුද්ගලයන් සමූහ වශයෙන් ආරක්ෂක කඳවුරු වෙත රැගෙන යාම අතුරුදහන් කිරීම්, ඝාතනය කිරීම සාමාන්‍ය අංගයක් බවට පත් විය. මෙවැනි ක්‍රියා නිරන්තරයෙන්ම දමිළ ප්‍රදේශවල සිදු වුණි. රජයේ ආරක්ෂක හමුදා ක්‍රියාකාරකම්වල විශේෂ අංගයක් වූයේ එල්.ටී.ටී.ඊ සංවිධානයේ ප්‍රචණ්ඩ ක්‍රියාවලට එරෙහිව ප්‍රති ප්‍රචණ්ඩත්වය ඉහළ මට්ටමින් භාවිතයට ගැනීමයි. එල්.ටී.ටී.ඊ සංවිධානයේ ත්‍රස්ත ක්‍රියා මර්ධනය කිරීම සඳහා ආණ්ඩුවේ සන්නද්ධ හමුදා විසින් යොදාගත් උපක්‍රම එල්.ටී.ටී.ඊ සංවිධානයේ උපක්‍රම තරම් ම සාහසික විය. සන්නද්ධ හමුදාවලට *'දුටු තැන සැක කටයුතු පුද්ගලයන් ඝාතනය කිරීමට'* ලබාදුන් බලය යුද්ධ කාලය තුල

අම්පාර දිස්ත්‍රික්කයේ නීති විරෝධී ඝාතන ඉහළ යාමට හේතු විය. ආරක්ෂා හමුදා විසින් සිදුකල අත්අඩංගුවට ගැනීම්, රඳවා තබා ගැනීම් සහ අතුරුදහන් කිරීම් හේතුවෙන් යුද කාලය තුල ආණ්ඩුව බොහෝ වේගයෙන් මර්ධනකාරී, පීඩාකාරී සහ ප්‍රජාතන්ත්‍ර විරෝධී ආයතනයක් බවට පත් විය.

ප්‍රචණ්ඩකාරී වාතාවරණය තුල දිස්ත්‍රික් සිවිල් පරිපාලනයේ බොහෝ අංශ පාලනය කෙරුණේ හමුදා නිළධාරීන් විසිනි. ත්‍රස්ත ක්‍රියා පැවති අනෙකුත් දිස්ත්‍රික්කවල මෙන් අම්පාර දිස්ත්‍රික්කයේ සිවිල් පරිපාලනයේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිළධාරියා ලෙස ජ්‍යෙෂ්ඨ හමුදා නිළධාරියෙකු පත් කෙරිණි. ආණ්ඩුව විසින් මෙම ක්‍රමය ප්‍රථමවරට ක්‍රියාවට නංවනු ලැබූයේ 1971 ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රථම සන්නද්ධ කැරැල්ලට මුහුණ දීම සඳහායි (Amarasinghe 1995). 1977 න් පසු මෙම ක්‍රමය භාවිතයට යෙදීම උතුරු නැගෙනහිර බෙදුම්වාදී අරගලය සමග විශාල ලෙසින් වර්ධනය විය. සම්බන්ධීකරණ නිළධාරියාට ලබාදුන් බලතල, ඔහුගේ තත්වය සහ ක්‍රියාකාරිත්වය දිස්ත්‍රික්කයේ සිවිල් නිළධාරින්ටත් පොලිස් පරිපාලකයන්ටත් ඉහළින් පැවතුනි. අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රධාන සිවිල් පරිපාලකයා වූ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) ගේ කාර්යභාරය හා තත්වය, දිස්ත්‍රික් හමුදා සම්බන්ධීකරණ නිළධාරියාට යටත්වූත් අප්‍රධානවූත් තත්වයට පත් විය. සම්බන්ධීකරණ නිළධාරියාගේ නියෝග මත රජයට හෝ පෞද්ගලික අංශයට අයත් ඕනෑම ආකාරයක නිශ්චල සහ චංචල දේපළක් තම භාරයට ගෙන පාලනය කිරීමේ හැකියාව හමුදාවට ලැබුණි. දිස්ත්‍රික්කයේ සෑම සිවිල් පාරිපාලන කටයුත්තක් තුළම හමුදා නියෝග බල පැවැත්වුණි. දිස්ත්‍රික් සිවිල් පරිපාලනය කෙරෙහි බෙදුම්වාදී ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා මගින් ඇති කරමින් පැවති අහිතකර බලපෑම හමුවේ රජය විසින් මෙවැනි වැඩ පිළිවෙළක් දියත් කල ද එමගින් සිවිල් නිළධාරින් කෙරෙහි ඇතිකල බලපෑම සුළු පටු නොවීය. එක් අතකින් එල්.ටී.ටී.ඊ සංවිධානයේ නියෝගවලටත් තවත් අතකින් රජයේ ආරක්ෂක හමුදාවල නියෝවලටත් යටත් විය යුතු පිරිසක් බවට ඔවුහු පත් වූහ. මේ අනුව යුද වාතාවරණය තුල සාමාන්‍ය ජනතාව මෙන්ම රජයේ නිළධාරින් ද යුද ආතතියට ලක් විය. යුද්ධයේ බලපෑම හේතුවෙන් ආතතියට ලක් ව රෝහල් ගත වූ පිරිස මෙන්ම රෝහල් වලින් බාහිරව ප්‍රතිකාර ලැබූ පිරිස ද විශාල විය. සිවිල් යුද්ධය පැවති කාලය තුල උතුරු සහ නැගෙනහිර අනෙකුත් ප්‍රදේශවල මෙන්ම අම්පාර දිස්ත්‍රික්කයෙහි ද පාලන කටයුතු හසුරුවන තීරණාත්මක බලවේගයන් බවට පත්ව සිටියේ එල්.ටී.ටී.ඊ සංවිධානය සහ රජයේ ආරක්ෂක හමුදාවන් ය. මේ අවධිය තුළ ප්‍රජාතන්ත්‍රවාදී

රජයේ ආරක්ෂක හමුදාවේ හෝ මේ කුමන කණ්ඩායමක වුව ද, තනි ආධිපත්‍ය යටතේ පවතින ප්‍රදේශයක පාලනයට වඩා ප්‍රතිවිරුද්ධ සන්නද්ධ කණ්ඩායම් දෙකක පාලනය යටතේ පවතින අම්පාර වැනි ප්‍රදේශයක ජනතාවට ඇති වන අහිතකර බලපෑම විශාල ය.

මෙලෙස දිගු කලක් එල්.ටී.ටී.ඊ සංවිධානය හා ශ්‍රී ලංකා රජය අතර පැවති සන්නද්ධ ගැටුම දෙපිරිස අතර 2002 වසරේ ඇතිකරගත් අවබෝධතා ගිවිසුම මගින් තාවකාලිකව අත් හිටවනු ලැබිණි. එසේ වුව ද, 2004 වසරේ දී අවබෝධතා ගිවිසුම බිඳ වැටීමත් එමෙන්ම එල්.ටී.ටී.ඊ සංවිධානයේ නැගෙනහිර අණ දෙන්නා වශයෙන් ක්‍රියාකළ මුරලිදරන් විනයාගමූර්ති (කරුණා අම්මාන්) එල්.ටී.ටී.ඊ යෙන් ඉවත් වීමත් සමග අම්පාර දිස්ත්‍රික්කය ඇතුළු නැගෙනහිර පළාත තුල නැවත යුද වාතාවරණයක් ඇති විය. කරුණා අම්මාන්ගේ නායකත්වයෙන් පිහිටුවන ලද Tamil Makkal Viduthalai Pulikal (TMVP) පක්ෂය අම්පාර ඇතුළු නැගෙනහිර පළාතේ අග්නිදිග ප්‍රදේශය තුල ශක්තිමත් වූ අතර එය ශ්‍රී ලංකා රජයේ ද සහාය ඇතිව එල්.ටී.ටී.ඊ සංවිධානයට එරෙහිව ගරිල්ලා යුද්ධයක නිරත විය. මේ අතර 2005 මහමැතිවරණයෙන් බලයට පත් පොදුජන එක්සත් පෙරමුණ ආණ්ඩුව නැගෙනහිර පළාත තුල නැවත යුද මෙහෙයුම් ආරම්භ කරන ලද අතර 2007 ජූලි වන විට සමස්ථ නැගෙනහිර පළාතම ආණ්ඩුවේ පාලනය යටතට ගැනීමට හැකිවිය. ඉන් පසු නැගෙනහිර පළාතේ අනෙකුත් ප්‍රදේශවල මෙන් අම්පාර දිස්ත්‍රික්කය කෙරෙහි දශක තිහකට ආසන්න කාලයක් මුළුල්ලේ පැවති සිවිල් යුද්ධය අවසන් විය.

නිගමනය

අම්පාර දිස්ත්‍රික්කයෙහි ජනවාර්ගික දේශපාලනය සහ එහි පැවති සිවිල් යුද්ධයෙහි ස්වභාවය විමර්ශනයට ලක් කල මෙම ලිපියෙන් අම්පාර දිස්ත්‍රික්කය පිහිටුවීම සහ ජනවාර්ගික දේශපාලනය අතර ඉතා සමීප සම්බන්ධතාවයක් පැවති බව හඳුනා ගැනීමට හැකි විය. විශේෂයෙන් අම්පාර දිස්ත්‍රික්කය පිහිටුවීමට මුල් වූ හේතු අතර සිංහල ජනවාර්ගික දේශපාලනය ඉතා දැඩි ලෙසින් බලපාන ලදි. ඒ අනුව අම්පාර දිස්ත්‍රික්කය පිහිටුවන ලද්දේ නැගෙනහිර පළාත තුල සිංහල ජනවාර්ගික ආධිපත්‍ය ස්ථාපිත කොට තහවුරු කිරීම සඳහාය යන්න යන්න අප විසින් ඇති කර ගත් එක් නිගමනයකි. අම්පාර දිස්ත්‍රික්කය පිහිටුවීමෙන් පසුව එහි හිමිකාරිත්වය සම්බන්ධයෙන් සිංහල දෙමළ සහ මුස්ලිම් ජනවාර්ගික කණ්ඩායම් අතර ඇතිවන

නිරන්තර තරගය අම්පාර දිස්ත්‍රික්කයේ දේශපාලනයෙහි පවතින එක් ප්‍රධාන ලක්ෂණයක් බව මෙම ලිපියෙන් අවධාරණයට ලක් කෙරිණි. අම්පාර දිස්ත්‍රික්කයේ ජනසංයුතියේ සහ ජන ව්‍යාප්ති රටාවේපවතින සුවිශේෂී රටාවත් එමෙන් ම භූගෝලීය ලක්ෂණත් සිවිල් යුද්ධයේ දී එල්.ටී.ටී. ඊ. සංවිධානයට වාසිදායක තත්වයක් ඇති කළ බව මෙම ලිපියෙන් අනාවරණය කර ගැනීමට හැකි විය. එල්. ටී. ටී. ඊ. සංවිධානයේ හෝ රාජ්‍ය ආරක්ෂක හමුදාවේ තනි ආධිපත්‍යය යටතේ පැවති ප්‍රදේශයක් මෙන් නොව එම පාර්ශ්ව දෙකෙහිම පාලනය යටතේ පැවති දිස්ත්‍රික්කයක් වීම නිසා අම්පාර දිස්ත්‍රික්කයේ වාසය කරන ජනතාවට සිවිල් යුද්ධය ඉතා දැඩි බලපෑමක් සිදු කළ බව මෙම අධ්‍යයනයෙන් හඳුනා ගැනීමට හැකි විය.

ආශ්‍රිත ග්‍රන්ථ හා ලිපි

Amarasinghe, Y.R. (1995) " Aspects of the State Crisis in Sri Lanka", In Mahinda Werake and P.V.J. Jayasekera (eds.) *Security Dilemmas of a Small States*, Part Two, New Delhi: South Asian Publishers Pvt Ltd. Pp 69-89

Ameerdeen, V. (2006) *Ethnic Politics of Muslims in Sri Lanka,* Kandy: Centre for Minority Studies

Bandarage, Asoka (2009) *The Seperatist Conflict in Sri Lanka: Terrorism, Ethnicity, Political Economy,* Colombo: Vijitha Yapa Publications.

Hansard (1961) 6 April

Hansard (1961) 7 April

Jupp, James (1978) *Sri Lanka: Third World Democracy,* London: Frank Cass and Company Limited

Moorcraft, Paul (2012) *Total Destruction of the Tamil Tigers: The Rare Victory of Sri Lanka's Long War,* South Yorkshire: Pen & Sword Books Ltd.

Rozairo, John Nigel (2011) *Livelihoods in a Conflict Setting: A case Study of the Ethnically Bordered Agricultural Villages in Ampara District, Sri Lanka,* Trondheim: Norwegian University of Science and Technology

Wilson, A.J. (1988) *The Break –Up of Sri Lanka: The Sinhalese Tamil Conflict,* London: Hurst

(1994) *S.J.V. Chelvanakam and the Crisis of Sri Lankan Tamil Nationalism 1947-1977: A Political Biography,* London: C Hurst & Co. (Publishers) Ltd.

උඩවත්ත, පියදාස (2013)*ඓතිහාසික දිගාමඩුල්ල*, මීරිගම: ආකර්ෂා ප්‍රකාශයෝ

ඩික්සිට්, ජේ. ඇන් (1998)*කොළඹ භූමිකාව*, කොළඹ: විජිත යාපා පොත්හල

ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ නිමවුම් කර්මාන්ත වර්ධනය සඳහා බලපාන සාධක: කුලියාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය (නැගෙනහිර කලාපය) ඇසුරින්

ඕ. ජී. දයාරත්න බණ්ඩා,
අයි. ඒ. ජේ. ඉඹුලාන ආරච්චි

රටක ආර්ථික වර්ධනයේ ප්‍රධාන මෙවලම සහ මානව ප්‍රාග්ධනය සහිත සේවා නියුක්තියක් උදෙසා පදනම සපයන පුරෝගාමී අංශය ලෙස කර්මාන්ත අංශය සැලකේ. ශ්‍රී ලංකාව වැනි මැදි ආදායම් ලබන රටවල මූලික අංගය ලෙසද නිමවුම් කර්මාන්ත අංශය හඳුනාගත හැකිය. මහබැංකු වාර්තාවට (2015) අනුව ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනය තුළ නිමවුම් කර්මාන්ත අංශයේ දායකත්වය සියයට 17.2 පමණ වේ. එසේම 2011 වර්ෂය වන විට නිමවුම් කර්මාන්ත අංශයේ සේවා නියුක්තිය 681,179 පමණ වන බව 2012 වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය අනුව හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකාවේ නිමවුම් කර්මාන්ත අංශය තුළ කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත ඉහළ දායකත්වයක් සපයයි. එමෙන්ම කර්මාන්ත අංශයට මෙන්ම ආර්ථික සංවර්ධනය සඳහා ද තීරණාත්මක අංශයක් වී ඇත. කුඩා පරිමාණ නිමවුම් කර්මාන්ත වර්ධනය සඳහා බලපාන සාධක ලෙස ණය ලබාගැනීම, ආයතන හිමිකරුගේ අධ්‍යාපන මට්ටම, ස්ත්‍රී පුරුෂ භාවය, ආයතනයේ වයස, ආයතනය භාවිතා කරන තාක්ෂණය සහ වෘත්තීය පුහුණුව යන සාධක අධ්‍යයන රැසක් මඟින් හඳුනාගෙන ඇත. මෙම අධ්‍යයනය තුළින් අරමුණු කොට ඇත්තේ ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ නිමවුම් කර්මාන්තවල වර්ධනයක් පවතීද යන්න හඳුනාගැනීමත් කුඩා පරිමාණ නිමවුම් කර්මාන්ත වර්ධනය සඳහා බලපාන සාධක හඳුනාගැනීමත් ය. මෙම අධ්‍යයනය සඳහා කුලියාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිර කලාපයේ ව්‍යාප්ත කුඩා පරිමාණ නිමවුම් ආයතන අතරින් සරල සසම්භාවී ක්‍රමවේදය යටතේ නිමවුම් ආයතන 60කින් යුත් නියැදියක් තෝරාගනු ලැබිය. එම නියැදිය සඳහා අතර ප්‍රශ්නාවලියක් භාවිතයෙන් රැස්කළ ප්‍රාථමික දත්ත භාවිතා කොට බහුගුණ ප්‍රතිපායන ආදර්ශයක් යොදාගනිමින් දත්ත විශ්ලේෂණය කරන ලදී. සමස්ත ප්‍රතිපායන ආදර්ශය සියයට 5 මට්ටම යටතේ වෙසෙසි වේ. තවදුරටත් නිර්ණන සංගුණකයේ අගය (R2) 0.7279 වීම තුළ ආදර්ශයේ යෝග්‍ය බව ඉහළ මට්ටමක පවතින බව පිළිබිඹු කරයි. අධ්‍යයන ප්‍රතිඵල අනුව ණය ලබාගැනීම, ස්ත්‍රී

පුරුෂ භාවය, ආයතනය භාවිතා කරන තාක්ෂණය සහ වෘත්තීය පුහුණුව යන ස්වායත්ත විචල්‍ය කුඩා පරිමාණ නිමවුම් කර්මාන්ත වර්ධනය සඳහා වෙසෙසි ධන බලපෑමක් සිදුකරන බව අනාවරණය වේ. නමුත් ආයතන හිමිකරුගේ අධ්‍යාපන මට්ටම සහ ආයතනයේ වයස යන ස්වායත්ත විචල්‍ය කර්මාන්ත වර්ධනය සමඟ ධනාත්මකව සම්බන්ධ වුව ද කර්මාන්ත වර්ධනය සඳහා එම විචල්‍යන් මඟින් වෙසෙසි ධන බලපෑමක් සිදුනොකරන බව ගම්‍ය වී ඇත. එහෙයින් අනාගතයේදී කුඩා පරිමාණ නිමවුම් කර්මාන්ත අංශයේ වර්ධනයක් උදෙසා ප්‍රබල බලපෑමක් සහිත විචල්‍යන් ලෙස ඉහතින් හඳුනාගත් විචල්‍යන් කෙරෙහි අවධානය යොමුකිරීම ඵලදායී වේ යැයි අපේක්ෂා කෙරේ.

01.හැඳින්වීම

දහඅට වන සියවස අගභාගයේදී මහා බ්‍රිතාන්‍ය කේන්ද්‍රකරගෙන ඇරඹි කාර්මික විප්ලවය සමඟ ආර්ථික ව්‍යුහය තුළ කර්මාන්ත අංශයේ වැදගත්කම ප්‍රචලිතවීමේ නව ප්‍රවණතාවක් නිර්මාණය විය. මෙම ප්‍රවණතාවය ලොව පුරා සංවර්ධනය වූ රටවල ඓතිහාසික ගමන් මඟ විමසීමේදී දැකියහැකි වූ තත්ත්වයකි. කාර්මික වර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස කාර්මික නගර බිහි වූ අතර ඒ තුළින් ඔවුන් කාර්මික අංශයේ ප්‍රසාරණයක් සහ පුළුල් ආර්ථික සංවර්ධනයක් අපේක්ෂා කළේය. එමෙන්ම රටේ පවතින සමාජ ආර්ථික ගැටලු එනම් සේවා වියුක්තිය, දරිද්‍රතාවය, ආදායම් විෂමතාවය යනාදිය සඳහා තිරසාර විසඳුම් කාර්මීකරණය තුළින් සෙවීමට බොහෝ රටවල් යොමු වී තිබේ. ඒ හේතුවෙන් ලෝකයේ බොහෝ සංවර්ධිත රටවල්වල සංවර්ධන මඟ සහ ආර්ථිකයේ ව්‍යුහය කෙරෙහි අවධානය යොමු කිරීමේදී එම රටවල ආර්ථික සංවර්ධනයත් ආර්ථික ශක්තිමත්භාවයත් රැඳී ඇත්තේ කාර්මික සංවර්ධනය මත බව හඳුනාගත හැකිය.

කර්මාන්ත යනු ලෝකයේ අති බහුතරයක් ආර්ථිකයන්හි කොදුනාරටිය බඳුය. මන්දයත් නවීන තාක්ෂණය භාවිතයෙන් නිෂ්පාදන ගුණත්වය වර්ධනය කරමින් පිරිවැය අවම කිරීම තුළින් වාර්ෂිකව භාණ්ඩ හා සේවා නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා කෘෂිකාර්මික අංශයට සාපේක්ෂව කර්මාන්ත අංශයට ඉහළ විභවතාවයක් පැවතීමයි. අන්තර්ජාතික ප්‍රමිත කාර්මික වර්ගීකරණයට අනුව කර්මාන්ත ප්‍රධාන වශයෙන් කැනීම් කටයුතු, නිමවුම් කර්මාන්ත, තැනීම් කටයුතු සහ විදුලිය, ජලය හා ගෑස් නිෂ්පාදන යනුවෙන් කොටස් හතරක් ලෙස හඳුනාගත හැකිය. මෙම

වර්ගීකරණයෙන් යුත් කර්මාන්ත රටක ආර්ථික සංවර්ධනය සඳහා අතිවිශාල කාර්යභාරයක් සිදුකරන අතර රාජ්‍ය ප්‍රතිපත්ති මඟින් එය වඩාත් ශක්තිමත් කරනු ලබයි. ශක්තිමත් සහ පුළුල් කාර්මික ප්‍රතිපත්ති මඟින් ආවරණය වූ කාර්මික අංශ ලෝකයේ රටවල් අතර ආර්ථික විෂමතා නිර්මාණය කිරීම දක්වා වර්ධනය වී තිබේ. ලෝකය සංවර්ධනය සහ අසංවර්ධනය අතර මිණුමේදී දෙරටක කාර්මික අංශයේ ශක්තිය එක් උපමානයක් ලෙස භාවිතා කරයි. කාර්මික භාණ්ඩවල පවතින පිරිවැය අවම කිරීමේ සහ නූතන තාක්ෂණය මුසු කිරීමේ සුවිශේෂ හැකියාව මත කාර්මික අංශය ශක්තිමත් කළ රටවල් විදේශ වෙළඳාමෙන් ද අතිවිශාල වාසි අත්කරගනිමින් ලෝක ආර්ථිකයේ බලවතුන් බවට පත්ව තිබේ. ඇල්ෆ්‍රඩ් මාර්ෂල්ට අනුව රටක ආර්ථික සාර්ථකත්වය රඳා පවතිනුයේ කාර්මික අංශයේ විශේෂීකරණය සහ සංකේන්ද්‍රණය මත වේ. ෂුම්පිටර්ගේ (Shumpiter) අදහස නූතන තාක්ෂණය සමඟින් ගමන් කරන නූතන කාර්මික භාණ්ඩ නිමවුම රටක් ආර්ථික සංවර්ධනය වෙත ගමන් කරවන පෙර ගමන්කරුගේ භූමිකාව රඟ දක්වන බවයි. එහෙත් ශ්‍රී ලංකාවේ කර්මාන්ත ව්‍යුහයේ ප්‍රධාන සංරචකය වන්නේ නිමවුම් කර්මාන්ත අංශයයි. මෙම නිමවුම් කර්මාන්ත අංශය සුක්ෂම, කුඩා, මධ්‍යම හා මහා පරිමාණ වශයෙන් විවිධ පරිමාණ පන්තීන්ට බෙදීමක් සිදුකර ඇතත් ඒ සඳහා විශ්වීය වශයෙන් පිළිගත් නිර්ණායකයක් නැත.[4] ව්‍යාපාර ආයතනවල පරිමාණය මැනීම සඳහා එක් එක් ව්‍යාපාර ආයතනවල ප්‍රාග්ධන මට්ටම හෝ සේවා නියුක්ති මට්ටම හෝ ඒ දෙකම හෝ භාවිතා කර ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ නිමවුම් කර්මාන්ත යන්න ප්‍රාග්ධන ආයෝජන ප්‍රමාණය රුපියල් 50,000ට අඩු සහ සේවා නියුක්තිය 20 ට අඩු කර්මාන්ත වේ.[5] නමුත් සේවක සංඛ්‍යාව 10 වැඩි හා 50 ට අඩු නිමවුම් කර්මාන්ත කුඩා පරිමාණ නිමවුම් කර්මාන්ත වේ.[6] ශ්‍රී ලංකාවේ නිමවුම් කර්මාන්ත අංශය ප්‍රධාන වශයෙන් ආහාර හා පාන වර්ග, කෘෂි නිමවුම් සැකසීමේ කර්මාන්ත, රසායනික ද්‍රව්‍ය, රබර්, ප්ලාස්ටික්, ඇඟළුම්, සම්භාණ්ඩ, දැව හා දැව නිෂ්පාදන, කඩදාසි, මැණික්, රන් ආභරණ, වානේ, මැටි ආශ්‍රිත නිෂ්පාදන සහ කොහු ආශ්‍රිත නිෂ්පාදන ආදියෙන් සමන්විත වේ.

---

[4] R. Fernando 'Small and Medium Industry in Sri Lanka:performance and Policies', Industry Development in Sri Lanka,Colombo, 1990.
[5] Department of Census andStatistics 1994.
[6] European Association 2003.

මධ්‍යම හා මහා පරිමාණ කර්මාන්තවලට සාපේක්ෂව කුඩා පරිමාණ කර්මාන්තවලට වර්ධනය සඳහා ඉහළ අවකාශයක් පවතින බවට පොදුවේ පිළිගත්ත ද වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ නිමවුම් කර්මාන්ත අසාර්ථකවීම ඉතා ඉහළ මට්ටමක පවතින බව මෑතකාලීන අධ්‍යයන තුළින් හඳුනාගෙන ඇත. එනම් ශ්‍රී ලංකාව තුළ ආරම්භ වන කුඩා පරිමාණ නිමවුම් කර්මාන්තවලින් සියයට 68ක් පමණ පළමු වසර 2-5 අතර අසාර්ථක වේ.[7] තත්ත්වය මෙසේ වුවත් සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස ශ්‍රී ලංකාවේ නිමවුම් කර්මාන්ත අංශයේ පවතින මෙම පසුබෑම නොසලකා හැරීමට නොහැක. මන්දයත් නිමවුම් කර්මාන්ත අංශය ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයෙන් අසන්න වශයෙන් සියයට 17.2ක පමණ දායකත්වයක් සපයන අංශයක් වීමයි. කුඩා පරිමාණ කර්මාන්ත වර්ධනය සඳහා බලපාන හේතු අධ්‍යයනය කිරීම තුළින්මේ සඳහා තිරසාර විසඳුමක් සැපයීමට හේතුවේ. ඒ අනුව කුඩා පරිමාණ නිමවුම් කර්මාන්ත වර්ධනය සඳහා වාර්ෂිකව ලබාගන්නා ණය ප්‍රමාණය, ව්‍යාපාරික ආයතනයේ වයස, ව්‍යාපාරික ආයතනය හිමිකරුගේ අධ්‍යාපන මට්ටම සහ ව්‍යාපාරික ආයතනය හිමිකරුගේ ස්ත්‍රී පුරුෂ භාවය යන සාධකවල බලපෑම මෙහිදී අධ්‍යයනය කිරීමට අපේක්ෂා කෙරේ.

02. සාහිත්‍ය විමර්ශනය

ලොව විවිධ පර්යේෂකයන් විසින් කර්මාන්ත වර්ධනය සඳහා බලපාන සාධක පිළිබඳව විවිධ අයුරින් අධ්‍යයන සිදුකර ඇත. එහිදී, කර්මාන්ත වර්ධනය සඳහා ඔවුන් හඳුනාගෙන ඇති සාධකද විවිධ ආකාර වේ. ඒ අනුව අෆන්ඩ්[8] විසින් කෙන්යාවේ නයිරෝබි (Nairobi) දිස්ත්‍රික්කයෙහි සුක්ෂම හා කුඩා පරිමාණ ව්‍යවසාය ව්‍යාපාරික ආයතන 80ක නියැදියක් භාවිතා කරමින් අධ්‍යයනයක් සිදුකර ඇත. එහිදී ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා සහ තැපැල් මඟින් දත්ත එක්රැස් කර ඇති අතර අඩුතම වර්ග නිමානිත (OLS) ක්‍රමවේදය භාවිතා කරමින් දත්ත විශ්ලේෂණය කර තිබේ. විශ්ලේෂණයට අනුව සුක්ෂම හා කුඩා පරිමාණ කර්මාන්ත වර්ධනය සඳහා ණයවලට ප්‍රවේශවීම, ආයතනයේ වයස හා ව්‍යවසායකයාගේ අධ්‍යාපන මට්ටම යන

[7] Y. Lingesiya, 'Indentifying Factors to Indicate the Business Performance of Small Scale Industries: Evidence from Sri Lanka',Global Journals Inc.(USA),2012.Vol.12.

[8] F.O. Afande, 'Factors Influencing Growth of Small and Microenterprises in Neirobi Central Business District', An international peer-reviewed journal.2015.Vol.9, pp.104-134.

සාධක ත්‍රිත්වය ධනාත්මකව සම්බන්ධ වන බව හඳුනාගෙන ඇත. එසේම ෆියර්සන්[9] විසින් දකුණු අප්‍රිකානු රටවල් 5කින් එනම් ස්වාසිලන්තය, ලෙසොතෝ, බොට්ස්වානා, සිම්බාබ්වේ සහ දකුණු අප්‍රිකාවේ නගර දෙකකින් රැස්කරන ලද දත්ත අඩුතම වර්ග නිමානිත (OLS) ක්‍රමවේදය යොදා ගනිමින් විශ්ලේෂණය කිරීම මඟින්කර්මාන්ත හිමිකරුගේ මානව ප්‍රාග්ධන මට්ටම, කර්මාන්ත ස්ථානගතවීම, හිමිකරුගේ ස්ත්‍රී පුරුෂ භාවය යනාදී සාධක කර්මාන්තයේ වර්ධනයට අනුලෝම වශයෙන්ද කර්මාන්තයේ වයස හා විශාලත්වය ප්‍රතිලෝම වශයෙන්ද සම්බන්ධ වන බව පෙන්වා දී තිබේ. මීට අමතරව කුඩා කර්මාන්ත, විශාල කර්මාන්තවලට සාපේක්ෂව අසාර්ථකත්වයට ඇති අවකාශය අඩු බවද දක්වයි. එහෙත් මෙහිදී අෆන්ඩ් (Afande) හා ෆියර්සන් (Pherson)යන දෙදෙනාම සුක්ෂම හා කුඩා කර්මාන්ත වර්ධනය පිළිබඳව අධ්‍යයනයට ලක් කර ඇතත් සුක්ෂම හා කුඩා කර්මාන්ත වර්ධනය සඳහා ආයතනයේ වයස යන සාධකය පිළිබඳව පරස්පර අදහසක් දක්වා ඇති බව පැහැදිලි වේ.

තවද නිමවුම් කර්මාන්ත වර්ධනය පිළිබඳව හෝල්[10] විසින් ඇමෙරිකා එක්සත් ජනපදයේ 1972-1979 කාලයේ නිමවුම් ආයතන 1,343ක් ද 1976-1983 කාලයේ කර්මාන්ත 1,098ක්ද 1972-1983 කාලය තුළ නිමවුම් ආයතන 962ක් ද පිළිබඳව කාලශ්‍රේණි දත්ත භාවිතා කරමින් සිදු කර ඇති අධ්‍යයනයේදී නිමවුම් කර්මාන්ත වර්ධනය හා කර්මාන්ත විශාලත්වය අතර ප්‍රතිලෝම සම්බන්ධයක් පවතින බව හඳුනාගෙන ඇත. එය ෆියර්සන්ගේ (Pherson) නිගමනය හා සමාන වේ. එහෙත් කර්මාන්ත විශාලත්වය හා කර්මාන්ත වර්ධනය අතර ප්‍රතිලෝම සම්බන්ධයක් පවතින බව එනම් පරිමාණානුකූල නොපිරිමැසුම් පවතින බව ආර්ථික විද්‍යාව තුළ න්‍යායාත්මක පිළිගැනීමයි. හුදෙක් ඒ පිළිබඳව පරීක්ෂා කිරීම වෙනුවට වෙනත් සාධක ඇතුළත් කරමින් අධ්‍යයනය සිදු කිරීමට යොමු වුයේ නම් වඩා ඵලදායී වනු ඇතැයි අපේක්ෂා කළ හැකිය. එමෙන්ම දුන්නේ සහ හුගාස්[11] විසින් 1975 -1985 අතර කාලපරිච්ඡේදය තුළ වූ එක්සත් රාජධානියේ ලැයිස්තුගත කළ හා ලැයිස්තුගත

---

[9] M. A.Pherson,'Growth of Micro and Small Enterprises in Southern Africa'.Journal of Development Economics. 1994.Vol. 48, PP. 253-277.

[10] B.H.Hall 'The Relationship Between Firm Size and Firm Growth in the U.S. Manufacturing Sector'. Journal of Industrial Economics. 1987. pp.583-606.

[11] P. Dunne, and A. Hughes,'Age, Size, Growth and Survival: UK Companies in the 1980s.' The Journal of Industrial Economics.1994. Vol. 42, No.2, pp. 115-14.

නොකළ සමාගම්වල වර්ධනය හා පැවැත්ම පිළිබඳව විමර්ශනය කිරීමක් මෙන්ම එක්සත් ජනපදයේ සහ එක්සත් රාජධානියේ පෙර අධ්‍යයන ප්‍රතිඵල සංසන්දනය කිරීමක් සිදුකර ඇත. මෙම අධ්‍යයනයේදී ඔවුන් විසින් සමාගම්වල වර්ධනය සමඟ සමාගම්වල වයස හා විශාලත්වය ප්‍රතිලෝම සම්බන්ධයක් දක්වන බවත් කුඩා කර්මාන්ත, විශාල කර්මාන්තවලට සාපේක්ෂව වේගයෙන් වර්ධනය වන බවත් නිගමනය කර ඇත. මෙම අධ්‍යයනයේදී කර්මාන්තයේ වයස යන සාධකය කර්මාන්ත වර්ධනය සමඟ ප්‍රතිලෝම සම්බන්ධයක් පවතින බව හඳුනාගෙන ඇත. මෙම ප්‍රතිඵලය අෆන්ඩිගේ (Afande) අධ්‍යයන ප්‍රතිඵල සමඟ සංසන්දනය කිරීමේදී එම ප්‍රතිඵල අතර පරස්පර බවක් පෙන්නුම් කරයි.

යසුදා[12] විසින් ව්‍යාපාර වර්ධනය, විශාලත්වය හා වයස පිළිබඳ ශෛලිගත කරුණක් ජපානයට ගැලපෙන අයුරින් තිබේද නැද්ද යන්න විමර්ශනය කිරීම හා ව්‍යාපාර වර්ධන අනුපාතිකය සඳහා වෙනත් විචල්‍යන්ට වඩා ව්‍යාපාරයේ වයස හා විශාලත්වය අතර ඇති සම්බන්ධය විශ්ලේෂණය කිරීමට ජපන් රජය විසින් ආවරණය කළ සමීක්ෂණ දත්ත යොදාගෙන ඇත. මේ සඳහා නිමවුම් ව්‍යාපාර 14,000කින් දත්ත රැස්කර ඇත. ප්‍රතිපායන ආදර්ශ මඟින් දත්ත විශ්ලේෂණය සිදුකර ප්‍රතිඵල ලෙස ව්‍යාපාරයේ වයස හා විශාලත්වය ව්‍යාපාර වර්ධන අනුපාතිකය සමඟ ප්‍රතිලෝම සම්බන්ධයක් හා R & D සඳහා දරණ වියදම, ව්‍යාපාර වර්ධනය සමඟ අනුලෝමව සම්බන්ධ වන බව හඳුනාගෙන ඇත.

වොල්ගාරිස් ඇතුළු පිරිස[13] විසින් ග්‍රීසියේ කුඩා පරිමාණ නිමවුම් කර්මාන්තවල විකුණුම් ශීඝ්‍රයෙන් වර්ධනය වීමට බෙහෙවින් බලපෑ විචල්‍ය හඳුනාගැනීමට ව්‍යාපාරික ආයතන 143ක් සසම්භාවී ලෙස තෝරාගෙන ප්‍රශ්නාවලියක් කර්මාන්ත වෙත යැවීමෙන් දත්ත රැස්කරනු ලැබිය. එම දත්ත අඩුතම වර්ග නිමානිත (OLS) ක්‍රමවේදය භාවිතයෙන් විශ්ලේෂණය කිරීම තුළින් ඔහු විසින් නිමවුම් කර්මාන්තවල විකුණුම් වර්ධනය සඳහා මුළු වත්කම්, සේවකයන්ගේ ඵලදායිතාවය

---

[12] T.Yasuda, 'Firm Growth, Size, Age and Behavior in Japanese Manufacturing'. Small Business Economics..2005. Vol. 24, No. 1 , pp. 1-15.

[13] F. Voulgaris, D. Asteriou, and G. Agiomirgianakis,'The Determinants of Small Firm Growth in the Greek Manufacturing Sector'. Journal of Economic Integration.2003. Vol. 18, No. 4, pp. 817-836.

හා දිගුකාලීනව ණය විශ්වාස යන විචල්‍යන් ධනාත්මකව සම්බන්ධ වන බවත් ද්‍රවශීලතාවය, ණය ප්‍රතිපත්ති, ස්ථාවර වත්කම් හා පිරිවැටුම ඍණාත්මකව සම්බන්ධ වන බවත් නිගමනය කරනු ඇත.

හෙෂ්මට්[14] විසින් ස්වීඩන්හි සේවකයන් 1-100 අතර සේවා නියුක්ත සුක්ෂම හා කුඩා පරිමාණ කර්මාන්තවලින් සමන්විත විශාල නියැදියක් මඟින් 1993-1998 අතර කාලපරිච්ඡේදය තුළ වූ panel data භාවිතා කර සුක්ෂම හා කුඩා පරිමාණ කර්මාන්ත වර්ධනය පිළිබඳව අධ්‍යයනයට ලක්කර ඇත. එහිදී ඔහු විසින් අඩුතම වර්ග නිමානිත (OLS) සහ Generalized Least Square (GLS) යන ක්‍රමවේද භාවිතා කරමින් දත්ත විශ්ලේෂණය කිරීම තුළින් කර්මාන්ත වර්ධනයට ආයතනයේ වයස හා විශාලත්වය ඉතා සංවේදී බව පෙන්වා දෙයි. එමෙන්ම සුක්ෂම හා කුඩා පරිමාණ කර්මාන්ත අතර ආවරණය නොවූ විෂමජාතිය වත්කම් වර්ධනය පිළිබඳව කර්මාන්තයේ වයස හා විශාලත්වය යන විචල්‍ය පිළිබඳ සංඛ්‍යා දත්ත මඟින් ආවරණය නොවන බවද තවදුරටත් හඳුනාගනී.

තුර්කියේ කුඩා සහ මධ්‍යම පරිමාණ ඇඟළුම් ආයතනවල වර්ධනය සඳහා වෙසෙසි බලපෑමක් ඇතිකරන සාධක හඳුනා ගැනීම සඳහා කරදෙනිශ්[15] විසින් ස්තාන්බුල් (Istanbul) ප්‍රදේශයේ කුඩා හා මධ්‍යම පරිමාණ ඇඟළුම් ආයතන හිමිකරුවන් 404ක් පමණ තෝරාගෙන රැස්කරගත් දත්ත බහුගුණ ප්‍රතිපායන ආදර්ශ භාවිතයෙන් විශ්ලේෂණය කර ඇත. එහිදී ඔහු ව්‍යාපාරික ආයතනයේ වයස, ව්‍යාපාරික ආයතනයේ විශාලත්වය, සේවකයන්ගේ හැකියාවන්, වෙළඳපළ තරඟය සහ අපනයන ප්‍රතිපත්ති යන සාධක පිළිබඳව අවධානය යොමුකර ඇත. ඇඟළුම්, දේශීය වෙළඳපොළේ අලෙවියට වඩා අපනයන මඟින් ඉහළ ලාභයක් ලබාගත හැකි බව එනම් සියයට 1 මට්ටමේදී අපනයන සහ ව්‍යාපාරික ආයතනයේ වර්ධනය අතර වෙසෙසි ධන සම්බන්ධයක් පවතින බවත් සියයට 5 මට්ටමේදී ව්‍යාපාරික ආයතනයේ විශාලත්වය සමඟ වෙසෙසි ධන සම්බන්ධයක් පවතින බවත් හඳුනාගෙන ඇත. නමුත් වෙළඳපළ තරඟය යන සාධක ආයතන වර්ධනය කෙරෙහි වැදගත් වන බවක්

---

[14] A. Heshmat,'On the Growth of Micro and Small Firms: Evidence from Sweden'. Small Business Economics.2001.Vol. 17, No. 3 , pp. 213-228.

[15] Karadeniz, E. 'Factors Contributing to the Growth of Turkish Small and Medium Sized Firms in the Clothing Industry'. sosyal bilimler dergisi.2001. pp.89-104.

හඳුනාගෙන නොමැත. එහෙත් හෝල්, පාක් ඇතුළු පිරිස සහ යසුදා යනාදීන් විසින් සිදුකරන ලද අධ්‍යයන මඟින් එළඹී ප්‍රතිඵලවලින් වෙනස් වන අතර කර්මාන්ත වර්ධනය හා විශාලත්වය අතර අනුලෝම සම්බන්ධයක් ඇති බව මෙම අධ්‍යයනය මඟින් හඳුනාගැනීම වැදගත්වේ.

උක්ත සඳහන් ආකාරයට නිමවුම් කර්මාන්ත වර්ධනය සම්බන්ධයෙන් අධ්‍යයන සිදුකර ඇති නමුත් කර්මාන්ත වර්ධනයෙන් වෙනස් වූ පුළුල් සංකල්පයක් ලෙස හඳුනාගතහැකි කර්මාන්ත කාර්ය සාධනය පිළිබඳව ෆෙයිරොස් විසින් අධ්‍යයනයක් සිදුකර ඇත. එහිදී ඔහු 2008 ඔක්තෝබර් මාසයේ සිට 2009 අප්‍රේල් මාසය දක්වා කාලය තුළ සම්මුඛ සාකච්ඡා මඟින් කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර ආයතන 25කින් පමණ රැස්කළ දත්ත විශ්ලේෂණය කරමින් පෙර සූදානම, නවෝත්පාදන සහ අවදානම්දැරීම යන ව්‍යවසායක ගතිලක්ෂණ කර්මාන්ත කාර්ය සාධනය සමඟ සහසම්බන්ධතාවයක් පවතින බවත්, මෙම සාධක විකුණුම් වර්ධනය, ලාභය, සේවක සංඛ්‍යාව වර්ධනය වීම සහ හිමිකරුගේ තෘප්තිමත් බව සමඟ ද සහසම්බන්ධතාවක් පවතින බව දක්වයි. මෙම අධ්‍යයනයේදී ප්‍රධාන වශයෙන් ව්‍යවසායක ගතිලක්ෂණ සහ කර්මාන්ත කාර්ය සාධනය කෙරෙහි අවධානය යොමුකර ඇත. එහෙත් කර්මාන්ත කාර්යසාධනය යන්න පුළුල් සංකල්පයක් වන අතර එය කර්මාන්ත වර්ධනයෙන් වෙනස් වේ.

මාහෙර් (Maher, 2010) විසින් ජෝර්දාන්වල කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සාර්ථකත්වය සඳහා බෙහෙවින් භාවිතා කරන ප්‍රධාන සාධක හඳුනාගැනීමේ අරමුණින් ව්‍යාපාරික ආයතන 163කින් සමන්විත නියැදියක් සේවා, නිමවුම් සහ සිල්ලර වෙළඳාම යන අංශ 3 නියෝජනය වන පරිදි තෝරාගෙන ඇත. ප්‍රශ්නාවලියක් ආශ්‍රයෙන් දත්ත රැස්කර විස්තරාත්මක සංඛ්‍යාන ශිල්ප ක්‍රමය මඟින් දත්ත විශ්ලේෂණය කිරීම තුළින් කාර්මික ක්‍රියාපටිපාටිය සහ තාක්ෂණය මෙන්ම ආයතනයේ ව්‍යුහය, මුල්‍ය ව්‍යුහය, අලෙවිය ඵලදායිතාවය සහ මානව සම්පත් ව්‍යුහය යන සාධක කර්මාන්ත සාර්ථකත්වය උදෙසා ධන හා වෙසෙසි සම්බන්ධයක් පවතින බව හඳුනාගෙන ඇත.

එසියෙන් සහ බලෝන්[16] විසින් කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්තවල තාක්ෂණික කාර්යක්ෂමතාව පිළිබඳ නයිජීරියාවේ සිදුකළ අධ්‍යනයේදී ප්‍රශ්නාවලියක් භාවිතයෙන් දත්ත රැස් කර තිබේ. එහිදී ජාත්‍යන්තර ප්‍රමිත කාර්මික වර්ගීකරණයට අනුව ආහාර හා පාන වර්ග, ඇඟළුම්, කඩදාසි නිෂ්පාදන, දැව හා දැව නිෂ්පාදන, ලෝහ නිෂ්පාදන, රබර්, ප්ලාස්ටික් සහ ගල් අගුරු නිෂ්පාදන ආදී වශයෙන් නිමවුම් කර්මාන්ත ප්‍රධාන අංශ 8ක් යටතේ වර්ගීකරණය කරන ලද අතර අධ්‍යනය සඳහා දත්ත රැස් කිරීමේදී සසම්භාවී ලෙස නියැදිය තෝරාගෙන ඇත. එහිදී අදියර 2ක් යටතේ මෙම තේරීම සිදුකර තිබේ. එනම් පළමු අදියර තුළදී භූගෝලීය වශයෙන් කලාප 6කින් නියැදිය තෝරාගෙන ඇති අතර එහිදී දෙවන අදියර තුළ ඉහතින් සඳහන් කළ වර්ගීකරණය අනුව කර්මාන්ත හිමියන් නියැදිය තුළට ඇතුළත් කරගෙන ඇත. එමෙන්ම ප්‍රශ්නාවලිය මඟින් තොරතුරු ලබා ගැනීමේදී කර්මාන්ත වර්ගය, කර්මාන්තයේ වයස හා පිහිටීම, සේවා නියුක්තිය, හැකියාවන්, පුහුණුව, ව්‍යවසයකයාගේ අධ්‍යාපන මට්ටම, ප්‍රාග්ධන භාවිතය, ව්‍යවසායක ගතිලක්ෂණ හා රාජ්‍ය ප්‍රතිපත්තිවල බලපෑම වැනි වෙනත් බාහිර සාධක යනාදිය පිළිබඳ මූලික අවධානය යොමු කර ඇත. එහිදී රැස්කරන ලද දත්ත විශ්ලේෂණය සඳහා විස්තරාත්මක ක්‍රමවේදය යොදාගෙන තිබේ. ප්‍රතිඵලවලට අනුව ආයතනයේ වයස, හැකියාවන් මත ආයෝජනය කිරීම, පුහුණුව හා අධ්‍යාපන මට්ටම යන සාධක තාක්ෂණික කාර්යක්ෂමතාව සඳහා වැදගත් වන නිර්ණායකයන් වන බවට ඔවුන් විසින් හඳුනාගෙන ඇත.

එසේම ශ්‍රී ලංකාවේ මඩකලපුව දිස්ත්‍රික්කයේ කර්මාන්ත කාර්ය සාධනය පිළිබඳව අවධානය යොමුකරමින් වරෝතයන්[17] විසින් ශ්‍රී ලංකාවේ මඩකලපුව දිස්ත්‍රික්කයේ කුඩා හා මධ්‍යම පරිමාණ නිමවුම් ව්‍යාපාර ආයතන 150ක දත්ත ආශ්‍රයෙන් මූල්‍ය, අලෙවිය, කළමනාකරණ, යටිතල පහසුකම් තාක්ෂණය, රාජ්‍ය නියාමන යන සාධක අතරින් මූල්‍ය, අලෙවිය, කලමනාකරණය සහ යටිතල පහසුකම් යන සාධක ප්‍රධාන වශයෙන් කර්මාන්ත කාර්යසාධනය සමඟ සහසම්බන්ධ වන

---

[16] Essien, A.E and Bellon, Y.A (2007). 'Technical Efficiency of Small and Medium Scale Industries (smi) in Nigeria:Evidence from nation-wide sample survey'.Studia Universitatis Babeş-Bolyai, Negotia, Lii, 2, pp.40-69.

[17] V. Varothayan, 'An Investigation of Strategic Factors Affecting the Performance of Manufacturing Based Small and Medium Enterprises (SMEs) Operating In Batticoloa District in Sri Lanka'. Scholarlink Research Institute Journals.2015.pp. 228-236.

බව හඳුනාගෙන ඇත. තවදුරටත් ඔහු කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත කාර්ය සාධනය සමඟ මුල්‍ය පදනම් කරගත් සාධක ඉහළ සහසම්බන්ධයක් පවතින බවත් කළමනාකරණය හා අලෙවිය මධ්‍යම මට්ටමේන් සහ රාජ්‍ය නියාමනය සම්බන්ධ සාධක හා තාක්ෂණය දුර්වල සහසම්බන්ධයක් පවතින බව දක්වා ඇත. එසේම ලින්ගේසියා[18] විසින් වවුනියාව දිස්ත්‍රික්කය පදනම් කරගෙන කුඩා පරිමාණ ආයතනික කාර්යසාධනය සඳහා බලපාන සාධක 5ක් පිළිබඳව ප්‍රධාන වශයෙන් අවධානය යොමු කර ඇත. නමුත් එහිදී සැලකිල්ලට ලක්කර ඇති විචල්‍යන් වරෝතයන් විසින් දක්වා ඇති විචල්‍යන්ගෙන් වෙනස් වේ. එහිදී හඳුනාගත් විචල්‍ය පහේ වැදගත්කම ඒවායේ මධ්‍යන්‍ය අගය මත පෙළගැස්වීමක් සිදුකර ඇත. එනම් කළමනාකරණ වෙනස සමඟ පාරිභෝගික තෘප්තිය, වාසිදායක වර්ධනය, ව්‍යාපාරයේ හා අදායම් මට්ටමේ වර්ධනය, සේවක සංඛ්‍යාවේ වර්ධනය සහ පිරිවැටුම් වර්ධනය පිළිවෙලින් දැක්විය හැකිය. ඒ අනුව මෙම අධ්‍යයන දෙකෙහිදීම කර්මාන්ත කාර්ය සාධනය පිළිබඳව අවධානය යොමුකර ඇති අතර කාර්ය සාධනය යන්න වර්ධනයෙන් වෙනස් වේ. එමෙන්ම සහ සහසම්බන්ධතාවයක් මඟින් සාධක අතර පවතින සම්බන්ධය කෙබඳු ද යන්න පිළිබඳව පැහැදිලි අදහසක් ලබාගැනීම අපහසු වේ. ඒ සඳහා හේතුඵල සම්බන්ධය සෙවීම තුළින් කර්මාන්ත කාර්ය සාධනයට ඉහත දක්වන ලද විචල්‍යන්ගේ පවතින ධන හා ඍණ සම්බන්ධයන් පැහැදිලිව හඳුනාගැනීමට හැකියාව ලැබේ.

දයාරත්න සහ රන්ජිත්[19] යන අය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය ආර්ථිකයන්හි කුඩා කර්මාන්ත සාර්ථකත්වය තීරණය කරන සාධක විභාග කිරීම, කුඩා ව්‍යාපාරවල සාර්ථකත්වය නගා සිටුවීමට ප්‍රතිපත්තියක් දියුණු කිරීම සහ කුඩා ව්‍යාපාරවල වැදගත්කම තීරණය කිරීමට බලපෑ හැකි වෙනත් සාධක හා හේතුඵල සම්බන්ධතාව තේරුම් ගැනීම අරමුණු කරගෙන කුලියාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිර හා බටහිර යන කලාප දෙකම පදනම් කරගෙන කුඩා කර්මාන්ත සාර්ථකත්වය උදෙසා ව්‍යවසායකයාගේ පවුල් පරිසරය, ව්‍යවසායකයාගේ තීරණ ගැනීමේ හැකියාව, ව්‍යවසායකත්වය උදෙසා ව්‍යවසායකයාගේ පුහුණු මට්ටම

[18] Y. Lingesiya, 'Indentifying Factors to Indicate the Business Performance of Small Scale Industries: Evidence from Sri Lanka',Global Journals Inc.(USA),2012.Vol.12.

[19] O.G. Dayarathna-Banda, and J.G.Sri Ranjith,'Deteminants of Success of Small Business: A Survey-Based Study in Kuliyapitiya Divitional Secretariat of Sri Lanka'. International Journal of Business and Social Research.2014.Val.4, No.6, pp.38-50.

සහ ව්‍යාපාරය මත ආයෝජනය කර ඇති මුදල් ප්‍රමාණය යන සාධක ඉතා වැදගත් වන බව හඳුනාගෙන ඇත. මෙම අධ්‍යයනයේදී මූලික වශයෙන් ව්‍යවසායක ගති ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කර ඇත.

විජයකුමාර් ඇතුළු පිරිස[20] විසින් කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්තවල දායකත්වය හා නැඹුරුව ආර්ථික වර්ධනය සඳහා බලපාන ආකාරය හඳුනාගැනීම, කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්තවල වර්ධනය හා තත්ත්වය සලකා බැලීම මෙන්ම එම කර්මාන්තවල වර්ධනය සඳහා රජය විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති පිළිබඳව අධ්‍යයනය කිරීමේ අරමුණින් ගම්පහ සහ කළුතර යන දිස්ත්‍රික්ක දෙක පදනම් කර ගනිමින් අධ්‍යයනයක් සිදුකර ඇත. නියැදිය මඟින් රැස්කරන ලද දත්ත විස්තරාත්මක ක්‍රමවේදය ඔස්සේ විශ්ලේෂණය කිරීම මඟින් ආර්ථික උත්පාතයක් ඇති කිරීම, දරිද්‍රතාවය අඩු කිරීම, සේවා වියුක්ති මට්ටම අඩු කිරීම යනාදිය සඳහා කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත මඟින් විශාල බලපෑමක් සිදුකරන බව විදේශීය වශයෙන් පුර්ව අධ්‍යයන මඟින් අනාවරණය කර ඇතත් ශ්‍රී ලංකාව තුළ දරිද්‍රතාවය අඩු කිරීම සඳහා කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත අංශය සමත්වී නොමැති බව ඔවුන් හඳුනාගෙන ඇත. එමෙන්ම කර්මාන්ත ක්ෂේත්‍රය තුළ සියයට 93ක් පමණ කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත පවතින නමුත් 2008 වසර වන විට රටේ දළ දේශීය නිෂ්පාදන සඳහා එහි දායකත්වය සියයට 20 පමණ අඩු මට්ටමක් පවතින බව දක්වයි. තවදුරටත් සලකා බලන විට කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත සඳහා කාන්තා සහභාගිත්වය සියයට 12ක් වැනි අඩු අගයක පවතින අතර පුරුෂ පක්ෂයේ සහභාගීත්වය සියයට 88ක් පමණ වන බව අධ්‍යයනය තුළින් අනාවරණය කරගෙන ඇත. එසේම කුඩා පරිමාණ ආයතන හිමිකරුවන්ට ඉතා අඩු අධ්‍යාපන මට්ටමක් පවතින බවත් කළමනාකරණ හැකියාව ඉතා පහළ බවත් මූල්‍ය හැකියාව එතරම් ශක්තිමත් නොවන බවත් දක්වන අතර සේවා නියුක්තිය, ප්‍රාග්ධනය, අගය එකතු කිරීමේ ක්‍රියාවලිය සහ කාන්ත සහභාගිත්වය ද කුඩා පරිමාණ කර්මාන්තවල පහළ මට්ටමක පවතින බවත් දක්වයි. අවසාන වශයෙන් ඔවුන් විසින් කුඩා කර්මාන්තවලට ණය ලබාදීමත් අවම වශයෙන් වසර 5ක කාලයක් හෝ බදු විරාම ලබාදිය යුතු බව යෝජනා කෙරේ.

---

[20] S.Vijayakumar, O. Brezinora, and M. Sedlacek,'The Status and Growth of Small and Medium Enterpricess in Sri Lanka'. 2012.

විජේවර්ධන[21] විසින් 1977න් පසුව කර්මාන්ත අංශය සඳහා ක්‍රියාත්මක වූ ප්‍රතිපත්ති සහ එම ප්‍රතිපත්ති සමඟ කුඩා පරිමාණ කර්මාන්ත අංශයේ වෙනස්වීම, ආයතනවලට යොදාගෙන ඇති අමුද්‍රව්‍ය, ශ්‍රමය සහ බලශක්තිය වැනි සාධක සම්බන්ධ වී ඇති ආකාරය පිළිබඳව ද්විතික දත්ත භාවිතයෙන් අධ්‍යයනය කර ඇත. එහිදී 1977න් පසුව කුඩා පරිමාණ කර්මාන්ත අංශයේ වර්ධනය පිළිබඳව සැහීමකට පත්විය නොහැකි බව දක්වයි. ඊට හේතු ලෙස 1977න් පසුව හඳුන්වා දුන් ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය දැක්වේ. නමුත් රටේ ආර්ථික ස්ථාවරත්වය සහ සංවර්ධනය උදෙසා කුඩා කර්මාන්ත අංශය වර්ධනය කළයුතු බව කියයි. ඒ සඳහා කර්මාන්ත අතර අනුපුරක සම්බන්ධතා ගොඩනැගෙන ආකාරයට දිගුකාලීන උපක්‍රම භාවිතා කළ යුතු බවත් ඇතැම් ප්‍රතිපත්ති මඟින් කර්මාන්ත සඳහා ඇතිකරන අහිතකර බලපෑම්වලින් බැහැරවීමේ සැලසුම් සකස් කළ යුතු බවත් මෙම අධ්‍යනය මඟින් යෝජනා වී ඇත.

විජේවර්ධන විසින් සිදුකළ අධ්‍යයනයට පරස්පර අධ්‍යයනයක් ලෙස පුෂ්පනාතන්ගේ[22] අධ්‍යයනය හඳුනාගත හැකිය. මෙම අධ්‍යයනය මඟින් ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ කර්මාන්ත මුහුණදෙන ගැටලු අධ්‍යයනය කිරීමත් එම කර්මාන්ත මඟින් ආර්ථිකයට කෙරෙන බලපෑම් අධ්‍යයනයට ලක්කර ඇත. අධ්‍යයනය සඳහා ද්විතික දත්ත භාවිතා කර ඇති අතර විස්තරාත්මක ක්‍රමවේදය මඟින් දත්ත විශ්ලේෂණය සිදුකර තිබේ. නිදහසෙන් පසුව විවිධ රජයන් විසින් අනුගමනය කරන ලද ප්‍රතිපත්ති කුඩා පරිමාණ කර්මාන්ත වර්ධනය සඳහා ඉතා දැඩිව බලපෑ ඇති බවත් මෙම අංශය තවදුරටත් වර්ධනය කරගැනීම සඳහා ඊට අනුබද්ධිතව පවතින ගැටලු අවම කිරීමට රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රතිශෝධනය කිරීම ඉතා වැදගත් බවත් අධ්‍යයනය තුළින් අවධාරණය කෙරේ.

---

[21] H. Wijewardhana, 'Structure and Growth Performance of Small Industry in Sri Lanka'. University of Wollongong, Australia. 1989.

[22] A.Pushpanathan, 'The Role of Small and Medium Scale Industries in an Emerging Economyof Sri Lanka'. Research Gate, 2015.

03. අධ්‍යයන ක්‍රමවේදය

පර්යේෂණ අරමුණු පෙරදැරි කරගෙන කුඩා පරිමාණ නිමවුම් කර්මාන්ත වර්ධනය යන පර්යේෂණ මාතෘකාවට අදාළව ප්‍රාථමික හා ද්විතීයික යන දත්ත වර්ග දෙකම මෙම අධ්‍යයනය සඳහා යොදා ගත් අතර ප්‍රාථමික දත්ත රැස්කිරීම සඳහා ව්‍යුහගත හා ව්‍යුහගත නොවන ප්‍රශ්න 17කින් සමන්විත ප්‍රශ්නාවලියක් භාවිතා කරන්නට විය. එහිදී ශ්‍රී ලංකාවේ කුලියාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිර කලාපය තුළ ග්‍රාම සේවා වසම් 45ක් පමණ පවතින අතර එහි කුඩා පරිමාණ නිමවුම් කර්මාන්ත ලියාපදිංචි ලැයිස්තුවට අනුව ආසන්න වශයෙන් ව්‍යාපාරික ආයතන 185ක් පමණ ඇතුළත් වේ. ඉන් 2014 වර්ෂයට පෙර ලියාපදිංචි වී ඇති ව්‍යාපාරික ආයතන 60කින් යුත් නියැදියක් ලියාපදිංචි ලැයිස්තුවෙන් සරල සසම්භාවී නියැදීම යටතේ තෝරාගෙන ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා මඟින් ප්‍රාථමික දත්ත රැස්කරන ලද අතර අධ්‍යයනය සඳහා අවශ්‍ය ද්විතියික දත්ත රැස්කිරීමේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දත්ත, ග්‍රාමසේවා කාර්යාලීය දත්ත, මහබැංකු වාර්තා,කුඩා පරිමාණ නිමවුම් කර්මාන්ත වර්ධනය සම්බන්ධයෙන් වූ පර්යේෂණ ලිපි, සඟරා ආදිය පරිශීලනය කරන ලදි.

- **ආනුභවික රාමුව**

පූර්ව අධ්‍යයනයන්ට අනුව කුඩා පරිමාණ නිමවුම් කර්මාන්ත වර්ධනය සඳහා බලපාන සාධක පිළිබඳව අධ්‍යයනය කිරීමේදී විවිධ ක්‍රමවේද භාවිතා කර ඇති බව සාහිත්‍ය විමර්ශනය මඟින් ගම්‍ය වේ. එහිදී සුක්ෂම හා කුඩා පරිමාණ කර්මාන්ත වර්ධනය සඳහා බලපාන සාධක[23] , සුක්ෂම හා කුඩා පරිමාණ කර්මාන්තවල වර්ධනය[24] , කුඩා පරිමාණ ආයතන වර්ධනය සඳහා බලපාන නිර්ණායක[25], කුඩා

[23] F.O. Afande, 'Factors Influencing Growth of Small and Microenterprises in Neirobi Central Business District', 2015. An international peer-reviewed journal.Vol.9, pp.104-134.

[24] M. A.Pherson,'Growth of Micro and Small Enterprises in Southern Africa'.Journal of Development Economics. 1994.Vol. 48, pp. 253-277.

[25] Voulgaris, F. Asteriou, D. and Agiomirgianakis, G. 'The Determinants of Small Firm Growth in the Greek Manufacturing Sector'. Journal of Economic Integration.2003. Vol. 18, No. 4, pp. 817-836.

කර්මාන්ත සාර්ථකත්වය සඳහා වන නිර්ණායක[26] ආදී වශයෙන් කුඩා පරිමාණ කර්මාන්ත වර්ධනය පිළිබඳව විවිධ රටවල් පදනම් කරගනිමින් අධ්‍යයන රැසක් සිදුකර ඇත. එම අධ්‍යයනවලදී දත්ත විශ්ලේෂණය කිරීම සඳහා විස්තරාත්මක ක්‍රමවේදය මෙන්ම ප්‍රමාණාත්මක ක්‍රමවේදයද භාවිතා කර ඇති බව අනාවරණය වේ.

මෙම අධ්‍යයනයේදී තවදුරටත් කුඩා පරිමාණ නිමවුම් කර්මාන්ත වර්ධනය සඳහා බලපාන සාධක පිළිබඳව කුලියාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින් රැස්කර ගත් දත්ත විශ්ලේෂණය කිරීම සඳහා ආර්ථිකමිතික ක්‍රමවේදය යොදාගත් අතර කෙන්යාවේ නයිරෝබි දිස්ත්‍රික්කය පදනම් කරගනිමින් අෆන්ඩ්[27] විසින් සිදුකළ අධ්‍යයනය ඒ සඳහා පූර්වාදර්ශ විය. ඒ අනුව මෙම අධ්‍යයනයේදී අඩුතම වර්ග නිමනිත ක්‍රමය (Ordinary Least Squares) භාවිතා කරමින් බහුගුණ ප්‍රතිපායන ආදර්ශයක් දත්ත විශ්ලේෂණය සඳහා යොදා ගන්නට විය. එසේම අධ්‍යයන ප්‍රතිඵල Stata 12 මෘදුකාංගය භාවිතා කොට ලබාගෙන ඇත. එම බහුගුණ ප්‍රතිපායන ආදර්ශය පහත ආකාර වේ.

$$yi = \beta 0 + \beta 1X1i + \beta 2X2i + \beta 3X3i + \beta 4D1i + \beta 5D2i + \beta 6D3i + Ui$$

අධ්‍යයන විචල්‍යන් හැඳින්වීම

Y = ව්‍යාපාරික ආයතනයේ වර්ධනය
i = නියැදි ඒකක
X_1 = ව්‍යාපාරික ආයතනය වාර්ෂිකව ලබාගන්නා ණය ප්‍රමාණය
X_2 = ව්‍යාපාරික ආයතනයේ වයස
X_3 = ව්‍යාපාරික ආයතනය හිමිකරුගේ අධ්‍යාපන මට්ටම
D_1 = ව්‍යාපාරික ආයතනය හිමිකරුගේ ස්ත්‍රී පුරුෂ භාවය
D_2 = ව්‍යාපාරික ආයතනය හිමිකරුගේ වෘත්තීය පුහුණුව
D_3 = ව්‍යාපාරික ආයතනය භාවිතා කරන තාක්ෂණය
U = දෝෂ පදය

[26]O.G. Dayarathna-Banda, and J.G.Sri Ranjith,'Deteminants of Success of Small Business: A Survey-Based Study in Kuliyapitiya Divitional Secretariat of Sri Lanka'. International Journal of Business and Social Research.2014.Vol.4, No.6, pp.38-50.

[27] F.O. Afande, 'Factors Influencing Growth of Small and Microenterprises in Neirobi Central Business District', 2015. An international peer-reviewed journal.Vol.9, pp.104-134.

- ව්‍යාපාරික ආයතනයේ වර්ධනය : ව්‍යාපාරික ආයතනයක වර්ධනය යනු එම ආයතනයේ මාසිකව හෝ වාර්ෂිකව හෝ සිදුවන ලාභය ඉහළ යාමක් හෝ අදායම ඉහළ යාමක් ලෙස සරලව අර්ථ දැක්විය හැකිය. එසේම කිසියම් ව්‍යාපාරික ආයතනයක වර්ධනය මිනුම් කිරීම සඳහා ආයතනයේ ලාභය, ආයතනයේ විකුණුම් ආදායම, ආයතනයේ සේවක සංඛ්‍යාව සහ ආයතනයේ භෞතික ප්‍රසාරණය යනාදීය පොදුවේ භාවිතා කෙරෙන මිනුම් ලෙස හඳුනාගත හැකිය. ඒ අනුව මෙම අධ්‍යනය තුළදී ව්‍යාපාරික ආයතනයේ වර්ධනය මිනුම් කිරීම සඳහා ආයතනයේ වාර්ෂික ලාභය භාවිතා කෙරේ.
- ව්‍යාපාරික ආයතනය වාර්ෂිකව ලබාගත් ණය ප්‍රමාණය:මෙහිදී 2014 හා 2015 යන වසර දෙක තුළ අදාළ කර්මාන්තය (විධිමත් හා අවිධිමත් ණය ලෙස නොසලකා) විසින් වාර්ෂිකව ලබාගත් ණය ප්‍රමාණය අදහස් කෙරේ. ණය ප්‍රමාණය රුපියල්වලින් මිනුම් කෙරේ.
- ව්‍යාපාරික ආයතනයේ වයස: මෙහිදී ව්‍යාපාරික ආයතනය ආරම්භ කර 2015 වසර වන විට වසර සංඛ්‍යාව අදහස් කෙරේ. එය අවුරුදු ගණන මඟින් මිනුම් කෙරේ.
- ව්‍යාපාරික ආයතනය හිමිකරුගේ අධ්‍යාපන මට්ටම: අධ්‍යාපන මට්ටම ප්‍රාථමික, ද්විතියික හා තෘතික වශයෙන් වර්ගීකරණය කළ හැකි අතර මෙහිදී ව්‍යාපාරික ආයතනයේ වර්ධනය සඳහා හිමිකරුගේ අධ්‍යාපන මට්ටම මඟින් සිදුවන බලපෑම සැලකීමේදී අධ්‍යාපන මට්ටම මිනුම් කිරීම සඳහා අධ්‍යාපනය ලැබූ වසර ගණන සැලකිල්ලට ගැනේ.
- ව්‍යාපාරික ආයතනය හිමිකරුගේ ස්ත්‍රී පුරුෂ භාවය: ව්‍යාපාරයේ හිමිකරු ස්ත්‍රියක්ද පුරුෂයෙක්ද යන්න මෙයින් අදහස් කෙරේ. මෙහිදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන්න ගුණාත්මක විචල්‍යක් වන අතර එය අනුව්‍යාජ විචල්‍යයක් ලෙස බහුගුණ ප්‍රතිපායන ආදර්ශයට ඇතුළත් කර ඇත. ඒඅනුව ස්ත්‍රී = 0, පුරුෂ =1 යනුවෙන් අගය ලබාදෙන ලදී.
- ව්‍යාපාරික ආයතනය හිමිකරුගේ වෘත්තීය පුහුණුව:මෙහිදී ව්‍යාපාර හිමිකරුවා විසින් සිය ව්‍යාපාරික කටයුතුවලට අදාළව යම් පාඨමාලාවක් හදාරා තිබේද යන්න අදහස් කෙරේ. මෙහිදීද වෘත්තීය පුහුණුව යන්න ගුණාත්මක විචල්‍යක් වන අතර එය අනුව්‍යාජ විචල්‍යක් ලෙස බහුගුණ ප්‍රතිපායන ආදර්ශයට ඇතුළත් කර ඇත. එහිදී, ව්‍යාපාරික ආයතන හිමිකරු

වෘත්තීය පුහුණුවක් ලබා සිටීද නැද්ද යන්න මෙහිදී අදහස් කෙරෙන අතර පිළිතුර ඔව් නම් 1 ක් ද නැත නම් 0 ක් දලෙස අගය ලබා දීමක් සිදුකෙරේ.

- ව්‍යාපාරික ආයතනය භාවිතා කරන තාක්ෂණය: මෙහිදී ව්‍යාපාරික ආයතනය විසින් භාවිතා කරනු ලබන්නේ සාම්ප්‍රදායික තාක්ෂණයද නවීන තාක්ෂණයද යන්න අදහස් කෙරේ. මෙහිදී සාම්ප්‍රදායික තාක්ෂණය ලෙස අර්ථ දක්වනු ලබන්නේ අත් යන්ත්‍ර (අතින් ක්‍රියාකරවන) භාවිතා කරමින් ශ්‍රමය බහුලව භාවිතා කරමින් නිෂ්පාදන කටයුතු සිදුකිරීමයි. නවීන තාක්ෂණය යනුවෙන් මෙහි අර්ථ දැක්වෙන්නේ භූමිතෙල්, පෙට්‍රල් වැනි ඉන්ධන භාවිතයෙන් හෝ විදුලිය භාවිතයෙන් ක්‍රියාකරවන යන්ත්‍ර සූත්‍ර භාවිතා කරමින් ප්‍රාග්ධන සුක්ෂමව නිෂ්පාදන කටයුතු සිදුකිරීමයි. මෙම විචල්‍ය ද ප්‍රමාණාත්මකව මිනුම් කිරීමට නොහැකි හෙයින් අනුව්‍යාජ විචල්‍යක් ලෙස ආදර්ශයට ඇතුළත් කෙරේ. ඒ අනුව සාම්ප්‍රදායික තාක්ෂණය = 0, නවීන තාක්ෂණය = 1 යනුවෙන් අගය ලබාදීමක් සිදුකෙරේ.

නියැදි ඒකක

නියැදි ඒකක යනු සසම්භාවී ලෙස තෝරාගත් 1 සිට60 දක්වා වන කුඩා පරිමාණ නිමවුම් ආයතන සංඛ්‍යාව අදහස් කෙරේ.

දෝෂ පදය

බහුගුණ ප්‍රතිපායන ආදර්ශයේ පරායත්ත විචල්‍ය සඳහා බලපෑම් කරන නමුත් ආදර්ශයේ ඇතුළත් වී නොමැති සියලුම විචල්‍යන්ගේ හැසිරීම නිරීක්ෂණය වේ.

04. ප්‍රතිඵල හා සාකච්ඡා


පළමු අරමුණ : ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ නිමවුම් කර්මාන්තවල වර්ධනයක් පවතියිද යන්න හඳුනා ගැනීම යන අරමුණ යටතේ දත්ත විශ්ලේෂණය

පූර්ව අධ්‍යයන අනුව ලින්ගේසියා[28] (Lingesiya 2012) විසින් සිදුකරන ලද අධ්‍යයනයේදී ශ්‍රී ලංකාව තුළ ආරම්භ වන කුඩා පරිමාණනිමවුම් කර්මාන්තවලින්සියයට68ක් පමණ පළමු වසර 2-5 අතර අසාර්ථක වන බව හඳුනාගෙන ඇත. ඒ අනුව මෙහිදී වර්තමානය වන විට ස්ථාපිත වී පවතින කුඩා පරිමාණ නිමවුම් කර්මාන්තවල තත්ත්වය කෙබඳුද යන්න හඳුනාගැනීම සඳහා එනම් එම කර්මාන්ත ක්‍රමයෙන් වර්ධනය වන්නේද නොඑසේ නම් ක්‍රමයෙන් අසාර්ථක වන්නේද යන්න හඳුනාගැනීම අපේක්ෂා කෙරේ. කුඩා පරිමාණනිමවුම් ආයතන රැසක එකතුවක් කුඩා පරිමාණ නිමවුම් කර්මාන්තය ලෙස හැඳින්විය හැකිය. එසේම කර්මාන්තයේ වර්ධනය යන්න ආයතනවල වර්ධනය මඟින් බිහිවේ. ඒ අනුව ආයතනයක වර්ධනය යනු කිසියම් ආයතනයක සාර්ථකත්වයට අදාළව යම් මිනුමක් මඟින් එහි ක්‍රියාවලිය වැඩිදියුණු වී ඇති බව දැක්වීමක් ලෙස හඳුනාගත හැකිය. එහිදී භාවිතා කරන මිනුම් ලෙස අයභාරය, ලාභය, සේවක සංඛ්‍යාව, වෙළඳපළ කොටස සහ ව්‍යාපාරික ආයතනයේ භෞතික ප්‍රසාරණය යනාදී නිර්ණායක පොදුවේ භාවිතා කෙරේ. මෙම මිනුම්වල ධනාත්මක වෙනසක් ආයතනයේ වැඩිදියුණු වීමක් ලෙස නිගමනය කළ හැක. ඒ අනුව මෙම අධ්‍යයනයේදී කුඩා පරිමාණ නිමවුම් කර්මාන්ත වර්ධනය මිනුම් කිරීම සඳහා ආයතනයේ ලාභය යොදා ගැනේ. එහිදී 2014 හා 2015 යන වර්ෂ දෙකෙහි වාර්ෂික ලාභයන් භාවිතා කරමින් වර්ධන අනුපාතිකයක් ලබා ගැනීම තුළින් ඒ ඒ නිමවුම් ආයතනයේ වර්ධන අනුපාතිකය අනුව ව්‍යාපාර කාණ්ඩ කිරීමක් සිදුකරන ලදී. එහෙයින් නියැදියේ ඇතුළත් දත්ත අනුව කුඩා පරිමාණ නිමවුම් ආයතනවල වර්ධනය පිළිබඳ දළ අදහසක් අංක 4.1 ප්‍රස්ථාර සටහන මඟින් නිරූපණය වේ.

---

[28] Y. Lingesiya, 'Indentifying Factors to Indicate the Business Performance of Small Scale Industries: Evidence from Sri Lanka',Global Journals Inc.(USA),2012.Vol.12.

ප්‍රස්තාර සටහන අංක (4.1) : කුඩා පරිමාණ නිමවුම් ආයතනවල වර්ධනය



මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය 2016

අංක 4.1 ප්‍රස්ථාර සටහනට අනුව නියැදිය තුළ ඇතුළත් සැම ආයතනයක් සතුවම යම් මට්ටමක වර්ධනයක් පවතින බව නිරීක්ෂණය වේ. එනම් නියැදියේ ඇතුලත් නිමවුම් ආයතන අතරින් වැඩි ප්‍රමාණයක් සියයට 10ත් සියයට 15ත් අතර වර්ධන අනුපාතිකයක් සහිත ආයතන වේ. එහි නිරූපණය වන ආයතන සංඛ්‍යාව 18කි. ඇතැම් ආයතන සියයට 35 පමණ වර්ධන වේගයක් පවතින අතර ඇතැම් ආයතන සියයට 5 අඩු වර්ධන වේගයක් පෙන්නුම් කරයි. සමස්තයක් ලෙස සැලකුවිට මෙහි දැක්වෙන ආයතනවල වර්ධන අනුපාතිකයක් පවතින නමුත් එය ඉහළ වර්ධනයක් ලෙස හඳුනාගැනීම අපහසු වුවත් සැම ආයතනයකකම යම් වර්ධනයක් පවතියි. ඒ අනුව නිමවුම් කර්මාන්තවල සැලකිය හැකි මට්ටමක වර්ධනයක් පවතින බව නිරීක්ෂණය කළ හැකිය.

- **දෙවන අරමුණ :**

කුඩා පරිමාණ නිමවුම් කර්මාන්ත වර්ධනය සඳහා බලපාන සාධක හඳුනාගැනීම යටතේ වාර්ෂිකව ලබාගත් ණය ප්‍රමාණය, ව්‍යාපාරික ආයතනයේ වයස, ව්‍යාපාරික ආයතනය හිමිකරුගේ අධ්‍යාපන මට්ටම, ව්‍යාපාරික ආයතනය හිමිකරුගේ ස්ත්‍රී පුරුෂ භාවය, ව්‍යාපාරික ආයතනය හිමිකරුගේ වෘත්තීය පුහුණුව සහ ව්‍යාපාරික ආයතනය භාවිතා කරන තාක්ෂණය යන සාධක මඟින් ආදර්ශයේ ඇතුළත් කර්මාන්ත වර්ධනය යන පරායත්ත විචල්‍ය මත ඇතිකරන බලපෑම කෙබඳුද යන්න හඳුනාගැනීම මෙමඟින් සිදුකර ඇත. එනම් මෙම අධ්‍යයන ප්‍රදේශය තුළ කුඩා පරිමාණ නිමවුම් කර්මාන්ත වර්ධනය සඳහා උක්ත සඳහන් සාධක අතරින් කුමන

සාධක වෙසෙසි බලපෑමක් ඇතිකරන්නේද යන්න අධ්‍යයනය කිරීම මෙහිදී සිදුකරන ලදී. පුර්ව අධ්‍යයනයන්ට අනුව ඒ ඒ අධ්‍යයන ප්‍රදේශය හෝ රට අනුව උක්ත සඳහන් සාධක මඟින් කුඩා පරිමාණ නිමවුම් කර්මාන්ත වර්ධනයට සිදුකරන බලපෑම විවිධත්වයෙන් යුක්ත විය. ඒ අනුව කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නියැදි දත්ත අනුව එම සාධකවල බලපෑම අධ්‍යයනය කිරීම මෙම අරමුණ යටතේ සිදුකරන ලදී.

අංක (4.1) වගුවෙන් දක්වා ඇති ප්‍රතිඵල ලබාගත් බහුගුණ ප්‍රතිපායන ආදර්ශයේ ප්‍රතිඵල ලබාගැනීම සඳහා නිරීක්ෂණ 60ක් යොදාගෙන ඇත. මෙහි දැක්වෙන ප්‍රතිඵල මඟින් කුඩා පරිමාණ නිමවුම් කර්මාන්ත වර්ධනය යන්නෙන් හඳුනාගැනෙන පරායත්ත විචල්‍ය මත වෙසෙසි බලපෑමක් ඇති කරනු ලබන හා වෙසෙසි බලපෑමක් ඇති නොකරන ස්වායත්ත විචල්‍යන් හඳුනාගත හැකිය. සමස්ත ආදර්ශයේ වෙසෙසියාව Prob>Fg ලැබෙන සම්භාවිතා අගයෙන් නිරූපණය කරයි. අධ්‍යයනයේ ප්‍රතිඵල අනුව Prob>F අගය 0.0000 වේ. එනම් එම අගය 0.01ට වඩා කුඩා වන අතර (0.0000<0.01) ආදර්ශය සමස්තයක් ලෙස සියයට 1මට්ටමේදී සංඛ්‍යානමය වෙසෙසි බවක් දක්වයි. එසේම නිර්ණක සංගුණකය (R2) භාවිතා කර ආදර්ශයේ යෝග්‍ය බව (R2) මිනුම් කරයි.ආදර්ශයේ R2 අගය 0ත් 1ත් අතර පිහිටයි. R2 අගය 0 වීමෙන් අදහස් වන්නේ ආදර්ශයේ පරායත්ත විචල්‍ය පැහැදිලි කිරීම සඳහා ආදර්ශය නුසුදුසු බවයි. එනම් ආදර්ශයේ ස්වායත්ත විචල්‍යන් මඟින් පරායත්ත විචල්‍ය විස්තර නොකරන බවයි. එසේම R2 අගය 1 වීමෙන් අදහස් වන්නේ පරායත්ත විචල්‍ය සම්පුර්ණයෙන්ම පැහැදිලි කිරීම සඳහා ආදර්ශය ප්‍රමාණවත් වන බවයි. ආදර්ශය වඩාත් සාර්ථක එකක් ලෙස නිර්ණක සංගුණකයේ අගය 1ට අසන්න වන අවස්ථාවේදී පිළිගනු ලබයි. ඒ අනුව මෙම ආදර්ශයේදී නිර්ණක සංගුණකයේ (R2) අගය 0.7279ක් වන අතර ගලපන ලද නිර්ණක සංගුණකයේ (R-2)අගය 0.6971වේ. නිර්ණක සංගුණකයේ අගය 1ට අසන්න වීම මඟින් ආදර්ශය සාර්ථක එකක් බව හඳුනාගත හැකි වේ. මෙහි R2 = 0.7279 වීම තුළ ආදර්ශය සඳහා යොදා ගත් ස්වායත්ත විචල්‍යන් මඟින් කුඩා පරිමාණ නිමවුම් කර්මාන්ත වර්ධනය වීම යන පරායත්ත විචල්‍ය සියයට 73කින් විස්තර කරන බව දැක්විය හැකිය.

වගු අංක (4.1) : බහුගුණ ප්‍රතිපායන ආදර්ශයේ ප්‍රතිඵල

Variables	Coefficient	Std. Err.	T Value	P>|t|	[95% Conf. Inerval]	
Credit	.0000232	8.00e-06	2.90	0.005**	7.18e-06	.0000393
Firm age	.2889752	.2286984	1.26	0.212	-.1697357	.747686
Edu. Year	.0408452	.4048419	0.10	0.920	-.7711648	.8528552
Geder	5.365895	2.669933	2.01	0.050*	.0106868	10.7211
Training	5.145844	2.202262	2.34	0.023*	.7286654	9.563022
Technology	7.421491	2.896324	2.56	0.013*	1.612201	13.23078
Cons	3.04163	2.801632	1.09	0.283	-2.577733	8.660992

Number of obs = 60, F(6, 53)= 23.63, Prob > F = 0.0000R-squared = 0.7279 , Adj R-squared = 0.6971

සටහන : ** මගින් 1% සහ * මගින් 5% මට්ටමේදී සංඛ්‍යානමය වෙසෙසි බව දැක්වේ.
මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය 2016


මේ අනුව මෙහිදි කුඩා පරිමාණ නිමවුම් කර්මාන්ත වර්ධනයවීම තීරණය කිරීම සඳහා යොදාගනු ලැබූ විචල්‍යන් වන වාර්ෂිකව ලබා ගත් ණය ප්‍රමාණය (Credit), ආයතනයේ වයස (Firm age), ව්‍යාපාරික ආයතනය හිමිකරුගේ අධ්‍යාපන මට්ටම (Edu.year), ව්‍යාපාරික ආයතනය හිමිකරුගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය (Gender), ව්‍යාපාරික ආයතනය හිමිකරුගේ වෘත්තීය පුහුණුව (Training) සහ ආයතනය භාවිතා කරන තාක්ෂණය (Technology) යන එක් එක් විචල්‍යන් කුඩා පරිමාණ නිමවුම් කර්මාන්ත වර්ධනය වීම සඳහා වෙසෙසි බලපෑමක් ඇති කරන්නේද නැද්ද යන්න මෙහිදී අධ්‍යයනය කිරීම සිදුවේ.

ව්‍යාපාරික ආයතනය වාර්ෂිකව ලබා ගන්නා ණය ප්‍රමාණය

ව්‍යාපාරික ආයතනය වාර්ෂිකව ලබා ගන්නා ණය ප්‍රමාණය රුපියල්වලින් මිණුම් කෙරේ. එහිදී ලබා ගන්නා ණය ප්‍රමාණය ඒකකයකින් වෙනස් වන විට ආයතනයේ ලාභය (ආයතනයේ වර්ධනය) වෙනස්වීමේ ප්‍රමාණය සංගුණකයේ (Coefficient) අගය මඟින් හඳුනාගත හැකිය. අධ්‍යයන ප්‍රතිඵල අනුව වාර්ෂිකව ලබා ගන්නා ණය ප්‍රමාණය ඒකකයකින් වෙනස් වීමේදී ආයතනයේ ලාභය 0.0000232කින් වෙනස් වන බව හඳුනාගත හැකිය. ආදර්ශයේ ප්‍රතිඵල අනුව ව්‍යාපාරික ආයතනය වාර්ෂිකව ලබා ගන්නා ණය ප්‍රමාණය, ව්‍යාපාරික ආයතනයේ වර්ධනය සඳහා 1% මට්ටමේදී වෙසෙසි ධන බලපෑමක් ඇති කරන සාධකයක් බව හඳුනාගත හැකිය. එනම් P>|t| = 0.005යන අධ්‍යයන ප්‍රතිඵලය 0.01ට වඩා අඩුවීම

(0.005<0.01) තුළ එය නිරීක්ෂණය වේ. මේ පිළිබඳව සිදුකර ඇති පූර්ව අධ්‍යයන අනුව අෆන්ඩි[29] විසින් සිදුකරන ලද අධ්‍යයනයේදී ද කුඩා පරිමාණ කර්මාන්ත වර්ධනය කෙරෙහි ණය සඳහා ප්‍රවේශවීම යන සාධකය වෙසෙසි ධන බලපෑමක් පවතින බව හඳුනාගෙන ඇත. එසේම වොල්ගාරිස් ඇතුළු පිරිස[30] විසින් සිදුකළ අධ්‍යයනයට අනුව දිගුකාලින ණය යන සාධකය කුඩා පරිමාණ කර්මාන්ත වර්ධනය සඳහා ධනාත්මකව සම්බන්ධ වන බව අනාවරණය කර තිබේ. මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල සහ පූර්ව අධ්‍යයන ප්‍රතිඵල සමපාත වීමක් හඳුනාගත හැක.

ප්‍රස්තාර සටහන අංක (4.2) : කුඩා පරිමාණ නිමවුම් කර්මාන්තවල ණය සඳහා ප්‍රවේශ වීම



මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය 2016

[29] F.O. Afande, 'Factors Influencing Growth of Small and Microenterprises in Neirobi Central Business District', 2015. An international peer-reviewed journal.Vol.9, pp.104-134.

[30] Voulgaris, F. Asteriou, D. and Agiomirgianakis, G. 'The Determinants of Small Firm Growth in the Greek Manufacturing Sector'. Journal of Economic Integration.2003. Vol. 18, No. 4, pp. 817-836.

අංක 4.2 ප්‍රස්තාර සටහන මඟින් කුඩා පරිමාණ නිමවුම් ආයතන විසින් 2014 සහ 2015 යන වසර දෙකෙහිදී බැංකු මඟින් ණය ලබා ගැනීමට යොමු වී ඇති ප්‍රමාණය දක්ව ඇත. ඊට අනුව නියැදියෙන් සියයට 50ක් ණය ලබාගෙන ඇති අතර සියයට 50ක් ණය ලබා ගැනීමට යොමුවී නොමැත. මෙසේ එලෙස නියැදියෙන් හරි අඩක ප්‍රමාණයක් ආයතන ණය ලබා නොගැනීමට හේතුව ඔවුන්ට තම ව්‍යාපාරික කටයුතු සඳහා ණය මුදල් අනවශ්‍ය වීම නොවන බව අධ්‍යයනය තුළින් අනාවරණය විය. එහිදී මූල්‍ය ආයතන විසින් ව්‍යාපාරිකයන් සඳහා ණය මුදලක් නිකුත් කිරීම සඳහා ව්‍යාපාරික ප්‍රජාවගෙන් අපේක්ෂා කරන සුදුසුකම් සපුරාලීමට ඔවුන් අපොහොසත් වීම සහ ණය නිකුත් කිරීමට දීර්ඝ කාලයක් ගතවීම නියැදියේ සියයට 50ක් ණය ලබා නොගැනීමට හේතුවී තිබේ. එසේම ඇතැම් ව්‍යාපාර හිමිකරුවන් අවධානම් දැරීමට පවතින අකමැත්ත නිසාද ණය සඳහා යොමු නොවන බව අනාවරණය විය. මූල්‍ය ආයතනවල ණය කොන්දේසි ලිහිල් කරනු ලබයි නම් කුඩා පරිමාණ නිෂ්පාදකයන් මෙයට වඩා ඉහළ ණය ඉල්ලුමක් නිර්මාණය වීමේ විභවතාවයක් පවතී. එසේම නියැදිය තුළ ඇතුළත් ආයතන අවිධිමත් අංශයෙන් ණය ලබාගැනීමට යොමුවී නොමැතිවීම ද විශේෂත්වයකි.

- **ව්‍යාපාරික ආයතනයේ වයස**

ප්‍රතිපායන ආදර්ශයේ ප්‍රතිඵලවලට අනුව ව්‍යාපාරික ආයතනයේ වයස යන සාධකය කර්මාන්ත වර්ධනයට ධනාත්මකව බලපෑම් කරන බව හඳුනාගත්ත දවෙසෙසි ධන බලපෑමක් පවතින බවක් හඳුනාගත නොහැකි විය. ඉන් ගම්‍ය වන්නේ ආයතනයේ වයස යන්න ආයතනයේ වර්ධනය සඳහා එතරම් වැදගත් නොවන බවයි. එය ව්‍යාපාරික ආයතනයේ වයස යන ස්වායත්ත විචල්‍යයේ සම්භාවිත අගය (P>|t|) 0.212වීම තුළින් එය අනාවරණය වේ. එම අගය සියයට 1 හෝ සියයට 5 හෝ සියයට 10 යන මට්ටම් එකක් යටතේ හෝ වෙසෙසි බලපෑමක් ඇති නොකරන විචල්‍යකි. එනම් ලැබී ඇති ප්‍රතිඵල අනුව කුඩා පරිමාණ නිමවුම් කර්මාන්ත වර්ධනය සඳහා ව්‍යාපාරික ආයතනයේ වයස යන සාධකය දුර්වල ධන සම්බන්ධයක් දක්වන බවයි. මෙම ප්‍රතිඵලවලට වෙසෙසිව පියර්සන් (Pherson) විසින් ස්වාසිලන්තය, ලෙසොතෝ, බොස්ට්වානා වැනි දකුණු අප්‍රිකානු රටවල් පදනම් කරගෙන සිදුකර ඇති අධ්‍යයනයේදී කුඩා පරිමාණ කර්මාන්ත වර්ධනය කෙරෙහි ව්‍යාපාරික ආයතනයේ වයස යන සාධකය ඍණාත්මකව බලපෑම් කරන බව හඳුනාගෙන ඇත.

එසේම පාර්ක් ඇතුළු පිරිස (Park et al) විසින් කොරියාවේ සිදුකළ අධ්‍යයනය හා දුන්නේ සහ හුගාස් (Dunne and Hughes) විසින් එක්සත් රාජධානිය පදනම් කරගනිමින් සිදුකළ අධ්‍යයනය මඟින්ද කුඩා පරිමාණ කර්මාන්ත වර්ධනය කෙරෙහි ව්‍යාපාරික ආයතනයේ වයස යන සාධකය ඍණාත්මකව බලපාන බව හඳුනාගනීයි. නමුත් මෙම අධ්‍යයනයේදී ආයතනයේ වයස කර්මාන්ත වර්ධනය සඳහා වෙසෙසි බලපෑමක් සිදු නොකළද ඍණ බලපෑමක් සිදු කරන බව නිරීක්ෂණය නොවීය. එය වෙසෙසි නොවන නමුත් ධන බලපෑමක් වේ.


නමුත් යම් ව්‍යාපාරික ආයතනයක් වෙළඳපළ තුළ රැඳී සිටින කාලය වැඩිවන විට එහි වෙළඳපළ කොටස වැඩි වීමට හේතුවන අතර එමඟින් ආයතනයේ ලාභය වැඩිකර ගැනීමට හැකියාවක් පවතින බව සාමාන්‍යයෙන් පිළිගත් අදහස වේ. නමුත් අධ්‍යයන ප්‍රදේශය සැලකීමේදී නිමවුම් කර්මාන්ත ව්‍යාප්තිය අනුව තෝරාගත් පොල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රමුඛ වුවද රෙදිපිළි හා ඇඟලුම්, ප්ලාස්ටික්, මැටි ආශ්‍රිත නිෂ්පාදන, ආහාර හා පාන වර්ග, කොන්ක්‍රීට් නිෂ්පාදන, දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන ආදී ආයතනවල වර්ධනය එනම් ලාභය වැඩිවීම සඳහා ආයතනයේ වයස යන සාධකයට වඩා භාණ්ඩවල ගුණත්වය, මිල, පෞද්ගලික හිතවත්කම් මත අලෙවි කිරීම්, යෙදවුම් සම්පාදනය කරන පාර්ශවය විසින්ම නිෂ්පාදන මිලදී ගැනීම ආදී වූ වෙනත් සාධකවල බලපෑම ප්‍රබලව පවතින බව අනාවරණය විය. ඒ අනුව ආයතනයේ වයස යන්න එහිදී එතරම් වැදගත් නොවන බව ආයතන හිමිකරුවන්ගේ අදහස වේ. ඉහත දක්වන ලද සම්බන්ධතා ජාලය වර්ධනය කිරීම කුඩා පරිමාණ කර්මාන්ත වර්ධනය සඳහා ඉහළ ප්‍රතිඵලයක් නිර්මාණය කරනු ලබන බව මින් ගම්‍ය කෙරේ.

- **ව්‍යාපාරික ආයතනය හිමිකරුගේ අධ්‍යාපන මට්ටම**

ව්‍යාපාරික ආයතනය හිමිකරුගේ අධ්‍යාපන මට්ටම ලෙස පාසල් අධ්‍යාපනය සැලකෙන අතර එය අවුරුදු මඟින් මිනුම් කෙරේ. මෙහිදී ප්‍රතිපායන ආදර්ශයේ ප්‍රතිඵල විශ්ලේෂණයට අනුව ව්‍යාපාරික ආයතනය හිමිකරුගේ අධ්‍යාපන මට්ටම යන ස්වායත්ත විචල්‍ය කුඩා පරිමාණ නිමවුම් කර්මාන්ත වර්ධනය සඳහා වෙසෙසි ධන බලපෑමක් ඇති නොකරන අතර ඉතා දුර්වල ධන සම්බන්ධයක් පවතින බව හඳුනාගත හැකිය. ඒ බව අදාළ විචල්‍යයේ සම්භාවිතා අගය (P>|t|) 0.920 වීම තුළින්

අනාවරණය වේ. එසේම අෆන්ඩි[31] විසින් සිදුකරන ලද අධ්‍යයනයේදී ද කුඩා පරිමාණ කර්මාන්ත වර්ධනය කෙරෙහි ආයතනය හිමිකරුගේ අධ්‍යාපන මට්ටම අනුලෝමව සම්බන්ධ වන බව හඳුනාගෙන ඇති අතර පියර්සන්[32] දකුණු අප්‍රිකානු රටවල් පදනම් කරගෙන සිදුකර ඇති අධ්‍යයනයේදී ද මේ හා සමාන ප්‍රතිඵලයක් ලබාගෙන ඇත. තවද එසියෙන් සහ බලෝන්[33] සිදුකළ අධ්‍යයනය තුළින්ද උක්ත සම්බන්ධය හඳුනාගෙන තිබේ.

ප්‍රස්තාර සටහන අංක (4.4) : කුඩා පරිමාණ නිමවුම් කර්මාන්ත හිමිකරුවන්ගේ අධ්‍යාපන මට්ටම



මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය 2016

[31] F.O. Afande, 'Factors Influencing Growth of Small and Microenterprises in Neirobi Central Business District', 2015. An international peer-reviewed journal.Vol.9, pp.104-134.
[32] M. A.Pherson,'Growth of Micro and Small Enterprises in Southern Africa'.Journal of Development Economics. 1994.Vol. 48, pp. 253-277.
[33] A.E. Essien, and Y.A. Bellon, 'Technical Efficiency of Small and Medium Scale Industries (smi) in Nigeria: Evidence from nation-wide sample survey'.Studia Universitatis Babeş-Bolyai, Negotia,2007.Lii, 2, pp.40-69.

ප්‍රස්තාර සටහන අංක (4.4) දැක්වෙන ආකාරයට අධ්‍යයනය තුළ කුඩා පරිමාණ නිමවුම් කර්මාන්ත හිමිකරුවන් බහුතරයක් ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපන මට්ටම්වල පසුවේ. එසේම ආයතනයේ වර්ධනය සඳහා හිමිකරුගේ අධ්‍යාපන මට්ටම එතරම් වැදගත් නොවන බව හඳුනාගෙන ඇත.මන්ද අධ්‍යයන ප්‍රදේශයට අනුව එම ප්‍රදේශයේ සුලභ කර්මාන්ත අතරින් ඇගළුම්, ආහාර හා පාන වර්ග, පොල් ආශ්‍රිත නිෂ්පාදන ආදී නිමවුම් කර්මාන්ත සඳහා ඔවුන් යොමුවී ඇත්තේ තම අත්දැකීම් මත බව අධ්‍යයනය මඟින් අනාවරණය වූ කරුණකි. එසේම ඇතැම් කර්මාන්ත, විශේෂයෙන්ම දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන, කොන්ක්‍රීට් නිෂ්පාදන මෙන්ම මැටි ආශ්‍රිත නිෂ්පාදන සඳහා යොමුවීමට මුලික වී ඇත්තේ ඔවුන්ගේ සහජ හැකියාවන් බවද තවදුරටත් අනාවරණය විය.


- **ව්‍යාපාරික ආයතනය හිමිකරුගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය**

ව්‍යාපාරික ආයතනය හිමිකරුගේ ස්ත්‍රී පුරුෂ භාවය යන විචල්‍යය අනුව්‍යාජ විචල්‍යයක් ලෙස ප්‍රතිපායන ආදර්ශයට ඇතුළත් කරන ලදි. මෙහිදී පුරුෂ යන්න 1 ලෙසද ස්ත්‍රී යන්න 0 ලෙසද අගය ලබාදී ඇත. ප්‍රතිපායන ආදර්ශයේ ප්‍රතිඵල අනුව ඉන් අදහස් වන්නේ ස්ත්‍රියකට සාපේක්ෂව ආයතන හිමිකරුවා පුරුෂයෙකු වීමේදී කුඩා පරිමාණ නිමවුම් කර්මාන්ත වර්ධනය 5.365895කින් වෙනස් වන බව සංගුණකය(Coefficient) මඟින් අදහස් වේ. එසේම මෙම විචල්‍යය සියයට 5මට්ටමේදී වෙසෙසි ධන බලපෑමක්, කුඩා පරිමාණ නිමවුම් කර්මාන්ත වර්ධනය මත ඇතිකරන බව සම්භාවිතා අගය (P>|t|) 0.050 වීම තුළින් ගම්‍ය වේ. එසේම පියර්සන්[34] දකුණු අප්‍රිකානු රටවල් පදනම් කරගෙන සිදුකර ඇති අධ්‍යයනයේදී කුඩා පරිමාණ කර්මාන්ත වර්ධනය කෙරෙහි ව්‍යාපාරික ආයතනය හිමිකරුගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය ධනාත්මකව බලපාන බව අනාවරණය කෙරේ. මෙහිදී ක්ෂේත්‍ර අධ්‍යයනයේ දත්ත අනුව ව්‍යාපාරික ආයතන හිමිකාරිත්වය අංක 4.5 ප්‍රස්තාර සටහනේ දැක්වෙන පරිදි ඉදිරිපත් කළ හැකිය.

---

[34] M. A.Pherson,'Growth of Micro and Small Enterprises in Southern Africa'.Journal of Development Economics. 1994.Vol. 48, pp. 253-277.

ප්‍රස්තාර සටහන අංක (4.5) : කුඩා පරිමාණ නිමවුම් කර්මාන්තවල හිමිකාරිත්වය



මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය 2016

අධ්‍යයනයට අනුව ආයතනයේ හිමිකරුගේ ස්ත්‍රී පුරුෂ භාවය එහි වර්ධනය කෙරෙහි වෙසෙසි ධන බලපෑමක් ඇති කරන ලදී. එනම් ස්ත්‍රියකට සාපේක්ෂව පුරුෂයෙකු ආයතනයේ හිමිකරු වන විට අදාළ ආයතනයේ වර්ධනය ඉහළ බවයි. ප්‍රස්තාර සටහන් අංක (4.5) මඟින් ආයතනයේ හිමිකාරිත්වය පිළිබඳ ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවය අතර සැසඳීමක් කළ අතර ඒ අනුව ආයතන හිමිකාරිත්වය වැඩි වශයෙන් පුරුෂ පාර්ශවය සතුවේ. එම අගය සියයට 80ක් වැනි ඉහළ මට්ටමක් ගන්නා නමුත් ස්ත්‍රීන් සතු හිමිකාරිත්වය සියයට 20ක් වැනි කුඩා අගයක් ගනී. මෙම තත්ත්වය සඳහා බලපාන ප්‍රධාන සාධකයක් ලෙස විවාහක කාන්තාවකට පවුල තුළ පවතින වගකීම් මෙන්ම සමාජ සංස්කෘතික තත්වයන් දැක්විය හැකිය. එසේම අධ්‍යයනයට ලක් වූ ප්‍රදේශයේ කර්මාන්තවල ස්වාභාවයද මේ සඳහා බලපෑමක් කළ හැකිය. විශේෂයෙන්ම කාන්තා සහභාගිත්වය පහළ අගයක් ගැනීම පිළිබඳව අවධානය යොමුකිරීම ඉදිරි අධ්‍යයන සඳහා සැලකිය යුතු අවකාශයක් නිර්මාණය කර ඇත. විජයකුමාර්[35] විසින් සිදුකරන ලද අධ්‍යයනයට අනුව කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්තවල කාන්තා සහභාගිත්වය ඉතා අඩු අගයක් ගන්නා බවත් අධ්‍යයනයට භාජනය වූ දිස්ත්‍රික්ක දෙක තුළ සියයට 88ක් පුරුෂ පක්ෂය විසින් කුඩා හා මධ්‍යම


[35] S.Vijayakumar, O. Brezinora, and M. Sedlacek,'The Status and Growth of Small and Medium Enterpricess in Sri Lanka'. 2012.

පරිමාණ කර්මාන්ත ක්‍රියාත්මක කරන බවත් හඳුනාගෙන ඇති අතර එම අධ්‍යයන ප්‍රතිඵල මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල සමඟ සමපාත වේ.

- **වෘත්තීය පුහුණුව**

ව්‍යාපාර හිමිකරුවා විසින් තමා නියැලී සිටින කර්මාන්තයට අදාළව යම් පුහුණුවක් ලබා තිබේද යන්න මින් අදහස් කෙරේ. වෘත්තීය පුහුණුව යන සාධකය අනුව්‍යාජ විචල්‍යයක් ලෙස ප්‍රතිපායන ආදර්ශය තුළ අන්තර්ගත වේ. එහිදී වෘත්තීය පුහුණුව නොලැබූ පුද්ගලයෙකුට සාපේක්ෂව පුහුණුව ලැබූ පුද්ගලයෙකු ආයතනයේ හිමිකරුවා වන විට ව්‍යාපාරික ආයතනයේ වර්ධනය කෙසේ වේද යන්න මින් අදහස් කෙරේ. ප්‍රතිඵල අනුව වර්ධනය 5.145844 කින් වෙනස් වන බව සංගුණකය (Coefficient) මඟින් දැක්වේ. එසේම කුඩා පරිමාණ නිමවුම් කර්මාන්ත වර්ධනය කෙරෙහි හිමිකරුගේ වෘත්තීය පුහුණුව යන සාධකය සියයට 5 මට්ටමේදී වෙසෙසි ධන බලපෑමක් පවතින බව දැක්විය හැකිය (0.025<0.05). පාසල් අධ්‍යාපනයේදී වෘත්තීය පුහුණු නොලැබුණද සලකා බලන කර්මාන්තය සඳහා සුවිශේෂී පුහුණුවක් ලබාදීම වියහැක. පරම්පරාවෙන් හෝ අත්දැකීමෙන් පුහුණුව ලැබූ කුඩා පරිමාණ නිෂ්පාදකයන් වුවද වෘත්තීය පුහුණුව ලැබීමෙන් පසු ගුණාත්මක බැවින් ඉහළ භාණ්ඩ නිපදවීම මඟින් අනෙකුත් සමජාතීය නිෂ්පාදන සමඟ සාර්ථකව තරඟ කිරීමටත් ඒ තුළින් වෙළඳපළ කොටස පුළුල් විමට හේතුවේ.

ප්‍රස්තාර සටහන අංක (4.6) : කුඩා පරිමාණ නිමවුම් කර්මාන්තවල වෘත්තීය පුහුණුව



මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය 2016


අධ්‍යයනයට අනුව වෘත්තීය පුහුණුව යන සාධකය කුඩා පරිමාණ නිමවුම් ආයතන වර්ධනය කෙරෙහි වෙසෙසි ධන බලපෑමක් ඇති කරන ලදී. එනම් ආයතන හිමිකරුවා තම නියැලී සිටින කර්මාන්තයට අනුබද්ධ වන යම් වෘත්තීය පුහුණුවක් ලබා තිබීම අදාළ ආයතනයේ වර්ධනය සඳහා හේතුවන බවයි. අංක (4.6) රූප සටහන මඟින් ආයතනයේ හිමිකරුවා වෘත්තීය පුහුණුවක් ලබා තිබීම හා වෘත්තීය පුහුණුවක් ලබා නොතිබීම අතර සැසඳීමක් කළ අතර කුඩා පරිමාණ නිමවුම් ආයතනවල හිමිකරුවන්ගෙන් වැඩි සංඛ්‍යාවක් වෘත්තීය පුහුණුවක් ලබාගෙන නොමැති බව හඳුනාගත හැකිය. එනම් සියයට වැනි ප්‍රමාණයක් වෘත්තීය පුහුණුවක් ලබා නොගෙන සිය අද්දැකීම් සහ සහජ හැකියාවන් මත නිෂ්පාදන සිදුකරන බවත් සියයට වැනි අඩු හිමිකරුවන් සංඛ්‍යාවක් වෘත්තීය පුහුණුවක් ලබාගෙන ඇති බවයි. නමුත් අධ්‍යයනයේ ප්‍රතිඵල අනුව වෘත්තීය පුහුණුවක් ලබා නොගත් පුද්ගලයෙකුට සාපේක්ෂව වෘත්තීය පුහුණුවක් ලබා ගත් පුද්ගලයෙකු ආයතනයේ හිමිකරු වීම තුළ එවැනි ආයතනවල ඉහළ වර්ධනයක් පවතින බව නිගමනය කළ හැකිය. එහෙයින් තවදුරටත් වෘත්තීය පුහුණුව ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සැපයීම කුඩා කර්මාන්ත වර්ධනයට හේතු වන බව ගම්‍ය වේ.

- **ආයතනය භාවිතා කරන තාක්ෂණය**

ව්‍යාපාරික ආයතනය නිෂ්පාදන ක්‍රියාවලියේදී භාවිතා කරනු ලබන්නේ සාම්ප්‍රදායික තාක්ෂණයද නූතන තාක්ෂණය ද යන්න මෙයින් අදහස් වේ. මෙහිදී තාක්ෂණය යන්න ගුණාත්මක විචල්‍යයක් වන හෙයින් එය අනුව්‍යාජ විචල්‍යයක් ලෙස ප්‍රතිපාදන ආදර්ශය තුළට ඇතුළත් කෙරේ. එහිදී සාම්ප්‍රදායික තාක්ෂණය භාවිතා කිරීමට සාපේක්ෂව නූතන තාක්ෂණය භාවිතා කරන විට ව්‍යාපාරික ආයතනයේ වර්ධනය 7.421491කින් වෙනස් වන බවයි. එසේම මෙම විචල්‍යය සියයට 5 මට්ටමේදී නිමවුම් කර්මාන්ත වර්ධනය සඳහා වෙසෙසි ධන බලපෑමක් ඇති කරන බව ඉන් ගම්‍ය වේ. එහිදී තාක්ෂණය යන විචල්‍යයේ සම්භාවිතා අගය (P>|t|) 0.013ක් වීම තුළින් ඒ බව හඳුනාගත හැකිය. මේ පිළිබඳව සිදුකරන ලද පූර්ව අධ්‍යයන අනුව කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත වර්ධනය තාක්ෂණය යන

සාධකය ඉතා වැදගත් වන බව එසියෙන් සහ බලෝන්[36] විසින් සිදුකළ අධ්‍යයනයේදීත් නාරායන්[37] විසින් සිදුකරන ලද අධ්‍යයනය මඟින්ද ගමගේ (Gamage 2003) විසින් සිදුකරන ලද අධ්‍යයනය තුළින්ද අනාවරණය කර ඇත. පූර්ව අධ්‍යයන ප්‍රතිඵල සමඟ මෙම අධ්‍යයනයේ ප්‍රතිඵලද සමපාත වේ. විශේෂයෙන්ම නූතන තාක්ෂණය කර්මාන්තයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට සෘජුවම හේතුවේ. එසේම නිමැවුම්වල ගුණාත්මක බව මෙන්ම සැපයුම් මට්ටම ස්ථාවරව සහ අඛණ්ඩව පවත්වාගෙන යාමටද හේතුවේ.

ප්‍රස්තාර සටහන අංක (4.7) : කුඩා පරිමාණ නිමවුම් ආයතනවල තාක්ෂණය



මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය 2016

කුඩා පරිමාණ නිමවුම් ආයතන විසින් නිෂ්පාදන ක්‍රියාවලියේදී භාවිතා කරන ලද තාක්ෂණය කෙබඳුද යන්නත් එමගින් ආයතන වර්ධනය කෙරෙහි සිදුකෙරෙන බලපෑම පිළිබඳවත් මෙම අධ්‍යයනය තුළින් අධ්‍යයනයට ලක්කළ අතර සාම්ප්‍රදායික තාක්ෂණයට සාපේක්ෂව නූතන තාක්ෂණය භාවිතා කිරීම මඟින් කුඩා පරිමාණ කර්මාන්ත වර්ධනය සඳහා ප්‍රබල බලපෑම් කෙරෙන බව අනාවරණය විය. නමුත් මෙම අධ්‍යයනය සඳහා භාවිතා කළ නියැදියෙහි ඇතුළත් නිමවුම් ආයතන අතරින්

---

[36] A.E. Essien, and Y.A. Bellon, 'Technical Efficiency of Small and Medium Scale Industries (smi) in Nigeria: Evidence from nation-wide sample survey'.Studia Universitatis Babeş-Bolyai, Negotia,2007.Lii, 2, pp.40-69.

[37] M.R.Narayan, 'Determinants of Competitiveness of Small-Scale Industries in India.'The Journal of Business in Developing Nation.2004.Vol.8, pp. 94-142.

සියයට 57වැනි ඉහළ ප්‍රමාණයක් සිය නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා සාම්ප්‍රදායික තාක්ෂණය භාවිතා කරන බව අංක (4.7) ප්‍රස්තාර සටහන මඟින්පෙන්වා දිය හැකිය.

05. සාරාංශය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පදනම් කර ගනිමින් සිදුකරන ලද මෙම අධ්‍යයනයේ දී කුඩා පරිමාණ නිමවුම් කර්මාන්ත වර්ධනය සඳහා බලපාන සාධක හඳුනාගැනීමට අපේක්ෂා කරන ලදී. ව්‍යාපාරික ආයතනයේ වර්ධනය යන්න ප්‍රතිපායන ආදර්ශයේ පරායත්ත විචල්‍යය ලෙස යොදාගෙන ඇත. එහිදී ව්‍යාපාරික ආයතනයේ වර්ධනය යන්න මිනුම් කිරීම සඳහා ලාභය යන නිර්ණායකය භාවිතා කරන ලදී. එහිදී 2014 හා 2015 යන වසර දෙකෙහිදී ඒ ඒ ව්‍යාපාර ආයතනයේ වාර්ෂික ලාභය අනුව වර්ධන අනුපාතිකයක් ලබාගැනීම තුළ නියැදියේ ඇතුළත් සෑම ආයතනයකම අඩු වැඩි වශයෙන් වර්ධන අනුපාතිකයක් පවතින බව හඳුනාගැනීමට හැකියාව ලැබුණි. එසේම ප්‍රතිපායන ආදර්ශයේ ප්‍රතිඵල අනුව සමස්තයක් ලෙස නියැදිය තුළ ඇතුලත් වූ නිමවුම් ආයතනවල වර්ධනයක් පවතින බව නිගමනය කළ හැකිය.

කුඩා පරිමාණ නිමවුම් ආයතන හිමිකරුවන් තම ව්‍යාපාරික කටයුතු සිදුකිරීමේදී නිබඳවම කාරක ප්‍රාග්ධන අපහසුතාවයන්ට මුහුණදේ. කාරක ප්‍රාග්ධන හිඟයට විසඳුමක් ලෙස ඔවුන් ණය ලබාගැනීමට යොමුවේ. නියැදියෙන් සියයට 50ක පිරිසක් පමණක් විධිමත් අංශයෙන් ණය පහසුකම් ලබාගෙන ඇත. ඇතැම් කුඩා පරිමාණ ආයතන හිමිකරුවන් ආයතනයේ කටයුතු සඳහා කිසිදු අංශයකින් ණය ගැනීමට යොමු වී නැත. ඇතැම් කුඩා පරිමාණ ව්‍යාපාරිකයන් යෙදවුම් සම්පාදකයන් හා නිමවුම් මිලදී ගන්නන් අතර ඉතා කෙටිකාලීන (දින 2ක් හෝ 3ක්) ණය ශේෂ පවත්වා ගනිමින් ක්‍රියාත්මක වන තත්වයක්ද හඳුනාගැනීමට හැකි විය. මේ සඳහා ඔවුනොවුන් අතර පවතින විස්වාසවන්ත බව ප්‍රබල සාධකයක් වී තිබේ. කෙසේ නමුත් අඩු පොලී අනුපාතිකයක් යටතේ විධිමත් අංශයෙන් ණය පහසුකම් ලබා ගැනීම මඟින් කුඩා පරිමාණ නිමවුම් ආයතන වර්ධනය සඳහා ධනාත්මකව බලපාන බව හඳුනාගතහැකිය. එහෙයින් රජයේ සහ පෞද්ගලික මැදිහත්වීම මඟින් කුඩා

පරිමාණ කර්මාන්ත සඳහා ණය ලබාගැනීමට තවදුරටත් පහසුකම් සැපයීම ඵලදායී වනු ඇත.

තවද කුඩා පරිමාණ ආයතනවල වයස යන්න එම ආයතන වර්ධනය සඳහා දුර්වල ධන බලපෑමක් පවතින බව අනාවරණය විය. එහිදී ආයතනවල වර්ධනය එනම් ලාභය වැඩිවීම සඳහා ආයතනයේ වයස යන සාධකයට වඩා භාණ්ඩවල ගුණාත්මක බව, මිල, පෞද්ගලික හිතවත්කම් මත නිර්මාණය වී ඇති අලෙවි දාමයන් සහ යෙදවුම් සම්පාදනය කරන පාර්ශවය විසින්ම නිෂ්පාදන මිලදී ගැනීම ආදී වූ වෙනත් සාධකවල බලපෑම ප්‍රබලව පවතින බව අනාවරණයවිය. එහෙයින් නිෂ්පාදනවල ගුණාත්මක බව ඉහළ නැංවීමට අවශ්‍ය පහසුකම් සැලසීම, පෞද්ගලික හිතවත්කම් මත නිර්මාණය වී ඇති අලෙවි දාමයන් තවදුරටත් ශක්තිමත් කිරීම ආදිය මඟින් නව ආයතනවලටද ඉහළ වර්ධනයක් කර ගමන් කළ හැකි බව ගම්‍ය වේ. එනම් සමාජ ආර්ථික ඉදිරි හා පසුපස සම්බන්ධතා ජාලය ශක්තිමත් කිරීම වඩා ඉහළ ප්‍රතිඵල ලබාදෙන බව මින් පැහැදිලි වේ.

අධ්‍යාපනය ලැබීම තුළින් පුද්ගලයන්ගේ මානව ප්‍රාග්ධනය ඉහළයාමට හේතුවේ. නමුත් පාසල් හා විශ්වවිද්‍යාල අධ්‍යාපනය තුළ කර්මාන්ත අංශය පිළිබඳ මූලික පුහුණු පාඨමාලා ඇතුලත් නොවීම තුළ අධ්‍යාපන මට්ටම යන සාධකය කර්මාන්ත වර්ධනය කෙරෙහි ප්‍රබලව බලපෑම් ඇති නොකිරීමට හේතුවක් වී තිබේ.

ස්ත්‍රියකට සාපේක්ෂව පුරුෂයෙකු ආයතනයේ හිමිකරුවා වීම තුළ ආයතනයේ වර්ධනය සඳහා වෙසෙසි බලපෑමක් ඇති කරන බව අධ්‍යයන ප්‍රතිඵල අනුව හඳුනාගත හැකිය. එසේම අධ්‍යයනයට භාජනය වූ කුඩා පරිමාණ කර්මාන්ත ස්වභාවය බොහෝ දුරට කාන්තා ව්‍යවසායකත්වයෙන් බැහැර වූ කර්මාන්ත වේ.

කුඩා පරිමාණ නිමවුම් ආයතනවල හිමිකරුවන් සිය ව්‍යාපාරික කටයුතුවලට අදාළව වෘත්තීය පුහුණුවක් ලබාගැනීම තුළ එය කර්මාන්තයේ වර්ධනය සඳහා වෙසෙසි ධන බලපෑමක් ඇතිකරන බව අධ්‍යයනය මඟින් අනාවරණය විය. නියැදිය තුළ ඇතුළත් කුඩා පරිමාණ නිමවුම් ආයතන හිමිකරුවන්ගෙන් වැඩි පිරිසක් පරම්පරාවෙන් හෝ අත්දැකීමෙන් හෝ සහජ හැකියාවන් මත සිය නිෂ්පාදන කටයුතු සිදුකරන බව අධ්‍යයනය මඟින් හඳුනාගත හැකිය. රජය මැදිහත්වීමෙන් කුඩා පරිමාණ නිෂ්පාදකයන් සඳහා ක්‍රමවත් පුහුණු සහ උපදේශන වැඩසටහන් සඳහා

පහසුකම් සැපයීම එම කර්මාන්ත වර්ධනය සඳහා ඉතා වැදගත් වන බව නිගමනය කළ හැකිය.

ආයතනයක නිෂ්පාදන ක්‍රියාවලියේදී තාක්ෂණය භාවිතා කිරීම මඟින් ශ්‍රමයේ ඵලදායිතාවය ඉහළ යාමක් සිදුවේ. එවිට කාර්යක්ෂම ලෙස නිෂ්පාදන සිදුකිරීමටත් අතිරික්ත බිහිකිරීමටත් එම ආයතනවලට හැකියාව ලැබේ. නමුත් ප්‍රාදේශීය වශයෙන් ව්‍යාප්තව පවතින කුඩා පරිමාණ නිමවුම් ආයතනවලින් වැඩි ප්‍රමාණයක සාම්ප්‍රදායික තාක්ෂණය භාවිතා කරනු ඇත. එනම් ශ්‍රම සුක්ෂම නිෂ්පාදන ක්‍රියාවලියක් පවතින බවයි. මෙම අධ්‍යයනයට අනුවද කුඩා පරිමාණ නිමවුම් ආයතනවල නිමවුම් ක්‍රියාවලියේදී නූතන තාක්ෂණයට සාපේක්ෂව සාම්ප්‍රදායික තාක්ෂණය බහුලව භාවිතා කරන බව නිරීක්ෂණය විය. නමුත් සාම්ප්‍රදායික තාක්ෂණය භාවිතා කරන ලද කුඩා පරිමාණ නිමවුම් කර්මාන්තවලට සාපේක්ෂව නූතන තාක්ෂණය භාවිතා කරන ආයතනවලට ඉහළ අතිරික්තයක් බිහි කිරීම සහ ගුණාත්මක නිෂ්පාදන ඉදිරිපත් කිරීම තුළ ඉහළ ආදායම් ඉපයීමට අවකාශය පවතින බව ප්‍රතිඵල මඟින් අනාවරණය විය.

ඒ අනුව කුඩා පරිමාණ නිමවුම් කර්මාන්ත විසින් ණය ලබාගැනීම, ස්ත්‍රී පුරුෂ භාවය, ආයතනය භාවිතා කරන තාක්ෂණය සහ වෘත්තීය පුහුණුව යන ස්වායත්ත විචල්‍ය කුඩා පරිමාණ නිමවුම් කර්මාන්ත වර්ධනය සඳහා වෙසෙසි ධන බලපෑමක් සිදුකරන බව අනාවරණය වේ. නමුත්ආයතන හිමිකරුගේ අධ්‍යාපන මට්ටම සහ ආයතනයේ වයස යන ස්වායත්ත විචල්‍ය කර්මාන්ත වර්ධනය සමඟ ධනාත්මකව සම්බන්ධවුවද කර්මාන්ත වර්ධනය සඳහා එම විචල්‍යන් මඟින් වෙසෙසි ධන බලපෑමක් සිදුනොකරන බව ගම්‍ය වී ඇත.

ශ්‍රී ලංකාවේ දේශීය සහල් මිල තීරණය වීම කෙරෙහි බලපාන සාධක

එම්. බී. රණතිලක

අයි. ඒ. පේ. ඉඹුලාන ආරච්චි

1. හැඳින්වීම

ගෝලීය වශයෙන් මෙන්ම ආසියාතික වශයෙන් ද පොදුවේ සහල් ප්‍රධාන ආහාර ද්‍රව්‍යයකි. ලෝක ජනගහනයෙන් බිලියන 2.4ක් ම තම පෝෂණ අවශ්‍යතාව වෙනුවෙන් සහල් පරිභෝජනය කරති. සහල් තුළින් ඔවුන්ගේ දෛනික කැලරි අවශ්‍යතාවයෙන් සියයට 20කට වඩා වැඩි ප්‍රමාණයක් සපුරාගනු ලැබේ (Lampe, 1995). එසේම IRRI (2013) වාර්තාවට අනුව ගෝලීය ඒක පුද්ගල ශක්ති පරිභෝජනයෙන් 1/4ක් පමණ සහල් පරිභෝජනයෙන් සපයාගත හැකි වේ. Peterson and Warren (1989) සිදුකළ අධ්‍යනයේදී ශ්‍රී ලංකාව ද ඇතුළුව සහල් මූලික ආහාරය වන ආසියාතික රටවල් 14ක් හඳුනාගෙන තිබේ. ඒවා නම් බංගලාදේශය, බුරුමය, චීනය, ඉන්දියාව, ඉන්දුනීසියාව, ජපානය, දකුණු කොරියාව, මැලේසියාව, නේපාලය, පිලිපීනය, සිංගප්පූරුව, ශ්‍රී ලංකාව, තායිලන්තය සහ තායිවානය යනාදිය යි. එසේම ආසියාතික රටවල් ලෝක සහල් නිෂ්පාදනයෙන් සියයට 90ක් නිෂ්පාදනය සහ පරිභෝජනය කරනු ලබයි (ලොකුපතිරගේ 2012).

ලෝක ජනගහනය වර්ධනය වීමට සමාන්තරව 1960 ගණනන්වල ආරම්භවන හරිත විප්ලවය තුළින් නව වී වර්ග හඳුන්වාදීම සහ පොහොර තාක්ෂණය වැඩිදියුණු වීම හේතුකොට ගෙන සහල් නිෂ්පාදන අංශයේ සුවිශේෂී වර්ධනයක් දක්නට ලැබුණි (ලෝක ආහාර සහ කෘෂිකාර්මික සංවිධානය 2012). එසේම පසුගිය දශක දෙකක කාලය තුළ චීනය, මැලේසියාව හා තායිලන්තය වැනි මැදි ආදායම් ලබන රටවල මාංශ සහ එළවළු වැඩි වශයෙන් පරිභෝජනය කර තිබෙන අතර ධාන්‍ය වර්ග අඩුවෙන් පරිභෝජනය කර තිබේ. ඊට සමාන්තරව මෑතකාලීනව ඉන්දියාව, ඉන්දුනීසියාව, වියට්නාමය හා ශ්‍රී ලංකාව වැනි අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින ආසියාතික රටවල ආදායම ඉහළයාමත් සමඟ ඒක පුද්ගල සහල් පරිභෝජනය සෙමින් පහළ බසින තත්වයක් දක්නට ලැබේ (IRRI 2013). නමුත් බංගලාදේශය, කාම්භෝජය, ලාඕසය, මියන්මාරය සහ පිලිපීනය වැනි මධ්‍යම අඩු ආදායම් ලබන ආසියාතික රටවල් බොහොමයක ඒක පුද්ගල සහල් පරිභෝජනය

කාලයත් සමඟ ඉහළ යන තත්වයක් දක්නට ලැබේ. එහේත් මෙම රටවලද ආදායම ඉහළ යාම සමඟ පුද්ගලයන් තම භෝජන රටාව වෙනස් කිරීමක් දක්නට ලැබෙන බැවින් ඒක පුද්ගල සහල් පරිභෝජනයේ වෙනස්වීමක් දැකිය හැක. නමුත් ජනගහන වර්ධනයට සමගාමීව අඩු ආදායම්ලාභී රටවල්වල සමස්ත සහල් ඉල්ලුමේ ඉහළයාමක් පවතී. ඒ තම දෛයිනික සමස්ත ශක්ති අවශ්‍යතාවයෙන් වැඩි ප්‍රතිශතයක් උකහාගැනීම සඳහා තම ආදායමෙන් විශාල කොටස සහල් පරිභෝජනය වෙනුවෙන් වැය කිරීමෙනි. FAPRI (2013) වාර්තාවට අනුව 2010 වර්ෂයේදී ටොන් මිලියන 388ක් වූ ආසියාතික සහල් ඉල්ලුම 2035 වසර වනවිට ටොන් මිලියන 465ක් ලෙස වර්ධනය වන බව ප්‍රක්ෂේපනය කර තිබේ. ඒක පුද්ගල ආදායම් වර්ධනය වේගවත් වීම හා ජනගහන වර්ධන වේගය ඉහළ යාමත් සමඟ මෙලෙස ගෝලීය වශයෙන් පවතින සහල් ඉල්ලුම් හා සැපයුම් ප්‍රවණතාවයන් මත ලෝක සහල් මිල නිරන්තරයෙන් උච්චාවචනය වන තත්වයක් හඳුනාගත හැකියි.

ලෝක සහල් මිල අස්ථාවර ස්වභාවයෙන් පැවතීම එම රටවල සහල් නිෂ්පාදකයන්ගේ සහ අතරමැදිකරුවන්ගේ ආදායම් කෙරෙහි මෙන්ම ඉල්ලුම් කරුවන්ගේ පැහැදම කෙරෙහි ද නොයෙක් බලපෑම් සිදුකළ හැකියි. ප්‍රධාන ආහාර ද්‍රව්‍යයක් ලෙස පමණක් නොව රසකැවිලි නිෂ්පාදනය, මධ්‍යසාර වර්ග සැකසීම, සබන් සහ සේදුම්කාරකයන් නිෂ්පාදනය මෙන්ම පශු සම්පත් නිෂ්පාදනය ආදිය සඳහාද බොහෝ රටවල් සහල් ඉල්ලුම් කරති (IRRI 2013). එබැවින් සහල් මිල ඉහළ යාම ගෝලීය වශයෙන් විවිධ පාර්ශවයන් කෙරෙහි බලපෑම් එල්ල කළ හැකි සාධකයකි. එනම් ඉහළ යන සහල් මිල පාරිභෝගික ක්‍රයශක්තිය සහ ජීවන තත්වය කෙරෙහි බලපෑම් ඇතිකළ හැකි අතරම නිෂ්පාදන කර්මාන්තවල පිරිවැය ඉහළ ගොස් කර්මාන්ත බිඳවැටීමට මෙන්ම ජාත්‍යන්තර වශයෙන් උද්ධමනකාරී ස්වභාවයන් සහ සේවා වියුක්ති තත්වයන් වුවද මතු කෙරෙන අර්බුදකාරී වාතාවරණ ඇතිකිරීමේ හැකියාවක් පවතියි.

ආසියාතික රටක් වශයෙන් ශ්‍රී ලංකාව තුළ ද සහල් සඳහා සමාජ, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික වැදගත්කමක් පවතී. ශ්‍රී ලාංකිකයෝ අතිබහුතරයක් තම ප්‍රධාන ආහාරය වශයෙන් සහල් පරිභෝජනය කරති. ඔවුන් තම කැලරි අවශ්‍යතාවයෙන් සියයට 45ක් ද ප්‍රෝටීන් අවශ්‍යතාවයෙන් සියයට 40ක් ද සහල් පරිභෝජනයෙන් සපුරාගනු ලබයි (IRRI 2013). ඒ සඳහා එක් පුද්ගලයකු වර්ෂයකදී සහල් කිලෝග්‍රෑම් 100ක් පරිභෝජනය කරයි (ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන

දෙපාර්තමේන්තුව 2013). සහල් සඳහා වන ඉල්ලුම වර්ෂයකට සියයට 1.1 බැගින් ඉහළ යන බව ඇතැම් පුරෝකථන තුළින් හෙළිකරන අතර එම ඉල්ලුම සපුරාලීම සඳහා සහල් නිෂ්පාදනය වර්ෂයකට සියයට 2.9ක අනුපාතයකින් ඉහළ යා යුතුයැයි ගණන් බලා තිබේ (ශ්‍රී ලංකා මහ බැංකුව 2011). එපමණක් නොව පරිභෝගිකයාගේ ප්‍රධාන ආහාර භෝගය සහ නිෂ්පාදකයාගේ හෝ අතරමැදිකරුගේ ප්‍රධාන ඉපයීම් මාර්ගය ලෙසද සේවා නියුක්තිය ඇතිකරන රැකියා මූලාශ්‍රයක් ලෙස ද සහල් නිෂ්පාදන අංශය වැදගත් වේ. ලොකුපතිරගේ (2012) කරන ලද පර්යේෂණයට අනුව මුළු ශ්‍රම බලකායෙන් සියයට 30කට වඩා වැඩි ප්‍රමාණයක් ඍජුවම හෝ වක්‍රව සහල් හා වී නිෂ්පාදන අංශය හා සම්බන්ධ වේ. එමෙන්ම ශ්‍රී ලාංකිකයන් මිලියන 1.8කට වැඩි ප්‍රමාණයක් තම ජීවනෝපාය වශයෙන් මෙම අංශයේ නියලෙන බව හඳුනාගෙන ඇත (මහ බැංකුව 2016).

දේශීය සන්දර්භය තුළ ද සහල් මිල නිරන්තරයෙන් උච්ඡාවචනය වන ස්වභාවයක් හඳුනාගත හැකි වේ. කාලගුණික හා දේශගුණික වෙනස්වීම්වලට අනුව සහ අස්වනු නෙළන වාරයන්හි විවිධත්වය අනුව සිදුවන අපේක්ෂිත විචලනයන් මෙන්ම අනපේක්ෂිත මිල කම්පනයන් ද ඒ අතර වේ. ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවලට අනුව 2008 වර්ෂයේදී අසාමාන්‍ය ලෙස ඉහළ ගිය වාර්ෂික සාමාන්‍ය සහල් මිල 2011 වසර වනවිට ක්‍රමයෙන් පහළ බැස තිබෙන අතර ප්‍රතිපත්තිමය වෙනස්කම් හා වෙළඳපොළ තත්ත්වයන්ට ප්‍රතිචාර දක්වමින් 2012-2016 කාලය තුළ ද සහල් මිල ක්‍රමයෙන් ඉහළ යාමක් වර්ධනය වී තිබේ. සහල් මිල අර්බුදය ප්‍රබල වීමක් 2017 වසර ආරම්භයේදී හඳුනා ගැනීමට හැකිවුණි. 2016 වර්ෂයේ නොවැම්බර් මාසය වනවිට රුපියල් 86.20ක පැවති නාඩු සහල් කිලෝග්‍රෑමයක මිල 2017 වර්ෂයේ ජනවාරි මාසය වනවිට 96.26ක් ලෙස ඉහළ යාමෙන් එය තහවුරු වේ (ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව 2017). මෙය රටතුළ සහල් හිඟයක් නිර්මාණය කිරීමට පවා හේතු වී තිබේ.

මෙලෙස නිරන්තරයෙන් සහල් මිල උච්ඡාවචනය වීම දේශීය ආර්ථික කාරකයන් කෙරෙහි නොයෙක් අයුරින් බලපෑම් කරයි. මිල ඉහළයාම පාරිභෝගික ක්‍රයශක්තිය, ජීවන තත්ත්වය හා දරිද්‍රතාව මත මෙන්ම කාර්මික නිෂ්පාදන අංශයේ වැටුප් පිරිවැය හා නිෂ්පාදන ඵලදායිතාව කෙරෙහිද බලපෑම් ඇතිකළ හැකියි. එමෙන්ම ඉතුරුම් හා ආයෝජන කෙරෙහිද බලපෑම් ඇතිකළ හැකියි. ඉහළ සහල් මිල ග්‍රාමීය ප්‍රදේශවල අඩු අධ්‍යාපනලාභී ශ්‍රමිකයන් උත්තේජනය කරයි. එය

දීර්ඝකාලීනව ග්‍රාමීය අංශයේ ශ්‍රමික වැටුප් ඉහළ යාමට හේතුවිය හැකියි. ඒ තුළින් වැටුප් ශ්‍රමික කුටුම්භ සහ ස්වයං රැකියාවල නියුතු ගොවීහු ප්‍රතිලාභ ලබති. සහල් මිල නිරන්තරයෙන් ඉහළයාම ආහාර මිල උද්ධමනයකට ද මඟපාදයි. එය පොදු මිල මට්ටම ඉහළගොස් උද්ධමනකාරී තත්ත්වයන් පවා ඇතිවීමට හේතුවිය හැකි අතරම ඒ හේතුවෙන් පසුකාලීනව සේවා වියුක්තිය වැනි සාර්ව ආර්ථික අස්ථායිතාවයන් ඇතිකිරීමට පවා හේතුවිය හැකියි. ඉහළ සහල් මිල ජාත්‍යන්තර ආර්ථික තරඟකාරිත්වය සීමා කිරීමට හේතුවිය හැකි අතරම ආහාර මිල අනපේක්ෂිත සහ අවිනිශ්චිත ලෙස උච්ඡාවචනය වන තරමට රටක දේශපාලනික ස්ථාවරත්වය ද අනපේක්ෂිත වේ. එමෙන්ම සහල් නිෂ්පාදකයාගේ ආදායම තීරණය කරන ප්‍රධාන සාධකය ලෙස ද වැදගත්වන ශ්‍රී ලංකාවේ දේශීය සහල් මිල තීරණය වීම කෙරෙහි බලපාන සාධක විමර්ශනය කිරීම කාලීන වශයෙන් වැදගත්කමක් උසුලයි. එමෙන්ම සහල් මිල තීරණය වීමට බලපාන සාධක සහල් මිල සමඟ පවත්නා කෙටිකාලීන හා දිගුකාලීන සබඳතාව සංඛ්‍යාත්මකව විශ්ලේෂණය කිරීම සහ මෙම සාධක අතුරින් බලාත්මක සාධක හඳුනාගැනීම මේ තුළින් අධ්‍යයනය කිරීමට අපේක්ෂා කෙරේ.

2. ආනුභවික අධ්‍යන

පසුගිය දශක කීපය තුළ සහල් මිල ඉහළ යාම, සහල් මිල ඉහළ යාමට හේතුවන සාධක, සහල් මිල ඉහළ යාමේ ධන සහ සෘණ ප්‍රතිවිපාක, ආදිය පිළිබඳව අතිවිශාල ආනුභවික අධ්‍යයන ප්‍රමාණයක් සිදුකර ඇත. මෙම අධ්‍යයන සඳහා ප්‍රථමික, ද්විතීක සහ රටවල් අතර හරස්කඩ දත්ත ආදිය උපයෝගී කරගනිමින් විස්තරාත්මක සහ ආර්ථික මිතික ක්‍රමවේද භාවිතයෙන් සහල් මිල සහ ඊට හේතු වූ සාධක විශ්ලේෂණය කර තිබේ. එම සාධක අතර සහතික මිල, වාර්ෂික වී නිමැවුම, තිරිඟුපිටිවල වාර්ෂික සාමාන්‍ය මිල, වර්ෂිකව ආනයනිත සහල් ප්‍රමාණය, වාර්ෂික බලශක්ති මිල, මධ්‍ය වාර්ෂික ජනගහනය, වර්ෂික වර්ෂාපතනය සහ සහල් වෙළඳපොළ කෙරෙහි වන රාජ්‍ය මැදිහත්වීම් යනාදී අංශයන් පිළිබඳව විශේෂ අවධානය යොමුකරමින් සාකච්ඡාවට ලක්කර ඇත.

දයාරත්න ඇතුළු පිරිස (Dayarathne et al, 2008) විසින් ශ්‍රී ලංකාවේ සහල් මිල පාලනයේ අර්ථ හා නිරර්ථ පිළිබඳ අධ්‍යනය කිරීම සඳහා ද්විතියික දත්ත මූලාශ්‍ර භාවිතයෙන් සාකච්ඡා කර තිබේ. එහිදී සහල් මිල ඉහළයාම හා රජයේ ප්‍රතිපත්ති භාවිතය පිළිබඳව අවධානය යොමු කරයි. නොමඟ යවන ආනයනික ප්‍රතිපත්ති සහ

තරඟකාරී නොවන සහල් වෙළඳපොළ ක්‍රියාකාරකම් ඉහළයන සහල් මිල කෙරෙහි මූලිකවම බලපාන බව හඳුනාගෙන තිබෙන අතර මිල සීමාවන් පැනවීම මඟින් ශ්‍රී ලංකාවේ සහල් මිල අර්බුදය එලදායිව විසඳිය නොහැකි බව පෙන්වා දී තිබේ. සහල් හා තිරිඟු ආනයනය කිරීම මිල සීමාවන් පැනවීමට සාපේක්ෂව කෙටිකාලීනව තාවකාලික සහල් හිඟය ඉවත් කළහැකි ක්‍රමයක් වන බව ඔවුන් පෙන්වා දී ඇත. එසේම කුමාර් සහ ශර්මා (Kumar & Sharma, 2006) යන අය විසින් මිල විචලතාව හා එහි නිර්ණායක අධ්‍යයනය කිරීම උදෙසා 1980-2000 කාලවකවානුවේ ඉන්දියාවේ තිරිඟු, සහල් සහ රළු ධාන්‍යවල මිලගණන් පිළිබඳ කාලශ්‍රේණි දත්ත ලබාගනිමින්, සංඛ්‍යානමය විශ්ලේෂණ ක්‍රමවේදය ඔස්සේ සිදුකරන ලද අධ්‍යයනය අනුව රජයේ මැදිහත්වීම් හා අනපේක්ෂිත සැපයුම සහල් සහ තිරිඟුවල මිල ඉහළයාම කෙරෙහි ඍණ බලපෑමක් ඇතිකරන බව හඳුනාගෙන ඇත. එමෙන්ම තිරිඟු හා සසඳන කල රජය විසින් සහල් මිලදී ගැනීම හා මිල සීමාවන් පැනවීම සඳහා මැදිහත්වීම තොග මිල පරාසය සඳහා වැඩි බලපෑමක් එල්ලකරන ආකාරය පෙන්වා දෙයි. මෙම අධ්‍යයනය දෙක තුළින්ම සහල් මිල පාලනය කෙරෙහි රාජ්‍ය මැදිහත්වීමෙහි ඍණ බලපෑම් පිළිබඳව සාකච්ඡා කර තිබේ.

සුසිල් ඇතුළු පිරිස (Sushil et al, 2008) විසින් ද්විතියික මූලාශ්‍ර ඔස්සේ රැස්කරන ලද දත්ත භාවිතකර සහල් මිල අර්බුදයේ හේතු, බලපෑම් සහ විසඳුම් පිළිබඳව අධ්‍යයනයට ලක්කර ඇත. එහිදී ඔවුන් විසින් විස්තරාත්මක ක්‍රමවේදය භාවිත කරමින් දත්ත විශ්ලේෂණය කිරීම තුළින් සහල් සඳහා පවතින දීර්ඝකාල ඉල්ලුම් සැපයුම් අසමබරතාව වර්තමාන සහල් අර්බුදයට බලපාන මූලිකවම හේතුවන බව පෙන්වා දෙයි. තවදුරටත් සහල් එලදා වර්ධන අනුපාතිකය, සහල් තොග මට්ටම, සහල් ඉල්ලුම, කෘෂිකාර්මික පර්යේෂණ හා සංවර්ධනය සඳහා වන රාජ්‍ය ආයෝජන සහ තෙල් මිල ඉහළයාමත් සමඟ සහල් නිෂ්පාදනයේ ශක්ති පිරිවැය ආදී සාධක සහල් මිල කෙරෙහි මූලිකවම බලපෑම් ඇතිකරන බව හඳුනා ගනියි. එමෙන්ම පර්යේෂණ හා සංවර්ධන කටයුතු ඉහළ නැන්වීම තුළින් සහල් එලදායිතාව ඉහළ නැන්වීම සහල් මිල අර්බුදයට මූලික විසඳුමක් බව දක්වන අතරම ආහාර මිල ඉහළයාම අඩුමතරමින් මිලියන 32ක් පමණ මිනිසුන් නැවත දරිද්‍රතාව දෙසට ඇදදැමීමට සමත්වන බවද පෙන්වා දී තිබේ. එමෙන්ම ජෙරමි ඇතුළු පිරිස (Jeremi, 2008) විසින් සහල් සහ ඉන්ධන මිල (බලශක්තිය) වෙනස්වීම පිලිපීනයේ දරිද්‍රතාව මත ඇතිකරන බලපෑම අධ්‍යයනය කිරීමට පිලිපීනයේ පවුල් ආදායම් හා

වියදම් සමීක්ෂණය (FIES, 2006), ආහාර හා කෘෂිකාර්මික සංවිධානය (FAO) මඟින් දත්ත ලබාගෙන ඇත. අපරාමිතික ශිල්ප ක්‍රමය හා ප්‍රතිපායන ආදර්ශ භාවිතයෙන් දත්ත විශ්ලේෂණය කිරීම තුළින් සහල් මිල ඉහළයාම හේතුවෙන් පිලිපීනයේ සහල් ගොවීන්ගෙන් සියයට 73.7ක් වාසි ලබන බවත්, සියයට 26.3ක් වැනි සැලකිය යුතු අනුපාතයකට අවාසි සිදුවන බවත් හඳුනාගෙන තිබේ. සුෂිල් ඇතුළු පිරිස සහ පෙරමි ඇතුළු පිරිස යන දෙපාර්ශවයේ ම ප්‍රතිඵල තුළ සහල් මිල දරිද්‍රතාවය කෙරෙහි බලපෑම් කරන අයුරු සාකච්ඡාවට ලක් කෙරේ.

ගොවියන්ගේ සුභසාධනය සහ ආහාර මිල වෙනස්වීම පිළිබඳව ක්‍රිස්ටෝපර් සහ පෝල් (Cristopher and Paul, 1996) විසින් මැඩගස්කරයේ සහල් මිල පදනම් කරගෙන අධ්‍යනයක් සිදුකර ඇත. සහල් මිල වෙනස්වීම්වල ව්‍යාප්තිය ප්‍රතීයමාන කිරීම සඳහා අපරාමිතික ඝනත්ව නිමානකය භාවිත කරමින් විශ්ලේෂණය කිරීම තුළින් සහල් මිල ඉහළ යාම කුටුම්බ සුභසාධනය මත ඍණ බලපෑමක් ඇතිකරන බව හඳුනාගෙන ඇත. එමෙන්ම කාලගුණය මත ඇතිවන නිෂ්පාදන කම්පන, දේශීය වෙළඳපොළ අපූර්ණතා සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ආදිය ද සහල් මිල හා කුටුම්බ සුභසාධනය කෙරෙහි බලපාන බව පෙන්නුම් කරයි. එසේම සහල් මිල ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණයන් හේතුවෙන් මැඩගස්කරයේ ඇතැම් ගොවීන් කරාඹු හා කෝපි නිෂ්පාදනයට පෙළඹෙන බව ද හඳුනාගෙන තිබේ. තව ද සහල් සහ තිරිඟු සඳහා මිල චලනය හා ව්‍යුහාත්මක ප්‍රතිපත්ති යථාර්ථය පිළිබඳව ගෝපකුමාර් සහ පණ්ඩිත් (Gopakumar & Pandith, 2014) විසින් 1981-2012 කාලසීමාව තුළ ඉංදියාවේ සහල් සහ තිරිඟු මිල ගණන් පිළිබඳව ලබාගත් වාර්ෂික දත්ත භාවිත කරමින් අඩුතම වර්ග නිමානිත (OLS) ක්‍රමවේදය යටතේ කරන ලද විශ්ලේෂණය අනුව ආහාර මිල අනවරතව ඉහළයාම හා සමාජය මත එහි බලපෑම ආදායම හා මුදල් සැපයුම මිල වෙනස්වීමේ අනුපාතය මත ධන වෙසෙසි බලපෑමක් ඇතිකරන අයුරුත් මිල වෙනස්වීමේ අනුපාතය හා පවතින නිෂ්පාදිත ප්‍රමාණය අතර ඍණ සබඳතාවක් පවතින බව ද හඳුනාගෙන ඇත. එසේම සහල් සහ තිරිඟු යන ආහාර වර්ග දෙකේම මිල උද්ධමනය කෙරෙහි ඉල්ලුම හා සැපයුම ඉහළ බලපෑමක් ඇතිකරන බවත් පෙන්වා දේ.

ක්‍රිස්ටිනා සහ ජිකුන් (Cristina and Jikun, 1996) විසින් තෝරාගනු ලබන ආසියාතික රටවල් 9ක සහල් මිල ආරක්ෂණ මට්ටම්වල විචලනය පැහැදිළි කිරීම හා

ප්‍රතිපත්ති ඉලක්කයන් ලෙස මිල ස්ථායිකරණයේ වැදගත්කම නිරූපණය කිරීම අරමුණු කරගනිමින් අධ්‍යයනයක් සිදුකර ඇත. එහිදී 1900-1988 කාලසීමාව සඳහා අදාළ රටවල් 9හි සහල් මිල ගණන් සම්බන්ධ හරස්කඩ දත්ත ලබාගනිමින් දත්ත එක්රැස් කරඇති අතර සංඛ්‍යානමය ක්‍රමවේදයන් භාවිතයෙන් දත්ත විශ්ලේෂණය කරයි. විශ්ලේෂණයට අනුව ලෝක මිල සියයට 10කින් ඉහළයාමත් සමඟ නාමික ආරක්ෂණ සංගුණකය සියයට 7කින් පහළ බසින බවත්, හුවමාරු අනුපාතය සියයට 10කින් ඉහළ යනවිට නාමික ආරක්ෂණ සංගුණකය සියයට 4කින් පහළ යන බව ද හඳුනාගෙන ඇත. එසේම පොහොර මිල ප්‍රතිපත්තිය වැනි ප්‍රතිපත්තිමය දායකත්වයන් මඟින් නිෂ්පාදන ඒකක පිරිවැය පහත හෙළීමට සමත්වන බවද ඔවුන් ද පෙන්වා දෙති. එසේම ඔට්සුකා සහ හයාමි (Otsuka and Hayami, 1985) විසින් ජපාන සහල් ප්‍රතිපත්තියේ ඉලක්ක සහ ප්‍රතිඵල පිළිබඳ සිදුකළ අධ්‍යයනයට අනුව සහල් ප්‍රතිපත්ති වැඩසටහන් හේතුවෙන් ශුද්ධ නිෂ්පාදන අතිරික්තය ඉහළයාම හා පාරිභෝගික අතිරික්තය පහළ යාම මෙන්ම ඉහළ මිල ආධාරක හේතුවෙන් ඇතිවන අතිරික්ත සැපයුම මඟින් දේශීය මිල ජාත්‍යන්තර මිලට වඩා පහළින් තැබීමට සමත්වන බව දක්වයි. මෙම අධ්‍යයන දෙක ඔස්සේ ම සහල් මිල ප්‍රතිපත්තිවල බලපෑම පිළිබඳ සාකච්ඡා කරඇති මුත් ප්‍රතිඵල තුළ යම් වෙනස්කම් දක්නට ලැබේ.

ජපානයේ ටොකුගාවා ප්‍රදේශයේ සඵලතාවය සහ සහල් මිල උච්චාවචනය පිළිබඳ අවධානය යොමුකරමින් ග්‍රිෆිත් සහ කියෝෂි (Griffith and Kiyoshi, 1990) විසින් කාලශ්‍රේණි දත්ත භාවිත කරමින් විශ්ලේෂණය කරන ලද අධ්‍යයනයට අනුව මිල ඉහළයාමත් සමඟ මරණ අනුපාතය ඉහළ යන බවත් මිල පහළ යාමත් සමඟ මරණ අනුපාතය පහළ යන බවත් හඳුනාගන ඇත. එසේම මිල හා උපත් අනුපාතිකය අතර ඍණ සබඳතාවක් පවතින බව ද මිල හා ළමා මරණ අනුපාතිකය අතර ධන සම්බන්ධතාවයක් පවතින බවත් හඳුනාගෙන තිබේ. බොහෝ අධ්‍යනයන් තුළින් සහල් මිල නිසා බලපෑමට ලක්වන නොයෙක් විචල්‍යන් පිළිබඳ සාකච්ඡාකර තිබුණ ද මෙලෙස සඵලතාවය හා සහල් මිල පිළිබඳ සිදුකර තිබෙන අධ්‍යයනයන් සුලබ බැවින් මෙය විශේෂ වැදගත්කමකින් යුක්ත වේ.


ටේලර් සහ ට්‍රුමාන් (Taylar and Truman, 1991) යන අය විසින් ධාන්‍ය නිෂ්පාදන මිල ගණන් විකෘති වීමේ ඍජු සහ වක්‍ර සාධක ප්‍රති අධ්‍යයනය කිරීම අරමුණු කරගනිමින් දියුණු වෙමින් පවතින රටවල ආහාර මිල ප්‍රතිපත්තිය පිළිබඳ සිදුකළ අධ්‍යයනයට අනුව ශුද්ධ ආනයනයන් සහ ආහාර ආධාරයන් ලබන රටවල්


තුළ ප්‍රතිවිරුද්ධ මිල ප්‍රතිපත්ති පරිසරයන් පවතින බව හෙලි කරයි. ආහාර ආධාර ලබන රටවල් තුළ දේශීය නිෂ්පාදකයන්ට එරෙහිව ශක්තිමත් සෘණ මිල නැඹුරුවක් පවතින ආකාරයත්, එනමුත් ශුද්ධ ආනයන සිදුවන රටවල් තුළ ශක්තිමත් ආරක්ෂණ නැඹුරුවක් පවතින ආකාරයත් පෙන්වාදෙනු ලබයි. එහිදී ආහාර ආරක්ෂණ අධිකාරිය සහ ජාත්‍යන්තර සහල් පර්යේෂණ ආයතනය (IRRI) මඟින් ලබාගත් ද්විතියික දත්ත රොබස්ට් (Robust) ගණනය කිරීම් ඔස්සේ විශ්ලේෂණය කරමින් මෙම අධ්‍යනය සිදුකර තිබේ.

එසේම තිරිඟු සහ සහල්වල අවම ආධාරක මිල ඉහළයාමත් සමඟ ඇතිවන ප්‍රතිඵල විභාග කිරීම අරමුණු කරගනිමින් පාරික් ඇතුළු පිරිස (Parikh et al, 2003) විසින් අවම ආධාරක මිල ඉහළයාමේ සුභසාධන බලපෑම සහ වර්ධනය පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා නිෂ්පාදන ඒකක 65කින් සහ ග්‍රාමීය නාගරික බව අනුව වෙන්කර තෝරාගත් කුටුම්බ ආකාර 10කින් ඒක පුද්ගල වියදම පිළිබඳ ලබාගත් දත්ත භාවිත කර ඇත. මෙම අධ්‍යනයට අනුව තිරිඟු සහ සහල් සඳහා වන අවම ආධාරක මිල ඉහළ යන විට එය සමස්ත දළ දේශීය නිෂ්පාදිතය පහළ දැමීමට, සමාහාර මිල දර්ශකය ඉහළ දැමීමට හා ආයෝජන පහළ බැසීමට මඟ පෙන්වන බව දක්වයි. ඒ, සහල් සහ තිරිඟුවල අවම ආධාරක මිල සියයට 10කින් ඉහළ යන විට සමස්ත දළ දේශීය නිෂ්පාදනය සියයට 0.33කින් පහළ යාමත්, සමාහාර මිල දර්ශකය සියයට 1.5කින් ඉහළ යාමත්, ආයෝජන සියයට 1.9කින් පහළ බැසීමත් යනාදී වශයෙනි. එලෙසම ඉහළ අවම ආධාරක මිල ඉල්ලුම අඩු කිරීමට සමත්වන අතරම විශාල තොගයක් පවත්වාගැනීම සඳහා මේ තුළින් මඟ පෙන්වන බව ද මෙම අධ්‍යනය තුළින් හඳුනාගනියි.

ඇමරිකාවේ සහල් ඉල්ලුම, සැපයුම හා සහල් මිල තීරණය වීමට බලපාන සාධක පිළිබඳ විශ්ලේෂණය කිරීම සම්බන්ධව අවධානය යොමු කරමින් ග්‍රාන්ට් සහ ලීත් (Grant and Leath, 1979) විසින් සිදුකළ අධ්‍යයනය සඳහා අඩුතම වර්ග නිමානක ක්‍රමය භාවිතයෙන් දත්ත විශ්ලේෂණයක් සිදුකර තිබේ. අධ්‍යයනයට අනුව, වාර්ෂික දේශගුණික වෙනස්වීම්, තාක්ෂණික වෙනස්වීම්, සහල් වගාකරන භූමි ප්‍රමාණය, පසුගිය වර්ෂයේ ගොවිපළ මිල, රජයේ වැඩසටහන් ආදී සාධක සහල් සැපයුම කෙරෙහි දැඩිලෙස බලපාන අතරම සහල්වල සිල්ලර මිල වෙනස්වීම සහල් ඉල්ලුම කෙරෙහි එතරම් බලපෑමක් නොමැති බව පෙන්වා දේ. එමෙන්ම වර්තමාන සහල් බීජ (බිත්තර වී) ඉල්ලුම ඊළඟ වසරේ වී වගාකරන අක්කර ප්‍රමාණය කෙරෙහි

ප්‍රස්තාර අංක (01) : ශ්‍රී ලංකාවේ දේශීය සහල් මිල හා වී නිෂ්පාදන ප්‍රවණතා





ඉහත අංක (01) ප්‍රස්තාර සටහනට අනුව 1977 සිට 2016 දක්වා කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ දේශීය සහල් මිල සහ දේශීය වී නිෂ්පාදන ප්‍රවණතාව පෙන්වයි. ඒ අනුව බොහෝ වර්ෂවලදී වාර්ෂික වී නිෂ්පාදනය මෙන්ම දේශීය සහල් මිල තුළ ද උච්ඡාවචනයන් රැසක් හඳුනාගත හැකියි. මහ බැංකු වාර්ෂික වාර්තාවන්ට අනුව මේ ප්‍රවණතාවන් අතරින් මෑත කාලීන විචලනයන් හා ඒ සඳහා බලපෑ හේතු සාධක පහත පරිදි විස්තර කළ හැකි වේ.

ශ්‍රී ලංකාව තුළ තීරණාත්මක මිල අර්බුදයක් ඇතිකළ කාල පරිච්ඡේදයක් ලෙස 2007 වර්ෂය දැක්විය හැක. එම වර්ෂයේදී කෘෂි නිෂ්පාදන අංශයන් තුළද කැපී පෙනෙන පහළ යාමක් පෙන්නුම් කර තිබේ. 2007 මහ බැංකු වාර්ෂික වාර්තාවට අනුව, එම වර්ෂයේ වී නිෂ්පාදනය සියයට 6.4ක පහළ යාමක් වාර්තා වේ. 2006/07 මහ කන්නයේ සහ 2007 යල කන්නයේ වී නිෂ්පාදනය පිළිවෙළින් සියයට 7.7කින් සහ සියයට 4කින් අඩු වී තිබේ. ආරක්ෂණ හේතූන් මත නැගෙනහිර පළාතේ ගොවීන් තම වාසස්ථාන මාරු කිරීම සහ කාලගුණික වෙනස්වීම මෙම පහළ යාමට හේතු වී ඇත. නැගෙනහිර පළාතේ වගාකළ බිම් ප්‍රමාණය මහ සහ යල කන්නයේදී පිළිවෙලින් සියයට 35කින් හා සියයට 18කින් පහත බැස තිබේ. එසේම 2006 යල කන්නයේදී වී මිල අඩු අගයක පැවතීම (කිලෝග්‍රෑමයක් රු.13.00 - රු.15.00) 2006/07 මහ කන්නයේදී වගාව අඩු වීමට හේතු විය. රජයේ වී මිලදී ගැනීමේ යන්ත්‍රණය ද නොකඩවා ක්‍රියාත්මක වුවද 2007 යල කන්නයේදී වෙළඳපොළ වී ගැනුම් මිල රජය ගෙවන මිලට වඩා වැඩි වූ නිසා රජයට වී මිලදී ගැනීමට නොහැකි විය. මේ අනුව

සාධක කිහිපයක බලපෑමෙන් 2007 වසර අග භාගයේදී සහල් මිල තියුණු ලෙස ඉහළ නැගුණි. තිරිඟු පිටි මිල ඉහළ නැගීමත් සමග සහල් සඳහා ඉල්ලුම සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි විය. ගෝලීය වශයෙන් තිරිඟු පිටි නිෂ්පාදනය පහළ යාමට එල්-නිනෝ සංසිද්ධිය ද බලපෑවේය. එය ගෝලීය වශයෙන් මෙන්ම දේශීය වශයෙන් ද තිරිඟු මිල ඉහළ යාමට හේතු විය. එය සහල් මිලෙහි ඉහළ යාමට ප්‍රබල බලපෑමක් ඇතිවිය. රජය තීරුබදු රහිතව සහල් ආනයනය කිරීමට අවකාශය ලබාදී තිබියදීත් ඉහළ යන ඉල්ලුමට සරිලන සැපයුමක් නොමැති වීමෙන් සහල් මිල නොකඩවා ඉහළ ගොස් තිබේ.

2008 වර්ෂයේ වී නිෂ්පාදනය වාර්තාගත මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 3.87ක් හෙවත් සහල් මෙට්‍රික් ටොන් දස ලක්ෂ 2.63ක් දක්වා සියයට 24කින් ඉහළ ගොස් තිබේ. මහ කන්නයේ වී නිෂ්පාදනය සියයට 7.8කින් පමණ ඉහළ ගිය ද 2008 වර්ෂයේ යල කන්නයේ වී නිෂ්පාදනය අති විශේෂ වර්ධනයක් පිළිබිඹු කරමින් සියයට 51කින් ඉහළ ගොස් තිබෙන අතර, මෙය නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ඕනෑම කන්නයක වාර්තා වූ දෙවනි ඉහළ ම වර්ධනය වී ඇති බව මහ බැංකු වාර්තා පෙන්වා දෙයි. එහි විශේෂත්වය වන්නේ එය සාමාන්‍යයෙන් අඩු වර්ධනයක් පෙන්නුම් කරන යල කන්නයෙන් වාර්තා වීමයි. රජය විසින් වී මිලදී ගැනීමේ ගැනුම් මිල සියයට 24කින් පමණ ඉහළ නැංවීම හේතුවෙන් පෙර වසරේ යල කන්නයට එරෙහිව මෙම වසරේ යල කන්නයේ වගාකළ කුඹුරු ඉඩම් ප්‍රමාණය සියයට 62කින් ඉහළ යාම ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබේ. මීට අමතරව රජය විසින් සහන මිලට අඛණ්ඩව පොහොර සැපයීම, රටේ සියලු පළාත්වල හිතකර වර්ෂාපතනයක් පැවතීම, රජයේ "අපි වවමු - රට නගමු" වැඩසටහන ඔස්සේ වගාවට යොදාගනු ලැබූ ඉඩම් ප්‍රමාණය ඉහළ යාම හා වගා ක්‍රම වර්ධනය වීම ඉහළ නිෂ්පාදනය සඳහා හේතු වූ අනෙත් සාධක තිබේ.

2008 වර්ෂයේ පළමු අර්ධය තුළ 2007 වසරේ අනුරූප කාලයට සාපේක්ෂව සහල් ඇතුළු කෘෂි භාණ්ඩවල දේශීය සැපයුම පහළ යාම නිසා දේශීය කෘෂිකාර්මික නිෂ්පාදනවල මිල ඉහළ නැගුණි. දිවයිනට ලැබුණු අධික වර්ෂාපතනය මඟින් මහ කන්නයේ වී අස්වැන්නට හානි සිදුවීම මෙයට හේතු විය. තිරිඟු පිටි මිල ඉහළ යාම නිසා ආදේශන බලපෑම හේතුකොට ගෙන සහල් සඳහා වූ ඉල්ලුම ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස සහල් මිල මත අමතර පීඩනයක් ඇතිවිය. මේ අතර ගොවීන් සතු තොග සීමිත වීමත් සමග පෞද්ගලික සහල් මෝල් හිමියන් අතර වී මිලදී ගැනීම

සඳහා ඇති වූ තරඟය ද සහල් මිල ඉහළ නැංවීම කෙරෙහි හේතු වී තිබේ. කෙසේ වුව ද 2008 අප්‍රේල් මස මැදදී රජය මඟින් සහල් මත පනවන ලද මිල සීමාව සහල් මිල ස්ථාවර කිරීමට හේතු වී තිබේ. යල කන්නයේ ලද සතුටුදායක අස්වැන්න නිසා දේශීය සැපයුම වර්ධනය වීම ද මිල ස්ථාවර කිරීමට දායක විය.

2009 වසරේ මුළු වී නිෂ්පාදනය, මෙතෙක් ඉහළම වී නිෂ්පාදනය ලෙස 2008 වසරේ පැවති මෙට්‍රික් ටොන් මිලියන 3.87ට සාපේක්ෂව මෙට්‍රික් ටොන් මිලියන 3.65ක් දක්වා පහළ ගොස් තිබේ. 2009 වසරේ මෙම සමස්ත පහළ වැටීම 2008 යල කන්නයේ ලබාගත් වාර්තාගත නිෂ්පාදනයට සාපේක්ෂව 2009 යල කන්නයේ නිෂ්පාදනය සියයට 27.6ක පහත වැටීම ප්‍රධාන වශයෙන් බලපෑවේය. මේ සඳහා ප්‍රධාන ලෙසම හේතුවූයේ මෝසම් වර්ෂාව ලැබීම පමාවීම හා එහි ප්‍රතිඵලයක් ලෙස වගාව සඳහා ජල සැපයුම ප්‍රමාද වීම හේතුවෙන් වගාවට ප්‍රමාණවත් පරිදි ජලය නොලැබී යාමයි (මහ බැංකුව, 2009). කෙසේ වෙතත් වගා කළ බිම් ප්‍රමාණය ඉහළ යාම හා වගා කන්නය පුරා පැවති යහපත් කාලගුණික තත්වය මත ඵලදායිතාවය ඉහළ යාම නිසා 2008/09 මහ කන්නයෙහි වී නිෂ්පාදනය පෙර මහ කන්නයට සාපේක්ෂව මෙට්‍රික් ටොන් මිලියන 2.4ක් දක්වා සියයට 12.2කින් ඉහළ ගොස් තිබේ. මෙම තත්වය සම්බන්ධිත සහල් මිල ගණන් පිළිබඳ සැලකීමේදී 2008 වසර සමග සැසඳීමේදී සහල්වල සාමාන්‍ය මිල 2009දී සියයට 2.1කින් අඩුවී තිබේ. 2008/09 මහ කන්නයේ සතුටුදායක අස්වැන්න, රජය මඟින් සහල් මත උපරිම මිල සීමාවන් පැනවීම සහ වසර අගදී සහල් ආනයනය තීරු බදු වලින් නිදහස් කිරීම ඉවහල් විය.

2009 වසර හා සසඳන විට 2010 වසරේදී සමස්ත වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 4.3ක් දක්වා සියයට 17.8කින් වර්ධනය විය. 2009/10 මහ කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 2.6ක් දක්වා සියයට 10කින් වර්ධනය වූ අතර, 2010 යල කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 1.6ක් දක්වා සියයට 31.8කින් වර්ධනය විය. ඒ සඳහා උතුරු හා නැගෙනහිර පළාත්වල වී වගාකරන බිම් ප්‍රමාණය ඉහළයාම, ප්‍රමාණාත්මකව ලැබුණු වර්ෂාපතනය සහ වගාව සඳහා නියමිත අවස්ථාවේදී ජල සැපයුම මෙන් ම රාජ්‍ය කෘෂිකාර්මික ප්‍රතිපත්තිය යටතේ පුරන් කුඹුරු අස්වැද්දීම යන හේතු බලපාන ලදි. ඊට අමතරව රජයේ පොහොර සහන වැඩසටහන හා රජයේ වී මිලදී ගැනීමේ වැඩ පිළිවෙළ නොකඩවා ක්‍රියාත්මක වීම 2010 වර්ෂයේ වී නිෂ්පාදනයේ ඉහළ වර්ධනයක් ලබා ගැනීමට හේතු වී තිබේ. මහ බැංකු වාර්ෂික වාර්තාවන් පෙන්වා දෙන පරිදි දේශීය සැපයුම් තත්වයන්හි වර්ධනය

මෙන් ම 2010 දෙසැම්බර් මාසයේදී සහල් මිල ඉහළ යෑම පාලනය කිරීමට රජය මඟින් ගත් ක්‍රියාමාර්ගයන් සහල් සාමාන්‍ය මිල පහළ දැමීමට හේතු වී තිබේ. ප්‍රධාන වශයෙන් ම වෙළඳපොළෙහි පැවති අඩු සහල් සැපයුම හේතුවෙන් පෙර වසර හා සැසඳීමේදී 2010 වර්ෂය ආරම්භයේ සහල් මිල සාපේක්ෂව ඉහළ අගයක පැවතිණි. ඉන් අනතුරුව නැගෙනහිර පළාතෙන් මහ කන්නයේ සරු වී අස්වනු නෙළීම ආරම්භ වීමත් සමග සහල් මිල ක්‍රමයෙන් පහත වැටිණි. කෙසේ වුව ද තිරිඟු පිටි සහ පාන්වල ඉහළ මිල ගණන් මඟින් ඇති කළ ආදේශන බලපෑම හේතුවෙන් සහල් සඳහා ඉල්ලුම ඉහළ යාම 2010 ඔක්තොම්බර් මස සිට නැවතත් සහල් මිල ඉහළ යාමට ආංශික වශයෙන් හේතු විය. එසේ වුව ද රජය විසින් 2010 දෙසැම්බර් 10 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සහල් මත මිල සීමාවන් පැනවීම මිල පාලනය කිරීමට හේතු වී තිබේ.

මහ බැංකු වර්තාවලට අනුව 2011 වසරේ සමස්ත වී නිෂ්පාදනය 2010 වසර හා සසඳන කල සියයට 10කින් අඩු වී තිබේ. යල කන්නයේ වී නිෂ්පාදනය සැලකිය යුතු ප්‍රමාණයක් වර්ධනය වී තිබියදීත් මහ කන්නයේ වී නිෂ්පාදනය අඩු වීම මෙම පසුබෑමට හේතු විය. මෙතෙක් කන්නයකදී වාර්තා වී ඇති ඉහළම වගා හානිය පිළිබිඹු කරමින් 2011 වසරේ ජනවාරි හා පෙබරවාරි මාසවල පැවති ගංවතුර තර්ජනයේ ඍජු හා වක්‍ර බලපෑම හේතුවෙන් මහ කන්නයේ වී නිෂ්පාදනය අඩු විය. ඇස්තමේන්තුගත ඍජු වගා හානිය මහ කන්නයේ වගාකළ බිම් ප්‍රමාණයෙන් සියයට 25ක් පමණ වන අතර සිදු වූ වක්‍ර හානිය වී ඵලදාවේ සැලකිය යුතු පහළ යාම තුළින් පිළිබිඹු විය. සිදුවූ වගා හානිය පූර්ණය කිරීමට යල කන්නයේ වැඩි බිම් ප්‍රමාණයක් වගා කිරීම සඳහා රජය විසින් පහසුකම් සලසන ලදි. එමෙන් ම සහන වගා ණය සැපයීම ද සිදුකර තිබේ. කෙසේ වෙතත් 2011 වසරේ යල කන්නයේ වී නිෂ්පාදනය සියයට 12.4කින් වර්ධනය වී තිබේ. යහපත් කාලගුණික තත්වයක් පැවතීම, වගාව සඳහා ප්‍රමාණවත් තරම් ජලය නිසි කලට සැපයීම හා පොහොර සහන වැඩපිළිවෙළ ද ඒ සඳහා බලපා ඇත.

සහල් මිල ගණන් පිළිබඳ සැලකීමේදී, වෙළඳපොළෙහි ප්‍රමාණවත් පරිදි තොග පැවතීම මෙන් ම රජය මඟින් 2010 දෙසැම්බර් මස සිට සහල් මත ඉහළ මිල සීමාවන් පැනවීම, 2011 වසර තුළ සහල්වල සාමාන්‍ය මිල ගණන් පහළ මට්ටමක පවත්වාගැනීමට හේතු විය. පෙර වසරට සාපේක්ෂව මෙම වසරේ සහල් මිල ගණන් සියයට 2.6කින් පහත වැටිණි. ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශවල පැවති අධික වර්ෂාව සහ

ගංවතුර හේතුවෙන් මහ කන්නයෙහි අඩු අස්වැන්නක් ලැබීමේ ප්‍රතිඵලයක් ලෙස 2011 පෙබරවාරි හා මාර්තු මාසවලදී සියලුම වර්ෂවල සහල් මිල ගණන් ඉහළ ගිය ද ඉන් අනතුරුව සැප්තැම්බර් මාසය දක්වා කාලය තුළ මිල ගණන් පහළ වැටීමක් දක්නට ලැබිණි. කෙසේ වුව ද සෘතුමය සාධක හේතුවෙන් වසර අවසානය වනවිට මිල ගණන් සුළු වශයෙන් ඉහළ යාමේ නැඹුරුවක් දක්නට ලැබුණු බව මහ බැංකු වාර්ෂික වාර්තා පෙන්වා දෙයි.

මහ බැංකු වාර්ෂික වාර්තා අනුව, 2011/12 මහ කන්නයේ වී නිෂ්පාදනය ඉහළ යාම සහ 2012 යල කන්නයේ වී නිෂ්පාදනය පහළ යාමේ ඒකාබද්ධ ප්‍රතිඵලය වූයේ 2012 වසරේ සමස්ත වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 3.84ක් දක්වා සියයට 1.2කින් ආන්තික වශයෙන් අඩු වීමයි. මේ වර්ෂයේ මහ කන්නයේදී සියයට 36ක ඉහළ වර්ධනයක් වී නිෂ්පාදනය තුළ වාර්තා වී ඇති අතර මේ සඳහා මහ කන්නය පුරා පැවති යහපත් කාලගුණික තත්වය සහ කුඩා හා මහා පරිමාණ වාරි සම්පාදනයේ දායකත්වයන් ප්‍රධාන වශයෙන් හේතු වී තිබේ. යල කන්නය තුළ පැවති වියලි කාලගුණික තත්වයන්ගේ බලපෑම හේතුවෙන් 2012 යල කන්නයේ වී නිෂ්පාදනය සියයට 41කින් අඩු වී තිබේ. මෙය පසුගිය වසර 5ක කාලය තුළ වගා කන්නයක වාර්තාගත අඩුම වී නිෂ්පාදනය වේ. මේ කාලයේදී නියගයෙන් බොහෝ වගා ඉඩම් විනාශ වී ඇති අතර නිෂ්පාදන ඵලදාව ද සියයට 5කින් අඩු වී තිබේ. නමුත් වසරේ සහල් අවශ්‍යතාව සැපිරීමට ප්‍රමාණවත් තරම් වී නිෂ්පාදනයක් පැවති බව වාර්තා වේ.

2012 වසරේ යල කන්නයේ වී අස්වැන්නෙහි අඩුවීම පිළිබිඹු කරමින් වසරේ දෙවන භාගයේදී සහල් මිල ගණන් ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු කොටගෙන සහල්වල බරතැබූ සාමාන්‍ය මිල සුළු වශයෙන් ඉහළ ගියේය. මහ කන්නයේ ඉතා විශාල වී අස්වනු ලැබීමත් සමග වෙළඳපොළෙහි ප්‍රමාණවත් තොග පැවතීම වසරේ මුල් මාස තුළ සහල් මිල ගණන් පහත මට්ටමක පවත්වා ගැනීමට හේතු විය. කෙසේ වුව ද ප්‍රධාන වගා බිම් ආශ්‍රිතව පැවති අයහපත් කාලගුණික තත්වයන්ගේ බලපෑමෙන් යල කන්නයේ වී අස්වැන්න අඩුවීම වසරේ දෙවන අර්ධය තුළ සහල් මිල ගණන් ක්‍රමිකව ඉහළ නැංවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබේ. මේ අතර වී සඳහා වූ සහතික මිල ද සියයට 10කින් ඉහළ නැංවුණි. මේ සියලු හේතුවල බලපෑමෙන් සියලුම සහල් වර්ගවල සාමාන්‍ය මිල සියයට 3.1කින් ඉහළ ගොස් තිබේ. වසරේ මුල් භාගයේදී පැවති අයහපත් කාලගුණික තත්වයන්ගේ බලපෑම මත සැලකිය යුතු වගා

හානියක් සිදු වුව ද 2013 වසරේ සමස්ත වී නිෂ්පාදනය කැපී පෙනෙන ලෙස වර්ධනය විය. එය පෙර වසරට සාපේක්ෂව සියයට 20ක වර්ධනයකි. හිතකර මට්ටමක පැවති ඊසානදිග මෝසම් වර්ෂාව හේතුවෙන් ජලාසවල ජල මට්ටම ඉහළ යාම හා රජය විසින් වී මිල ඉහළ දැමීම හේතුවෙන් වගාකරුවන් 2013 යල කන්නයේ දී ඉහළ බිම් ප්‍රමාණයක් අස්වැදීම යල කන්නයේ වී නිෂ්පාදනය කැපී පෙනෙන ලෙස ඉහළ යාමට හේතු විය. නමුත් මහ කන්නයේ පැවති අයහපත් කාලගුණික තත්වයන්ගේ බලපෑම පිළිබිඹු කරමින් පෙර වර්ෂයේ මහ කන්නයේ ඵලදාවට සාපේක්ෂව හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 4,444ක සිට 4,281ක් දක්වා පහළ බැස තිබේ. මෙම ත්වයට සමාන්තරව 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වසරේදී සහල්වල සාමාන්‍ය මිල ගණන් ඉහළ මට්ටමක පැවතිණි. 2012 වසරේ යල කන්නයේ පැවති අයහපත් කාලගුණික තත්වය හේතුවෙන් ලද වාර්තාගත අඩු වී අස්වැන්න සහ සැපයුම් හිඟතාවයන් නිසා 2013 වසරේ මුල් කාලසීමාව තුළ සහල් මිල ගණන් ඉහළ මට්ටමක පැවතුණි. නමුත් මෙම වර්ෂයේ යල, මහ කන්නවල සරු අස්වනු ලැබීමේ ප්‍රතිඵලයක් ලෙස වසරේ පසුකාලීනව සහල් මිල ගණන් පහළ යාමක් දැකගත හැකි වූ බව මහ බැංකු වාර්ෂික වාර්තා පෙන්වා දෙයි.

වියලි කාලගුණික තත්වයන්ගේ බලපෑම මත 2014 වසර තුළ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 3.38ක් දක්වා සියයට 27කින් පහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස වසර තුළ නිපදවනු ලැබූ සහල් ප්‍රමාණය ද පහළ ගිය බව මහ බැංකු වාර්තා පෙන්වා දෙයි. වී ඵලදාව පහළ යාමත්, අස්වැන්න නෙළාගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණය අඩු වීමත් මේ සඳහා හේතු වී තිබේ. වී නිෂ්පාදනයේ වැඩිම පහළ යාම යල කන්නයේදී පෙන්නුම් කර තිබෙන අතර ඒ සියයට 35.5කින් පහළ යාමකි. මහ කන්නයේදී මෙම පහළ යාම සියයට 21.4කි. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2014 වසරේ සහල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 27.1කින් පහළ යාමක් පෙන්නුම් කරනු ලැබීය. යල කන්නය තුළ වාරි ජල සැපයුම අඩු මට්ටමක පැවතීම හේතුවෙන් අඩු ජල ප්‍රමාණයක් අවශ්‍යවන වෙනත් භෝග වී වගා බිම්වල වගා කිරීම සඳහා රජය විසින් ගොවීහු උනන්දු කරවන ලද හ. යල සහ මහ කන්න දෙකෙහිම පැවති අයහපත් කාලගුණික තත්වය හේතුවෙන් වී නිෂ්පාදනය පහත වැටීම මෙම වසරේ සහල් මිල ගණන් ඉහළ යාමට හේතු විය. තවද සහල් ආශ්‍රිත නිෂ්පාදන වෙනුවෙන් සහල් මිලදී ගැනීම සඳහා ඇතිවූ තරගකාරීත්වය ද සහල් මිල කෙරෙහි යම් පීඩනයක් ඇතිකිරීමට හේතු විය. දේශීය වෙළඳපොළෙහි සැපයුම් සීමාවලට පිළියම් යොදමින් මිල පීඩනය යම් තරමට සමනය කිරීම සඳහා 2014 අප්‍රේල් 9වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ආනයනික

සහල් මත පනවා තිබූ සියලු බදු වෙනුවට කිලෝග්‍රෑමයට රුපියල් 5ක විශේෂ භාණ්ඩ බද්දක් පනවා තිබෙන අතර එය තවදුරටත් රුපියල දක්වා අඩු කර තිබේ (මහ බැංකුව 2015). මෙහි ප්‍රතිඵලයක් ලෙස සහල් ආනයනය ඉහළ යාම සැපයුම් හිඟය අවම කිරීම සඳහා හේතු වූ තිබේ. මීට අමතරව වෙළඳපොළ මිලට වඩා ඉතා පහළ මට්ටමක පැවති සහල්වල උපරිම මිල සීමාවද ඉහළ නංවන ලදි. තව ද 2014 අප්‍රේල් 27වන දින සිට ලක් සතොස වෙළඳ සල්වල ආනයනික සහල්වල උපරිම සිල්ලර මිල පහළ දමා තිබේ. සහල් මිල තරමක් දුරට පාලනය කරගැනීමට මෙම ක්‍රියාමාර්ග උපකාරී වී තිබෙන බව මහ බැංකු වාර්තා පෙන්වා දෙයි.

මහ බැංකු වාර්ෂික වාර්තාවට අනුව, හිතකර ප්‍රතිපත්ති සහ යහපත් කාලගුණික තත්වයන් හේතුවෙන් 2015 වසර තුළදී වී නිෂ්පාදනය මෙතෙක් වාර්තා වූ ඉහළ ම නිෂ්පාදන මට්ටම දක්වා වර්ධනය විය. එය පෙර වසරට සාපේක්ෂව සියයට 42.6ක වර්ධනයකි. වසර තුළ වගා කළ සහ අස්වැන්න නෙළාගන්නා ලද බිම් ප්‍රමාණය සැලකිය යුතු ලෙස වර්ධනයත් සමග සාමාන්‍ය ඵලදාව ඉහළ යාම එයට දායක විය. මෙම වසරේ මහ කන්නයේදී වී නිෂ්පාදනය සියයට 28.7කින් වර්ධනය වූ අතර යල කන්නය තුළ නිෂ්පාදනය සියයට 69.7කින් වර්ධනය විය. වී මිලදී ගැනීමේ සහතික මිල, පොහොර සහනාධාරය සහ වී අලෙවි මණ්ඩලය විසින් තොග මිලදී ගැනීම හරහා වූ රජයේ මැදිහත්වීම්, 2015 වසරේ වී අංශයේ සැලකිය යුතු වර්ධනය සඳහා දායක විය. ප්‍රතිපත්තිමය වෙනස්කම් හා වෙළඳපොළ තත්වයන්ට ප්‍රතිචාර දක්වමින් 2015 වසරේදී වී සහ සහල් මිල ගණන් උච්ඡාවචනය විය. ආරම්භක සහල් තොගය පහළ මට්ටමක පැවතීම හේතුවෙන් මෙම වසර ආරම්භයේදී සහල් මිල ගණන් ඉහළ මට්ටමක පැවතුණි. මෙලෙස වසර මුලදී ඉහළ මට්ටමක පැවති සහල් මිල මහ කන්නයේ ඉහළ වී අස්වැන්න හා වසරේ මුල් කාලයේ සහල් ආනයනය ඉහළ යාම හේතුවෙන් ක්‍රමයෙන් අඩුවිය. කෙසේ වුව ද 2014 වසරේ වාර්තා වූ මිල මට්ටම ඉක්මවා යාමට මෙම අඩුවීම ප්‍රමාණවත් නොවීය. රජයේ වී මිලදීගැනීමේ වැඩසටහන යටතේ වී ගැනුම් මිල ඉහළ දැමීමේ ප්‍රතිඵලයක් ලෙස වී මිල ක්‍රමයෙන් වැඩි වීමෙන් වසරේ සිව්වන කාර්තුවේදී සහල් මිල යලි ඉහළ ගියේය. මීට අමතරව සහල් ආනයනය අධෛර්යමත් කිරීමට හා දේශීය ගොවීන් ආරක්ෂා කිරීමේ අරමුණින් 2015 වසරේ මාර්තු 26වන දින සිට සහල් මත පනවන ලද විශේෂ භාණ්ඩ බද්ද ඉහළ නැංවීම ද ඉහළ සහල් මිල ගණන් සඳහා හේතු වී තිබේ.

2016 මහ බැංකු වාර්ෂික වාර්තාවට අනුව, වී නිෂ්පාදනය, 2015 වර්ෂයේදී වාර්තා වූ ඉහළ ම අස්වැන්නෙන් පසු 2016 වසරේදී මෙට්‍රික් ටොන් මිලියන 4.4ක් දක්වා සියයට 8.3කින් පහත වැටුණි. අස්වැන්න නෙළාගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණය සියයට 7.1කින් පහළ ගිය අතර 2015 වසරේදී හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 4428ක් වූ වී ඵලදාව 2016 වසරේදී 4372ක් දක්වා පහත වැටුණි. මෙය 2015/16 මහ කන්නය තුළ වී නිෂ්පාදනය ඉහළ යෑමේ සහ 2016 යල කන්නය තුළ වී නිෂ්පාදනය පහළ යෑමේ ඒකාබද්ධ ප්‍රතිඵලයකි. 2015 වසර අග භාගයේදී පැවති හිතකර වර්ෂාපතන තත්වයත්, වී වගා කරන ප්‍රදේශවල අස්වැන්න නෙළාගන්නා ලද බිම් ප්‍රමාණයෙහි ඉහළ යෑමත් මහ කන්නයේ වී නිෂ්පාදනය ඉහළ යාමට හේතු විය. මේ අතර වසරේ දෙවන කාර්තුවේ හටගත් දැඩි කුණාටු තත්වය නිසා ඇතිවූ ගංවතුර හා නායයෑම් හේතුවෙන් 2016 යල කන්නයේ වී නිෂ්පාදනය පෙර වසරේ යල කන්නයට සාපේක්ෂව සියයට 21.9කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි. මෙය එම වසර අගභාගයේදී සියලුම වී ප්‍රභේදවල මිල ගණන් ඉහළ යාමට ද හේතු වී තිබේ.

සහල් අංශය පිළිබඳ සැලකීමේදී, 2015 සහ 2016 වසරවලදී සහල් ආනයනය සඳහා පනවන ලද බදු ඉහළ යෑම සහ 2015 වසරේදී වාර්තා වූ ඉහළ වී අස්වැන්න හේතු කොටගෙන පැවති සහල් තොග ඉහළ යාමට අනුකූලව 2016 වසරේදී සහල් ආනයනය ශීඝ්‍ර ලෙස පහත වැටුණි. 2016 නොවැම්බර් මස පළමුවැනිදා සිට ආනයනය කරන සහල් කිලෝග්‍රෑමයකට රු.50ක රේගු බද්දක්, සියයට 15ක එකතු කළ අගය මත බද්දක්, සියයට 7.5ක වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්දක් සහ සියයට 2ක ජාතිය ගොඩනැගීමේ බද්දක් වශයෙන් බදු කිහිපයක් හඳුන්වා දුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2016 වසරේදී ආනයනය කරන ලද සහල් ප්‍රමාණය 2015 වසරේ සිට සියයට 89.7කින් තියුණු ලෙස පහත වැටුණි. කෙසේ වුවත් 2016 වසර අවසාන වනවිට වී සැපයුමෙහි ඇතිවූ හිඟය සහල්වල සිල්ලර මිල ඉහළ යාමට හේතු වූ අතර, රජය විසින් ආනයනය කරන ලද සහල් වෙළඳපොළට සැපයීම මඟින් සහල් මිල ස්ථායිව පවත්වාගෙන යාමට හේතු විය. මෙම වර්ෂයේදී පැනවූ ආනයනික බදු 2017 ජනවාරි මස 9වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ඉවත් කොට ඒ වෙනුවට ආනයනය කරන සහල් ප්‍රභේද වන සම්බා, නාඩු සහ රතු සහල් වර්ග මත කිලෝග්‍රෑමයට රුපියල් 15ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් හඳුන්වා දෙන ලදි. 2017 ජනවාරි මස 27 දින සිට මෙය රුපියල් 5 දක්වා තවදුරටත් අඩු කරන ලදි. සහල් වෙළඳුන් විසින් වෙළඳපොළෙහි කෘත්‍රිම සහල් හිඟයක් මවා පෑම අධෛර්යමත් කිරීම සඳහා මෙම පියවර හඳුන්වාදෙනු ලැබීය.

4. පර්යේෂණ ක්‍රමවේදය

ශ්‍රී ලංකාවේ දේශීය සහල් මිල තීරණය වීම කෙරෙහි බලපාන සාධක, සහල් මිල සමග පවත්නා කෙටිකාලීන හා දිගුකාලීන සබඳතාව හඳුනාගැනීම සඳහා අංක (01) ප්‍රතිපායන ආදර්ශය යොදා ගැනුණි.

$$RP_t = \beta_0 + \beta_1(GP_t) + \beta_2(PP_t) + \beta_3(PW_t) + \beta_4(iR_t) + \beta_5(EP_t) + \beta_6(AP_t) + \beta_7(RA_t) + e_t \ldots\ldots\ldots(01)$$

RP= ශ්‍රී ලංකාවේ දේශීය සහල් මිල (සහල් කිලෝග්‍රෑමයක වාර්ෂික සාමාන්‍ය මිල)

GP= වී කිලෝග්‍රෑමයකට පනවා ඇති සහතික මිල

PP= වාර්ෂික වී නිෂ්පාදන ප්‍රමාණය

Pw = තිරිඟු පිටි කිලෝග්‍රෑමයක වාර්ෂික සාමාන්‍ය මිල

iR= වාර්ෂික සහල් ආනයනික ප්‍රමාණය

EP= වාර්ෂික සාමාන්‍ය විදුලි ගාස්තුව

AP= මධ්‍ය වාර්ෂික ජනගහනය

RA= වාර්ෂික වර්ෂාපතනය (mm)

εt = සසම්භාවී දෝෂ පදය

ආදර්ශයේ පරාමිතීන් නිමානය කිරීම සඳහා 1977-2016 කාලපරිච්ඡේදයට අදාළ ද්විතියික දත්ත භාවිත කෙරුණු අතර ඒ සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තා, ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු වාර්තා, ප්‍රකාශිත පොත්පත් හා සඟරා සහ අන්තර්ජාලය ආශ්‍රයෙන් දත්ත එක්රැස් කරන ලදි. දත්ත විශ්ලේෂණය සඳහා E-Views පරිගණක මෘදුකාංගය උපයෝගී කර ගැනුණි.

මෙහිදී සහල් මිල තීරණය වීම කෙරෙහි බලපාන විචල්‍යයන්ට අදාළ දත්තයන් ලබාගත් මිනුම් පහත ආකාර වේ.

දේශීය සහල් මිල	- නාඩු සහල් කිලෝග්‍රෑමයක වාර්ෂික සාමාන්‍ය මිල රු. වලින්
සහතික මිල	- වී කිලෝග්‍රෑමයකට පනවා ඇති වාර්ෂික සහතික මිල රුපියල්
වී නිෂ්පාදන ප්‍රමාණය	- වාර්ෂික වී නිෂ්පාදන ප්‍රමාණය මෙට්‍රික් ටොන් දහස් වලට
තිරිඟු පිටි මිල	- කිලෝග්‍රෑමයක වාර්ෂික සාමාන්‍ය මිල රුපියල්වලින්
සහල් ආනයනික	-වාර්ෂික සහල් ආනයනික ප්‍රමාණය මෙට්‍රික් ටොන් දහස් වලට
විදුලි ගාස්තුව	- වාර්ෂික සාමාන්‍ය විදුලි ගාස්තුව රුපියල්වලින්

ජනගහනය - මධ්‍ය වාර්ෂික ජනගහනය දහස් වලිනි
වර්ෂාපතනය - වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර් වලට අනුව වේ.

5. දත්ත විශ්ලේෂණය

ශ්‍රී ලංකාවේ දේශීය සහල් මිල තීරණය වීම කෙරෙහි බලපාන සාධක හඳුනාගැනීම සම්බන්ධව සිදුකරන මෙම අධ්‍යනයේදී 1977-2016 කාල පරිච්ඡේදයට අදාළ ද්විතීයික දත්ත භාවිත කරන ලදි. ආර්ථිකමිතික ක්‍රමවේදය භාවිත කිරීමට පෙර සහල් මිල තීරණය වීම කෙරෙහි තීරක බලපෑමක් ඇතිකරන සාධකයන්හි ස්ථායිතාවය පරීක්ෂා කිරීම වැදගත් වේ. ඒ අනුව ප්‍රතිපායන ආදර්ශය තුළ යොදාගන්නා විචල්‍යයන්හි ස්ථායි බව (Stationarity) පරීක්ෂා කිරීම සඳහා අදාළ සියලුම විචල්‍යයන් වෙන් වෙන් වශයෙන් ඒකක මූල පරීක්ෂාවට භාජනය කරන ලදි. එක් එක් විචල්‍යන්ට අදාළ දත්ත ශ්‍රේණීන්ගේ ඒක මූල බව පරීක්ෂා කිරීම සඳහා වර්ධිත ඩිකී ෆුලර් පරීක්ෂාව (Augmented Dickey Fuller Test - ADF) භාවිත කෙරුණි. ඒකක මූල පරීක්ෂාව විචල්‍යයන්හි මට්ටම් (Level) සහ පළමු අන්තරය (First difference) යන අවස්ථාවන් යටතේ සිදු කරන ලදි. එක් එක් විචල්‍යයන් සඳහා ඒකක මූල පරීක්ෂාව කිරීමෙන් ලද ප්‍රතිඵල පහත අංක 1 සංඛ්‍යා සටහන මගින් දැක්වේ.

අංක (01) සංඛ්‍යා සටහනෙන් හඳුනාගත හැකි පරිදි Augmented Dickey Fuller (ADF) පරීක්ෂාවට අනුව විචල්‍යන් සියල්ලම පළමු වෙනස යටතේ ස්ථායි වන හෙයින් අනුකලන පිළිවෙළ එකක් (Order Of Integration One) පැවති බව තහවුරු විය. තවද විචල්‍යයන් 1(1) අවස්ථාවේදී ස්ථායි වීමෙන් සහානුකලන පරීක්ෂාව (Cointegration Test) සඳහා වලංගු භාවයක් ඇති කරනු ලැබීය. එනම් සහල් මිල හා එය තීරණය වීම කෙරෙහි බලපාන සාධක අතර දිගුකාලීන සම්බන්ධතාවයක් පවතින්නේදැයි පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය වලංගුභාවය ඇතිකරන ලදි. එබැවින් පහත පරිදි සහානුකලන පරීක්ෂාව වෙත ප්‍රවේශ විය හැකියි.

සංඛ්‍යා සටහන අංක (01) : විචල්‍යයන් සඳහා ඒකක මූල පරීක්ෂාවේ ප්‍රතිඵල

විචල්‍යය	අවස්ථාව	ADF පරීක්ෂා සංඛ්‍යාතිය	ඒකක මූල බව	ස්ථායී බව
RP	මට්ටම් අවස්ථාව	-1.796225	ඒකක මූල වේ	ස්ථායී නොවේ
	පළමු අන්තරය	-5.258717**	ඒකක මූල නොවේ	ස්ථායී වේ
GP	මට්ටම් අවස්ථාව	2.042557	ඒකක මූල වේ	ස්ථායී නොවේ
	පළමු අන්තරය	-7.754612**	ඒකක මූල නොවේ	ස්ථායී වේ
PP	මට්ටම් අවස්ථාව	-0.281602	ඒකක මූල වේ	ස්ථායී නොවේ
	පළමු අන්තරය	-7.091926**	ඒකක මූල නොවේ	ස්ථායී වේ
Pw	මට්ටම් අවස්ථාව	-0.767577	ඒකක මූල වේ	ස්ථායී නොවේ
	පළමු අන්තරය	-4.728925**	ඒකක මූල නොවේ	ස්ථායී වේ
iR	මට්ටම් අවස්ථාව	-5.852459**	ඒකක මූල නොවේ	ස්ථායී වේ
EP	මට්ටම් අවස්ථාව	0.465327	ඒකක මූල වේ	ස්ථායී නොවේ
	පළමු අන්තරය	-6.945006**	ඒකක මූල නොවේ	ස්ථායී වේ
AP	මට්ටම් අවස්ථාව	-2.309079	ඒකක මූල වේ	ස්ථායී නොවේ
	පළමු අන්තරය	-6.411730**	ඒකක මූල නොවේ	ස්ථායී වේ
RA	මට්ටම් අවස්ථාව	-6.477763**	ඒකක මූල නොවේ	ස්ථායී වේ

සටහන: අවධි අගය (5%) - 2.9 වේ. ** මගින් 5% වෙසෙසි මට්ටමේදී දත්ත ශ්‍රේණියේ ස්ථායී බව දක්වේ.

ජොහැන්සන් සහානුකලන පරීක්ෂාව

කාලශ්‍රේණි ආර්ථිකමිතික විශ්ලේෂණයේදී දිගුකාලීනව විචල්‍යයන් අතර සමතුලිත සබඳතාවයක් පවතීදැයි පරීක්ෂා කිරීම සඳහා සහානුකලන පරීක්ෂාව සිදුකරනු ලැබීය. ඒ අනුව මෙහිදී ජොහැන්සන් සහානුකලන පරීක්ෂාව යටතේ ශ්‍රී ලංකාවේ දේශීය සහල් මිල හා එය තීරණය වීම කෙරෙහි බලපානු ලබන ප්‍රධාන විචල්‍යයන් අතර දිගුකාලීන සම්බන්ධතාවක් පවතින්නේ ද යන්න පරීක්ෂා කරන ලදි. සහානුකලන පරීක්ෂාව සිදු කිරීමට ප්‍රථම යෝග්‍ය විලම්භ ගණන පරීක්ෂා කළ යුතු විය. එම පරීක්ෂාවේදී LR, FPE, AIC, SC හා HQ යන නිර්ණායකයන්ට අනුව යෝග්‍ය විලම්භ ගණන 1ක් ලෙසට යෝජනා කරනු ලැබීය.

මෙලෙස නිර්ණායක වැඩි ප්‍රමාණයක් මඟින් යෝජනා කරනු ලබන ප්‍රශස්ත අගය වන විලම්භ 1 විශ්ලේෂණය සඳහා පාදක කරගනු ලැබීය. තව ද ADF පරීක්ෂාවට අනුව විචල්‍යයන් 1(1) අවස්ථාවේදී ස්ථායී වන හෙයින් (අංක 01 සංඛ්‍යා සටහන) සහානුකලන පරීක්ෂාව සඳහා වන මූලික ගුණාංගයක් තෘප්ත වීම තුළින් ඒ සඳහා වලංගුභාවයක් ඇති කර තිබේ. ඉන්පසුව ජොහැන්සන් සහානුකලන පරීක්ෂාව

භාවිත කරමින් විචල්‍යයන් අතර පවතින සහානුකලන සම්බන්ධතා ගණන පරීක්ෂා කරන ලදී. ඊට අදාළ ප්‍රතිඵල අංක (02) සංඛ්‍යා සටහනේදී දක්වා ඇත.

අංක (02) සංඛ්‍යා සටහනට අනුව විචල්‍යයන් අතර දිගුකාලීන සම්බන්ධතාවක් පවතී ද යන්න නිගමනය කිරීම සඳහා Trace සංඛ්‍යාතිය භාවිත කරන ලදී. එහිදී සියයට 5 වෙසෙසි මට්ටමට අදාළ අවධි අගය වන 159.53ට වඩා Trace සංඛ්‍යාත අගය වන 228.64 අගය විශාල වීම හේතුවෙන් සහානුකලන සම්බන්ධතාවයක් නොමැත යන අප්‍රතිෂ්ඨ්‍ය කල්පිතය (Rank=0) ප්‍රතික්ෂේප කර සහානුකලන සම්බන්ධතාවයක් හෝ ඊට වඩා වැඩි ගණනක් පවතී යන විකල්ප කල්පිතය (Rank>0) පිළිගන්නා ලදී. ඒ අනුව සියයට 5වෙසෙසි මට්ටම යටතේදී ආදර්ශයේ සහානුකලන සබඳතා දෙකක් හඳුනාගත හැකි වූ හෙයින් සහල් මිල හා සහල් මිල තීරණය වීම කෙරෙහි බලපාන විචල්‍යයන් අතර දිගුකාලීන සම්බන්ධතාවක් පවතින බව තහවුරු විය.

සංඛ්‍යා සටහන අංක (02): සහානුකලන පරීක්ෂාවේ ප්‍රතිඵල

Hypothesized No. of CE(s)	***Eigenvalue***	***Trace Statistic***	***0.05 Critical Value***	***Prob.*****
*None **	*0.857203*	*228.64*	*159.53*	*0.0000*
*At most 1 **	*0.808845*	*154.68*	*125.62*	*0.0003*
At most 2	*0.544243*	*91.81*	*95.75*	*0.0907*
At most 3	*0.459008*	*61.94*	*69.82*	*0.1806*
At most 4	*0.362096*	*38.59*	*47.86*	*0.2765*
At most 5	*0.309009*	*21.52*	*29.79*	*0.3263*
At most 6	*0.178164*	*7.47*	*15.49*	*0.5237*
At most 7	*0.000355*	*0.02*	*3.84*	*0.9073*

Trace test indicates 2 cointegrating eqn (s) at the 0.05 level

කෙටිකාලීන හා දිගුකාලීන සම්බන්ධතාව

විචල්‍යයන් අතර දිගුකාලීන සමතුලිත සම්බන්ධතාවක් පවතින බව තහවුරු කරගැනීමෙන් අනතුරුව විචල්‍යයන් අතර වන කෙටිකාලීන සම්බන්ධතාව මෙන්ම විචල්‍යයන් අතර වන දිගුකාලීන සමතුලිත සම්බන්ධතාව ද හඳුනාගැනීම වැදගත් විය. ඒ සඳහා කාලශ්‍රේණි ආර්ථිකමිතික ක්‍රමවේදයේදී යොදා ගනු ලබන දෛශික දෝෂ ශෝධන ආදර්ශය (Vector Error Correction Model) භාවිත කරන ලදී.

විචල්‍යයන් අතර දිගු කාලීන සම්බන්ධතාව

දෛශික දෝෂ ශෝධන ආදර්ශයේ ප්‍රතිඵල අනුව, ආදර්ශයේ දෝෂ ශෝධන පදය සෘණ සහ වෙසෙසි වීම තුළින් දිගුකාලීන සමතුලිත සම්බන්ධතාවයක් පවතින බව තහවුරු විය. එයින් ගම්‍යවන අදහස නම් සෑම වසරකදීම කෙටිකාලීන අසමතුලිතයේ සිට දිගුකාලීන සමතුලිතය දෙසට ප්‍රතිශතක 0.780ක වේගයකින් පැමිණෙන බව හෙවත් සෑම වසරකදීම ප්‍රතිශතක 0.780ක් බැගින් අසමතුලිතය නිවැරදි කරන බවයි. මෙලෙස ආදර්ශයේ දෝෂ ශෝධන පදය වෙසෙසි වීම මඟින් සහානුකලන සම්බන්ධතාවය වලංගු විය. මේ නිසා ආදර්ශයේ විචල්‍යයන් අතර දිගුකාලීන සම්බන්ධතාවයක් පවතින බව ප්‍රකාශ කළ හැකි විය. ඒ අනුව සහල් මිල හා එය තීරණය වීම කෙරෙහි බලපාන සාධක අතර හඳුනාගත හැකි දිගුකාලීන සම්බන්ධතාවය අංක (02) ශ්‍රිතයේ දක්වා ඇති පරිදි ගොඩනැගිය හැකි වේ.

$$RP(-1) = 9.18 - 1.35\ GP(-1) - 0.10\ IR(-1) - 0.02\ PP(-1) + 1.61\ PW(-1) + 0.01\ RA(-1) + 0.004\ AP(-1) \ldots\ldots (02)$$

(-3.379)** (-9.447)* (-6.225)* (10.645)* (2.681)** (7.658)*

ශ්‍රී ලංකාව තුළ වී මිලදී ගැනීම සඳහා සහතික මිල ක්‍රමයක් ක්‍රියාත්මක වීම මඟින් 1977 වර්ෂයේ සිටම දේශීය වී නිෂ්පාදන හා සහල් නිෂ්පාදන අංශය කෙරෙහි වැදගත් බලපෑමක් ඇති කර තිබේ. අංක (02) ආදර්ශයට අනුව, වී කිලෝග්‍රෑමයක වාර්ෂික සහතික මිල (GP) සියයට 5 වෙසෙසි මට්ටම යටතේදී සහල් කිලෝග්‍රෑමයක වාර්ෂික සාමාන්‍ය මිල සමග දිගුකාලීන සෘණ වෙසෙසි සම්බන්ධයක් පවතින බව හඳුනාගත හැක. රජය විසින් වී කිලෝග්‍රෑමයක් සඳහා ගෙවනු ලබන සහතික මිල ඉහළ නංවන විට සහල් කිලෝග්‍රෑමයක මිල පහළ යන බව ඉන් අදහස් වේ. 2016 ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවට අනුව එම වර්ෂයේ වී සඳහා සහතික ගැනුම් මිල අඩු කෙරුණි. සම්බා වී ප්‍රභේද සඳහා සහතික කළ ගැනුම් මිල කිලෝග්‍රෑමයට රුපියල් 50 සිට 41 දක්වා ද නාඩු වී කිලෝග්‍රෑමයක සහතික ගැනුම් මිල රුපියල් 45 සිට රුපියල් 38ක් දක්වා අඩු කරනු ලැබීය. මෙම ප්‍රතිපත්තිමය තීරණය යල කන්නයේ වී නිෂ්පාදනය පහළ යාමත් සමග සහල් මිල ඉහළ යාමට හේතු වී ඇති බව එම පාර්ශවය පෙන්වා දී තිබේ. මේ තුළින් ගම්‍ය වන අදහස නම් රජය වී සඳහා ඉහළ සහතික මිලක් නියම කිරීම ගොවීන් විසින් ඉහළ නිෂ්පාදනයක් සඳහා පෙළඹීමක්

ඇතිකරන බවත් එහි ප්‍රතිඵලයක් ලෙස සහල් සැපයුමේ ඇතිවන වර්ධනය හේතුවෙන් සහල් මිල පහළ යාමටත් බලපෑම් ඇතිකරන බවයි.

අංක (02) ආදර්ශයට අනුව වාර්ෂික ආනයනික සහල් ප්‍රමාණය (IR) හා වාර්ෂික සාමාන්‍ය සහල් මිල අතර දිගුකාලීනව ඍණ වෙසෙසි සබඳතාවක් පවතින බව හඳුනාගැනීමට හැකි වුණි. එය සියයට එකක වෙසෙසි මට්ටම යටතේදීම වෙසෙසි වේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ ආනයනික සහල් ප්‍රමාණය ඉහළ යන විට වාර්ෂික සාමාන්‍ය සහල් මිල පහළ යන බව මේ තුළින් පෙන්වා දේ. සහල් ආනයනය ඉහළ නැංවීම තුළින් දිගුකාලීනව දේශීය සමස්ත සහල් සැපයුමේ ඉහළ යාමක් ඇති වේ. එය සහල් මිල පහළ මට්ටමක තැබීමට හේතුවනු ලබයි. 2014 වර්ෂයේ මහ බැංකු වාර්ෂික වාර්තාවට අනුව, එම වර්ෂයේ සැප්තැම්බර් මස සිට ක්‍රියාත්මක වන පරිදි සහල් ආනයනික බදු සහල් කිලෝග්‍රෑමයට රුපියල් 1 දක්වා අඩු කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස සහල් ආනයනික ප්‍රමාණය ඉහළ ගොස් ඇති අතර එය දේශීය සහල් නිඟය අවම කිරීමට මෙන්ම දේශීය සහල් මිල පහළ හෙළීමට ද හේතු වී තිබේ. මෙම ප්‍රතිඵලය දයාරත්න ඇතුළු පිරිස (2008) විසින් පෙන්වා දී ඇති සහල් ආනයනය කිරීම දේශීය සහල් නිඟය අවම කිරීමට මෙන්ම දේශීය සහල් මිල පහළ දැමීමට ද ඵලදායි විසඳුමක් වේ යන නිගමනය සමග සමපාත වේ.

වාර්ෂික වී නිෂ්පාදන ප්‍රමාණය (PP) සියයට එක වෙසෙසි මට්ටම යටතේදී සහල් කිලෝග්‍රෑමයක වාර්ෂික සාමාන්‍ය මිල සමග දිගුකාලීන ඍණ වෙසෙසි සම්බන්ධයක් පවතින බව ප්‍රතිඵල මඟින් සනාථ විය. වාර්ෂික වී නිෂ්පාදන ප්‍රමාණය ඉහළ යාමේදී දේශීය සහල් මිල පහළ යන බව ඒ තුළින් අදහස් කෙරේ. වී නිෂ්පාදන ප්‍රමාණය යනු දේශීය සහල් සැපයුම තීරණය කරන එක් ප්‍රධාන සාධකයකි. ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවන්ට අනුව 2005 වර්ෂයේදී වැඩි බිම් ප්‍රමාණයක වී වගා කිරීම හේතු කරගෙන මහ සහ යල කන්න දෙකේදී ම වී නිෂ්පාදනය පිළිවෙලින් සියයට 21 හා සියයට 29ක ප්‍රතිශතයකින් වර්ධනය වී තිබේ. එම තත්වය සහල් මිල පහළ යෑමට හේතු වී ඇත. එමෙන් ම බොහෝ දේශීය කෘෂි භාණ්ඩවල මිල ගණන් තියුණු ලෙස ඉහළ ගිය 2007 වර්ෂයේදී දේශීය වී නිෂ්පාදනය සියයට 6.3කින් පහළ යෑම සහල් මිල ගණන් ඉහළ යෑමට බලපා ඇත. Kumar and Sharma (2006) විසින් ද මෙම ප්‍රතිඵලයට සමානව වී සැපයුම හා සහල් මිල ඍණාත්මක සම්බන්ධයක් පවතින බව හඳුනාගෙන තිබේ.

තිරිඟු පිටි කිලෝග්‍රෑමයක වාර්ෂික සාමාන්‍ය මිල (PW) හා සහල් කිලෝග්‍රෑමයක වාර්ෂික සාමාන්‍ය මිල අතර දිගුකාලීන ධන වෙසෙසි සම්බන්ධතාවයක් පවතින බව ප්‍රතිඵල තුළින් තහවුරු වේ. මෙම ප්‍රතිඵලය සියයට එක වෙසෙසි මට්ටම යටතේදී එහි වෙසෙසි බව හඳුනාගත හැකි විය. ඒ අනුව තිරිඟුපිටි කිලෝග්‍රෑමයක වාර්ෂික සාමාන්‍ය මිල ඉහළ යාමේදී දේශීය සහල් මිල ද ඉහළ යන බව ඉන් ගම්‍ය කෙරේ. 2007 වර්ෂයේදී ගෝලීය වශයෙන් තිරිඟු පිටි නිෂ්පාදනය පහළ යාම හේතුවෙන් තිරිඟු පිටි මිල තියුණු ලෙස ඉහළ යාමේ ආදේශන ප්‍රතිඵලයක් ලෙස සහල් සඳහා ඉල්ලුම ඉහළ ගොස් තිබෙන අතර තිරිඟුපිටි මිල ඉහළ මට්ටමක පැවතීම සහල් මිල නොකඩවා ඉහළ මට්ටමක තබාගැනීමට හේතු වී ඇත (ශ්‍රී ලංකා මහ බැංකුව 2007). තිරිඟු සැපයුම සහ සහල් මිල අතර සෘණ සබඳතාවක් පවතින බව Shim (1971) විසින් ද හඳුනාගෙන තිබේ. ඉන් යෝජනා කරනු ලබන්නේ තිරිඟු සැපයුම ඉහළයාම තිරිඟු මිල පහළ යාමට මෙන්ම එම ආදේශන බලපෑමේ ප්‍රතිඵලයක් ලෙස සහල් මිල පහළ යාමට ද හේතුවන බවයි.

වාර්ෂික වර්ෂාපතනය (RA) වාර්ෂික සාමාන්‍ය සහල් මිල කෙරෙහි දිගුකාලීනව ධන වෙසෙසි බලපෑමක් ඇතිකරන බව ප්‍රතිඵල අනුව හඳුනාගත හැකි විය. එහිදී එම විචල්‍ය සියයට 5 වෙසෙසි මට්ටම යටතේදී වෙසෙසි වූහ. වාර්ෂික වර්ෂාපතනය ඉහළ යනවිට දිගුකාලීන සහල් මිල ද ඉහළ යන බව ඉන් අදහස් කරයි. අනෙකුත් සාධක ස්ථාවරව පවතින විට වාර්ෂික වර්ෂාපතනය එක් ඒකකයකින් ඉහළ යාමේදී දිගුකාලීනව වාර්ෂික සාමාන්‍ය සහල් මිල ඒකක 0.01කින් ඉහළ යන බව ඉන් අර්ථකථනය කළ හැකි වේ. වර්ෂාපතනය වූ කලී කෘෂිකර්මාන්තය වෙත ජල සැපයුම තීරණය කරන ප්‍රධාන සාධකයකි. නමුත් අඛණ්ඩ වර්ෂාපතනය දිගුකාලීනව අයහපත් කාලගුණික තත්වයක් බවට පත්විය හැකියි. මහ බැංකු වාර්ෂික වාර්තාවන්ට අනුව, 2010 වසර හා සසඳන කළ 2011 වසරේ සමස්ත වී නිෂ්පාදනය සියයට 10කින් අඩු වී තිබේ. 2011 වසරේ ජනවාරි හා පෙබරවාරි මාසවල පැවති ගංවතුර තර්ජනයේ ඍජු හා වක්‍ර බපලෑම හේතුවෙන් මහ කන්නයේ වී නිෂ්පාදනය අඩු විය. 2009/10 මහ කන්නයට සාපේක්ෂව 2010/11 මහ කන්නයේ සාමාන්‍ය වී එලදාව හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 4,583 සිට හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 3,668 දක්වා අඩු වී තිබේ. අධික වර්ෂාව සහ ගංවතුර හේතුවෙන් ඇතිවූ මෙම බලපෑම 2011 වර්ෂයේ පෙබරවාරි හා මාර්තු මාසවලදී සියලුම වර්ගවල සහල් මිල ගණන් ඉහළ යාමට හේතු වී තිබේ.

මධ්‍ය වාර්ෂික ජනගහනය (AP) සහ දේශීය සහල් කිලෝග්‍රෑමයක වාර්ෂික සාමාන්‍ය මිල අතර දිගුකාලීනව ධන වෙසෙසි සම්බන්ධතාවක් පවතින බව තහවුරු විය. මධ්‍ය වාර්ෂික ජනගහනය ඉහළ යාමත් සමඟ දිගුකාලීනව සහල් මිල ඉහළ යන බව එහි අදහසයි. ජනගහනය ඉහළ යාමත් සමග දිගුකාලයේදී රටේ සමස්ත සහල් ඉල්ලුමේ ඉහළ යාමක් හඳුනාගත හැකි වීම එයට හේතුවයි. IRRI (2013) වාර්තාවට අනුව ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවල ආදායම ඉහළ යාමත් සමග ඒක පුද්ගල සහල් පරිභෝජනය සෙමින් පහළ බසින තත්වයක් දක්නට ලැබෙන බව පෙන්වා දෙයි. 2010 වසරේදී 108.7ක් වූ ඒක පුද්ගල සහල් පරිභෝජනය 2016 වසර වනවිට 107.8ක් බවට පත්වීමෙන් එය සනාථ වේ. නමුත් සමස්ත සහල් ඉල්ලුමේ ඉහළ යාමක් පවතී. FAPRI (2013) වාර්තාවට අනුව, 2010 වර්ෂයේදී මිලියන ටොන් 388ක් වූ ආසියාතික සහල් ඉල්ලුම 2035 වසර වනවිට මිලියන ටොන් 465ක් ලෙස වර්ධනය වනබව ප්‍රක්ෂේපණය කර තිබේ. එබැවින් ඒක පුද්ගල සහල් පරිභෝජනය පහළ යනු ලැබුව ද ජනගහනය ඉහළ යාම දිගුකාලීනව සහල් ඉල්ලුමේ වැඩි වීමක් හා සහල් මිලෙහි ඉහළ යාමක් සඳහා හේතුවිය හැක.

විචල්‍යයන් අතර කෙටිකාලීන සම්බන්ධතාවය පරීක්ෂා කිරීම

සහල් මිල හා එය තීරණය වීම කෙරෙහි බලපාන සාධක අතර පවත්නා දිගුකාලීන මෙන්ම කෙටිකාලීන සම්බන්ධතාය පරීක්ෂා කිරීම සඳහා භාවිත කරන ලද දෛශික දෝෂ ශෝධන ආදර්ශයට අනුව, විචල්‍යයන් අතර පවත්නා කෙටිකාලීන සම්බන්ධතාව අංක (03) ආදර්ශයෙන් පෙන්වා දී ඇති පරිදි හඳුනාගත හැකි වේ.

$$D(RP) = 1.63 + 0.70\ D[RP(-1)] - 1.93\ D[EP(-1)] - 0.53\ D[GP(-1)] - 0.008\ D[IR(-1)] - 0.003\ D[PP(-1)]$$

(1.623) (2.647)** (-1.459) (-1.217) (-2.249)** (-2.244)**

$$+ 0.25\ D[PW(-1)] + 0.001\ D[RA(-1)] + 0.0001\ D[AP(-1)] \quad \ldots\ldots\ldots (03)$$

(1.152) (0.629) (0.044)

අංක (03) ආදර්ශයට අනුව පෙර වසරේ සහල් මිල {D(RP(-1)} මෙම වසරේ සහල් මිල සමග සියයට 5 වෙසෙසි මට්ටම යටතේ ධන වෙසෙසි සබඳතාවක් පවතින අයුරු හඳුනාගත හැකි වේ. දයාරත්න ඇතුළු පිරිස (2008) සිදුකළ අධ්‍යයනයට අනුව

පෙර වසරේ සහල් මිල හා මෙම වසරේ වී මිල අතර ශක්තිමත් ඒකරේඛීයතාවක් පවතින බව හඳුනාගෙන තිබේ. ඒ අනුව පෙර වසරේ සහල් මිල ඉහළ යාම මේ වසරේ වී මිල ඉහළ යාමට හේතුවන අතර එය නැවතත් වර්තමාන සහල් මිල ඉහළ නංවයි. නමුත් වාර්ෂික සාමාන්‍ය විදුලි ගාස්තුව (D(EP(-1)) හා වී කිලෝග්‍රෑමයක සහතික මිල {D(GP(-1)} යන විචල්‍යයන් සහල් මිල කෙරෙහි වෙසෙසි බලපෑමක් ඇති නොකරන අයුරු ප්‍රතිඵල අනුව හඳුනාගත හැකි වේ. රජය සහතික මිලට වී මිලදී ගැනීමේ ක්‍රියාවලිය වූ කලී මිල ගණන් උච්චාවචනය මත කෙටිකාලීනව වක්‍ර බලපෑමක් මිස ඍජු බලපෑමක් ඇතිකළ නොහැකි සාධකයකි. මන්ද රජය විසින් ගොවීන්ගෙන් සහතික මිලට වී මිලදී ගනු ලබන්නේ සියයට 10ටත් වඩා අඩු ප්‍රමාණයකි. රණතිලක (2008) පෙන්වාදෙන පරිදි 1990න් පසු ඇතිවූ පෞද්ගලීකරණ වැඩසටහන් හරහා රජයේ වී මිලදී ගැනීමේ දායකත්වය ක්‍රමයෙන් අඩුවී තිබේ. එබැවින් කෙටිකාලීනව සහතික මිල ඔස්සේ සහල් මිල තීරණය වීම කෙරෙහි ඍජු බලපෑමක් එල්ල කළ නොහැකි වේ. නමුත් මෙම විචල්‍ය සහල් මිල සමග පවත්නා න්‍යායාත්මක සම්බන්ධය (ඍණ) එපරිද්දෙන් ම හඳුනාගත හැකි විය.

පෙර වසරේ ආනයනික සහල් ප්‍රමාණය {D(IR(-1)} කෙටිකාලයේදී සියයට 5 වෙසෙසි මට්ටම යටතේ මෙම වසරේ දේශීය සහල් මිල කෙරෙහි ඍණ වෙසෙසි බලපෑමක් ඇතිකරනු ලබයි. ඒ අනුව කෙටිකාලයේදී ආනයනික සහල් ප්‍රමාණය ඉහළ යාමත් සමග දේශීය සහල් මිල පහළ බසින බව ඉන් අදහස් කරයි. අනෙකුත් සාධක ස්ථාවරව පවතිනවිට ආනයනික සහල් ප්‍රමාණය එක් ඒකකයකින් ඉහළ යනවිට කෙටිකාලයේදී දේශීය සහල් කිලෝග්‍රෑමයක වාර්ෂික සාමාන්‍ය මිල ඒකක 0.008කින් පහළ යයි. දයාරත්න ඇතුළු පිරිස (2008) හඳුනාගෙන ඇති පරිදි තාවකාලික සහල් හිඟය ඉවත්කර සමස්ත දේශීය සහල් සැපයුම ඉහළ නැංවීම උදෙසා සහල් ආනයනය කිරීම හේතුවන අතර, ඒ මඟින් දේශීය සහල් මිල කෙටිකාලීනව පහළ යනු ලබන බව නිගමනය කර තිබේ. පසුගිය වසරේ වාර්ෂික වී නිෂ්පාදන ප්‍රමාණය {D(PP(-1)} සහ මෙම වසරේ දේශීය සහල් කිලෝග්‍රෑමයක වාර්ෂික සාමාන්‍ය මිල අතර ද කෙටිකාලීන ඍණ වෙසෙසි සම්බන්ධයක් පවතින බව හඳුනාගත හැකි වේ. දේශීය සහල් සැපයුම තීරණය කරන ප්‍රධානතම සාධකය වන වාර්ෂික වී නිෂ්පාදන ප්‍රමාණය මෙම වර්ෂයේ මෙන්ම ඊළඟ වර්ෂය ආරම්භයේ සහල් තොගය තීරණය කිරීමට ද හේතු වේ. ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවට අනුව, 2014 යල කන්නයේ වී නිෂ්පාදනය පහළ යාම මෙන්ම ඉන් පෙර කන්න කිහිපයකදීම ලද අඩු

අස්වනු හේතුවෙන් සහල් තොගය අඩු මට්ටමක පැවතීම 2015 වසර ආරම්භයේදී සහල් මිල ඉහළ මට්ටමක පැවතීමට හේතු වී තිබේ.

පෙර වසරේ තිරිඟු පිටි කිලෝග්‍රෑමයක වාර්ෂික සාමාන්‍ය මිල {D(PW)-1)} කෙටිකාලයේදී මෙම වසරේ දේශීය සහල් මිල කෙරෙහි සෙසෙසි බලපෑමක් ඇති නොකරන බව හඳුනාගත හැකි වේ. නමුත් දයාරත්න ඇතුළු පිරිස (2008) මෙන්ම IRRI (2013) වාර්තාවෙන් ද පෙන්වාදෙන්නේ කෙටිකාලීනව සහල් මිල පහත දැමීමට තිරිඟු පිටි ආනයනය මඟින් විශේෂ බලපෑමක් ඇතිකරන බවයි. නමුත් මෙම අධ්‍යනයේ තිරිඟු පිටි මිල හා සහල් මිල අතර පවත්නා න්‍යායාත්මක සම්බන්ධය (ධන) එලෙසම හඳුනාගත හැකි විය. එමෙන්ම වාර්ෂික වර්ෂාපතනය කෙටිකාලීනව දේශීය සහල් මිල කෙරෙහි වෙසෙසි බලපෑමක් ඇති නොකරන ඉහත ප්‍රතිඵල අනුව හඳුනාගත හැකිවේ. වර්ෂාපතනය වී නිෂ්පාදනය වෙත ජල සැපයුම තීරණය කරන සාධකයක් වුව ද කෙටිකාලීනව එය වී නිෂ්පාදනය ඉහළ නැංවීමට හෝ වී වගාවට හානි වීමට විශේෂ බලපෑමක් ඇති නොවිය හැකිය. එය බොහෝ විට අඛණ්ඩ වර්ෂාපතනයත් සමග දිගුකාලීනව ඇතිවන ධනාත්මක හෝ ඍණාත්මක බලපෑමක් පමණි.

මධ්‍ය වාර්ෂික ජනගහනය {D(AP(-1)} හා දේශීය සහල් මිල අතර ද කෙටිකාලීන වෙසෙසි සබඳතාවයක් නොපවතින බව හඳුනාගත හැකි වේ. නමුත් එහි න්‍යායාත්මක සම්බන්ධයෙහි (ධන) වෙනසක් සිදුවී නොමැත. Cristopher and Paul (2008) අනුව, සහල් ඉල්ලුම වූ කලී ජනගහනය මතම පමණක් නොව, ඒක පුද්ගල ආදායම ඉහළ යාමත් සමග පුද්ගලයන්ගේ පරිභෝජන පුරුදු වෙනස්වීමට ද සමගාමීව තීරණය වන්නකි. එමෙන්ම Shim (1971) අනුව ද ඒක පුද්ගල වැයකළ හැකි ආදායම ඉහළ යාම හා ජනගහනය ඉහළයාම යන සංසිද්ධි දෙකම ඒකාබද්ධව සහල් ඉල්ලුම කෙරෙහි ප්‍රතිචාර දක්වන බව පෙන්වා දෙයි. එබැවින් රටක මධ්‍ය වාර්ෂික ජනගහනය ඉහළ යාම කෙටිකාලීනව දේශීය සහල් මිල මත වෙසෙසි බලපෑමක් ඇති නොකිරීමට හේතු විය හැකියි.

6. නිගමන හා ප්‍රතිපත්ති ගම්‍යතා

ශ්‍රී ලංකාවේ දේශීය සහල් මිල තීරණය වීම කෙරෙහි බලපාන සාධක සහල් මිලත් සමග පවත්නා දිගුකාලීන හා කෙටිකාලීන සබඳතාවයේ ස්වරූපය හඳුනාගැනීම සඳහා සිදුකළ කාල ශ්‍රේණි ප්‍රතිපායන ආදර්ශය නිමානයට අනුව ලද ප්‍රතිඵල ඔස්සේ නිගමනයන් කිහිපයකට එළඹීම හා සුදුසු ප්‍රතිපත්තිමය යෝජනා ඉදිරිපත් කිරීම මෙහිදී සිදු කෙරේ.

දේශීය වාර්ෂික වී නිෂ්පාදන ප්‍රමාණය ඉහළයාමේදී දිගුකාලීනව සහල් මිල පහළ යාමේ ප්‍රවණතාවක් පවතී.

දේශීය වී නිෂ්පාදනය වූ කලී රටෙහි දේශීය සහල් සැපයුම තීරණය කරන එක් ප්‍රධානතම ක්ෂේත්‍රය කි. අංක (02) ආදර්ශයෙන් දක්වන ලද අධ්‍යයන ප්‍රතිඵලවලට අනුව, වී නිෂ්පාදන ප්‍රමාණය හා සහල් මිල අතර දිගුකාලීන සෘණ වෙසෙසි සබඳතාවක් පවතින බව හඳුනාගැනීමට හැකිවුණි. ඒ අනුව අනෙකුත් සාධක ස්ථාවරව පවතින අවස්ථාවක වාර්ෂික වී නිෂ්පාදනය එක් ඒකකයකින් ඉහළ යාමේදී දිගුකාලීනව සහල් කිලෝග්‍රෑමයක වාර්ෂික සාමාන්‍ය මිල ඒකක 0.02කින් පහළ යයි. ඒ තුළින් ගම්‍ය වන්නේ දේශීය වී නිෂ්පාදන ප්‍රමාණය ඉහළ නැංවීම දිගුකාලීනව සහල් මිල පහළ මට්ටමක පවත්වාගෙන යාමට හේතුවන බව වේ. කෙටිකාලීනව ද මෙම විචල්‍යයන් අතර සෘණ වෙසෙසි සබඳතාවය දක්නට ලැබුණි. Kumar and Sharma (2006) විසින් ද මෙම නිගමනයට සමානව වී සැපයුම හා සහල් මිල සෘණාත්මක සම්බන්ධයක් පවතින බව නිගමනය කර තිබේ. එමෙන් ම IRRI (2013) වාර්තාවේ නිගමනය ද ඒ සමග සමපාත වේ.

දිගුකාලීනව සහල් ආනයනය ඉහළ නැංවීම තුළින් දේශීය වෙළඳපළ සහල් මිල පහළ දැමිය හැක.

දේශීය සහල් අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට දේශීය සහල් නිෂ්පාදනය ප්‍රමාණවත් නොවන අවස්ථාවන් වලදී සහල් ආනයනය කිරීම මඟින් එම හිඟ සහල් ප්‍රමාණය සපුරාලීම සාමාන්‍ය පිළිවෙතයි. සහල් ආනයන කිරීම දේශීය සහල් තොගය ඉහළ නැංවීමට හේතුවේ. මෙම අධ්‍යයන ප්‍රතිඵලයට අනුව ආනයනික සහල් ප්‍රමාණය හා දේශීය සහල් මිල අතර දිගුකාලීන සෘණ වෙසෙසි සබඳතාවයක් දක්නට ලැබුණි. එහිදී අනෙකුත් සාධක ස්ථාවරව පවතින විට, වාර්ෂික සහල් ආනයනික

ප්‍රමාණය එක් ඒකකයකින් ඉහළ යාමේදී දිගුකාලීනව වාර්ෂික සාමාන්‍ය සහල් මිල ඒකක 0.10 කින් පහළ යන බව පෙන්වාදිය හැකිය. දයාරත්න ඇතුළු පිරිස (2008) විසින් ද මෙයට සමපාත නිගමනයක් ඉදිරිපත් කර තිබේ. මේ අනුව දිගුකාලීනව සහල් ආනයනය ඉහළ නැංවීම තුළින් දේශීය වෙළඳපොළ සහල් මිල පහළ දැමිය හැකි බවට නිගමනය කළ හැකියි.

දිගුකාලයේදී තිරිඟු පිටි මිල ඉහළ යාමේදී එය දේශීය සහල් මිල ද ඉහළ යාම කෙරෙහි ආදේශන බලපෑමක් ඇතිකරනු ලැබේ.

ප්‍රායෝගිකව තිරිඟු පිටි මිල හා සහල් ඉල්ලුම අතර ආදේශන සබඳතාවයක් පවතී. තිරිඟු පිටි මිල ඉහළ මට්ටමක පැවතීම තිරිඟු පාරිභෝගිකයන් ව සහල් පාරිභෝජනය වෙත යොමු කිරීමට හේතු වේ. එය දේශීය සහල් ඉල්ලුම කෙරෙහි පීඩනයක් ඇති කරයි. ඉහත අංක (02) ආදර්ශයෙන් හඳුනාගත් පරිදි ද තිරිඟු පිටි මිල හා සහල් මිල අතර දිගුකාලීන ධන වෙසෙසි සබඳතාවක් දක්නට ලැබුණි. එම ප්‍රතිඵලයට අනුව අනෙකුත් සාධක ස්ථාවරව පවතින විට තිරිඟුපිටි මිල එක් ඒකකයකින් ඉහළ යාමේදී දිගුකාලීනව සහල් කිලෝග්‍රෑමයක වාර්ෂික සාමාන්‍ය මිල ඒකක 1.61කින් ඉහළ යන බවට අර්ථකථනය කළ හැකියි. IRRI (2013) විසින් ද මෙයට සමාන නිගමනයකට එළඹේ. Shim (1971)ට අනුව ද තිරිඟු සැපයුම හා සහල් මිල අතර ඍණ සබඳතාවක් පවතින බව හඳුනාගෙන තිබේ. ඒ අනුව තිරිඟු මිල මඟින් සහල් මත ඇතිකරන ආදේශන බලපෑම සහල් වෙළඳපොළේ මිල අර්බුදයට බලපාන එක් හේතුවක් බව නිගමනය කළ හැකි වේ.

ජනගහනය ඉහළ යාම දිගුකාලයේදී දේශීය සහල් මිල ඉහළ යාම කෙරෙහි බලපායි.

VEC ආදර්ශයේ ප්‍රතිඵලවලට අනුව, ජනගහනය ඉහළ යාම දිගුකාලීනව දේශීය සහල් මිල කෙරෙහි ධන වෙසෙසි බලපෑමක් ඇතිකරන බව හඳුනාගැනීමට හැකි වුණි. ඒ අනුව අනෙකුත් සාධක ස්ථාවර අවස්ථාවේදී මධ්‍ය වාර්ෂික ජනගහනය එක් ඒකකයකින් ඉහළ යාමේදී දිගුකාලීනව සහල් මිල ඒකක 0.004කින් ඉහළ යන බව අර්ථකථනය කළ හැකියි. ජනගහනය ඉහළ යාම දිගුකාලීනව දේශීය සමස්ත සහල් ඉල්ලුම ඉහළ යාමට හේතු විය හැකියි. එය අනාගත දේශීය සහල් මිල මත පීඩනයක් ඇති කිරීමට සමත්වන සාධකයකි. 2010 වර්ෂයේදී මිලියන ටොන් 388ක් වූ ආසියාතික සහල් ඉල්ලුම 2035 වසර වනවිට මිලියන ටොන් 465ක් ලෙස වර්ධනය

වනබව ප්‍රක්ෂේපණ තුළින් හඳුනාගත ඇත (FAPRI 2013). එබැවින් ජනගහනය ඉහළ යාම දිගුකාලීනව සහල් ඉල්ලුමේ වැඩි වීමක් හා සහල් මිලෙහි ඉහළ යාමක් සඳහා හේතුවිය හැකි බව නිගමනය කළ හැකි වේ.

පෙර වසරේ සහල් මිල ඉහළ මට්ටමක පැවතීම කෙටිකාලයේදී මෙම වසරේ සහල් මිල ඉහළ යාමට හේතු වේ.

ආදර්ශය 2 හි නිමානිත සංගුණකයන් මඟින් හඳුනාගත හැකි පරිදි පෙර වසරේ සහල් මිල හා මෙම වසරේ සහල් මිල අතර කෙටිකාලීන ධන වෙසෙසි සම්බන්ධතාවක් පවතින බව දක්නට ලැබුණි. එම ප්‍රතිඵලයට අනුව, අනෙකුත් සාධක ස්ථාවරව පවතින අවස්ථාවක පසුගිය වර්ෂයේ සහල් මිල එක් ඒකකයකින් ඉහළ යාමේ දී, කෙටිකාලයේදී මෙම වර්ෂයේ සහල් මිල ඒකක 0.702කින් ඉහළ යන බව අර්ථකථනය කළ හැකි වේ. දයාරත්න ඇතුළු පිරිස (2008) විසින් නිගමනය කර ඇති පරිදි ද පෙර වර්ෂයේ සහල් මිල හා මෙම වර්ෂයේ වී මිල අතර ශක්තිමත් ඒකරේඛීයතාවයක් පවතියි. එබැවින් පෙර වර්ෂයේ සහල් මිල ඉහළ මට්ටමක පැවතීම මෙම වසරේ වී මිල ඉහළ යාමට හා එම බලපෑම සහල් මිල ද ඉහළ යාමට හේතු වන බව නිගමනය කළ හැකි වේ.

වී සහතික මිල ඉහළ නැංවීම වී නිෂ්පාදනයට දැරිගැන්වීමක් ඇතිකරන අතරම දිගුකාලීනව එය දේශීය සහල් මිල පහළ යාමට හේතු වේ.

දේශීය වී ගොවීන්ගෙන් වී මිලට ගැනීම සඳහා රජය විසින් සහතික මිල ක්‍රමය හඳුන්වාදීම දේශීය වී නිෂ්පාදන ක්ෂේත්‍රයේ වැදගත් සංධිස්ථානයක් විය. ඉහත අධ්‍යයන ප්‍රතිඵල මඟින් තහවුරු වූ පරිදි වී සහතික මිල හා දේශීය සහල් මිල අතර දිගුකාලීන සෘණ වෙසෙසි සබඳතාවක් හඳුනාගැනීමට හැකි විය. අනෙකුත් සාධක ස්ථාවරව පවතින අවස්ථාවේදී වී කිලෝග්‍රෑමයක වාර්ෂික සහතික මිල එක් ඒකකයකින් ඉහළ ගැන්වීමේදී දිගු කාලයේදී සහල් කිලෝග්‍රෑමයක වාර්ෂික සාමාන්‍ය මිල ඒකක 1.35කින් පහළ යන බව මේ තුළින් අර්ථකථනය කළහැකි වේ. ඒ අනුව වී සඳහා සහතික ගැනුම් මිල ඉහළ නැංවීම වී ගොවීන් දේශීය වී නිෂ්පාදනය කෙරෙහි දිරිගැන්වීමක් ඇතිකරවන අතරම එය දේශීය සහල් මිල පහළ යාමට ද හේතුවන බව නිගමනය කළ හැකියි.

විදුලි ගාස්තුව, සහතික මිල, තිරිඟු පිටි මිල, වර්ෂාපතනය හා ජනගහනය යන සාධක කෙටිකාලයේදී සහල් මිල සමග වෙසෙසි සබඳතාවයක් නොදක්වයි.

මෙම සාධකයන් සහල් මිල සමග කෙටිකාලීනව වෙසෙසි සබඳතාවක් නොදැක්වුව ද ඒවායේ අපේක්ෂා කරන න්‍යායාත්මක සබඳතාවය එලෙසම පවතී. මෙලෙස ඇතැම් සාධක කෙටිකාලයේදී සහල් මිල කෙරෙහි වෙසෙසි බලපෑමක් ඇති නොකළ ද දිගුකාලීනව සැලකීමේදී එම සාධක සහල් මිල තීරණය වීම කෙරෙහි වෙසෙසි බලපෑමක් ඇතිකරන සාධක බව හඳුනාගත හැකි වේ.

ඒ අනුව වී නිෂ්පාදනයේ ඵලදායිතාවය ඉහළ නැංවීම උදෙසා ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වැදගත් පියවරක් ලෙස පෙන්වාදිය හැකි වේ. මන්ද අධ්‍යයනය තුළින් හඳුනාගත් පරිදි වී නිෂ්පාදනය සහල් මිල කෙරෙහි වැදගත් බලපෑමක් එල්ල කරයි. එමෙන් ම රජය විසින් සහතික මිල ඔස්සේ වී මිලදී ගැනීම සඳහා ප්‍රමාණවත් හා කාර්යක්ෂම මැදිහත්වීමක් සිදු කිරීම කාලෝචිත ක්‍රියාවලියක් වේ. රජය වී මිලදී ගැනීමේ යන්ත්‍රණය ඔස්සේ සහතික මිලට වී මිලදී ගනු ලැබුව ද ඒ සියයට 10ට අඩු ප්‍රමාණයකිනි. එය කෙටිකාලීනව වී හෝ සහල් මිල ගණන් උච්ඡාවචනය පාලනය කිරීම සඳහා බොහෝවිට ඍජු බලපෑමක් ඇති නොකරයි. එබැවින් එම යන්ත්‍රණය කාර්යක්ෂම කිරීම වැදගත් ප්‍රතිපත්තියකි. එමෙන් ම දේශීය සහල් ඉල්ලුම සැපිරීමට දේශීය නිමැවුම ප්‍රමාණවත් නොවන විටදී කෙටිකාලීන සහල් හිඟය ඉවත් කිරීම සඳහා සහල් ආනයනය කිරීම ඵලදායි විසඳුමකි. ඒ අනුව සහල් හා තිරිඟු මත ආනයනික තීරුබදු පහළ මට්ටමක පවත්වාගෙන යාම දේශීය සහල් මිල අර්බුදයට එක් විසඳුමක් වේ. සහල් මිල අර්බුදය තාවකාලිකව විසඳුව ද ඒ සඳහා දිගුකාලීන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගැනීම වැදගත් ය. එබැවින් දිගුකාලීන ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම උදෙසා ආහාර විවිධාංගීකරණය තුළින් සහල් සඳහා වන ඉල්ලුම අඩු කරවීම වැදගත් වේ. කෙසේ වුවත් සහල් වෙළඳ පොළෙහි සහල් මිල තීරණය වීම කෙරෙහි සහල් වෙළඳපොළෙහි අතරමැදිකරුවන් විසින් ඇති කෙරෙන බලපෑම් සැලකීමට නොහැකිවීම මෙම අධ්‍යනයේ පවතින සීමා කමකි. ඒ සඳහා සංඛ්‍යාත්මක විශ්ලේෂණයෙන් ඔබ්බට ගොස් විස්තරාත්මකව එය විශ්ලේෂණය කළ යුතු වේ.

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

Agbogo, E., Udouso, A.B. and Tiku, E.N. (2013). 'Factors Affecting Rice Consumption In Cross River State in Nigeria'. *IOSR journal of agricultural and veterinary science.* Vol. 4, no. 2, pp. 29-33.

Akanni, A.K. (2002). 'Agricultural Price Policy, Consumer Demand And Implications For Household Food Security In Nigeria'. *International journal of food and agricultural economics.* Vol. 2, no. 1, pp. 121-132.

Barrett, B. and Dorosh, A. (1996). 'Farmer's Welfare And Changing Food Prices'. *American agricultural economics association.* Vol. 15, no.4, pp. 656-669.

Bhandari, H. , Pandey, S. , Rosegrant, M. and Sulser, T. (2008). 'Rice Price Crisis: Causes, Impact And Solutions'. *Asian Journal of Agriculture And Development.* Vol. 7, no. 2.

Campbell, E.C. (1932). 'Factors Affecting The Price Of Rice'. *Bureau of agricultural economics.* Vol. 5, no. 297.

Dayarathne, OG. , Jayawickrama, JMA. and Ranathilaka, MB. (2008). 'Sense And Nonsence Of Rice Price Controls In Sri Lanka'. *The peradeniya journal of economics*. Vol. 2, no. 1 & 2, pp. 60-85.

Feeney, G. and Kiyoshi, H. (1990). 'Rice Price Fluctuation And Fertility in Late Tokugawa Japan'. *The society for Japanese studies*. Vol. 16, no. 1, pp. 1- 30.

Gao, X.M., Wailes, J. E. and Cramer, L.G. (1994). 'A Synthetic Demand System'. *Review of agricultural economics*. Vol. 16, no. 1, pp. 27-38.

Gopakumar, K.U. and Pandith, V. (2014). 'Price Movement For Rice And Wheat'. *Indian economic review*. Vol. 49, no. 2, pp. 227-244.

Grant, R. Warren. , Leath, N. Mack. (1979). 'Factors affecting supply, demand and prices of U.S. Rice'. No. 3.

Intal, S.P., Francine, L. and Illescas, A. (2012). 'Rice Prices & The National Food Authority'. *Philippine institute for development studies*.Vol. 2.

IRRI, (2013). 'Rice Almanac'. *Global Rice Science Partnership, International Rice Research Institute.*

Ito, S., Wesley, E., Peterson, F. and Grant, R.W. (1989). ' Rice In Asia'. *American journal of agricultural economics*. Vol. 71, no. 1, pp. 32-42.

Kumar, P. and Sharma, A. (2006). 'Price Variability And Its Determinants'. *Indian economic review.* Vol. 41, no. 2, pp. 149-172.

Lampe, K. (1995). 'Rice Research; Food For Four Billion People'. *International Rice Research Institute*. Vol. 35, no. 3, pp. 253-261.

Otsuka, K. and Hayami, Y. (1985). 'Goals And Consequences Of Rice Policy In Japan'. *American journal of agricultural economics*. Vol. 67, no. 3, pp. 529-538.

Pandey, S., Rosegrant, W., Sulser, T. and Bhandari, H. (2008). 'Rice Price Crisis'. *Asian journal of agricultural and development*. Vol. 7, no. 2, pp. 1-14.

Peterson, W. and Warren, G. (1989). 'Rice in Asia'. *American Journal Of Agricultural Economies.* Vol. 71, no.1, pp.32-42.

Reyes, M., Sobrevinas, A., Bancolita, J. and Jesus, J. (2008). 'Analysis Of The Impact Of Changes In The Price Of Rice And Fuel On Poverty In The Philippine'. *CBMS network meeting.* Vol. 2, no. 3, pp. 101-150.

Sachchamarga, K. and Williams, W.G. (2004). 'Economic Factors Affecting Rice Production In Thailand'. *TAMRC international research.*

Sarris, A. (2008). 'Agricultural Commodity Markets And Trade'. *International journal of food and agricultural economics*. Vol. 2.

Shim, K. (1971). 'An Economic Analysis Of Rice Price In The Republic Of Korea'. *Agricultural economics staff conference*. Vol. 5, no. 3, pp. 200-261.

Taylor, S. and Phillips, P. (1991). 'Food Pricing Policy In Developing Countries'. *American journal of agricultural economics*. Vol. 73, no. 4, pp. 1036-1043.

ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව. (2013-2017). ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තු වාර්තා. කොළඹ.

ශ්‍රී ලංකා මහ බැංකුව. (1977-2016). මහබැංකු වාර්ෂික වාර්තා. කොළඹ 01. ශ්‍රී ලංකා මහ බැංකුව.

සෝමසුන්දර, ඩී. (2002). *කෘෂි ආර්ථික විද්‍යාව.* කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

The Rising Powers in Indian Ocean and their Rivalry A Study of China and India

Nishantha Hettiarachchi

Abstract

The purpose of this article was to explore and analyse the contending issues between the two rivals . Hence, the border issue, military issues, economic issues and chosen strategies by the two have been discussed.The study enabled to understand the impact of rising and emerging powers in the Indian Ocean. Indian Ocean with the gradual rise of China and India from middle power status to great powers in the Indian Ocean Region with their gradual increasing of economic strengths. It was also found the gradual economic prowsess leading the to states to think of increasing role in the international economic realm. Consequently it was found a multiplication of powers and their rivalry. It highlighted that economic growth and needs for further expanding of the same had lead to concern much more over the security and safety of energy rivalry which paved the way for different types of strategic triads among power rivals. The discussion allowed to proceed to elaborate the economic and military power of China and its implications over the politics in the Indian Ocean region. The security and safety issue of Chinese goods and services had lead China to engage with the small states of South Asia which India traditionally considered as her hegemonic area of influence. However the issue remain that China and India were compeled to coorperate despite traditional rivalry plus new form of rivalry.

Keywords: Rising Powers, China, India, Indian Ocean Region, Contending Issues

Introduction

The scholars on the growing and rising other powers in the international and world politics had paid attention to the role of the rising powers within the international political realm. The rising powers of the Indian Ocean had been no exception. The geopolitical realities of Asian powers and their impacts also have clear implications for the rest of the world. When it came to the present study's theme, it should be highlighted that both two

powers spanned over a common geopolitical space across the Himalaya's South, Southwest and Southeast Asia. Consequently, that common geopolitical space had made strategic and geopolitical competition a marker of their relation. The realist school's concerns about location, resources and access become relevant to understand the Sino-Indian dynamics. Scholars have already observed that those factors contributed to the Sino-India Rivalry and worked as markers of their rivalry in the IOR (Garver 2001:3). In this context, it had been pertinent to explore rival contest of China and India in relation to location, resources and access from a historical perspective. That historical perspective helped to discuss many Sino-Indian issues: specifically border dispute, nuclear arms race, strategic influence, and their own geo-economic strategies with reference to trade and energy. The purpose of this article is to explore and analyse the contentending issues between the two rivals. Hence, the border issue, military issues, economic issues and chosen strategies by the two have been discussed.

Border Dispute

The border issue that emerged in the late 1950s between China and India continues even to date as an escalating issue. In this context, it is necessary to highlight the dramatic changes in China and India relations over the past sevan decades to understand the nature and content of boader issue. The shcolars have categorized Sino-Indian boarder issue into five phases (Arif 2013: 29; Malone and Mukherjee 2010: 138). They are follows:

(a) Purported friendship and anti-imperialist foreign policy of early 1950s,

(b) The era of serious differences in the end of 1950s,

(c) Period of deep antagonism in the 1960s,

(d) Age of reconciliation in the 1980s and

(e) The period of productive relationship in post-cold war era and continuing rivalry over the relationship of China with littoral states of the IOR.

Each phase is discussed briefly in the following section of the article.

Scholars of China and India relations highlighted that China and India had shared interest in the context of colonialism and imperialist power struggle.

peace and reconciliation are advocated by various initiatives throughout the nation building process in post-war Sri Lanka, and on the other hand immense challenges are sustained in relation to the key controversies, only negative peace in practice. The structural issues are still observed in a greater degree as a legacy of the prolonged nature of the unresolved conflict. The Report of the LLRC was established to give room to deal with the roots of the national question and investigating issues of war crimes and human rights violations in Sri Lanka. Despite its limited mandate on the purpose of investigation and contribute to the ongoing reconciliation process in post-war Sri Lanka, weaknesses and shortcomings still prevail in relation to the implementation of the recommendations made by the LLRC. As a government formed Commission, the report is being criticized on its view on war crimes and human rights related violations that were not made in its recommendations based on the evidence. Furthermore, though the Commission does admit the seriousness of the identified structural issues, avoids identifying them in-depth or assessing their gravity fully in the perspective of security, and on the other hand, recommendations made, on behalf of the issues, not concentrated adequately regarding the security situation on the ground in terms of its implementation, in tri-level. In fact, the security dimension of the respected issue and the impact on the level of operation not analyzed comprehensively, though the real situation existing on the ground structurally and psychologically challenging with those issues. Due to this nature the ongoing implementation process of the recommendations made by the LLRC still facing challenges on the ground.

References

Abdul-Monem, M. Al-Mashat. (1985) National Security in the Third World, Boulder: Westview Press.

Abu-Nimer, Mohammed. (2001) "Education for Coexistence in Israel: Potential and Challenges" in Reconciliation, Justice, and Coexistence: Theory & Practice, ed, Oxford Books

Alex, Conte. (2012) "Breaking the Cycle of Continued Impunity for War-time Abuses in Sri Lanka" in International Law Comment, London: Chatham House

Amnesty International. (2009) Twenty years of Make-Believe: Sri Lanka's Commissions of Inquiry, London: Amnesty International Publications

Amnesty International. (2011) When will they get justice? Failures of Sri Lanka's Lessons Learnt and Reconciliation Commission, London: Amnesty International Publications

Armstrong, A. David. & Davenport, Christian. (2008) "Internal war, battle deaths and the influence of the living on the dead" in Intra-State Conflict, Governments and Security: Dilemmas of deterrence and assurance, eds. Saideman, S. M. & Zahar, M. J.,New York: Routledge Taylor & Francis Group.

Baker, Jo. (2011) Reconciling Truth and Gender: Lessons for Sri Lanka, <http://www.jobakeronline.com/wp-content/uploads/2011/10/Reconciling-Truth-an d-Gender-Jo-Baker1.pdf> Last visited on September 2, 2012

Balasooriya, Ajith. (2011) "Winner Takes All: Opportunities and Challenges to the Government of Sri Lanka (GoSL) in Post-Conflict Peacebuilding in Sri Lanka" in IPSHU English Research Report Series, 25, 72-99

Bandarage, Asoka. (2009) The Separatist Conflict in Sri Lanka: Terrorism, ethnicity, political economy, New York/Bloomington: Universe, Inc.

Bar Siman Tov, Yaacov. (2004) "Dialectics between Stable Peace and Reconciliation" in From Conflict Resolution to Reconciliation, ed. Bar Siman Tov, Yaacov., New York: Oxford University Press

Bar-Tal, Daniel. & Bennink, H. Gemma. (2004) "The Nature of Reconciliation as an Outcome and as a Process" in From Conflict Resolution to Reconciliation, ed. Bar Siman Tov, Yaacov., New York: Oxford University Press

Behuria, K. Ashok. (2006) "Ethnic Conflict in Sri Lanka: Seeking a Transformative Way Out" in Strategic Analysis, 30(1), 93-121

Beswick, Danielle. & Jackson, Paul. (2011) Conflict, Security and Development: An Introduction, London/New York: Routledge Taylor & Francis Ltd.

Brouneus, Karen. (2003) Reconciliation: Theory and Practice for Development Cooperation, Stockholm: Swedish International Development Cooperation Agency

Carlsson, Kenneth. (2011) on the move Towards a Peaceful Future? A case study of Sri Lanka and its challenges in the search for positive peace, Sweden, Lund: Lund University

Cheran, R. (2009) "Pathways of Dissent: An Introduction to Tamil Nationalism in Sri Lanka" in Pathways of Dissent: Tamil Nationalism in Sri Lanka, ed. Cheran, R., Washington D.C.Sage

Collins, Alan. (2007) Contemporary Security Studies, Oxford: Oxford University Press

Conte, Alex. (2012) "Breaking the Cycle of Continued Impunity for War-time Abuses in Sri Lanka" in International Law Comment, London: Chatham HouseDaly, Erin. & Sarkin, Jeremy. (2007) Reconciliation in Divided Societies: Finding Common Ground, Pennsylvania: University of Pennsylvania Press

De Mel, Neloufer. (2013) The Promise of the LLRC: Women Testimony and Justice in Post-War Sri Lanka, Colombo: International Centre for Ethnic Studies

De Silva, K. M. (2001) "Sri Lanka's Prolonged Ethnic Conflict: Negotiating a Settlement" in International Negotiation, 6, 437-469

Dwyer, Susan. (1999) "Reconciliation for Realists" in Ethics and International Affairs, 13(1), 81-98

Feargal, Cochrane., Bahar, Baser. & Ashok, Swain. (2009) "Home Thoughts from Abroad: Diasporas and Peace-Building in Northern Ireland and Sri Lanka" in Studies in Conflict & Terrorism, 32, 681-704

Feith, David. (2010) "Tamil and Sinhala relations in Sri Lanka: a historical and contemporary perspective" in Global Change, Peace & Security, 22(3), 345-353

Fernando, Laksiri. (1999) "Ethnic Conflict and the State in Sri Lanka: A Possible Solution?'in Conflict and Community in Contemporary Sri Lanka: 'Pearl of the East' or the 'Island of Tears', Ed. Gamage, Siri. & Watson, I. B., New Delhi: Sage Publications

Galtung, Johan. (1969) "Violence, Peace, Peace Research" in Journal of Peace Research, 6(3), 167-191

Galtung, Johan. (2001) "After Violence, Reconstruction, Reconciliation, and Resolution" in Reconciliation, Justice, and Coexistence: Theory & Practice, ed. Abu-Nimer, Mohammed., Oxford: Lexington Books

Sardesai, Shonali. (2005) Aid, Conflict, and Peacebuilding in Sri Lanka 2000-2005, Colombo: The Asia Foundation

Grobbelaar, Janis. & Ghalib, Jama M. (2007) "Security and Reconciliation in Post-Conflict Society: The Matter of Closing the Books in South Africa and Somalia", in Bildhaan: An International Journal of Somali Studies, 7(5), 1-38

Hayner, B. Priscilla. (2001) Unspeakable truth-transitional justice and the challenge of Truth Commissions, New York: Routledge Taylor & Francis Ltd.

Hennayake, K. Shantha. (1989) "The Peace Accord and the Tamils in Sri Lanka" in Asian Survey, 29(4), 401-415

Hoglund, Kristine. & Svensson, Isak. (2009) "Mediating between tigers and lions:Norwegian peace diplomacy in Sri Lanka's civil war" in Contemporary South Asia, 17(2), 175-191

IDEA. (2003) "Reconciliation After Violent Conflict" in A Handbook-Handbook Series, Stockholm: International Institute for Democracy and Electoral Assistance

International Crisis Group. (2007) "Sri Lanka: Sinhala Nationalism and the Elusive Southern Consensus" in Asia Report, 141

Jayawardene, Kumari. (1984) "Ethnic Consciousness in Sri Lanka: Continuity and Change" in Sri Lanka the Ethnic Conflict: Myths, Realities & Perspectives, New Delhi: Navrang

Jayawickreme, Eranda., Jayawickreme, Nuwan. & Miller, Elise. (2010) "Triumphalism, fear and humiliation: The psychological legacy of Sri Lanka's civil war" in Dynamics of Asymmetric Conflict, 3(3), 208-222

Keethaponcalan, S. I. (2005) "The Ethnic Conflict in Sri Lanka and the Dynamics of Third Party Activities" in Conflict, Conflict Resolution and Peace Building: An Introduction of Theories and Practices, ed. Uyangoda, Jayadeva., Colombo: University of Colombo, Department of Political Science and Public Policy & IMCAP

Kearney, R. N. (1985) "Ethnic Conflict and the Tamil Separatist Movement in Sri Lanka" in Asian Survey, 32(9), 898-917

Kumaran, S. Kay. (2011) The Track Record of Sri Lankan Commissions: The Need for an International Investigation of War Crimes, Washington, D.C.United States Tamil Political Action Council

Little, David. (1999) "South Asia's Enduring War" in Creating Peace in Sri Lanka: Civil War and Reconciliation, ed. Robert, I. Rotberg., Washington, D.C.: Brookings Institution Press

Long, J. William. & Brecke, Peter. (2003) War and Reconciliation: Reason and Emotion in Conflict Resolution, Cambridge: Massachusetts Institute of Technology

Manogaran, Chelvadurai. (1987) Ethnic Conflict and Reconciliation in Sri Lanka, Hawai, University of Hawaii Press

McGregor, Lorna. (2006) "Beyond the time and space of peace talks: Re-appropriating he peace process in Sri Lanka" in International Journal of Peace Studies, 11(1),39-57

Melegoda, Nayani. (2011) "Return to Normalcy: New Directions for Positive Peace in Sri Lanka" in Journal of International Development and Cooperation, 17(1), 155-166.

Pavey, Eleanor. & Smith, Chris. (2009) "Post-Conflict Reconstruction and SecuritySector Reform in Sri Lanka" in Security Sector Reform in Challenging Environments, eds. Hans Born & Albrecht Schnabel., Munster: LIT

Peiris, Mohan. (2011) "Sri Lanka's Approach: Restorative Justice vs. Retributive Justice" in Inaugural National Conference on Reconciliation, Colombo, Sri Lanka:Lakshman Kadirgamar Institute for International Relations and Strategic Studies

Smith, Chris. (1999) "South Asia's Enduring War" in Creating Peace in Sri Lanka: Civil War and Reconciliation, ed. Robert, I. Rotberg., Washington, D.C. BrookingsInstitution Press

Uyangoda, Jayadeva. (2007) "Ethnic Conflict in Sri Lanka: Changing Dynamics",Washington, D.C. East-West Center Washington

Uyangoda, Jayadeva. & Bastian, Sunil. (2008) "State responsiveness to public securityneeds: the politics of security decision-making: Sri Lanka country study" in CSDGPapers

Vayrynen, Tarja. (1998) "Ethnic Communality and Conflict Resolution" in Cooperationand Conflict, 33(1), 59-80

Venkateshwar, Rao P. (1988) "Ethnic Conflict in Sri Lanka: India's Role and Perception" in Asian Survey, 28(4), 419-436

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේදී පළාත් පාලන ආයතනවල කාර්යභාරය සහ මහජන තෘප්තිමත්භාවයඃ දොම්පේ ප්‍රාදේශීය සභාව ඇසුරින්

එම්.කේ. නදීකා දමයන්ති

සංක්ෂේපය

ඝන අපද්‍රව්‍ය යනු ලොව ඇතැම් රටවලට ධන උල්පතක් වන්නා සේම ඇතැම් රටවලට දැඩි පීඩනයක් ගෙන දෙන සමාජ ව්‍යසනයකි. මෙම ගැටලුව සම්බන්ධ ශ්‍රී ලාංකික අත්දැකීම් සැලකිල්ලට ගැනීමේදී පිළිබිඹු වන්නේ සතුටුදායක තත්ත්වයක් නොවන අතර වර්තමානය වන විට මෙය රජයට, පළාත් පාලන ආයතනවලට මෙන්ම මහජනතාවට ද, දැඩි පීඩනයක් ගෙන දෙන ගැටලුවක් බවට පත්ව ඇත. මෙම අධ්‍යයනය සඳහා පාදක වූ මූලික අරමුණ වන්නේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේදී පළාත් පාලන ආයතන විසින් සිදුකරන ක්‍රියාකාරකම් සහ එම ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේදී පළාත් පාලන ආයතනවල භූමිකාව සම්බන්ධයෙන් මහජන තෘප්තිමත්භාවය කෙබඳු ද? යන්න විමර්ශනයට ලක් කිරීමයි. මෙම අධ්‍යයනය සඳහා පාදක කරගත් ප්‍රදේශය වන දොම්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය අහඹු ලෙස තෝරා ගනු ලැබූ අතර අධ්‍යයනය ප්‍රමාණාත්මක මෙන්ම ගුණාත්මක දත්ත සහ තොරතුරු ද, මත පදනම් වූ මිශ්‍ර ක්‍රමවේදයක් භාවිතා කරමින් සිදු කරන ලදී. අධ්‍යයනය සඳහා තොරතුරු රැස් කිරීමේදී ප්‍රාථමික සහ ද්විතියික යන දෙයාකාරයේම දත්ත යොදා ගනු ලැබූ අතර ප්‍රාථමික දත්ත සම්පාදනය සඳහා දොම්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වරිපනම් බදු ගෙවන නිවාස සහ වෙළඳසැල් 100 අහඹු ලෙස තෝරා ගන්නා ලදී. ප්‍රාථමික තොරතුරු සම්පාදනයේදී ප්‍රශ්නාවලි ක්‍රමය, සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණ භාවිතා කරන ලදී. ද්විතියික තොරතුරු සම්පාදනයේදී මෙම විෂයය සම්බන්ධයෙන් වන මුද්‍රිත ලේඛන, වාර්ෂික වාර්තා ආදිය උපයෝගී කර ගැණිනි. ගුණාත්මක දත්ත සහ තොරතුරු විස්තරාත්මක ක්‍රමවේදය ඔස්සේ ද,

ප්‍රමාණාත්මක දත්ත සරල සංඛ්‍යානමය විධි ක්‍රම ඔස්සේ ද විශ්ලේෂණය කරන ලදී. අධ්‍යයනයෙන් අනාවරණය වූ අන්දමට පවතින නීතිරීති සහ ප්‍රතිපත්තිවලට සම්පූර්ණයෙන් අනුකූල වන අන්දමේ ක්‍රියාමාර්ග නොවුනත් ප්‍රදේශයේ කසල කළමනාකරණය සඳහා සැලකිය යුතු අන්දමේ කාර්යභාරයක් ප්‍රාදේශීය සභාව විසින් ඉටු කරනු ලබයි. ප්‍රතිචාරීන්ගෙන් 70%ක් කසල කළමනාකරණ වැඩසටහන සම්බන්ධයෙන් තෘප්තිමත් වන අතර 20%ක් අතෘප්තිමත් ද, ඉතිරි 10% මධ්‍යස්ථ මතයක් ද ප්‍රකාශ කළහ. කසළ කළමනාකරණ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේදී මහජන සහාය නිසි පරිදි නොලැබීම ප්‍රතිපත්තිය සාර්ථක කර ගැනීම සඳහා විශාල බාධාවක් බවට පත්ව ඇත.

මුඛ්‍ය පදඃ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය, රාජ්‍ය ප්‍රතිපත්ති, පළාත් පාලන ආයතන, දොම්පේ ප්‍රාදේශීය සභාව

1.0 හැඳින්වීම

1.1 පසුබිම

කැලි කසල යනු ලොව බොහෝ රටවල පළාත්පාලන ආයතනවලට ඉසුරක් බවට පත් වූවක් වුවත් වර්තමානය වන විට එය ශ්‍රී ලංකාවට සහ ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවලට ද, ඉමහත් ගැටලුවක් මෙන්ම බරක් බවට ද පත් වූවකි. මෙම තත්ත්වය වඩා හොඳින් පැහැදිලි කරනු ලබන මෑත කාලීන උදාහරණය වන්නේ 2017 අප්‍රේල් මස 14 දින කොළඹ මීතොටමුල්ල ප්‍රදේශයේ සිදුවූ කුණු කන්ද නාය යාමෙන් සිදුවූ ජීවිත සහ දේපල විනාශයයි. ශ්‍රී ලංකාව තුළ සාමාන්‍යයෙන් දිනකට කසල මෙට්‍රික් ටොන් 7,500ක් ජනනය වන අතර එය වාර්ෂිකව ගණනය කිරීමේදී මෙට්‍රික් ටොන් 2,737,500 වේ. මෙම කසලවලින් පළාත් පාලන ආයතන විසින් දෛනික එක් රැස් කරන කසල ප්‍රමාණය මෙට්‍රික් ටොන් 3500කි (www.unescap.org). ඒ අනුව පළාත් පාලන ආයතන විසින් වර්තමානය වන විට ද දෛනිකව ජනනය වන කසලවලින් අඩකටත් වඩා වැඩි ප්‍රමාණයක් නිසි පරිදි රැස් කිරීමක් සිදු නොකරන අතර ඒවා විවෘත පරිසරයට මුදා හැරීම හෝ ගෘහස්ත මට්ටමින් දහනය කිරීම වැනි ක්‍රියාමාර්ගයක් ඔස්සේ බැහැරලීම සිදු කරනු ලබයි.

නාගරීකරණය, කුඩා ඉඩම් කැබලිවල පදිංචිවන පවුල් සංඛ්‍යාව ඉහළ යාම, ජනතාවගේ ජීවන රටාව වෙනස් වීම ආදි සාධක මෙසේ කැලි කසල විශාල ප්‍රමාණයක් දෛනිකව එක් රැස්වීම සඳහා බලපා ඇත. මෙසේ ජනනය වන අපද්‍රව්‍ය කළමනාකරණයේ මූලික වගකීම පළාත් පාලන ආයතනවලට පැවරෙන බව මහ නගර සභා ආඥා පනතේ 125, 130 සහ 131 වගන්තිවලින් ද, නගර සභා පනතේ 118, 119 සහ 120 වගන්තිවලින් ද, ප්‍රාදේශීය සභා පනතේ 93 සහ 94 වගන්තිවලින් ද පැහැදිලි කරනු ලබයි. එකී පනත්වලින් පැහැදිලි කරන අන්දමට අඩිපාරවල් ඇතුලුව වීදි නිසි පරිදි අතුගා පවිත්‍ර කිරීමත්, වීදිවල පවතින කසල නිසි කාල සීමාවක් තුළදී විධිමත්ව ඉවත් කිරීමත්, වීදිවල සහ ගෘහ ඒකකයන්හි පවතින කැලි කසල බැහැර කිරීම සඳහා හැකිතාක් දුරට අවශ්‍ය පියවර ගැනීමත් පළාත් පාලන ආයතනවල වගකීමක් වේ. එමෙන්ම වීදිවල සහ නිවාසවල පවතින කසල පළාත් පාලන ආයතනවල දේපළක් විය යුතු බවත් ඒ සියලු ද්‍රව්‍ය විකිණීමට හෝ බැහැර කිරීමට පළාත් පාලන ආයතනවලට සම්පූර්ණ බලය හිමිවන බවත් විස්තර කෙරේ. ඒ අනුව පළාත් පාලන ආයතන විසින් ඒ සඳහා විවිධ පියවර ගෙන ඇති අතර පිළිසරු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, දෛනිකව සේවකයින් යොදවා තම බල ප්‍රදේශයේ කැලි කසල එකතු කිරීම, එක් රැස් කරන අපද්‍රව්‍ය නිසි පරිදි බැහැර කිරීම හෝ ප්‍රතිචක්‍රියකරණය සඳහා කටයුතු කිරීම ඒ අතර ප්‍රමුඛ වේ.

වගු සටහන් අංක 01න් දිවයින තුළ පළාත් මට්ටමන් දිනකට ජනනය වන කසල ප්‍රමාණය, පිළිසරු ව්‍යාපෘතිය යටතේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා පිහිටුවා ඇති මධ්‍යස්ථාන සංඛ්‍යාව සහ පළාත් පාලන ආයතන විසින් දිනකට කළමනාකරණය කිරීමට අපේක්ෂිත කසල ප්‍රමාණයත් දැක්වේ. එම වගු සටහනින් පෙන්නුම් කරන ආකාරයට දෛනිකව කැලි කසල විශාල ප්‍රමාණයක් ජනනය වුවත් ඒ සියලු අපද්‍රව්‍ය පළාත් පාලන ආයතනයේ ආදායමක් බවට පත් කර ගැනීමට හෝ නිසි පරිදි කළමනාකරණය කිරීමට පළාත් පාලන ආයතනවලට පවතින හැකියාවක් නොමැති බව පැහැදිලි වේ.

වගු සටහන් අංක 01ඃ පළාත් මට්ටමින් දෛනික ජනනය වන කැලි කසල ප්‍රමාණය සහ කාබනික පොහොර නිෂ්පාදනය සඳහා පිහිටුවා ඇති මධ්‍යස්ථාන සංඛ්‍යාව

පළාත	දෛනිකව ජනනය වන අපද්‍රව්‍ය ප්‍රමාණය (මෙ.ටො)	කාබනික පොහොර නිෂ්පාදන ඒකක සංඛ්‍යාව	කළමනාකරණය කිරීමට අපේක්ෂිත අපද්‍රව්‍ය ප්‍රමාණය (මෙ.ටො.)	සමස්ත අපද්‍රව්‍ය ප්‍රමාණයෙන් කාබනික පොහොර නිපදවන ප්‍රතිශතය
උතුර (යාපනය)	78.5	03	11.0	14.41
උතුරු මැද	82.2	16	58.5	71.16
වයඹ	200.9	21	118.0	58.73
මධ්‍යම	314.8	10	30.0	9.53
බස්නාහිර	1783.0	17	116.7	6.55
දකුණ	249.5	24	94.0	37.68
සබරගමුව	153.5	08	36.0	23.45
ඌව	110.6	07	56.0	50.63
නැගෙනහිර	278.5	06	22.0	7.9

මූලාශ්‍රයඃ www.unescap.org

අදාළ ආයතන විසින් අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා යම් යම් පියවර ගෙන ඇති නමුත් එදිනෙදා සාකච්ඡාවන්හිදී මෙන්ම රාජ්‍ය ප්‍රතිපත්ති සම්බන්ධයෙන් තීන්දු තීරණ ගන්නා පාර්ලිමේන්තුව වැනි ආයතනවලදී ද කසල කළමනාකරණය පිළිබඳ ගැටලුව මෙන්ම ඒ ආශ්‍රිතව පැන නගින බලපෑම් සම්බන්ධයෙන් ද නිරන්තරයෙන් කරුණු මතුවීම තුළින් පැහැදිලි කෙරෙනුයේ කැලි කසල නිසා මතුවන ගැටලු සඳහා සතුටුදායක පිළිතුරක් මෙතෙක් ලැබී නොමැති බවයි.

1.2 අධ්‍යයන අරමුණු

මෙම ලිපියේ ප්‍රධාන අරමුණ වන්නේ කසල කළමනාකරණය කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් පළාත්පාලන ආයතනවල ක්‍රියාකාරකම් සහ එකී ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් බල ප්‍රදේශයේ ජනතාවගේ තෘප්තිමත්භාවය විග්‍රහ කිරීමයි.

1.3 අධ්‍යයන ගැටලුව

මෙම අධ්‍යයනය සඳහා පාදක වූ මූලික ගැටලුව වන්නේ කළමනාකරණයේදී පළාත්පාලන ආයතනවලට පැවරී ඇති කාර්යභාරය ඉටු කිරීමේදී කිසියම් ආකාරයක ගැටලුවලට මුහුණ දෙන්නේ ද? සහ එකී ගැටලු මඟහරවා ගනිමින් කැලි කසල බැහැර කිරීම සහ කළමනාකරණය සඳහා පවතින විකල්ප කවරේද? සහ ප්‍රදේශයේ කැලි කසල කළමනාකරණය සම්බන්ධයෙන් සේවාලාභීන්ගේ තෘප්තිමත්භාවය කුමන ස්වභාවයක් ගන්නේද? සේවාලාභීන්ගේ තෘප්තිමත්භාවය හෝ අතෘප්තිමත් භාවයට බලපා ඇති හේතු සාධක කවරේද? යන ගැටලු වේ.

1.4 අධ්‍යයනයේ වැදගත්කම

අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ මූලික වගකීම පළාත් පාලන ආයතනවලට පැවරුන ද, වර්තමානය වන විට අපද්‍රව්‍ය කළමනාකරණය ප්‍රමුඛ ජාතික ගැටලුවක් බවට පත්ව ඇත. එම නිසා අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් පළාත් පාලන ආයතනවල කාර්යභාරය, වගකීම, ඒවා ඉටු කිරීම සඳහා දරනු ලබන ප්‍රයත්න මෙන්ම එම ක්‍රියාදාමයේදී ඔවුන් මුහුණ දෙන ගැටලු පිළිබඳව හැදෑරීම කාලීනව වැදගත් වේ. ඒ හා සමාන්තරව, අපද්‍රව්‍ය කළමනාකරණ ගැටලුවට මුහුණ දෙන සහ අපද්‍රව්‍ය ජනනය කරන ජනතාවගේ චර්යාව, ආකල්ප මෙන්ම පළාත්පාලන ආයතන මෙම ගැටලුවේදී ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ ඔවුන්ගේ තෘප්තිමත් භාවය විමසුමට ලක් කිරීම ද වැදගත් වනුයේ ඔවුන් මෙම ගැටලුවේ ප්‍රධානතම පාර්ශවකරුවන් වන බැවිනි. මේ අනුව අධ්‍යයනය සඳහා පාදක කරගනු ලැබූ ගැටලුව කාලීනව වැදගත් ගැටලුවක් වශයෙන් සඳහන් කළ හැක.

1.5 ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේදී ප්‍රාථමික මෙන්ම ද්විතියික දත්ත භාවිතා කර ඇත. ප්‍රාථමික දත්ත සපයා ගැනීමේදී ප්‍රශ්නාවලි සහ නිරීක්ෂණ ක්‍රමවේදය භාවිතා කර ඇති අතර ද්විතියික දත්ත සපයා ගැනීමේදී වාර්ෂික වාර්තා, පර්යේෂණ ලිපි ආදිය යොදා ගෙන ඇත. මෙම අධ්‍යයනය සඳහා දොම්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය අහඹු ලෙස තෝරා ගනු ලැබූ අතර බල ප්‍රදේශයේ වරිපනම් බදු ගෙවන ගෘහස්ථ සහ වෙළඳ ප්‍රජාවගෙන් අහඹු ලෙස තෝරා ගනු ලැබූ සිය දෙනෙකුගෙන් 2016 අගෝස්තු-සැප්තැම්බර් මාසවලදී ප්‍රශ්නාවලිය ආශ්‍රිතව තොරතුරු ලබා ගැණිනි. රැස්කර ගනු

ලැබූ ප්‍රමාණාත්මක දත්ත සරල සංඛ්‍යානමය විධි ක්‍රම භාවිතයෙන් විශ්ලේෂණය කරනු ලැබූ අතර ගුණාත්මක දත්ත සහ තොරතුරු විස්තරාත්මක ක්‍රමවේදය භාවිත කරමින් විශ්ලේෂණය කරනු ලැබිණි.

1.6 ලිපියෙහි සැකැස්ම

මෙම ලිපිය කොටස් හතරකින් සමන්විත වන අතර පළමු කොටසින් ලිපියේ හැඳින්වීම ඉදිරිපත් කෙරේ. දෙවැනි කොටසින් රාජ්‍ය ප්‍රතිපත්ති සහ රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිළිබඳ න්‍යායාත්මක පසුබිම ඉදිරිපත් කෙරෙන අතර තෙවැනි කොටසින් කසල කළමනාකරණයට අදාළ නෛතික පසුබිම, රාජ්‍ය ප්‍රතිපත්ති සහ අදාළ ක්‍රියාකාරකම් පිළිබඳව සාකච්ඡා කෙරේ. සිවුවැනි කොටසින් කසල කළමනාකරණය සම්බන්ධයෙන් සිදු කරන ලද මෙම පර්යේෂණයේ දත්ත විශ්ලේෂණය ද, අවසාන කොටසින් නිගමන සහ යෝජනා ද ඉදිරිපත් කෙරේ.

2.0 රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිළිබඳ න්‍යායාත්මක පසුබිම

2.1 රාජ්‍ය ප්‍රතිපත්ති අර්ථ දැක්වීම

ඉතිහාසයේ අන් කවරදාටත් වඩා නූතන ජාතික රාජ්‍යයන්හි කාර්ය භාරය සංකීර්ණ ස්වභාවයක් උසුලන අතර එකී සංකීර්ණතා මධ්‍යයේ රාජ්‍ය ගමන් කරන දිශානතිය සහ පුරවැසියන් වෙනුවෙන් රාජ්‍ය ඉටු කරන කාර්යභාරය පිළිබඳව පෙන්නුම් කරනුයේ රාජ්‍ය ප්‍රතිපත්තිය තුළිනි. රාජ්‍ය ප්‍රතිපත්ති සම්බන්ධයෙන් අර්ථ දැක්වීම් කරන න්‍යායාචාර්යවරුන් සහ විද්වතුන්ගේ අදහස් සැලකිල්ලට ගැනීමේදී පැහැදිලි වන්නේ රාජ්‍ය ප්‍රතිපත්ති සම්බන්ධයෙන් නිශ්චිත වූ අර්ථ නිරූපණයක් ලබා දිය නොහැකි බවයි. රාජ්‍ය ප්‍රතිපත්ති අර්ථ අර්ථ දක්වන රිචඩ් රෝස් පෙන්වා දෙන්නේ, "රාජ්‍ය ප්‍රතිපත්ති යනු හුදකලා හෝ තනි සිදුවීමක් නොවන බවයි". රෝස් පෙන්වා දෙන අන්දමට 'රාජ්‍ය ප්‍රතිපත්තියක් යනු ව්‍යුක්ත තීරණයකට වඩා දීර්ඝ කාලීනව අඩු වැඩි වශයෙන් එකිනෙකට සම්බන්ධ වූ ක්‍රියාකාරකම් මාලාවක සහ ඒවායෙහි ප්‍රතිඵල' වේ (Rose, 1969: X). රිචඩ් රෝස්ගේ අදහසට සමාන අදහසක් ඉදිරිපත් කරන හැරල්ඩ් ඩී. ලැස්වෙල් සහ කප්ලාන් ඒබ්‍රහම් පෙන්වා දෙනු ලබන්නේ 'රාජ්‍ය ප්‍රතිපත්ති යනු අරමුණු, අගය කිරීම් හෝ වටිනාකම් සහ ක්‍රියාකාරකම්වල ප්‍රක්ෂේපිත වැඩසටහන්' වන බවයි (Lasswell & Kaplan, 1963: 71). මිචෙල් හැමිල්ටන් අර්ථ දක්වන අන්දමට රාජ්‍ය ප්‍රතිපත්ති යනු "පරිබාහිර වටපිටාව පිළිබඳව


අවබෝධයෙන් යුතුව ඉදිරියට ගමන් කළ යුතු, නවීකරණයවූත්, නම්‍යවූත්, නිර්මාණාත්මක වූත්, සාක්ෂි මත පදනම් වූ අත්දැකීම් තුළින් උපත ලද, ඇගයීමකින් යුත්ත, ඉදිරියේදී සඵලත්වයක් දැකිය හැකි නීතිමය බලාධිකාරයකින් යුක්ත වන්නක් ලෙසිනි. ඒ අනුව රාජ්‍ය ප්‍රතිපත්තියක් අවශ්‍ය වූ අවස්ථාවකදී සමාජයට ගැළපෙන ආකාරයෙන් වෙනස් කළ හැකි අනාගත සුභසිද්ධිය අරමුණු වූ අධිකාරීමය බලයක් ඇති දෙයක්" වශයෙන් හඳුනා ගත හැකිය.

රාජ්‍ය ප්‍රතිපත්තිය යනු කුමක්දැයි අර්ථ දක්වන ඩේවිඩ් ඊස්ටන් පවසන්නේ 'රාජ්‍ය ප්‍රතිපත්තිය යනු සමස්ත සමාජය සඳහා සපයන අධිකාරීත්වයක් සහිත වටිනාකම්' බවයි (Easton, 1953: 129). ඊස්ටන්ගේ නිර්වචනයෙහි ඇතුළත් වන අධිකාරීත්වය පිළිබඳ අදහස තුළින් පැහැදිලි කෙරෙන්නේ රාජ්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රාජ්‍යයට සුවිශේෂී බල අධිකාරීත්වයක් හිමිවන බවත්, රාජ්‍ය ප්‍රතිපත්ති කඩකරන හෝ නොපිළිපදින පිරිස් හෝ ආයතනවලට එරෙහිව ක්‍රියාත්මක වීමේ හැකියාවක් රාජ්‍යයට හිමිවන බවත්ය. කොච්රාන් ඇතුලු පිරිස විසින් රාජ්‍ය ප්‍රතිපත්තිය යනු 'මහජනතාවගේ ගැටලු විසඳීම සඳහා රාජ්‍ය ආයතන හෝ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන සිතා මතා සකස් කරන ලද ක්‍රියාපටිපාටි' වේ යනුවෙන් අර්ථ නිරූපණය කරති (Cochran *etal*, 2009: 1-2). 'රාජ්‍ය ප්‍රතිපත්ති' යන්න නිර්වචන කරමින් තෝමස් ආර්.ඩයි විසින් පෙන්වා දෙනු ලැබුවේ 'රාජ්‍යය විසින් සිදු කිරීමට හෝ නොකිරීමට තීරණය කරනු ලබන ඕනෑම දෙයක් රාජ්‍ය ප්‍රතිපත්තිය වේ' යනුවෙනි (Dye, 1975: 01). කෙසේ වුව ද, මෙම නිර්වචනයෙහි අන්තර්ගතය සම්බන්ධයෙන් අදහස් දක්වන ඇතැම් විද්‍යාර්ථීන් පෙන්වා දෙනු ලබන්නේ ඉහත කී නිර්වචනය තුළින් යම්තාක් දුරකට රාජ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ අදහසක් ඉදිරිපත් කරනු ලැබුවත් නිර්වචනය තුළින් ඉදිරිපත් වන රජය විසින් ඉටු කිරීමට අපේක්ෂා කරන දෑ සහ රජය විසින් සත්‍ය වශයෙන්ම ඉටු කරන දෑ අතර පවතින ප්‍රතිවිරුද්ධතාව පිළිබඳව මේ තුළින් කිසිදු අදහසක් ඉදිරිපත් නොකරන බවයි. එනම්, කිසියම් විෂය ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන් වන රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක භාවයේදී කිසියම් වෙනස්කමකට ලක්වන බව මේ තුළින් ගම්‍ය වේ. රාජ්‍ය ප්‍රතිපත්ති සම්බන්ධයෙන් ඉදිරිපත්ව ඇති ඉහත නිර්වචන පිළිබඳව විමසා බැලීමේදී පෙනී යන්නේ රාජ්‍ය ප්‍රතිපත්ති යනු අධිකාරීත්ව බලය සහිත, එකිනෙක ක්‍රියාකාරකම්, තීරණ මෙන්ම ඒවායේ ප්‍රතිඵල සමඟ අන්‍යොන්‍යව බැඳී පවතින, දීර්ඝ කාලීන සිදුවීම් මාලාවක් වන බවයි.

2.2 රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම

රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදන යනු අඛණ්ඩව, නොනැවතී, චක්‍රයක ආකාරයෙන් නැවත නැවත සිදුවන ක්‍රියාවලියකි. එනම් කිසියම් ගැටලුවක් හඳුනා ගෙන ඒ සඳහා වන විකල්ප විසඳුම් අතුරින් වඩාත්ම ප්‍රශස්ථ සහ ක්‍රියාවට නැංවීමේ හැකියාව පවතින විසඳුම තෝරාගෙන, එය ප්‍රතිපත්තියක් දක්වා වර්ධනය කර ක්‍රියාවට නැංවීම, අධීක්ෂණය, ඇගයීම සහ ඒ තුළින් මතුව ඇති ගැටලු සහ සාධනීය ලක්ෂණ හඳුනා ගනිමින් නැවත නැවත ප්‍රතිසංස්කරණවලට ලක්කරමින් සිදුකරන පියවර ගණනාවකින් සමන්විත ක්‍රියාවලියක් වශයෙන් එය හඳුනා ගත හැක (රූප සටහන් 01). යම්කිසි රාජ්‍ය ප්‍රතිපත්තියක් සකස් කිරීමේදී ඒ සඳහා මුලින්ම පාදක වන්නේ අදාළ ක්ෂේත්‍රය තුළින් මතුවන ගැටලුවකි. ගැටලුව නිසි පරිදි හඳුනා ගැනීමෙන් පසුව ගැටලුව සඳහා පවතින විකල්ප විසඳුම් අවස්ථා හඳුනා ගැනීම කළ යුතු වේ. එහිදී ගැටලුවක් නිරාකරණය කිරීම සඳහා විකල්ප අවස්ථා රාශියක් පවතින අතර එම විකල්ප අතරින් ක්‍රියාත්මක කළ හැකි වඩාත් උචිත විකල්පය තෝරා ගැනීමට සිදු වේ. එහිදී විවිධ පාර්ශවවල දායකත්වය විශේෂයෙන්ම පර්යේෂණ සොයා ගැනීම් සහ ක්ෂේත්‍ර මට්ටමේ අත්දැකීම්, මාධ්‍ය විසින් හෙළි කරන තොරතුරු ආදිය ඉතා වැදගත් වේ.

රූප සටහන් 01: ප්‍රතිපත්ති චක්‍රය



මූලාශ්‍ර: Cairney, P., 2012

රාජ්‍ය ප්‍රතිපත්තියක් හඳුන්වා දෙනු ලබන්නේ දේශපාලන ක්‍රමය තුළ පවතින්නා වූ සමාජ, ආර්ථික, සංස්කෘතික හෝ වෙනත් ක්ෂේත්‍රයක ගැටලුවක් විසඳීම අරමුණු කර ගනිමිනි. මෙසේ කිසියම් වූ ගැටලුවකට පිළියමක් වශයෙන් හඳුන්වා දෙනු ලබන ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීමේදී මෙන්ම ක්‍රියාත්මක කිරීමේදී ද, පාර්ශව රැසක් ඒ සඳහා දායක වේ. එකී හවුල්කාර පාර්ශව අධිකාරීත්වයක් සහිත ව්‍යවස්ථාදායකය, විධායකය, රාජ්‍ය සේවය සහ අධිකරණය මෙන්ම අධිකාරීත්ව බලයක් නොමැති බලපෑම් කණ්ඩායම්, සිවිල් සංවිධාන, මහජනතාව, විශේෂයෙන්ම අදාළ ප්‍රතිපත්තියේ ප්‍රතිලාභීන් හෝ ඉලක්කගත කණ්ඩායම්, ප්‍රභූන්, ජනමාධ්‍ය, අන්තර්ජාතික සංවිධාන සහ සම්බන්ධතා, පර්යේෂණ ආයතන සහ විශේෂඥයින් ආදියෙන් සමන්විත වේ.

එමෙන්ම කිසියම් ප්‍රතිපත්තියකට පාදක වන ගැටලුව නිසි අන්දමින් විශ්ලේෂණය නොකර, ප්‍රතිපත්තිය ක්‍රියාවට නැඟෙන වටපිටාව පිළිබඳ නිසි අවබෝධයකින් තොරව සම්පාදනය කරන ප්‍රතිපත්තියක් ක්‍රියාවට නැංවීමේදී පවතින ගැටලුව නිරාකරණය නොවනවා පමණක් නොව වෙනත් ගැටලු ජනිත කිරීමක් ද සිදුවේ. මාර්තා ඩර්තික් පෙන්වා දෙන අන්දමට සියලු පාර්ශවවල මනා සහයෝගයක්, ඇවැසි ස්ථානවලදී මනා සම්බන්ධීකරණයක් සහ සන්නිවේදනයක් නොමැති නම් කෙතරම් සාර්ථකව සම්පාදනය කරන ලද ප්‍රතිපත්තියක වුව ද, අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම දුෂ්කර වේ (Derthick, 1972:32-35). කිසියම් වූ ප්‍රතිපත්තියක් සාර්ථකව ක්‍රියාවට නංවා අපේක්ෂිත ඉලක්ක හෝ ප්‍රතිඵල සපුරා ගැනීම කෙරෙහි ප්‍රතිපත්ති සම්බන්ධයෙන් අදාළ පාර්ශවවල දැනුවත්භාවයට අමතරව එකී පාර්ශවවල විශේෂයෙන්ම ජනතා සහභාගීත්වය වැදගත් වේ. විශේෂයෙන්ම සිවිල් සහ ප්‍රජා සංවිධානවල සහභාගීත්වය අවශ්‍ය වේ (Reejal, 2003: 234). මෙම මතය තවදුරටත් තහවුරු කරන එඩ්වඩ් සහ ෂාකන්ස්කි පෙන්වා දෙන්නේ පවතින ගැටලුවලට පිළියමක් ලෙසින් වඩා ප්‍රායෝගික ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීමේදී අනෙකුත් සියලු සාධකවලට වඩා මහජන සහාය සහ මහජන මතය විශේෂයෙන් වැදගත් වන බවයි (Edwards III & Sharkansky, 1978: 17).

රාජ්‍ය ප්‍රතිපත්තියකින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට අවශ්‍ය තවත් කොන්දේසියකි කිහිපයකි. එනම්, අවශ්‍ය මානව හා භෞතික සම්පත් නිසි පරිදි, ක්‍රමවත්ව, අවශ්‍ය අවස්ථාවන්හිදී ප්‍රමාදයකින් තොරව සැපයීම (Makinde, 2005: 1), ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් නිලධාරීන් මෙන්ම සාමාන්‍ය පුද්ගලයින් තුළ පවතින

ප්‍රතිඥානාත්මක ආකල්ප (Edwards III, 1980:3), අල්ලසින් සහ දූෂණයෙන් තොරවීම සහ ඉලක්ක සපුරා ගන්නා තුරු ප්‍රතිපත්තිය අඛණ්ඩව ක්‍රියාවට නැංවීම (Makinde, 2005:1) ඒ අතර ප්‍රමුඛ වේ. කිසියම් වූ ප්‍රතිපත්තියක් සංකල්පීයමය වශයෙන් පරිපූර්ණ වුවත්, සත්‍ය ලෝකයේදී එය ක්‍රියාවට නැංවීමට අවශ්‍ය සම්පත් නිසි පරිදි නොලැබෙන්නේ නම් ප්‍රතිපත්තියෙන් අපේක්ෂිත ප්‍රතිඵල අත්කර ගැනීමට නොහැකි බව ප්‍රත්‍යක්ෂය. එමෙන්ම ප්‍රතිපත්තියකින් අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට නම් ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවෙන බිම් මට්ටමේ කටයුතු සම්බන්ධයෙන් නිසි සහ ක්‍රමවත් අධීක්ෂණයක් අඛණ්ඩව ක්‍රියාත්මක වීම අත්‍යවශ්‍ය කොන්දේසියක් බවට පත්වේ. මෙහිදී අධීක්ෂණය යනුවෙන් අදහස් කරන්නේ රාජ්‍ය අංශය තුළින් සිදු කෙරෙන අධීක්ෂණය ඉක්මවා ගිය තත්ත්වයකි. ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට දායකවන සියලු පාර්ශව නිසි පරිදි දැනුවත් කර ප්‍රතිපත්ති සම්පාදනයේදී මෙන් ම ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ ඇගයුම් කටයුතු සිදු කිරීම ආදී සියලු පියවරයන් සඳහා සැබෑ ජනතා සහභාගීත්වයක් ලබා ගැනීමට කටයුතු කිරීම තුළින් ප්‍රතිපත්තියකින් අපේක්ෂිත අරමුණුවලින් බොහොමයක් සාර්ථකව අත්පත් කරගත හැක. එයට හේතු වන්නේ ප්‍රතිපත්තිය තමන්ගේම එකක් වන බවට ජනතාව තුළ මතුවන විශ්වාසය තුළින් එය ක්‍රියාත්මක කිරීමට බාධාකාරී වන සාධක මැඩ පවත්වමින් අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය ජීවය ජනතාව විසින්ම ලබා දීමයි.

3.0 කසල කළමනාකරණය සම්බන්ධිත රාජ්‍ය ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරකම්

3.1 ජාතික මට්ටම

කසල කළමනාකරණය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේදී ඒ සඳහා ආයතන සහ අණ පනත් රාශියක් මැදිහත් වන බව නොරහසකි. ජාතික මට්ටම පිළිබඳව සලකා බැලීමේදී මධ්‍යම පරිසර අධිකාරිය සහ ජාතික 1980 අංක 47 දරණ ජාතික පරිසර පනත ද විශේෂයෙන් වැදගත් වේ. ජාතික පරිසර පනතේ 12 වන වගන්තියේ සඳහන් වන අන්දමට විශේෂ හෝ පොදු විධාන අනුව යමින් අමාත්‍යවරයාගේ අනුමැතිය සහිත ලේඛනයක් මගින් පළාත් පාලන ආයතනයක සීමාව තුළ පරිසරය රැක ගැනීම හෝ එසේ කිරීමට කටයුතු සලස්වන ලෙස පළාත් පාලන ආයතනවලට බලය පැවරීමේ හැකියාව මධ්‍යම පරිසර අධිකාරියට හිමිවේ. එමෙන්ම මෙම පනතේ ප්‍රතිපාදන තුළින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති සඳහා පාරිසරික නිර්දේශ

ලබාදීමේ බලය මධ්‍යම පරිසර අධිකාරියට හිමි වේ. එයට අමතරව පිළිසර කසල කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ කසල කළමනාකරණ ව්‍යාපෘති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් පාලන ආයතනවලට අවශ්‍ය පහසුකම් සැපයීම සහ උපදෙස් සැපයීමේ බලය මධ්‍යම පරිසර අධිකාරියට හිමිවේ. එමෙන්ම පනතේ 12 වන වගන්තියට අනුව පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ පරිසරය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් කටයුතු සැලැස්වීම සඳහා පොදු හෝ විශේෂ විධි විධාන ලියවිල්ලක් තුළින් පළාත් පාලන ආයතනවලට පැවරිය හැක. තව ද, පනතේ 2 (1) උපවගන්තිය යටතේ විධානයක් දෙනු ලබන සෑම පළාත් පාලන ආයතන සීමාවක් තුළම පාරිසරික ආරක්ෂාව සම්බන්ධයෙන් වූ යම් නිර්දේශ මෙන්ම පාරිසරික දූෂණ වැළැක්වීම සම්බන්ධයෙන් පරිසර අධිකාරි විසින් නිකුත් කරන නිර්දේශ බලාත්මක කර ක්‍රියාත්මක කරන ලෙස අදාළ ආයතනයට නියම කිරීම සිදුකළ හැක. පනත තුළින් තවදුරටත් පැහැදිලි කරන අන්දමට අපද්‍රව්‍ය, කසල සහ මළ අනවසරයෙන් බැහැර කිරීම හෝ තැන්පත් කිරීම තහනම් කිරීමත්, පස්, ඇල මාර්ග හෝ දියමාර්ග කරා පිළිසකර නොකළ මළ හො උප ප්‍රමාණික කර්මාන්ත පිටාර ගැලීම් හෝ විස රසායනික ද්‍රව්‍ය බැහැර කිරීම වැළැක්වීමටත් අදාළ විධි විධාන සලසා ඇත.

2007 හඳුන්වා දෙනු ලැබූ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ජාතික ප්‍රතිපත්තිය තුළින් පැහැදිලි කෙරෙන අන්දමට අවශ්‍ය දත්ත නොමැතිකම නිසා මෙරට දිනකට ජනනය කරන හෝ ජනනය වන අපද්‍රව්‍ය ප්‍රමාණය නිවැරදිව ගණනය කිරීම අපහසු මට්ටමක පවතී. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ක්‍රියාවලියට සම්බන්ධ ආයතන විසින් අපද්‍රව්‍ය කළමනාකරණයට දක්වන දායකත්වය අඩුවීම හේතුවෙන් මේ සම්බන්ධව ගැටලු රාශියක් පැන නැගී ඇත. මේ නිසා නිසි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රවේශයක් ක්‍රියාත්මක කිරීමේ අරමුණින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හඳුන්වා දීමට පියවර ගෙන ඇත. ඒ අනුව මෙම ප්‍රතිපත්තියෙහි අරමුණු වන්නේ,

1. අපද්‍රව්‍ය ජනනය කරන්නා වූ සහ අපද්‍රව්‍ය කළමනාකරණය හෝ ඒ සම්බන්ධ සේවා සැපයීම සිදු කරන සියලු පාර්ශවවල පාරිසරික සහ සමාජ වගකීම් තහවුරු කිරීම

2. පරිසර හිතකාමී ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා තනි තනි පුද්ගලයින් සහ ආයතන ඒකාබද්ධ කිරීම සඳහා ක්‍රියාකාරී ලෙස දායක වීම

3. තැන් තැන්වල අපද්‍රව්‍ය බැහැර කිරීමේ ප්‍රමාණය අවම කිරීම සඳහා අවශ්‍ය සම්පත් උපරිම අන්දමින් සපයා දීම

4. අපද්‍රව්‍ය බැහැර කිරීම නිසා සිදුවන්නා වූ හානිකර පාරිසරික බලපෑම් අවම කිරීම මගින් ජනතාව සහ පරිසර පද්ධතියෙහි යහපැවැත්ම තහවුරු කිරීම එකී අරමුණුවලට ඇතුළත් වේ.

ඉහත සඳහන් කළ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පිළිසරු ජාතික කසල කළමනාකරණ වැඩසටහන දියත් කරනු ලබයි. මෙම වැඩසටහන තුළින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා සමස්ත මඟ පෙන්වීමක් සිදු කරන අතර ජාතික සම්බන්ධීකරණය සහ සම්පත් සංවර්ධනය ඔස්සේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධ ආර්ථික සහ කාර්මික වැඩසටහන්වලට අවශ්‍ය පහසුකම් සපයා දෙනු ලබයි.

පිළිසරු කසල ව්‍යාපෘතියට අදාළව අරමුණු පහක් හඳුනාගත හැක. එනම්,

1. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සැකසීම

2. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික උපාය මාර්ග සැලැස්ම ක්‍රියාවට නැංවීම

3. ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අදාළ පාර්ශවකරුවන් අධ්‍යයනය සහ දැනුවත් කිරීම තුළින් ධාරිතා වර්ධනය කිරීම

4. කසල කළමනාකරණ ව්‍යාපෘති වැඩටසහන් ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් පාලන ආයතනවලට අවශ්‍ය පහසුකම් සැපයීම

5. කසල කළමනාකරණය සම්බන්ධයෙන් කාර්යක්ෂම ලෙස නීතිමය පියවර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය සංශෝධන සිදු කිරීම (පරිසර අමාත්‍යාංශය, 2011).

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන විසින් ඉටු කරන කාර්ය භාරය ද මෙම ප්‍රතිපත්තියේදී ප්‍රමුඛ වැදගත්කමක් හිමිකර ගනු ලබයි. ඒ අනුව පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ විසින් ඒ සඳහා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය නමින් වෙනම ඒකකයක් පවත්වා ගෙන යනු ලබන අතර ඒ තුළින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අදාළ මෙහෙයුම්

කමිටු පිහිටුවීම, ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අවශ්‍ය පහසුකම් සහ උපදෙස් සපයා දීම ආදී විවිධ ක්‍රියාකාරකම් ඉටු කරනු ලබයි (www.lgpc.gov/lk).

3.2 පළාත් මට්ටම

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් පළාත් මට්ටමෙන් ක්‍රියාත්මක ප්‍රතිපත්ති සහ වැඩසටහන් පිළිබඳව අවධානය යොමු කිරීමේදී 2007 අංක 01 දරණ බස්නාහිර පළාත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රඥප්තිය විශේෂ වැදගත්කමක් උසුලනු ලබයි. මෙම ප්‍රඥප්තිය තුළින් බස්නාහිර පළාත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය පිහිටුවනු ලබන්නේ බස්නාහිර පළාත තුළ අපද්‍රව්‍ය එකතු කිරීම, වෙන් කිරීම, ප්‍රවාහනය කිරීම, අපහරණය කිරීම සහ කළමනාකරණය කිරීම අරමුණු කර ගනිමිනි. මෙම ප්‍රඥප්තිය තුළින් අධිකාරියට හිමිකර දී ඇති කාර්යයන් අතර, පළාත තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණට අදාළ අධීක්ෂණ කටයුතු ඉටු කිරීම, පළාත් පාලන ආයතන සහ එයට අදාළව සිදුවිය හැකි ආපදා නිශ්චය කිරීම සහ තක්සේරු කිරීම, එකී ආපදා වැළැක්වීම සඳහා අවශ්‍ය ක්‍රියා පටිපාටි සකස් කොට ක්‍රියාවට නැගීම, අපද්‍රව්‍ය නැවත භාවිතා කිරීම සහ ප්‍රතිචක්‍රීයකරණය සම්බන්ධයෙන් පර්යේෂණ පැවැත්වීම සහ අපද්‍රව්‍ය අක්‍රමවත් ලෙස බැහැර කිරීම නිසා දූෂණය වී ඇති ස්ථාන හඳුනාගෙන ඒවා යථා තත්ත්වයට පත් කිරීම සඳහා සැලසුම් සකස් කිරීම, අවශ්‍ය නීති නියම පැනවීම සහ එම නීතිවලට අදාළව ක්‍රියාත්මක වීම සහතික කිරීම පුමුඛ වේ. එමෙන්ම පළාත තුළ දේශීය හෝ විදේශීය මූල්‍යාධාර සහිතව වෙනත් ආයතනයක් හෝ පුද්ගලයෙකු විසින් ක්‍රියාත්මක කරනු ලබන සියලුම ව්‍යාපෘති පළාත් පාලන ආයතන සහ අදාළ අනෙකුත් ආයතන සමඟ සම්බන්ධීකරණය සහ අධීක්ෂණය කිරීමේ කටයුත්ත ද අධිකාරියට පැවරී ඇත. තව ද, අපද්‍රව්‍ය කළමනාකරණය සහ අපද්‍රව්‍ය ජනනය සීමා කිරීම හෝ අවම කිරීම සඳහා ජනතාව දැනුවත් කිරීම, එයට අදාළ පර්යේෂණ පැවැත්වීම අධිකාරියෙහි විෂයය පථයට ඇතුළත් වේ. මෙයට අමතවර අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් වන නීති රෙගුලාසි උල්ලංඝනය කිරීම පිළිබඳව ජනතාව විසින් හෝ පළාත් පාලන ආයතන හෝ වෙනත් ඕනෑම ආයතනයක් විසින් සිදු කරන පැමිණිලි පරීක්ෂා කිරීම සහ ඒවාට අදාළව සුදුසු පියවර ගැනීම ද අධිකාරියෙහි කාර්යයක් වශයෙන් ප්‍රඥප්තියෙහි සඳහන් වේ (බස්නාහිර පළාත් සභාව, 2007). ප්‍රඥප්තිය තුළින් හිමිව ඇති නීතිමය බලය ඔස්සේ පළාත් අධිකාරිය විසින් බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන

සමඟ ඒකාබද්ධව පිවිතුරු පානැල්, පිවිතුරු සුව පියස, පිවිතුරු පුර වැනි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ උපදේශන සේවා වැඩසටහන් දියත් කරනු ලබයි.

ඉහත කරුණුවලට අමතරව 2008.07.30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1560/6 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ බස්නාහිර පළාතේ 2008 අංක 01 දරණ නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ රීති මෙහිදී වැදගත් වේ. එම ගැසට් නිවේදනය තුළ අපද්‍රව්‍ය ජෛවභායනය වන සහ ජෛවභායනය නොවන වශයෙන් වර්ගීකරණ ලේඛනයක් ඉදිරිපත් කර ඇති අතර (වගු සටහන් 02) නාගරික ප්‍රදේශවල අපද්‍රව්‍ය ජනනය කරන්නන් විසින් අපද්‍රව්‍ය බැහැර කිරීමේදී ජෛවභායනය වන සහ නොවන වශයෙන් වර්ගීකරණය කර වෙන වෙනම බහාලුම්වලට දෙනිකව රැස්කළ යුතුය. එසේම, කාර්මික, වෛද්‍ය සහ සෞඛ්‍ය ආරක්ෂක ආයතන තමන් භාවිතා කළ විෂ සහිත සහ සායනික අපද්‍රව්‍ය නාගරික ඝන අපද්‍රව්‍යවලින් වෙන්කර ජාතික පාරිසරික (තත්ත්ව ආරක්ෂණ) රෙගුලාසිවලට අනුකූලව ගබඩා කිරීම සහ බැහැර කිරීම සිදු කළ යුතුවේ. තව ද, අපද්‍රව්‍ය ජනනය කරන්නන් විසින් විද්‍යුත් සහ තොග අපද්‍රව්‍ය දෛනික ඝන අපද්‍රව්‍යවලින් වෙන් කොට රැස්කර පළාත්පාලන ආයතනවලට හෝ ඔවුන්ගේ බලයලත් ආයතනවලට භාරදීම කළ යුතුවේ. මෙම රීතිවලින් තවදුරටත් පැහැදිලි කරන අන්දමට ඉදිකිරීම් හේතුවෙන් ජනනය වන ඝන අපද්‍රව්‍ය සහ බිඳ හෙළීම් නිසා ජනනය වන සුන්බුන් අනෙකුක් අපද්‍රව්‍ය සමඟ මුසු නොකොට බැහැර කිරීම සඳහා අදාළ පළාත් පාලන ආයතනයට හෝ ඔවුන්ගේ බලයලත් තැනැත්තන්ට ලබාදිය යුතුවේ. මෙයට අමතරව මහජනතාවට විවෘත ගොඩනැගිල්ලක් තුළ හෝ ප්‍රසිද්ධ ස්ථානවල හෝ පදික වේදිකා, පටුමාවත් මත හෝ ප්‍රවාහන මාධ්‍යයන් තුළ කෙළ ගැසීම හෝ කසළ දැමීම නොකළ යුතු බවත්, කසළ විවෘත දහනය කිරීම හෝ එසේ කරවීම නොකළ යුතු බවත්, අසල්වැසියන්ට පීඩාකාරී විය හැකි හෝ ප්‍රදේශයේ ජීවත්වන සතුන්ගේ සහ ශාකවල පැවැත්මට අහිතකර බලපෑමක් සිදු කළ හැකි හානිකර, සායනික හෝ අන්තරායකාරී අපද්‍රව්‍ය ගෙවත්තේ වැළලීම, ගෙවත්තේ තබා ගැනීම නොකළ යුතු බවත් එම රීතිවල සඳහන් වේ. තව ද, අප්‍රසන්න ගඳක් සහිත ද්‍රව හෝ අර්ධ ඝන අපද්‍රව්‍ය යම් පරිශ්‍රයක පිදිංචිකරුවෙක් විසින් විටියක් මත හෝ පොදු ස්ථානයක් මත හෝ කාණුවකට හෝ නොදැමිය යුතු බවත්, යම් පරිශ්‍රයක පදිංචිකරුවන් විසින් සංවෘත භාජනයක් තුළ හැර කසළ තැන්පත් කිරීම හෝ තැන්පත් කිරීමට සැලැස්වීම නොකළ යුතු බවත් පෙන්වා දේ.

වගු සටහන් අංක 02ඃ අංක 1560/6 අති විශේෂ ගැසට් නිවේදනයේ සඳහන් අපද්‍රව්‍ය වර්ගීකරණය

අපද්‍රව්‍ය වර්ගය	අයත්වන අයිතම
දෛනිකව ජනනය කරනු ලබන පහසුවෙන් පෛවහායනය වන අපද්‍රව්‍ය	එළවළු සහ පළතුරු කසළ, මස් සහ මාළු ඉතිරිවන අපද්‍රව්‍ය, සැකසූ ආහාර හෝ ඒවායේ කසළ, සත්ත්ව මළ, ගෙවතු කසළ, සත්ත්ව මළ, මිනිස් මළ, ඩයිපර් නැප්කින් සහ සැහැල්ලු කාබනික ද්‍රව්‍ය
පෛවහායනය නොවන හෝ අඩුවෙන් පෛවහායනය වන අපද්‍රව්‍ය	තුනී කඩදාසි, සණ කඩදාසි, හාඩ්බෝඩ්, ප්ලාස්ටික්, පොලිතීන්, ඉවත ලන හා කැපූ රෙදි කැබලි, පොල් කුඩු, ලෝහ, , පිඟන් ද්‍රව්‍ය, අළු, වැලි, සිල්ක් ද්‍රව්‍ය, බොරළු, සුත්‍රිකා බල්බ, වීදුරු භාණ්ඩ, අකාබනික පෙණ සහිත භාණ්ඩ, ඇසුරුම් සඳහා ගනු ලබන ද්‍රව්‍ය, රබර් සහ රබර් ආශ්‍රිත ද්‍රව්‍ය, කොහු සහ කොහු මුල්කොට සැකසූ ද්‍රව්‍ය, කපා ඉවතලන කෙස් කැබලි සහ අනිකුත් අකාබනික ඝන ද්‍රව්‍ය
විද්‍යුත් අපද්‍රව්‍ය	ශීතකරණ, ජංගම දුරකථන, රේඩියෝ, රූපවාහිනී යන්ත්‍ර, පරිඝනක, සෙල්ලම් බඩු, විද්‍යුත් පරිපථ
තොග ද්‍රව්‍ය	කිලෝග්‍රෑම් 10ට වැඩි ගෘහස්ථ අපද්‍රව්‍ය, පාවිච්චි කළ ගෘහ භාණ්ඩ, ටයර්, කපන ලද ගස්වල කොටන්
බිඳ හෙළීම් සහ ඉදි කිරීම් අපද්‍රව්‍ය	ෂීට් වර්ග, සෙවිලි කිරීමට ගන්නා ද්‍රව්‍ය, පස්/පොළොවෙන් ඉවත් කර ද්‍රව්‍ය, පයිප්ප, වැහිපීළි, කඩා ඉවත ලන කොන්ක්‍රීට් සහ සිමෙන්ති ආශ්‍රිත ද්‍රව්‍ය, යකඩ කුරු සහ පාවිච්චි කළ පලංචි ද්‍රව්‍ය

ගෘහස්ථව ජනනය වන සායනික හෝ විෂ සහිත ද්‍රව්‍ය	බැටරි, ටියුබ් ලයිට්, භාවිත කළ හෝ පිච්චුන තෙල් වර්ග, එන්නත් කටු, උෂ්ණත්වමාපක, කෘමි සහ වල් නාශක සහ අනෙකුත් විෂ සහිත දියර වර්ග සහ සනීපාරක්ෂක තුවා
අන්තරායකාරී අපද්‍රව්‍ය	1996 අංක 924/13 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ නිශ්චිතව දක්වා ඇති අපද්‍රව්‍ය

උපුටා ගැනීම: 2008.07.30 දිනැති අංක 1560/6 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය

3.3 පළාත් පාලන මට්ටම

සෑම පළාත් පාලන ආයතනයක්ම කැලි කසල එකතු කිරීම, බැහැර කිරීම ඇතුලු අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතුවල නියැලේ. මේ සඳහා සෑම පළාත් පාලන ආයතනයක් සතුවම යාන්ත්‍රණයක් සහ අඩු වැඩි වශයෙන් මානව සහ භෞතික සම්පත් පවතී. පළාත් පාලන නීතියෙන් විස්තර කරන අන්දමට සියලුම අපද්‍රව්‍ය පළාත් පාලන ආයතනවල දේපළක් වන අතර කැලි කසල එකතු කිරීමේ සිට අවසන් බැහැර කිරීම සිදු කිරීමටත්, විකිණීමටත් සම්පූර්ණ අයිතිය පළාත් පාලන ආයතනවලට හිමිවේ.

පළාත් පාලන පනත්වලින් ලබා දී ඇති වගකීම් සහ කාර්යභාරයට අමතරව රජය සහ පළාත් සභා විසින් පසුකාලීනව නිකුත් කරනු ලැබූ අණ පනත්, රෙගුලාසි ආදිය තුළින් ද පළාත් පාලන ආයතන විසින් අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් ඉටු කළ යුතු කාර්යභාරය සහ වගකීම් විස්තර කර ඇත. 2008.07.30 දිනැති අංක 1560/6 අති විශේෂ ගැසට් නිවේදනයට අනුව සෑම පළාත් පාලන ආයතනයක්ම සතියට දෙවතාවක් දොරින් දොරට කසළ රැස් කිරීම කළ යුතු අතර ඒවා එකතු කරන ආකාරය සහ වේලාව පදිංචිකරුවන්ට පූර්වයෙන් දැනුම්දීම කළ යුතුය. එමෙන්ම සාමාන්‍යයෙන් පළාත් පාලන ආයතනවලට ගෙවන බදුවලට අමරතව දොරින් දොරට කසල එකතු කිරීම වෙනුවෙන් අදාළ ගෘහ ඒකක, ව්‍යාපාරික සහ කාර්මික ස්ථානවලින් මාසික ගාස්තුවක් අය කිරීමේ බලය පළාත් පාලන ආයතනවලට හිමිවේ (වගු සටහන් අංක 03).

වගු සටහන් අංක 03ඃ දොරින් දොර කසළ එකතු කිරීම වෙනුවෙන් ගෙවිය යුතු භාවිත ගාස්තු ප්‍රමාණය

		මාසික ගාස්තු ප්‍රමාණය (රුපියල්)	
පරිශ්‍රය	**පරිශ්‍රයේ ප්‍රමාණය**	**අවම**	**උපරිම**
ගෘහස්ථ	වර්ග අඩි 1000ට අඩු	30	200
	වර්ග අඩි 1000-3000	50	300
	වර්ග අඩි 3000ට වැඩි	100	500
වාණිජ	වර්ග අඩි 1000ට අඩු	100	750
	වර්ග අඩි 1000-3000	200	1000
	වර්ග අඩි 3000ට වැඩි	250	1500
කාර්මික	වර්ග අඩි 1000ට අඩු	100	750
	වර්ග අඩි 1000-3000	200	1000
	වර්ග අඩි 3000ට වැඩි	250	2000
හෝටල්,	වර්ග අඩි 1000ට අඩු	100	500
ආපනශාලා,	වර්ග අඩි 1000-3000	200	2000
සාත්තු නිවාස	වර්ග අඩි 3000ට වැඩි	300	5000
පන්සල්, රජයේ රෝහල් සහ රාජ්‍ය ආයතන		පළාත් පාලන ආයතනයට තීරණය කළ හැක	

උපුටා ගැනීමඃ 2008.07.30 දිනැති අංක 1560/6 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය

එමෙන්ම, තම බල ප්‍රදේශයේ පුරවැසියන් දැනුවත් කිරීම සඳහා පළාත් පාලන ආයතන විසින් අපද්‍රව්‍ය වර්ගීකරණය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කරන අතරම, වර්ගීකරණය කරන ලද අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කිරීම සහ පුනර්භාවිතය පිළිබඳව කටයුතු ප්‍රවර්ධනය කළ යුතුය. එමෙන්ම, සෑම පළාත් පාලන ආයතනයක් විසින්ම තම බල ප්‍රදේශය තුළ පිහිටි සියලු ශ්‍රේණිවල පොදු පාරවල්, පදික වේදිකා, බෝක්කු, කාණු සහ සෑම පොදු ස්ථානයක්ම විධිමත් කාල පරාසයක් තුළ පවිත්‍ර කිරීම සිදු කළ යුතුය. තව ද, සෑම පළාත් පාලන ආයතනයක් විසින්ම දිරාපත්වන සහ දිරාපත් නොවන කසළ බහාලීම සඳහා සෑම වර්ගයකටම අයත් මාර්ග දෙපස සහ පොදු ස්ථානවල සංඥත කසළ බඳුන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් තැබීම සහ නඩත්තු කිරීම කළ යුතු බව එම රෙගුලාසිවල දැක්වේ. බස්නාහිර පළාතේ 2008 අංක 01 දරණ නාගරික ඝන අපද්‍රව්‍ය

කළමනාකරණ රීතිවල සඳහන් කර ඇති අන්දමට, සෑම පළාත් පාලන ආයතනයක්ම නාගරික ඝන අපද්‍රව්‍ය නිශ්චිත අවසාන බැහැර කිරීමේ පහසුකමක් වෙත ප්‍රවාහනය කළ යුතු අතර ඒවාට අදාළ වාර්තා නිසි පරිදි නඩත්තු කළ යුතුය. තව ද, නාගරික ඝන අපද්‍රව්‍ය මහා පරිමාණ ප්‍රවාහනය සඳහා යොදවනු ලබන සෑම වාහනයක්ම පිරිසිදු තත්ත්වයෙන් පවත්වාගෙන යා යුතු අතර අපද්‍රව්‍ය ප්‍රවාහනයේදී මහජනතාවට නොපෙනෙන ලෙස ඒවා ආවරණය කළ යුතුය.

එක්රැස් කරනු ලැබූ කැලි කසල බැහැර කිරීම සඳහා පළාත් පාලන ආයතන විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලබයි. මේ අනුව කසල බැහැර කරන නිවාස, වෙළඳසැල්, කර්මාන්තශාලා හෝ ආයතන ආදී ප්‍රාථමික මූලාශ්‍රවලින් දිරන සහ නොදිරන වශයෙන් වෙන් කරන ලද අපද්‍රව්‍ය පළාත් පාලන ආයතනය විසින් ලබා ගනී. එසේ එක් රැස් කරනු ලැබූ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කිරීම, දහනය හෝ පිළිස්සීම, විවෘත ලෙස අපහරණය කිරීම, කාබනික පොහොර සැකසීම හෝ පහත් බිම් ගොඩ කිරීම සඳහා අදාළ ස්ථාන වෙත ප්‍රවාහනය කිරීම පළාත් පාලන ආයතනය විසින් සිදු කරනු ලබයි. දිරාපත්වන කසල භාවිතා කරමින් පළාත් පාලන ආයතන විසින් කාබනික පොහොර නිෂ්පාදනය කිරීම සිදු කරනු ලබයි. නොදිරන අපද්‍රව්‍යවලින් ඇතැම් ඒවා ප්‍රතිචක්‍රීයකරණය කරන අතර ප්‍රතිචක්‍රීකරණයෙන් ප්‍රතික්ෂේප වන නොදිරන අපද්‍රව්‍ය සහ ඇතැම් අවස්ථාවලදී වෙන් නොකරන ලද මිශ්‍ර අපද්‍රව්‍ය බිම් පිරවීම සඳහා භාවිතයට ගනු ලබයි. කෙසේ වුව ද, බිම් පිරවීම සිදු කරන්නේ නම් ඉංජිනේරු තාක්ෂණයට අනුව ස්ථානගත කිරීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම ආදී සියලු කටයුතු නිසි ක්‍රමවේදයක් අනුව සිදු කළ යුතු වේ.

3.4 දොම්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

දොම්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය වර්ග කිලෝ මීටර් 180 ආසන්න විශාල ප්‍රදේශයක් ආවරණය කරනු ලැබුවත් කසල එකතු කිරීම සිදු කරනු ලබන්නේ සමස්ත ග්‍රාම නිලධාරී වසම්වලින් 31% පමණ ප්‍රදේශයක් ආවරණය වන, වරිපනම් බදු ගෙවන නාගරික ප්‍රදේශය තුළ පවතින නිවාස, වෙළඳසැල් සහ කර්මාන්තශාලා තුළින් පමණි. පවතින ඇස්තමේන්තු අනුව දොම්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දෛනිකව ටොන් 35-40 ආසන්න කැලි කසල ප්‍රමාණයක් ජනනය වන අතර ඉන් එක්රැස් කරනු ලබන්නේ 20%ක් එනම් ටොන් අටකට ආසන්න ප්‍රමාණයකි. මෙම කාර්යය සඳහා 28

දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් දොම්පේ ප්‍රාදේශීය සභාව විසින් යොදවා ඇත (දොම්පේ ප්‍රාදේශීය සභා ලේකම්වරයා සමඟ 2016.08.17 දින පැවති සම්මුඛ සාකච්ඡාව)

දොම්පේ ප්‍රාදේශීය සභාව විසින් දෛනික රැස්කරනු ලබන අපද්‍රව්‍ය අවසන් බැහැරකිරීම සිදු කරනු ලබන්නේ මධ්‍යම පරිසර අධිකාරිය සහ කොරියාවේ සුක්දෝවන් සන අපද්‍රව්‍ය කළමනාකරණ ආයතනය එක්ව කිරිඳිවැල මාලිගාවත්ත ප්‍රදේශයේ පිහිටුවා ඇති ග්‍රීන් පාර්ක් බිම් පිරවුම් මධ්‍යස්ථානයටය. එහිදී දිරාපත්වන කසල, කාබනික පොහොර අංගනයේදී කාබනික පොහොර බවට පත් කෙරෙන අතර නොදිරන අපද්‍රව්‍ය හෙක්ටයාර දෙකක භූමි ප්‍රමාණයක විසිර ඇති සනීපාරක්ෂක බිම් පිරවුම් ප්‍රදේශයට බැහැර කරනු ලබයි. මෙහිදී බැහැර කරන කසල තුළින් සිදුවන වායු සහ ජල දූෂණය වැළැක්වීම සඳහා යම් යම් ක්‍රියාමාර්ග අනුගමනය කර ඇත.

මෙයට අමතරව ප්‍රාදේශීය සභාව විසින් අපද්‍රව්‍ය ජනනය අවම කිරීම සහ විධිමත් ලෙස කසල බැහැර කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇති අතර පිවිතුරු පුර වැඩසටහන යටතේ නිවාස සංකීර්ණ සහ කුඩා ඉඩම්වල ඉදිවන නිවාස සඳහා කොම්පොස්ට් බැරල් ලබාදීම සිදු කරනු ලබයි. එමෙන්ම පිවිතුරු සුවපියස වැඩසටහන යටතේ සාමාන්‍ය අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමවේදයෙන් බැහැරව ජෛව අපද්‍රව්‍ය බැහැර කිරීම පිළිබඳව රෝහල් සහ වෛද්‍ය මධ්‍යස්ථාන දැනුවත් කිරීම සිදු කරනු ලබයි (දොම්පේ ප්‍රාදේශීය සභා ලේකම්වරයා සමඟ 2016.08.17 වැනි දින පැවති සම්මුඛ සාකච්ඡාව).

ප්‍රාදේශීය සභාව විසින් අපද්‍රව්‍ය තුළින් මුදල් උපයා ගන්නා ප්‍රධාන මාර්ග දෙකක් පවතී. එනම් කර්මාන්තශාලාවලින් අපද්‍රව්‍ය බැහැර කිරීමේදී ඒ සඳහා මුදලක් අයකර ගැනීම සහ දිරාපත්වන අපද්‍රව්‍ය භාවිතා කරමින් කාබනික පොහොර නිෂ්පාදනය කොට අලෙවි කිරීමයි. ප්‍රධාන කර්මාන්තශාලා දොළහක කැලි කසල ප්‍රාදේශීය සභාව විසින් ලබා ගන්නා අතර එහිදී අපද්‍රව්‍ය ටොන් 01ක් සඳහා රුපියල් 5000/= මුදලක් අයකර ගැනේ. කෙසේ වුවත්, අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ප්‍රාදේශීය සභාව විසින් වාර්ෂිකව සැලකිය යුතු මුදලක් වැය කරන බව වගු සටහන් අංක 2න් පැහැදිලි කෙරේ. ප්‍රාදේශීය සභාව විසින් 2014 වර්ෂයේදී රුපියල් 13,017,388/= ක මුදලක් ද, 2015දී 11,913,574/= මුදලක් ද අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වැයකර ඇත (වගු සටහන 02). වගු සටහනෙහි දත්තවලින් පෙන්නුම් කෙරෙන අන්දමට ප්‍රාදේශීය සභාව විසින් කසල කළමනාකරණයේදී වැය කරන

මුදලින් 90% ආසන්න මුදලක් වාර්ෂිකව වැය කරනු ලබන්නේ සේවක වැටුප් සහ අතිකාල දීමනා වශයෙනි.

වගු සටහන 02ඃ ප්‍රාදේශීය සභාව විසින් අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වැය කළ මුදල (රුපියල්)

මුදල් වැයකළ කාරණය	2014		2015	
	මුදල (රුපියල්)	%	මුදල (රුපියල්)	%
සේවක වැටුප්සහ අතිකාල දීමනා	11,509,905	88.4	10,741,415	90.2
යන්ත්‍රෝපකරණනඩත්තු කටයුතු	547,655	4.2	252,878	2.1
ඉන්ධන වියදම්	959,828	7.4	796,705	6.7
ගබඩා ද්‍රව්‍ය වියදම්		0.0	122,545	1.0
සම්පූර්ණ වියදම	13,017,388	100.0	11,913,573	100.0

මූලාශ්‍රයඃ දොම්පේ ප්‍රාදේශීය සභාව, 2016.

4.0 ක්ෂේත්‍ර දත්ත විශ්ලේෂණය

4.1 නියැදියේ පසුබිම

දොම්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි වරිපනම් බදු ගෙවන සහ ප්‍රාදේශීය සභාව විසින් කැලි කසල එකතු කිරීම සිදු කරන නිවාස සහ වෙළඳසැල් ඇතුළත්ව ඒකක 100ක් මෙම අධ්‍යයනයේ නියැදිය වශයෙන් අහඹු ලෙස තෝරා ගැණිනි. එයට අමතරව අපද්‍රව්‍ය කළමනාකරණයට සම්බන්ධ ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩලයෙහි සාමාජිකයින් සමඟ පවත්වන ලද සම්මුඛ සාකච්ඡා ඇසුරින් ලබාගත් තොරතුරු ද අධ්‍යයනය සඳහා භාවිතා කරන ලදී. අධ්‍යයනය සඳහා තොරතුරු ලබාදුන් ප්‍රතිචාරීන්ගෙන් 60%ක් ස්ත්‍රීන් වූ අතර 40%ක් පුරුෂයින් විය. ප්‍රතිචාරීන්ගෙන් 74%ක් වසර 10ක් හෝ එයට වැඩි කාලයක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජීවත් වූවන් වන අතර 15%ක් වසර 5-9 අතර කාලයක් ද, 11%ක් වසර 5 අඩු කාලයක් ද, ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෝ වෙති. මෙම නියැදිය තුළ ගෘහණියන් 45% සහ සේවා නියුක්තිකයින් 55%ක් නියෝජනය විය.

4.2 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් සේවාලාභීන්ගේ තෘප්තිමත්භාවය

කැලි කසල එකතු කිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව විසින් ඉටු කරන සේවාව සම්බන්ධයෙන් නියැදියේ 70%ක් තෘප්තිමත් බව ප්‍රකාශ කරන නමුත් 20%ක් සේවාව පිළිබඳව තමන් තෘප්තිමත් නොවන බව අනාවරණය කළහ. ඉතිරි 10% ප්‍රකාශ කරනු ලැබුවේ ප්‍රාදේශීය සභාව විසින් සපයන සේවාව මධ්‍යස්ථ මට්ටමක පවතින බවයි. කැලි කසල බැහැර කිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව සපයන සේවාව ප්‍රමාණවත් නොවන බව පැවසීමට බලපෑ හේතු සාධක වගු සටහන් අංක 04න් ඉදිරිපත් කෙරේ.

වගු සටහන් අංක 04ඃ ප්‍රාදේශීය සභාව විසින් සපයන සේවාව ප්‍රමාණවත් නොවීමට හේතු

හේතු	සංඛ්‍යාව	ප්‍රතිශතය % (N=20) *
කැලි කසල බැහැර කිරීමට ස්ථානයක් නොවීම	18	90.0
ගෘහස්ථ සහ වෙළඳසැල්වල කැලි කසල රැගෙන යාම සිදුකළත් කැලි කසල නිසා අවහිර වන කාණු පද්ධති පිරිසිඳු නොකිරීම	13	65.0
නිශ්චිත දිනයක නිශ්චිත වේලාවක අපද්‍රව්‍ය රැගෙන යාමට නොපැමිණීම	10	50.0
නිශ්චිත කාල රාමුවක් තුළ කැලි කසල රැගෙන නොයාම නිසා සතුන් විසින් කසල මලු ඉරා දැමීමෙන් පරිසරය අපවිත්‍ර වීම	10	50.0
ඇතැම් අවස්ථාවලදී කැලි කසල රැගෙන නොයෑම	08	40.0
කැලි කසල රැගෙන යාම වෙනුවෙන් ඇතැම් කම්කරුවන් මුදල් බලාපොරොත්තුවීම	06	30.0

* එකම පුද්ගලයා විසින් කරුණු කිහිපයක් සඳහන් කිරීම නිසා ප්‍රතිශත එකතුව 100ට සමාන නොවේ.

මූලාශ්‍රයඃ ක්ෂේත්‍ර සමීක්ෂණය, 2016

මෙහිදී ප්‍රාදේශීය සභාව විසින් සපයන සේවාව සම්බන්ධයෙන් තමන් තෘප්තිමත් නොවන බව පැවසූ ප්‍රතිචාරීන් අතුරින් 90% (පුද්ගලයින් 18) ක් එසේ පැවසීමට හේතුව වන්නේ තමන්ට කැලි කසල බැහැර කිරීම සඳහා නිශ්චිත

ස්ථානයක් නොවීම නිසා ප්‍රාදේශීය සභාවේ කැලි කසල එකතු කිරීමේ රථය පැමිණෙන තුරු ඇතැම් අවස්ථාවල දින ගණනාවක් කැලි කසල තම ව්‍යාපාරික ස්ථානය/නිවස ඉදිරිපිට හෝ ඇතුළත තබාගෙන සිටීමට සිදුවීමයි. මේ නිසා ඉඳුල් වැනි අපද්‍රව්‍ය එක්රැස්වන අවස්ථාවලදී අධික දුර්ගන්ධයක් වහනය වීමත් ඒ තුළින් සෞඛ්‍ය ගැටලු මතුවීමත් නිසා ප්‍රාදේශිය සභාව විසින් සපයන සේවාව සම්බන්ධයෙන් තමන් තෘප්තිමත් නොවන බව ඔවුහු පවසති. එමෙන්ම මේ සම්බන්ධයෙන් ප්‍රතිචාරීන් ඉදිරිපත් කරන අනෙක් වැදගත් කරුණ වන්නේ තම නිවාස සහ ව්‍යාපාරික ආයතනවල කැලි කසල රැගෙන යාම සිදුකළත් ඇතැම් අවස්ථාවලදී නගරයේ කාණු පද්ධතිය කැලි කසල නිසා විශේෂයෙන්ම නොදිරන කැලි කසල හේතුවෙන් අවහිරවීම සිදුවන නමුත් ඒවා නිසි පරිදි පවිත්‍ර කිරීමක් සිදු නොවන බවයි. ඒ තුළින් වැසි කාලවලදී කාණු පද්ධතියෙන් ජලය ගලා නොයාම නිසා තමන්ට මාර්ග සම්බන්ධයෙන් ගැටලු රාශියකට මුහුණ දීමට සිදුවන බව ප්‍රතිචාරීන්ගේ අදහස විය. එමෙන්ම දිරාපත් නොවන අපද්‍රව්‍ය සමඟ මුසුවූ ජලය කාණු පද්ධතිය තුළ රැඳීම නිසා මදුරුවන් බෝවීම නිසා මතුවන ගැටලු රාශියකට මුහුණ දීමට සිදුවන බව ඔවුන්ගේ අදහසයි. මෙයට අමතරව නිශ්චිත කාල සටහනකට අනුව අපද්‍රව්‍ය එක් රැස් කිරීම සිදු නොවීම හේතුවෙන් අපද්‍රව්‍ය එක් රැස් වීමත්, සතුන් විසින් අපද්‍රව්‍ය සහිත මලු ඉරා දැමීම ආදි හේතු නිසා මැස්සන් බෝවීම, දුර්ගන්ධයක් පැතිරයාම සහ සෞඛ්‍ය ප්‍රශ්න හටගැනීම ආදිය ප්‍රාදේශීය සභාව විසින් සපයන සේවාව සම්බන්ධයෙන් අතෘප්තිමත්වීම කෙරෙහි ප්‍රතිචාරීන්ගෙන් 50%කට බලපා ඇත. එමෙන්ම ඇතැම් අවස්ථාවලදී ප්‍රාදේශිය සභාවෙහි කම්කරුවන් සහ වාහන කැලි කසල රැගෙන යාමට පැමිණියත් තම නිවාස හෝ ව්‍යාපාරික ස්ථාන ඉදිරිපිට තබා ඇති කැලි කසල රැගෙන යාම සිදු නොකිරීම නිසා තමන් ප්‍රාදේශීය සභාව විසින් සපයන සේවාව සම්බන්ධයෙන් තෘප්තිමත් නොවන බවට ප්‍රාදේශීය සභා සේවාව සම්බන්ධයෙන් අතෘප්තිමත් බව පැවසූ ප්‍රතිචාරීන්ගෙන් 40% (පුද්ගලයින් 8) අනාවරණය කර ඇත. කෙසේ වුව ද, මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා සේවකයින් සමඟ සිදු කරන ලද සම්මුඛ සාකච්ඡාවන්ගෙන් අනාවරණය වූ කරුණ වූයේ ඇතැම් අවස්ථාවලදී ප්‍රාථමික ස්ථානවලින් කසල බැහැර කිරීමේදී ඒවා වර්ගීකරණයකට ලක් නොකොට මිශ්‍රව පවතින අවස්ථාවලදී තමන් කසල රැගෙන යාම සිදු නොකර බවයි. මේ සම්බන්ධයෙන් ඇතැම් අවස්ථාවලදී ප්‍රාථමික කසල බැහැර කරන්නන් සහ ප්‍රාදේශීය සභා සේවකයින් අතර ආරවුල්කාරී තත්ත්වයන් පවා හටගෙන ඇති බව අනාවරණය විය. එසේම, ප්‍රාදේශීය සභාව විසින් සපයන සේවාව

සම්බන්ධයෙන් අතෘප්තිමත් බව පැවසූ ප්‍රතිචාරීන්ගෙන් 30%ක් එසේ පැවසීමට හේතු සාධක වී ඇත්තේ ඇතැම් අවස්ථාවලදී කසල රැගෙන යාමට පැමිණෙන කම්කරුවන් ඒ වෙනුවෙන් මුදල් හෝ වෙනත් ත්‍යාග බලාපොරොත්තු වීමය (වගු සටහන් 4).

සේවාලාභීන්ගෙන් 70%ක් ප්‍රාදේශීය සභාව විසින් සපයන සේවාව සම්බන්ධයෙන් තෘප්තිමත් බව සඳහන් කළ අතර නිසි කාල සටහනක් අනුව කැලි කසල රැගෙන යාම ඒ සඳහා බලපා ඇති ප්‍රධානතම සාධකය වේ. ප්‍රතිචාරීන්ගෙන් 24%ක් (ප්‍රතිචාරීන් 24ක්) කැලි කසල රැගෙනයාම සඳහා ප්‍රාදේශීය සභා කාර්ය මණ්ඩලය පැමිණෙන දිනය හෝ වේලාව නිශ්චිතව පැවසිය නොහැකි බව පැවසූ අතර නිශ්චිත දිනයක පැමිණෙන නමුත් කාල වේලාව නිශ්චිතව පැවසිය නොහැකි බව 30%ක් පැවසූහ. නිශ්චිත දිනයක සහ නිශ්චිත වේලාවක් තුළ ප්‍රාදේශීය සභා කාර්ය මණ්ඩලයේ පිරිස පැමිණ කැලි කසල රැගෙන යන බව 46% මතය විය. සමීක්ෂණය සඳහා ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 35%ක් අනාවරණය කළ අන්දමට කැලි කසල හේතුවෙන් විශේෂයෙන්ම ඝන අපද්‍රව්‍ය හේතුවෙන් ඔවුහු විවිධාකාර ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණ දෙති. එය තම දෛනික ජීවිතය සඳහා දැඩි බලපෑමක් ඇති නොකරන නමුත් පූගොඩ සතිපොළ ප්‍රදේශය, තැපැල් ස්ථානය අවට ප්‍රදේශය සහ වෛද්‍ය මධ්‍යස්ථානය අවටත් කිරිඳිවැල සහ දොම්පේ නගර ආශ්‍රිතවත් තැනින් තැන අනවසර කසල බැහැර කිරීම නිසා කාණු පද්ධතිය අවහිරවීම, දුර්ගන්ධයක් පැතිරීම සහ දැඩි අප්‍රසන්න බවක් හටගනී. අනවසර කැලි කසල බැහැර කිරීමේදී අදාළ පුද්ගලයින්ට දඩුවම් ලබාදීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක නොවීම නිසා එම ගැටලුව නිරාකරණය කර ගැනීමට අපහසු බවත්, ඒ නිසා එය අඛණ්ඩව ක්‍රියාවට නැගෙන්නක් බවට පත්ව ඇති බවත් ප්‍රතිචාරීන්ගේ අදහස විය. සමස්ත නියැදියෙන් 20%ක් පෙන්වා දුන් අන්දමට මේ ආකාරයට අවිධිමත් අන්දමින් කසල බැහැර කිරීම නිසා නගරයේ කාණු පද්ධතිය අවහිරවීම සිදුව ඇති අතර එය ප්‍රදේශය තුළ වාසය කරන සහ එදිනෙදා කර්තව්‍යයන් සඳහා නගරයට පැමිණෙන අයට ද බාධාවක් වේ. වැසි දිනවලදී මෙම තත්ත්වය වඩාත් අහිතකර වේ.

ප්‍රාදේශීය සභාව විසින් කැලි කසල රැගෙන යන ප්‍රදේශවල පදිංචිකරුවන්ට ඒවා දිරාපත් වන සහ දිරාපත් නොවන වශයෙන් වෙන් කිරීමට උපදෙස් ලබා දී ඇති බව නියැදියේ ප්‍රතිචාරීන්ගෙන් 100% පැවසූ අතර අපද්‍රව්‍ය වෙන් කිරීම සඳහා බහාලුම් මලු ප්‍රාදේශීය සභාව විසින් ලබා දෙන බව 75% ප්‍රතිචාරය විය. ඉතිරි 25% පැවසුවේ ප්‍රාදේශීය සභාව විසින් ඇසුරම් මලු ලබා නොදෙන බවයි. මේ වන විට ප්‍රාදේශීය

සභාව විසින් කි.ග්‍රෑ.10-15 අතර ධාරිතාවක් සහිත අපද්‍රව්‍ය අසුරන මල්ලක් රුපියල් 150/= මුදලකට ජනතාවට ලබාදීමට කටයුතු කර ඇති අතර ප්‍රාදේශීය සභාව වෙතින් ඇසුරුම් මලු මිලදී නොගත් පිරිස 25%කි. වගු සටහන් අංක 05න් අපද්‍රව්‍ය බහාලුම් ලබාදීම සම්බන්ධයෙන් ප්‍රතිචාරීන්ගේ මතය ප්‍රදේශ අනුව ඉදිරිපත් කෙරේ. ඒ තුළින් පැහැදිලි කෙරෙනුයේ දොම්පේ නගරය ආශ්‍රිතව ජීවත්වන ප්‍රතිචාරීන් වැඩි පිරිසක් ප්‍රාදේශීය සභාව විසින් ඇසුරුම් මලු ලබා දී නොමැති බව හෙළිකර ඇති බවයි. මෙම අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය සිදුකරන ලැබූ 2016 සැප්තැම්බර්-ඔක්තෝබර් කාල සීමාව වන විට සමස්ත බල ප්‍රදේශය තුළ ඇසුරුම් මලු ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබීමත්, ඇතැම් ප්‍රතිචාරීන් විසින් මුදල් ගෙවා ඇසුරුම් මලු ලබා නොගැනීමත් මෙයට හේතු වී ඇත.

වගු සටහන 05ඃ අපද්‍රව්‍ය බහාලුම් ලබාදීම පිළිබඳ ප්‍රතිචාරීන්ගේ මතය

ප්‍රදේශය	ඇසුරුම් ලබාදීම		ඇසුරුම් ලබා නොදීම	
	සංඛ්‍යාව	ප්‍රතිශතය (N=75)	සංඛ්‍යාව	ප්‍රතිශතය (N=25)
කිරිඳිවැල	34	45.3	01	4.0
පූගොඩ	21	28.0	09	36.0
දොම්පේ	20	26.7	15	60.0
එකතුව	75	100.0	25	100.0

මූලාශ්‍රඃ ක්ෂේත්‍ර සමීක්ෂණය, 2016

පළාත් පාලන ආයතන තුළින් කැලි කසල ප්‍රවාහනය කිරීමේදී ඇතැම් අවස්ථාවලදී ප්‍රවාහන රථවලින් සහ අපද්‍රව්‍ය මාර්ග පුරා විසිරී යාම පිළිබඳ චෝදනා එල්ලවීම සුලභ තත්ත්වයකි. කෙසේ වුවත් දොම්පේ ප්‍රාදේශීය සභාව සම්බන්ධයෙන් අධ්‍යයනයට ලක් කළ නියැදිය තුළින් එවැනි චෝදනාවක් එල්ල නොවූ අතර කලකට ඉහත එම ගැටලුවට ප්‍රදේශවාසීන් මුහුණ දෙනු ලැබූවත් මේ වන විට කැලි කසල ප්‍රවාහනය සඳහා ප්‍රාදේශීය සභාව සතුව නවීන යන්ත්‍රෝපකරණ පවතින හෙයින් එම ගැටලුව බොහෝ දුරට මඟහැරී ඇති බව සමස්ත නියැදියේ මතය විය.

සමස්ත නියැදියේම අදහස වූයේ ප්‍රාදේශීය සභාව විසින් වරින් වර සහ අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් දැනුවත් කිරීම් සිදු කරන බවයි. දැන්වීම් පත්‍රිකා බෙදා හැරීම සහ ජංගම ප්‍රචාරණ රථ මේ සඳහා බහුලව භාවිතා කරන මාධ්‍ය වශයෙන් ප්‍රතිචාරීන්ගෙන් 51%ක් හඳුනා ගෙන ඇත. කෙසේ වුව ද, මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ ප්‍රතිචාරීන් සියලුම දෙනාගේ අදහස වූයෙ සහ අපද්‍රව්‍ය

නිසා මතුවන ගැටලු අවම කර ගැනීම සඳහා ගෘහස්ථ පරිසරය තුළම කාබනික පොහොර නිපදවීම, නොදිරන ද්‍රව්‍ය භාවිතය වෙනුවට දිරාපත් වන ආදේශක භාවිතා කිරීම වැනි කරුණු සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව විසින් තමන්ට පුහුණුවීම් හෝ දැනුවත් කිරීම් කර නොමැති බවත් එවැනි වැඩසටහන් බොහෝ දුරට ක්‍රියාත්මක කරනු ලබන්නේ ප්‍රාදේශීය සභාව විසින් දැනට අපද්‍රව්‍ය එක් රැස් කිරීම සිදු නොකරන ප්‍රධාන මාර්ගවලින් බැහැරව පවතින අපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධයෙන් ගැටලු පවතින කුඩා ඉඩම්වල පදිංචි ජනතාව වෙනුවෙන් බවයි.

4.3 අපද්‍රව්‍ය කළමනාකරණයේදී ජනතා වගකීම

අපද්‍රව්‍ය එක් රැස් කිරීම සහ බැහැර කිරීමේදී ප්‍රාදේශීය සභාව මුහුණ දෙන ගැටලුවක් වන්නේ ප්‍රාථමික අපද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථානවලදී ඒවා වර්ගීකරණයකට ලක් නොකර බැහැර කිරීමයි. මේ නිසා සේවකයින් යම් යම් අපහසුතා සහ ගැටලුවලට මුහුණ දේ. කෙසේ වුව ද, තමන් බැහැර කරන අපද්‍රව්‍ය වෙන්කොට බැහැර කිරීම ගැටලුවක් නොවන බව ප්‍රතිචාරීන්ගෙන් 86%ක් අනාවරණය කළ අතර ඒ සම්බන්ධයෙන් තමන් කිසියම් ගැටලුවකට මුහුණ දෙන බව පැවසූ ප්‍රතිශතය 14%කි. කසල වර්ගීකරණයේදී තමන් දුෂ්කරතාවන්ට මුහුණ දෙන බව පැවසූ සියලු දෙනාම ව්‍යාපාරිකයින් වූ අතර විශේෂයෙන්ම ආහාර පාන අලෙවි කරන වෙළඳසැල්වලට අදාළ ප්‍රතිචාරීන්ගෙන් මේ පිළිබඳ අදහස් ඉදිරිපත් විය. එම පිරිස අනාවරණය කළ අන්දමට වෙළඳසැල්වලට පැමිණෙන පාරිභෝගික ජනතාව අපද්‍රව්‍ය බැහැර කිරීමේදී ඒවා වෙන් කර බැහැර කිරීමකට යොමු නොවන බවත්, එම නිසා තමන්ගේ දෛනික කටයුතු සමඟ ඒවා නැවත වෙන් කිරීම අපහසු බවත් ඔවුන්ගේ අදහස විය. කෙසේ වුව ද, එවැනි අදහස් දැක්වූ බොහොමයක් වෙළඳසැල් තුළ වෙන් වෙන් වශයෙන් අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා භාජන තබා තිබූ බවක් නිරීක්ෂණය නොවිණි. අනෙක් අතට එළවළු සහ පළතුරු වෙළඳසැල් හිමියන්ගේ අදහස වූයේ තමන් මිලදී ගෙන ඇති ඇසුරුම් මලු තම වෙළඳසැලෙහි අපද්‍රව්‍ය ඉවත ලෑමට තරම් ප්‍රමාණවත් නොවන හෙයින් ප්‍රාදේශීය සභාවේ කම්කරුවන් සමඟ සාකච්ඡා කොට තමන් විසින්ම සකසා ගත් ඇසුරුම්වලට තම වෙළඳසැල්වල කැලි කසල අසුරන බවයි. සමස්තයක් වශයෙන් සලකා බැලීමේදී ඇතැම් අවස්ථාවලදී කැලි කසල වර්ගීකරණයට ලක්කර ඉවත ලෑම සම්බන්ධයෙන් යම් යම් ගැටලු සහ දුෂ්කරතාවන්ට

මුහුණ දෙනු ලැබුවත් එය තමන්ගේ යුතුකමක් සේ සලකා තමන් එම කාර්යය ඉටු කරන බව නියැදියේ බහුතර ප්‍රතිචාරීන්ගේ මතයයි.

නගරය තුළ අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා පොදු කසල බඳුන් ප්‍රාදේශීය සභාව විසින් සපයා නොමැති බව ද සමස්ත නියැදියේම ප්‍රතිචාරය විය. ප්‍රතිචාරීන් පෙන්වා දුන් අන්දමට කලකට ඉහත ප්‍රාදේශීය සභාව විසින් එවැනි කසල බඳුන් නගරයේ තැනින් තැන තබා තිබුනත් පසු කාලීනව ප්‍රාදේශීය සභාව විසින් ඒවා ඉවත් කර ඇත. නගරයට පිටතින් වාසය කරන, අපද්‍රව්‍ය බැහැර කිරීමේ හැකියාව පවතින ජනතාව පවා සත්ත්ව මළකුණු වැනි කම්කරුවන්ට භාජනයට අතදමා ගැනීමට අපහසු ද්‍රව්‍ය වෙන් කිරීමකින් තොරව මෙම භාජනවලට දැමීම නිසා නගර අලංකරණය උදෙසා තබා තිබූ එම බඳුන් ඉවත් කිරීමට සිදු වූ බව ප්‍රාදේශීය සභාවේ කසල කළමනාකරණයට සම්බන්ධ කම්කරුවන් සහ නිලධාරීන් විසින් අනාවරණය කරන ලදී. මේ තුළින් පැහැදිලි කරනුයේ පොදු සුභ සිද්ධිය සඳහා පවතින සම්පත් අනිසි පරිහරණයට ලක් කිරීම හේතුවෙන් එම සම්පත් සහ ඒවා භාවිතයට පවතින හැකියාව අහිමි වන බවයි. ජනතාව තුළ පවතින අනවබෝධය, පොදු සම්පත් පරිහරණය පිළිබඳව පවතින ආකල්පමය දුර්වලතා මෙන් ම නොසැලකිල්ල මෙවැනි තත්ත්වයන් සඳහා පාදක වී ඇත.

මෙයට අමතරව නගරය ආශ්‍රිතව සිදුකළ නිරීක්ෂණවලදී පැහැදිලි වූ එක් කරුණක් වූයේ ජාතියේ අනාගතය භාර ගැනීමට සිටින තරුණ සහ ළමා පරපුර ද දැනටමත් සමාජ ව්‍යසනයක් බවට පත්ව ඇති කැලි කසල ප්‍රශ්නය සම්බන්ධයෙන් හෝ තම පරිසරය සෞඛ්‍යාරක්ෂිතව පිරිසිදුව තබා ගැනීම සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමු නොකරන බවයි. පෞද්ගලික උපකාරක පන්ති අවසානයේ හෝ වෙනත් කටයුතු සඳහා නගරයට පැමිණ බස් නැවතුම්පොල හෝ වෙනත් ප්‍රසිද්ධ ස්ථානවල රැඳෙන යෞවන යෞවනියන් තමන් පරිහරණය කරන කඩදාසි, ආහාර ඇසුරුම් ආදිය කිසිදු වග විභාගයකින් තොරව පරිසරයට මුදාහරිනු දැකිය හැක. මේ තුළින් පැහැදිලි කෙරෙනුයේ කුඩා කාලයේ සිටම පරිසර සුරක්ෂිතතාව සහ කසල කළමනාකරණය සම්බන්ධයෙන් දරුවන් දැනුවත් කිරීමත්, ඒ හා සම්බන්ධ ආකල්ප ගොඩ නැගීමට කටයුතු කිරීමත් සිදු කළ යුතු බවයි.

4.0 සාරාංශ, නිගමන සහ යෝජනා

සමස්තයක් ලෙස සලකා බැලීමේදී දෛනිකව ජනනය වන අපද්‍රව්‍ය තුළින් සුලු ප්‍රතිශතයක් පමණක් අදාළ පළාත් පාලන ආයතන විසින් කළමනාකරණය කරනු ලබයි. අනෙක් අතට ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ජාතික මට්ටමේ සිට පහළට බොහෝ නීති රෙගුලාසි පනවා ඇති අතර ඒවා සම්බන්ධයෙන් ජනතාව යම් ප්‍රමාණයකට දැනුවත් කිරීම ද සිදුව ඇත. බොහෝ විට මෙසේ කළමනාකරණය කිරීම සිදු වන්නේ නාගරික ප්‍රදේශ ආශ්‍රිත ජනනය වන ඝන අපද්‍රව්‍ය වේ. මෙම කාර්යය සඳහා පළාත් පාලන ආයතන ප්‍රමුඛතාව ලබා දී කටයුතු කරන අතර සැලකිය යුතු මට්ටමක මානව, මූල්‍ය සහ භෞතික සම්පත් ප්‍රමාණයක් වැය කිරීම ද සිදු කරනු ලබයි. ක්ෂේත්‍ර අධ්‍යයනය සිදුකළ දොම්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් බහුතරයක් තෘප්තිමත් බව අනාවරණය කරන නමුත් අධ්‍යයනයට භාජනය කළ නියැදිය තුළ ද සැලකිය යුතු ප්‍රතිශතයක් එම සේවාව සම්බන්ධයෙන් අතෘප්තිමත් මට්ටමේ පසුවේ. එයට බලපා ඇති ප්‍රධානතම හේතු සාධක වන්නේ නිශ්චිත කාල සටහනකට අනුව කැලි කසල රැගෙන නොයාම, කාණු පද්ධතිය අවහිරවීම පිළිබඳ නිසි සැලකිල්ලක් නොදැක්වීම, නගරයට පිටතින් වාසනය කරන පුද්ගලයින් විසින් නගරාශ්‍රිත ප්‍රදේශවලට අනවසරයෙන් කැලි කසල බැහැර කිරීම නතර කිරීම සඳහා පියවර නොගැනීම ආදියයි.

අනෙක් අතට කැලි කසල සමාජ ප්‍රශ්නයක් දක්වා පරිවර්තනය වීමට දායකත්වය දැක්වූ සහ දක්වන ජනතාව තුළම එම ගැටලුව සහ ඒ තුළින් මතුකරන ප්‍රතිවිපාක සම්බන්ධයෙන් පවතින නොදැනුවත්කම, නොසැලකිල්ල, එය තමන්ට බාහිරින් පවතින ආයතනයක කාර්යයක්ය යන ආකල්පය, තම අයිතිවාසිකම් සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරනවා සේම තම යුතුකම පිළිබඳව ද අවධානයක් ලබාදී කටයුතු නොකිරීම, පොදු දේපළ සහ පොදු සම්පත් සම්බන්ධයෙන් පවතින ආකල්පමය දුර්වලතා ද මේ සඳහා දායක වී ඇත.

රාජ්‍ය ප්‍රතිපත්තියක් සකස් කිරීමේ සිට ක්‍රියාත්මක කිරීම දක්වා පාර්ශව ගණනාවක් දායක වන අතර ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් ද රජය, පළාත් සභාව, පළාත් පාලන ආයතන, නොදිරන කසල එක්රැස් කරන බලයලත් ආයතන සහ පුද්ගලයින් මෙන්ම ජනතාව ද පාර්ශවකරුවන් වේ. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් වන රාජ්‍ය ප්‍රතිපත්ති දෙස බැලීමේදී ලේඛනගතව

4.0 සාරාංශ, නිගමන සහ යෝජනා

සමස්තයක් ලෙස සලකා බැලීමේදී දෛනිකව ජනනය වන අපද්‍රව්‍ය තුළින් සුලු ප්‍රතිශතයක් පමණක් අදාළ පළාත් පාලන ආයතන විසින් කළමනාකරණය කරනු ලබයි. අනෙක් අතට ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ජාතික මට්ටමේ සිට පහළට බොහෝ නීති රෙගුලාසි පනවා ඇති අතර ඒවා සම්බන්ධයෙන් ජනතාව යම් ප්‍රමාණයකට දැනුවත් කිරීම ද සිදුව ඇත. බොහෝ විට මෙසේ කළමනාකරණය කිරීම සිදු වන්නේ නාගරික ප්‍රදේශ ආශ්‍රිත ජනනය වන ඝන අපද්‍රව්‍ය වේ. මෙම කාර්යය සඳහා පළාත් පාලන ආයතන ප්‍රමුඛතාව ලබා දී කටයුතු කරන අතර සැලකිය යුතු මට්ටමක මානව, මූල්‍ය සහ භෞතික සම්පත් ප්‍රමාණයක් වැය කිරීම ද සිදු කරනු ලබයි. ක්ෂේත්‍ර අධ්‍යයනය සිදුකළ දොම්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් බහුතරයක් තෘප්තිමත් බව අනාවරණය කරන නමුත් අධ්‍යයනයට භාජනය කළ නියැදිය තුළ ද සැලකිය යුතු ප්‍රතිශතයක් එම සේවාව සම්බන්ධයෙන් අතෘප්තිමත් මට්ටමේ පසුවේ. එයට බලපා ඇති ප්‍රධානතම හේතු සාධක වන්නේ නිශ්චිත කාල සටහනකට අනුව කැලි කසල රැගෙන නොයෑම, කාණු පද්ධතිය අවහිරවීම පිළිබඳ නිසි සැලකිල්ලක් නොදැක්වීම, නගරයට පිටතින් වාසනය කරන පුද්ගලයින් විසින් නගරාශ්‍රිත ප්‍රදේශවලට අනවසරයෙන් කැලි කසල බැහැර කිරීම නතර කිරීම සඳහා පියවර නොගැනීම ආදියයි.

අනෙක් අතට කැලි කසල සමාජ ප්‍රශ්නයක් දක්වා පරිවර්තනය වීමට දායකත්වය දැක්වූ සහ දක්වන ජනතාව තුළම එම ගැටලුව සහ ඒ තුළින් මතුකරන ප්‍රතිවිපාක සම්බන්ධයෙන් පවතින නොදැනුවත්කම, නොසැලකිල්ල, එය තමන්ට බාහිරින් පවතින ආයතනයක කාර්යයක්ය යන ආකල්පය, තම අයිතිවාසිකම් සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරනවා සේම තම යුතුකම පිළිබඳව ද අවධානයක් ලබාදී කටයුතු නොකිරීම, පොදු දේපළ සහ පොදු සම්පත් සම්බන්ධයෙන් පවතින ආකල්පමය දුර්වලතා ද මේ සඳහා දායක වී ඇත.

රාජ්‍ය ප්‍රතිපත්තියක් සකස් කිරීමේ සිට ක්‍රියාත්මක කිරීම දක්වා පාර්ශව ගණනාවක් දායක වන අතර ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් ද රජය, පළාත් සභාව, පළාත් පාලන ආයතන, නොදිරන කසල එක්රැස් කරන බලයලත් ආයතන සහ පුද්ගලයින් මෙන්ම ජනතාව ද පාර්ශවකරුවන් වේ. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් වන රාජ්‍ය ප්‍රතිපත්ති දෙස බැලීමේදී ලේඛනගතව

ප්‍රමාණවත් සහ ප්‍රශස්ථ මට්ටමේ ප්‍රතිපත්ති රාශියක් එකිනෙක ආයතන විසින් සකසා ඇති බව ද සත්‍යයකි. කෙසේ වුවත්, ප්‍රායෝගික මට්ටමේ පවතින යම් යම් ගැටලු සහ දුෂ්කරතා පිළිබඳ නිසි අවධානයක් සහ අධ්‍යයනයකින් තොරව සකස් කරන ප්‍රතිපත්ති අවසානයේ බිම් මට්ටමේ ක්‍රියාත්මක කිරීමේදී අපේක්ෂිත ඉලක්ක කරා ගමන් කිරීමට බාධා පමුණුවන බවයි.

මෙම අධ්‍යයනය තුළින් තහවුරු කරනු ලබන තවත් විශේෂිත කරුණක් වන්නේ මාර්තා ඩර්තික් පෙන්වා දෙන අන්දමටම ඕනෑම රාජ්‍ය ප්‍රතිපත්තියක් සාර්ථකව ක්‍රියාවට නැංවීම සඳහා එහි පාර්ශවකරුවන් අතර මනා සහ අඛණ්ඩ සන්නිවේදනයක් පැවතීම අත්‍යවශ්‍ය බවයි. මෙම අධ්‍යයනයෙන් හෙළිකරන අන්දමට පළාත් පාලන ආයතන විසින් ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙල සම්බන්ධයෙන් ජනතාවගෙන් සැලකිය යුතු කොටසකට අවබෝධයක් නොමැති අතර ඇතැම් කරුණු සම්බන්ධයෙන් වැරදි වැටහීම් ජනතාව තුළ පවතින බව ද තහවුරු වේ.

රාජ්‍ය ප්‍රතිපත්ති සම්බන්ධයෙන් සිදුකර ඇති බොහෝ අධ්‍යයනවලින් තහවුරු කර ඇති අන්දමටම තුමන හෝ සාධකයක් හේතුවෙන් ජනතා සහාය ලබා ගැනීමට අපහසු රාජ්‍ය ප්‍රතිපත්ති ඒවායේ අපේක්ෂිත ප්‍රතිඵල කරා ළඟා වන්නේ අවම වශයෙනි. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් දැනට පවතින ප්‍රතිපත්ති පවා අපේක්ෂිත ඉලක්ක කරා ගමන් නොකිරීමට සහ අනවශ්‍ය ගැටලු මතු කිරීමට ප්‍රධාන හේතුවක් වශයෙන් ජනතා සහාය නිසි පරිදි නොලැබීම පෙන්වා දිය හැක. ජාතික ව්‍යවසනයක් බවට පත්ව ඇති මෙම ගැටලුවට පිළියම් සෙවීම සඳහා සන්තෘප්ත කළ යුතු මූලික කාරණයක් ලෙස ජනතා සහභාගීත්වය නිසි පරිදි ලබා ගැනීමට හැකිවන ආකාරයෙන් කසල ජනනය වන ස්ථානයේදීම ඒවා නිසි පරිදි වර්ගීකරණයකට ලක් කිරීමට ජනතාවට අවශ්‍ය මාර්ගෝපදේශ ලබාදීම, කසළ නිසි පරිදි බැහැර කිරීමේ වගකීම සහ එම වගකීම නොසලකා හැරීමෙන් උද්ගත වන තත්ත්ව පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සඳහා කිසියම් අඛණ්ඩ වැඩසටහනක් සැලකිය යුතු කාලයක් දක්වා හෝ ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතුය.

පරිශීලන ග්‍රන්ථ

දොම්පේ ප්‍රාදේශීය සභාව, 2016. *දොම්පේ ප්‍රාදේශීය සභා වාර්ෂික වාර්තාව-2016.* දොම්පේ: දොම්පේ ප්‍රාදේශීය සභාව

පරිසර අමාත්‍යාංශය, 2011. පිවිතුරු රටක් කරා, බත්තරමුල්ලෙ: පරිසර අමාත්‍යාංශය.

බස්නාහිර පළාත් සභාව, 2007. *2007 අංක 01 බස්නාහිර පළාත් සභා අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රඥප්තිය,* කොළඹ: බස්නාහිර පළාත් සභාව

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, 1987. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත, කොළඹ: රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, 1980. *1980 අංක 47 ජාතික පරිසර පනත,* කොළඹ: රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, 2008. *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය අංක 1560/6, 2008.07.30,* කොළඹ: ශ්‍රී ලංකා රාජ්‍ය මුද්‍රණ සංස්ථාව.

Cairney, P., 2012. *Understanding Public Policy: Theories and Issues*, New York: Palgrave Macmillan.

Cochran, G.E., Meyer, L.C., Cara, T.R. & Cayer, N.J., 2009. *American Public Policy: An Introduction,* Boston: Cengage Learning.Inc.

Derthick, M., 1972. *New Towns in Towns*, Washington: Urban Institute.

Dye, T.R., 1975. *Understanding Public Policy*, Englewood Chiffs: N.J. Prentice Hall.

Easton, D., 1953. *The Political System*, New York, Knoff Publishers.

Edwards III, G.C. & Sharkansky, I., 1978. *The Policy Predicament*, San Francisco: W.H. Freeman.

Edwards III, G.C., 1980. *Implementing Public Policy*, Washington, Congressional Qualtely Press.

Lasswell, H. D. & Kaplan, A., 1970. *Power and Society*, New Haven: Yale University Press.

Makinde, T., 2005. *Problems of Policy Implementation in Developing Nations: The Nigerian Experience*, Journal of Social Science, 11(1): 63-69.

Reejal, P. R., 2003. *Public Policy Analysis*, Kathmandu: Pairavi Prakashan.

Rose, R., 1969. *Policy Making in Great Britain*, London: MacMillan.
www.lgpc.gov/lk
www.unescap.org, N.D., *National Solid Waste Management Program in Sri Lanka*, PPT., Colombo: Central Enviornmental Authority of Sri Lanka.

ශ්‍රී ලංකාවේ මහජන මතය නිර්මාණය කිරීමෙහිලා සමාජ මාධ්‍යයක් ලෙස ෆේස්බුක්හි /මුහුණු පොතෙහි බලපෑම: 2015 ජනාධිපතිවරණය ඇසුරින්

යු.එල්.එච්.ඩී පෙරේරා

සංක්ෂේපය

මහජන මතය ගොඩනැංවීමෙහි ලා නව සමාජ මාධ්‍යයක් ලෙස මුහුණු පොතේ කාර්යභාරය ඉතා පුළුල් ය. මෙම අධ්‍යනයේ අරමුණ නම්, ශ්‍රී ලංකාවේ මහජන මතය නිර්මාණය කිරීමෙහිලා සමාජ මාධ්‍යයක් ලෙස මුහුණු පොතෙහි බලපෑම: 2015 ජනාධිපතිවරණය ඇසුරින් පිරික්සීමයි. මෙහිදී පොත්පත්, සඟරා ඇසුරුන් ද්විතීයියක දත්ත රැස්කර ගත් අතර, ප්‍රථමික දත්ත 2015 ජනාධිපතිවරණය ඇසුරු කරගනිමින් ප්‍රධාන අපේක්ෂකයින් හා ඔවුන්ට සහයෝගය දෙමින් අවශේෂ දේශපාලන හා දේශපාලන නොවන ප්‍රභූන් මුහුණු පැතිකඩ භාවිතා කර ඇති ආකාරය නිරීක්ෂණය කිරීම තුළින් රැස්කරගන්නට විය. මෙහිදී අධ්‍යයන ක්‍රමවේදය ලෙස විශ්ලේෂණාත්මක ක්‍රමවේදය භාවිතා කරන ලදි.

මුඛ්‍ය පද: *මහජන මතය, මුහුණු පොත, ජනාධිපතිවරණය, නව සමාජ මාධ්‍ය*

1.0 හැඳින්වීම

1.1 "මහජන මතය" යන්න හඳුනා ගැනීම

රාජ්‍යයක පවතින ආණ්ඩුව විසින් ක්‍රියාවට නංවන්නාවූ රාජ්‍ය ප්‍රතිපත්ති, එහි ක්‍රියාකාරීත්වය හා දේශපාලනික වශයෙන් වැදගත් සිදුවීම් පිළිබඳව, දෙන ලද අවස්ථාවකදී ජනතාව විසින්ප්‍රකාශ කරනු ලබන අදහස්වල සාමාන්‍යකරණය වූ අදහස "මහජන මතය" ලෙස හැඳින්වේ (සොයිසා, 2009: 539). තව ද ජිනදාස, 2015දී "නිර්මාණාත්මක සන්නිවේදනය හා විචාර අධ්‍යයනය" යන කෘතිය තුළ දක්වන ආකාරයට දේශපාලන විද්‍යාවට අනුව මහජන මතය යනු, දේශපාලන කටයුතු හෝ රාජ්‍ය පිළිබඳ ජනතාව තුළ පවතින ආකල්ප සහ විශ්වාසයන්ගේ එකතුවයි. හර්බර්ට් බ්ලුමර් දක්වන ආකාරයට මහජන මතය යනු, ඕනෑම අවස්තාවකදී පොදු ප්‍රශ්නයක් පිළිබඳව සාකච්ජා කරන පුද්ගලයින්ගේ සාමුහික හැසිරීම් ආකාරයයි. යම් රාජ්‍යයක් වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී වීම සඳහා එකිනෙකා විසින් හුවමාරු කරගනු ලබන මෙන්ම ප්‍රකාශ කරගනු ලබන මතයන් විසින් වඩාත්

ශක්තිමත් සහ දැනුවත් පුරවැසියන් ගොඩනැඟීම අත්‍යවශ්‍ය බව ජේම්ස් මැඩිසන් (Jemes Madison) දක්වා තිබේ (ජිනදාස, 2015: 95). වෝල්ටර් ලිප්මාන් 1922 දී " ජනමතය" යනුවෙන් කෘතියක් රචනා කළේය. ඒ තුළ මහජන මතය පිළිබඳ විග්‍රහා කිරීමෙන් ඔබ්බට ගොස් මහජන මතය ගොඩනැංවීම සඳහා ජනමාධයේ දායකත්වය පිළිබඳව විග්‍රහා කර ඇත (කුමාරපේලි, 2009, 149). කෙසේවෙතත්, ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් තුළ මහජන මතය යන්නට සුවිශේෂී ස්ථානයක් හිමි වේ. ඒ අතර, වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන සෑම රාජ්‍යයක් තුළම මහජන මතය යන්නට ඉතා වැදගත්තැනක් හිමි වේ. එහෙත්, ඒකාධිපති පාලන තන්ත්‍ර ක්‍රියාත්මක වනරටවල්වල මහජන මතයට වැඩි වැදගත්කමක් නොලැබේ. නිදසුන් ලෙස ඉතාලියේ මුසෝලිනි යටතේ ක්‍රියාත්මක වූ පාලන ක්‍රමය තුළ හා ජර්මනියේ හිට්ලර් යටතේ ක්‍රියාත්මක වූ පාලන ක්‍රමය තුළ මේ තත්ත්වය හඳුනා ගත හැකිය.

කෙසේ වෙතත් ඇමරිකානු ජනාධිපතිවරයෙකුව සිටි "ජේම්ස් මැඩිසන්" වරෙක ප්‍රකාශ කරන ලද්දේ, "යම් රාජ්‍යයක් වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී වීම සඳහා එකිනෙකා විසින් හුවමාරු කරගනු ලබන මෙන්ම, ප්‍රකාශ කරගනු ලබන මතයන් විසින් ශක්තිමත් සහ දැනුවත් පුරවැසියන් ගොඩනැඟීම අත්‍යවශ්‍ය බවයි (ජිනදාස, 2015: 95). ජෙරමි බෙන්තම් විසින් ව්‍යාවස්ථාපිත පාලනය හැඩගැසිවීමෙහි ලා ජනමතයෙහි වැදගත්කම දක්වා ඇත. ඔහු දක්වන ආකාරයට, රාජ්‍යයේ සියලුම අණපනත් හා තීන්දු තීරණ ජනමතයේ සුපරීක්ෂාවට ලක්විය හැකි බවයි. එමෙන්ම, රජයේ අනර්ථකාරී ක්‍රියාකාරකම් වළක්වා ගත හැකි එකම සුපරීක්ෂාකාරී මෙවලම මහජන මතය බව ඔහු පෙන්වා දෙයි. මහජන මතය යන්න තුළ කැපී පෙනෙන සුවිශේෂී ලක්ෂණ කිහිපයක් හඳුනා ගත හැකිය. එයට අනුව, මහජන මතය යන්නතනියෙන් හඳුනාගතනොහැක. එය හඳුනා ගත හැක්කේ යම්කිසි සිදුවීමක් සමඟය. උදාහරණ ලෙස ගත්කළ"ජාතික ආණ්ඩුව" පිළිබඳ මහජන මතය ගොඩනැඟෙන්නේ ජාතික ආණ්ඩුවක් ලෙස පාර්ලිමේන්තුව ගොඩනැඟීමට උත්සාහ දරන විටදී ය.

එසේම "මහජන මතය" යන්න නිරන්තරයෙන් ගොඩනැඟෙන්නේ වර්තමානය පදනම් කරගෙනය. අතීතයේවත්, අනාගතයේවත් සිදුවන දෙයක් පිළිබඳව මහජන මතයක් ගොඩනොනැඟේ. යම්කිසි සිදුවීමක් සම්බන්ධයෙන් දේශපාලන ආයතනයක්, දේශපාලනික වශයෙන් ක්‍රියාකාරී පුද්ගලයන් මතු කරන අදහස් තුළින් මහජන මතය ගොඩනැඟේ. පසුව පහළ මට්ටමේ සිටින අය විවිධ

අයුරින් එය අර්ථ දැක්වීමෙන් එය ව්‍යාප්ත වේ. මෙයට ඉතා හොඳ මෑතකාලීන උදාහරණයක් නම් මෛත්‍රීපාල සිරිසේන මහතා අතින් කියැවුණු "යහපාලනය" පිළිබඳ සංකල්පය පසුව බොහෝදෙනාගේ අවධානයට ලක්විය. එනම් මෙම අදහස පසුකාලීනව ගුවන් විදුලිය, රූපවාහිනිය, පෝස්ටර් හා පුවත්පත් වැනි සන්නිවේදන උපක්‍රම හරහා බිම් මට්ටමේ අය වෙත ව්‍යාප්ත විය. පසුව බිම් මට්ටමේ පිරිස් එය පදනම්කරගෙන යම් යම් අදහස්වලට පැමිණීම, නිගමනවලට පැමිණීම හා එම නිගමන ප්‍රකාශ කිරීම සිදුකරනු ලැබේ. අවසානයේදී දේශපාලන තීන්දු තීරණ ගැනීමේදී හා දේශපාලනයේ හැසිරීමේදී ඒ මඟින් විශාල බලපෑමක් ඇති කෙරේ.

එසේම මහජන මතයේ ඇති සුවිශේෂීත්වය නම්, කිසියම් මහජන මතයක් පැනනැඟුණු සිදුවීම සමඵයකට පත් වූ පසු එම මහජන මතය දේශපාලන කරළියෙන් ඉවත් වීමයි."මහජන මතය" යන්න පිළිබඳව අවධානය යොමු කිරීමේදී දැකගත හැකි ප්‍රධාන කරුණක් නම්, සමාජයේ සියලුදෙනාම දේශපාලන සංසිද්ධියක් පිළිබඳව එක හා සමානව අදහස් නොදක්වන බවයි. එයට හේතූන් නම්, නොදැනුවත්කම,කාලය සීමිත වීම, කිසියම් දේශපාලන හෝ සමාජීයීය සංසිද්ධියක් සම්බන්ධයෙන් සැබෑ ස්වාභාවය ප්‍රකාශ කිරීමට ඇති අකමැත්තයනාදියයි. සැබවින්ම ගතහොත් උක්ත හේතු පදනම් කරගනිමින් සමාජයේ සැළකිය හැකි බහුතරයක් මහජන මතයක් ගොඩනැඟීමට දායක වන්නේ නැත. එබැවින් මහජන මතය යන්න දේශපාලන ක්‍රමයේ ජීවත්වන පුරවැසි බහුතරයේ අදහස ලෙස අර්ථ දැක්විය නොහැක. එබැවින් මෙහිදී සිදු වන්නේ, බල පිරමීඩයේ ඉහළින් සිටින අය ප්‍රකාශ කරන අදහස් එයට සමීපව සිටින අය වෙතටත්, ඔවුන් හරහා සමාන්‍ය ජනතාව වෙතටත් තේරුම් ගත හැකි ආකාරයෙන් පහළට බැසගොස් සමාන්‍ය ජනතාව සමඟ මුසුවීමයි. එබැවින් මහජන මතය ගොඩනැඟීමේදී හා හැඩගැසීමේ දී දේශපාලන ක්‍රියාකාරීන් ඉහළ මට්ටමේ සිටින පිරිස් ලෙස වැදගත් දායකත්වයක් ඉටු කරනු ලබන අතර, ඔවුන්ගේ මතයන් බල පිරමීඩයේ පහළම මට්ටම වන ජනතාව වෙත ගෙන යාම සම්බන්ධයෙන් සරසවි ආචාර්යවරු, ආගමික නායකයින්, සිවිල් සමාජ ක්‍රියාකාරීන්, රාජ්‍ය සේවාව තුළ බලපෑම්සහගත නිලතලතාන්ත්‍රිකයින් හා ජනමාධ්‍යයන අය රංගදක්වන භූමිකාව ඉතා ඉහළය. උදාහරණයක් නම් 2014 දකුණු පළාත් සභා මැතිවරණයේදී නිළියන් නාමයෝජනා බාරදීමේදි ප්‍රධාන වශයෙන්ම විරුද්ධ වුයේ ජනමාධ්‍ය විසිනි. එමඟින් නිළියන් දේශපාලනයට නොපැමිණිය යුතු බවට මතයක් ගොඩනඟන ලදි.

මහජන මතය හැඩගැස්වීම සඳහා බලපාන සාධක ගණනාවකි. ඒ අතර පුද්ගලයෙකු සතු පුර්ව දැනුම, ආකල්ප හා අගය කිරීම් යනාදිය වැදගත්ය. එසේම ලබා ඇති අධ්‍යාපනයේ ප්‍රමාණය හා එහි ස්වභාවය පිළිබඳව ඇති බලපෑම ද, ඒ හා සමානව වැදගත්ය. එනම් එම අධ්‍යාපනය විධිමත් අධ්‍යාපනයක් ද, අවිධිමත් අධ්‍යාපනයක් ද යනාදිය සේම එම අධ්‍යාපනය අපරදිග නැඹුරු අධ්‍යාපනයක් ද, පෙරදිග නැඹුරු අධ්‍යාපනයක් ද යනාදිය ද, වැදගත්ය. විශේෂයෙන් ගත් කළ ජනතා විමුක්ති පෙරමුණ ආදි දේශපාලන පක්ෂයන්හි පාක්ෂිකයින් හා සාමාජිකයින් හට ලබාදෙන අවිධිමත් අධ්‍යාපනය සෘජුවම ඔවුන්ගේ දේශපාලන සහභාගීත්වය කෙරෙහි බලපා ඇත. එසේම, දේශපාලන, ආර්ථික, සංස්කෘතික හා සමාජීයීය පරිසරයේ ස්වභාවය බලපෑම් කරයි. එනම්, ඇමරිකාව, බ්‍රිතාන්‍ය, ඔස්ට්‍රාලියාව මෙන් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන පසුබිමක් පවතිනම් එවැන්නක් තුළ මහජන මතය ගොඩනැඟීමට අවස්තාව පවතී. එසේ නොවන විට මහජන මතය මර්දනය වීමක් දැක ගත හැකිය. එසේම, විධිමත් ලෙස අදහස් සංසරණය වීමට ඇති අයිතිය. එනම් මාධ්‍ය නිදහස යන්න ද, මහජන මතය ගොඩනැඟීමට බලපායි.ශ්‍රී ලංකාවේ මෑතකාලීනව ජනමාධ්‍යවේදීන් සම්බන්ධයෙන් අසන්නට ලැබුණු සිදුවීම්තුළින් ශ්‍රී ලංකාවේ අදහස් සංසරණය වීමතුළින් මහජන මතය ගොඩනැංවීමේ ලාගැටලු පවතින බවපැහැදිළි වේ.

මේ අතර වයස් මට්ටම ද මහජන මතය ගොඩනැංවීමට බලපායි (සොයිසා, 2009: 539).කෙසේවෙතත්, වත්මන වන විට මහජන මතය ගොඩනැංවීම සම්බන්ධයෙන් ජනමාධ්‍ය ප්‍රධාන වන අතර විද්‍යා හා තාක්ෂණයේ දියුණුව සමඟ නව මාධ්‍ය උපක්‍රමයන් තුළින් උපත ලැබූ සමාජ මාධ්‍යයන්/ සමාජජාලා වෙබ් අඩවි එහි මුලිකත්වයගෙන කටයුතු කෙරේ.

1.2 නව මාධ්‍ය, සමාජ මාධ්‍ය, සමාජ මාධ්‍යයක් ලෙස මුහුණුපොත හඳුනා ගැනීම

1.2.1 ජන මාධ්‍ය හා නව මාධ්‍ය යන්න හඳුනා ගැනීම

ඕනෑම පුරවැසියකුගේ එදිනෙදා දෛනික ජීවිතය පවත්වාගෙන යාම සඳහාත්, සන්නිවේදනය සඳහාත් තීරණාත්මක කාර්යයභාරයන් ජන මාධ්‍ය මඟින් ඉටු කරන බව පෙන්වා දිය හැකිය. ලෝකයේ ජන මාධ්‍ය ප්‍රධාන කොටස් 03 කට බෙදා වෙන් කල හැකිය.

1. මුද්‍රිත මාධ්‍ය
2. විද්‍යුත් මාධ්‍ය
3. නූතන මාධ්‍ය

මෙහිදී මුද්‍රිත මාධ්‍යයන් ලෙස පුවත්පත්, සඟරා, පත්‍රිකා පොත් යනාදිය හඳුන්වා දිය හැකිය. එමෙන්ම ගුවන් විදුලිය හා රූපවාහිණිය විද්‍යුත් මාධ්‍ය ලෙස සැලකේ. නූතන මාධ්‍ය ලෙස හඳුන්වන්නේ පරිගණකය ආශ්‍රිත කර ගනිමින් තොරතුරු සන්නිවේදන තාක්ෂණය සම්බන්ධව වර්ධනය වී ඇති මාධ්‍යයන්ය. ඒවා නම්, අන්තර්ජාලය, ජංගම දුරකථනයආදියයි. මෙම මාධ්‍ය හරහා එකිනෙකා අතර අදහස් හුවමාරුවක් මෙන්ම පුද්ගලයාගෙන් පුද්ගලයාට තොරතුරු අදහස් ආකල්ප ගෙන යාමක් සිදු කරනු ලබයි. එඩ්වඩ් සැපීර් පැවසූ ලෙස "ශරීරයේ රුධිරය ගමන් කරන්නේ යම් සේද සමාජය තුළ සන්නිවේදනයත් එසේ ක්‍රියාත්මක වනු ලබයි". සැබවින්ම මෙම සන්නිවේදන මාධ්‍ය ඒ සඳහා මනා පිටුවහලක් සපයනු ලබයි. මෙම මාධ්‍ය තෙවර්ගය අතුරින් වැඩි අවධාණයක් යොමු කරනු ලබන්නේ නව මාධ්‍ය කෙරෙහිය. 1980 දශකය වන තෙක් සන්නිවේදන තාක්ෂණයේ ප්‍රමුඛයා බවට පත් වූයේ, මුද්‍රිත මාධ්‍ය හා විද්‍යුත් මාධ්‍යයයි. කෙසේවෙතත්, 1945න් පසුව ලොව දෙකඩවීම ආරම්භ කළ සීතල යුද්ධය ජයග්‍රහණය කිරීමට නව සන්නිවේදන තාක්ෂණය යොදාගන්නා ලදි. ඒ ඔස්සේ ලොව ඉලෙක්ට්‍රොනික තාක්ෂණික මාධ්‍යයන් මඟින් සන්නිවේදනය කිරීම වේගවත් විය (ගමගේ, 2015: 73).මේ අනුව ක්‍රමානුකූලව නව මාධ්‍ය යන්න කරළියට පැමිණෙන්නට විය. ඇන්ඩෘ එල්. සැපයිරෝ දක්වන ආකාරයට නව ඩිජිටල් තාක්ෂණයේ ආගමනය හේතුවෙන් තොරතුරු පාලනයක් සිදුවන්නේ ද, අත්දැකීම් හා සම්පත් මොනවා ද, යන්න පිළිබඳව විශාල පරිවර්තනයක් සිදු වී ඇත (ජිනදාස, 2014:170). එසේම, කැලුම් රිමර් (2009), ලිස්ටර් (2003) සහ ෆ්‍රීඩ්මන් (2005) යනාදීන් දක්වන ආකාරයට නව මාධ්‍ය සම්බන්ධයෙන් එනම් එය ක්‍රියාවට නැංවීම, එයට අවැසි ප්‍රාග්ධනය සම්පාදනය සම්බන්ධයෙන් ගැටලු පවතී (ජිනදාස, 2014: 171). නව මාධ්‍ය සඳහා උදාහරණ ලෙස අන්තර්ජාලය, වෙබ් අඩවි, බහුමාධ්‍ය තාක්ෂණය ආදිය මෙන්ම, ෆේස්බුක්(Face Book), ට්විටර්(Twitter), ගූගල්ප්ලස් (Google Plus), මයි ස්පේස්(My Space), ලින්ක්ඩ් ඉන්(Linkd In), යූ ටියූබ් (You Tube) වැනි සමාජ මාධ්‍යයන් ප්‍රමුඛ වේ.

1.2.2 නව සමාජ මාධ්‍යයක් ලෙස මුහුණුපොත හඳුනා ගැනීම

නව මාධ්‍ය පිළිබඳව කතා කිරීමේදී වත්මන විට අවධානයට යොමුවන උක්ත දක්වා ඇති සමාජ මාධ්‍ය පිළිබඳව අමතක කළ නොහැකිය. කෙසේවෙතත්, සමාජ මාධ්‍ය යනු බහුවිධ හා සංකීර්ණ සංසිද්ධියක්. එය හරි කලබලකාරී වේදිකාවක් නැතහොත් විවෘත පොළක් වගෙයි. ඒ තුළ අලෙවි කිරීමක් නැති වුවත් සෝෂාකාරී හා කලබලකාරී පොලක ඇති ගතිසොබාවලට සමාන්තර බවක් සමාජ මාධ්‍ය තුළ හමු වේ. එසේම සමාජ මාධ්‍ය අන්තර්ගතයත් අතිශයින් විවිධාකාරයි. එහි සංසරණය වන හා බෙදා ගන්නා සියල්ල ග්‍රහණය කරන්නට කිසිවකුටත් නොහැකියි. කෙසේවෙතත්, සමස්ත ලෝකයටම මෙම සමාජ මාධ්‍යයන් ඔස්සේ එකිනෙකාට එකිනෙකා සම්බන්ධ වී ඇති අතර, රටක සමාජ, ආර්ථික හා දේශපාලන ක්‍රියාවලිය සම්බන්ධයෙන් ද, මෙම සමාජ මාධ්‍ය ඔස්සේ සිදු කරන බලපෑම ඉතා ප්‍රභලය.වත්මන තුළසමාජ මාධ්‍ය පොදු උන්නතියට උපක්‍රමශීලිව යොදා ගැනීමේ පුරෝගාමීන් හැටියට දකුණු කොරියාව, මැලේසියාව, ඉන්දුනිසියාව හා තායිලන්තය දැක්විය හැකියි. ලිංගික ප්‍රචණ්ඩත්වය, කම්කරු අයිතිවාසිකම්, පාරිසරික ප්‍රශ්න, පාරිභෝගික උද්ඝෝෂණ ආදී බොහෝ කරුණු සම්බන්ධයෙන් ඒ රටවල සමාජ ක්‍රියාකාරිකයන් සමාජ මාධ්‍ය දක්ෂ ලෙස යොදා ගන්නවා. මධ්‍යයම ප්‍රාන්තිකයන් මිලියන 300කට වඩා වෙසෙන ඉන්දියාවේද, සමාජ මාධ්‍ය හා ඉන්ටර්නෙට් භාවිතය ජන සමාජයට පුළුල් වශයෙන්බලපෑම් කරනු ලැබේ. විශේෂයෙන් අල්ලස හා දූෂණයට එරෙහිවත් කාන්තාවන්ට නිසි රැකවරණය සඳහාත් මෑත කාලයේ ඉන්දියාව හරහා පැතිර ගිය මහා පරිමාණයේ ජනතා උද්ඝෝෂණ තීව්‍ර කළේ, සමාජ මාධ්‍ය භාවිතයයි. අද වන විට ට්විටර්, ෆේස්බුක් වැනි සමාජ මාධ්‍යයන් ඉතා ප්‍රබල මට්ටමින් ශ්‍රී ලංකාව තුළ ද, භාවිතා වේ. ඒ අතුරුනුත් "ෆේස්බුක" ප්‍රබලතම නව සමාජ මාධ්‍යයක් ලෙස සැළකිය හැකිය. වර්ෂ 2004 පෙබරවාරි 04වන දින හාවර්ඩ් විශ්ව විද්‍යාලයේ ඉගෙනුම ලබමින් සිටි Mark Zuckerbeg ගේ මුලිකත්වයෙන් යුතුව Edurdo Saverin, Dustin Moskovitz සහ Chris hughe යන මිතුරන්ගේ එකතුවෙන් ආරම්භයෙදී "ෆේස්බුක් සමාජ ජාලය" නිර්මාණය විය. ඔවුන් මෙය සකස් කළේ ඔවුනොවුන් සමඟ පුද්ගලික සබඳතා පවත්වාගෙන යාමේ මෙවලමක් වශයෙනි. පසුව ක්‍රමානුකූලව මෙය ලෝකය පුරා ව්‍යාප්ත විය. 2013 සැප්තැම්බර් මාසයේ ප්‍රසිද්ධ කළ සංඛ්‍යා ලේඛනවලට අනුව ෆේස්බුක්හි සමාජිකයින් සංඛ්‍යාව බිලියන 1.19ක් හෙවත් කෝටි 119 කි. මේ සංඛ්‍යාව නිතිපතා වැඩිවෙයි. ඒ සෑම මසකදීම 1.67ක වේගයකිනි.

එනම් මාසයකට කෝටි දෙකක සංඛ්‍යාවක් අලූතින් ෆෙස්බුක් වෙත එයි (ජයසුන්දර, 2014: 05). කෙසේවෙතත්, 2012 අග වන විට ශ්‍රී ලංකාවේ ෆේස්බුක් ගිණුම් සංඛ්‍යාව 1,515,720ක් වී යයි ජාත්‍යන්තර වෙබ් දත්ත හරහා සොයාගෙන ඇත (nalakagunawardene.com, 2014).

2.0 මහජන මතය නිර්මාණය කිරීම සඳහා නව සමාජ මාධ්‍යයක් ලෙස මුහුණු පොතේ බලපෑම

ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ජන ජීවිතයේ පැවැත්ම ඇතිවන්නේ මහජන මතය පදනම් කරගෙන බව අපට සිතිය හැකිය. දේශපාලන විද්‍යාවට අනුව මහජන මතය යනු, දේශපාලන කටයුතු හෝ රාජ්‍යය පිළිබඳ ජනතාව තුළ පවතින ආකල්ප සහ විශ්වාසයන්හි එකතුවකි. (ජිනදාස, 2015: 95). යම්කිසි දේශපාලනමය වශයෙන් වැදගත් පුද්ගලයෙක්, සිදුවීමක්, ආයතනයක්, ප්‍රතිපත්තියක්, වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් එම දේශපාලන ක්‍රමය තුළ ජීවත්වන මිනිසුන් දරණ ආකල්පවල සාමාන්‍යකරණය මහජන මතය ලෙස හැඳින්විය හැකිය. කෙසේවෙතත් අද වන විට රාජ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමේදී ජනමාධ්‍යයේ බලපෑම සුළුපටු එකක් නොවන තත්ත්වයට පත්ව ඇත. ඒ අතිනුත් නව සමාජ මාධ්‍යයක් ලෙස මුහුණු පොතේ බලපෑම තීව්‍ර යැයි කිව හැකිය. එහි බලපෑම දේශීය වශයෙන්ම මෙන්ම, විදේශීය වශයෙන් ද, ඉතා පැහැදිළිව දැකගත හැකිය. නව සමාජ මාධ්‍යය යනුවෙන් හැඳින්වෙන මාධ්‍යය භාවිතයේදී ග්‍රාහකයාගේ ප්‍රතිපෝෂණ සහ අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වය මත වැඩි වැඩියෙන් රඳාපැවතීම දැකිය හැකි විශේෂ ලක්ෂණයයි. ඒ අනුව එය විශ්වීය සන්නිවේදන ක්‍රියාවලියේ ලක්ෂණයකි. මෙම පරිච්ඡේදයේ දී ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන්නේ දේශපාලන ප්‍රංපචයන් කෙරෙහි මහජන මතය නිර්මාණය කිරීමෙහි ලා දේශීය වශයෙන් මෙන්ම විදේශීය වශයෙන් නව මාධ්‍යයක් ලෙස මුහුණු පොතේ බලපෑම පිළිබඳවයි.

2.1 මහජන මතය නිර්මාණය කිරීම සඳහා ෆේස්බුක්හි බලපෑම පිළිබඳ ජාත්‍යන්තර අත්දැකීම්

අද වන විට "ෆේස්බුක්" නම් සමාජ මාධ්‍යයට දේශ සීමා බැමි බිඳදමමින් මහජන මතය ගොඩනැඟීමේ ලා කටයුතු කිරීමේ හැකියාව නිර්මාණය වී ඇත. එය අද වන විට පෙරදිගට ද, අපරදිගට ද, යන්න අඳාළ නොවේ. කෙසේවෙතත්, මෑත කාලයේ සමාජ මාධ්‍යයක් ලෙස මහජන මතය නිර්මාණය කිරීම සඳහා ෆේස්බුක්

භාවිතා කරන ලද ප්‍රබල අවස්තාවක් ලෙස 2008 ඇමරිකානු ජනාධිපතිවරණය සැලකිය හැකිය. එහිදී බැරක් ඔබාමා විසින් සිය සමස්ත මැතිවරණ ප්‍රචාරණ ව්‍යාපාරයම ගෙනයනු ලැබුවේ, ෆේස්බුක්, ට්විටර්, යු-ටියුබ් සහ බ්ලොග් අඩවි හරහා ය. ඒ අනුව සමස්තයක වශයෙන් ගත් කළ නව සමාජ මාධ්‍යයන් 15ක් හරහා මිලියන ගණනාවක ඇමරිකානුවන් ඔබාමා සමඟ සම්බන්ධව සිටින්නට විය. කෙසේවෙතත්, මෙම සමාජ මාධ්‍යයන් අතුරින් ඔබාමා වඩාත් ප්‍රබලව භාවිතා කළ සමාජ මාධ්‍යයක් ලෙස "ෆේස්බුක්" හඳුන්වා දිය හැකිය. ඒ පිළිබඳ ගෙනහැර දැක්වීමේ දී, මැතිවරණ දිනය ආසන්න වන විට ඔබාමාගේ ෆේස්බුක් පිටුව වෙත ඇමරිකානුවන් විශාල පිරිසක් එකතු වී සිටි අතර ඔහු විසින් සිදු කරන ලද දේශන ආදිය යු-ටියුබ් වෙත එක් කළ අතර ඒවා මිලියන 50ක පමණ ප්‍රේක්ෂකයින් පිරිසක් නරඹා ඇත (ගමගේ, 2015: 75).

2009 අප්‍රේල් මස 07 වන දින පවත්වන ලද "මොල්ඩෝවා" ජනරජ මැතිවරණයේහිදී ද, "ෆේස්බුක්" ප්‍රබල කාර්යභාරයක් සිදු කරන ලදි. "මෝල්ඩෝවා" නම් යුරෝපීය රාජ්‍යය තුළ පැවති මැතිවරණයේදී ද, පාලන බලය අත්පත්කරගෙන සිය කොමියුනිස්ට් පක්ෂය නැවතවරක් බලය තහවුරු කරගන්නට විට. නමුත් එම මැතිවරණය සාධාරණ එකක් නොවන බව පවසමින් නැවත වරක් ජන්ද ගණන් කරන ලෙස එරට විශාල ජනතා උද්ඝෝෂණයක් ඇති විය. එහිදී එම විරෝධතාවන්පදනම් කරගනිමින් මහජන මතය ඔවුන් මෙහෙයවනු ලැබුයේ ප්‍රධාන වශයෙන්ම ට්විටර්, ෆේස්බුක් ඇතුලු අනෙකුත් සමාජ මාධ්‍යයන් ඔස්සේය. කෙසේවෙතත්, මෙලෙස පැවති තත්ත්වය පදනම් කරගනිමින් නව රජයක් පිහිටුවීමට මෝල්ඩෝවට හැකි නොවුණි. එහෙත් සැබවින්ම මෙම මැතිවරණයේදී "ෆේස්බුක්" නම් සමාජ මාධ්‍යයට වඩා ට්විටර් භාවිතා කරන්නට වූ අතර, එහෙයින් එය "ට්විටර් විප්ලවය" නැතිනම් "දම් විප්ලවය" ලෙස හඳුන්වනු ලැබේ (ගමගේ, 2015: 76).

ෆේස්බුක් හරහා මහජන මතයක් නිර්මාණය කිරීම තුළ ප්‍රතිපත්ති සම්පාදනයට බලපෑම් කරන ලද අවස්තාවක් කොළොම්බියාව මුල්කරගෙන සිදු විය. කොළොම්බියාවේ වාසය කළ "ඇමෙන්ඩා" නම් තරුණිය ෆේස්බුක් මඟින් ඇති වූ ප්‍රේම සබඳතාවක් බිඳ වැටීමෙන් දිවි නසාගත් අතර, මෙමඟින් ෆේස්බුක් පිළිබඳව නව නීති සම්පාදනය කිරීමේ අවශ්‍යතාව පිලිබඳව මහජන මතයක් ගොඩනැඟුණි. ඒ අනුව එය පදනම් කරගනිමින් දේශපාලන යාන්ත්‍රණය විසින් "ෆේස්බුක්" සම්බන්ධයෙන් නව නීතියක් සම්පාදනයකොට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදි

(සුරවීර, 2011). එසේම, ස්පාඤ්ඤයේ දියත්වූ 15-M ව්‍යාපාරය ද, ලෝක දේශපාලනය තුළ නව මාධ්‍යයක් ලෙස ෆේස්බුක් මඟින් මහජන මතය ගොඩනැංවීම සම්බන්ධයෙන් බලපෑම් කළ අවස්ථාවක් ලෙස සැලකේ. නව දේශපාලන වෙනසක් ඉල්ලමින් කටයුතු කළ මෙම සංවිධානය එකී වෙනස සිදු කිරීම සඳහා අවැසි මහජන මතය ගොඩනඟණු ලැබුයේ ෆේස්බුක් මඟිනි.

මෑතකදී ඊජිප්තුව තුළ සිදු වූ අරගලකාරී තත්ත්වය ෆේස්බුක් තුළින් නිර්මාණය කරන ලද මහජන මතය පදනම් කරගනිමින් සිදු කරන ලද "ෆේස්බුක් විප්ලවයක්" ලෙස හැඳින්විය හැකිය. දශක තුනකට අධික කාලයක් ඊජිප්තුව පාලනය කළහොස්නි මුබාරක් සති කිහිපයක් තුළදී රටින් පළවා හැරීමට හැකි වුයේ අන්තර්ජාලය මඟින් දේශපාලන විචාරක අදහස වේ. මරණ ගණන 384කට සීමා කරමින් මෙම විප්ලවය ජයගත හැකිවුයේ, අන්තර්ජාලය හේතුකොටගෙනය යන්න බව බටහිර විචාරකයින් මෙන්ම, ඊජිප්තු නායකයින් ද, පිළිගනී. මෙම ෆේස්බුක් විප්ලවය මෙහෙය වූ නිර්ණාමික නායකයෙකු මාධ්‍යයට ප්‍රකාශ කළේ, *"අපි උද්ඝෝෂණ සැලසුම් කළේ, ෆේස්බුක් මඟින්, සම්බන්ධීකරණය කටයුතු කළේ ට්විටර් මඟින්, ලෝකයාට මේ පණිවිඩය කියුවේ යූ-ටියුබ් හරහාය යනුවෙනි* (සුරවීර, 2011)". මෙම විප්ල්වයේදී මුබාරක් ඉවත්ව විය යුතු බවට ජනතාව අතරින් මහජන මතයක් ගොඩනඟන්නට ෆේස්බුක් නායකයින් උත්සුක වන්නට වූ අතර, උද්ඝෝෂණ පැවැත්වෙන දිනය, ස්ථානය හා කළ යුතු දේ ෆේස්බුක් මඟින් දැනුම් දුණි. මේ තත්ත්වය තුළ මුබාරක් රජය අන්තර්ජාලය තහනම් කරන්නට වුව ද, එම වාරණ නොතකා ෆේස්බුක් සටන්කාමීන් වාරණ නීති නොතකා කටයුතු කරන්නට විය.මේ හේතුවෙන් අවසානයේදී මුබාරක් හට රජය පිහිටුවීමට නොහැකි විය.එසේම, පෙරදිග රාජ්‍යයන් වෙත අවධානය යොමු කිරීමේදී ඉන්දියාව අමතක කළ නොහැකිය. ඉන්දියාවේ අගමැති නරේන්ද්‍ර මෝදි ද, තම මැතිවරණ ව්‍යාපාරය තුළත්, ඉන්පසුවත් නව මාධ්‍යයක් ලෙස ෆේස්බුක් ඇතුළු අනෙකුත් සමාජ මාධ්‍යයන් භාවිතා කරමින් තමන්ට පක්ෂව මහජන මතයක් ගොඩනඟන්නට විය. ඔහු ඉන්දියාවේ සියලුම පුවත්පත් හා 275ක් පමණ වන ප්‍රවෘත්ති නාලිකා අතහැර ෆේස්බුක් හා සමාජජාලා භාවිතා කරමින් සිය මැතිවරණ කටයුතු මෙහෙයවන්නට විය. ඉන්දියාවේ ෆේස්බුක් භාවිතා කරන පිරිස මිලියන 100කි. ඉන්දීය අගමැති මැතිවරණ කාලසීමාවේත් ඉන් පසුවත් මෙම සමාජ මාධ්‍යය සමඟ සක්‍රීයව කටයුතු කරන ලදි. කෙසේවෙතත් මිලියන 10කට වඩා වැඩි පිරිසක් මෝදි සමඟ ෆේස්බුක් පිටුව සමඟ සම්බන්ධ වී

ඇත. එතුමා සිය නිවේදන, පණිවිඩ ඉංග්‍රීසි, හින්දි යන භාෂා දෙවර්ගයෙන්ම ෆේස්බුක් ඇතුලු අනෙකුත් සමාජ මාධ්‍යයන් තුළ නිකුත් කරන්නට විය (ගමගේ, 2015: පිටුව 77).

එසේම 2013 පෙබරවාරි මස පවත්වන ලද කෙන්යාවේ ජනාධිපතිවරණයේ අපේක්ෂකයින් එරට මුල්ම සජීව ටෙලිවිෂන් විවාදට සහභාගී වූ අතර, එය යු-ටියුබ්, ෆේස්බුක් හා වෙනකුත් සමාජ මාධ්‍යයන් හරහා විකාශනය වන්නට විය. මෙහිදී අපේක්ෂකයින් ජනමතයක් ගොඩනැඟීමේ අරමුණින් මෙම වැඩසටහන මෙහෙය වීම සිදු කළ ද, අවසානයේ වැඩි පිරිසකින් චෝදනා එල්ල වන්නට වූයේ අපේෂකයින් ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු නොදී මඟහැර යනු ලබන බවයි. එහෙත් සමහර ප්‍රේක්ෂකයින් ප්‍රකාශ කරනු ලැබුවේ, අපේක්ෂකයින් වඩාත් හොඳින් සිය ප්‍රතිපත්ති ඉදිරිපත් කරන්නට වූ බවයි. ඒ මඟින් එක් අතකින් සමහර අපේක්ෂකින් සම්බන්ධයෙන් ධනාත්මක මහජන මතයක් ගොඩනැංවීමට ඔවුනට හැකි විය (nalakagunawardene.com, 2014). එසේම ඉන්දුනීසියාවේ 2014 වර්ෂයේ පවත්වන ලද ජනාධිපතිවරණය මෙන් ම ටියුනීසියාවේන් ඇරඹී අරාබි වසන්තය තුළ අවස්ථා රැසකම ෆේස්බුක් හරහා මහජන මතයක් ගොඩනැංවීමට හැකි විය. මේ අනුව බලන කළ ෆේස්බුක් යන සමාජ මාධ්‍ය වඩාත් ප්‍රබල මට්ටමින් ජාත්‍යන්තරය තුළ මහජන මතය ගොඩනැංවීමෙහි ලා භාවිතා කෙරේ.

2.2 මහජන මතය නිර්මාණය කිරීම සඳහා මුහුණුපොතේ බලපෑම ශ්‍රී ලංකාව ආශ්‍රයෙන්

වත්මන තුළ දැකගත හැකි විශේෂිතම කාරණාව නම් ශ්‍රී ලංකාවේ දේශපාලන ප්‍රතිපත්ති සම්පාදනයට වැඩිවශයෙන් මහජනතාව මුහුණුපොත හරහා බලපෑම් කිරීමේ තත්ත්වයයි. විශේෂයෙන්ම, සයිටම්, මීතොටමුල්ල කසළ කළමනාකරණය සම්බන්ධයෙන් මතු වූ ගැටලුව, උමා ඔය, සිංහල මුස්ලිම් ගැටලුව සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සම්පාදනයේදී මේ තත්ත්වය ඉතා ප්‍රබලව දැකගත හැකි විය. සයිටම් ඒ අතුරිනුත් ප්‍රධානතම වේ. එසේම ෆේස්බුක් හරහා ජනතා මතය ඒකරාශි කරගැනීම පමණක් නොව, විවිධ නිවේදන පවා ජනතාගත කිරීම සිදු වේ. එය පහත උදාහරණයෙන් පැහැදිළි වේ.

"සයිටම් අහෝසි කරනු !
විරෝධතා පාගමන

ඔක්තෝබර් 10 කොළඹදී"- සයිටම් විරෝධී සිසු ජන ව්‍යාපාරය (Abolish Saitm ෆේස්බුක් මුහුණු පිටුව, 2017)

එසේම, දේශපාලන ක්‍රමය තුළ පවතින අල්ලස, දූෂණය, විනිවිදභාවය සම්බන්ධයෙන් වන ගැටලු මඟහැරීම උදෙසා මහජන මතයක් ගොඩනැඟීමට ෆේස්බුක් හරහා උත්සුක වන අන්දම වත්මන වන විට ශ්‍රී ලංකාවේ දැකගත හැකිය.

"සිල් රෙදි හොරු ටික
නිදැල්ලේ ඉන්නේ,
ඔය අහිංසකයෝ දෙන්නට
නිදහසේ පෙම් කරන්ඩ ඉඩ දීලා!" (Abolish Saitm ෆේස්බුක් මුහුණු පිටුව, 2017)

උක්ත දැක්වෙන ෆේස්බුක් වැකිය තුළ එක්තරා ආකාරයකට ශ්‍රී ලංකාවේ දේශපාලඥයින්ගේ වංචා, දූෂණ ගැන අවබෝධයක් හා හෙළි කිරීමක් සිදු කරන අතරම, පවතින දේශපාලන ක්‍රමය තුළින් අවධානය යොමු කළ යුතු විශාල ගැටලු, දූෂණ ගැන තීන්දු තීරණ නොගෙන ඉතා සුලු කාරණා සම්බන්ධයෙන් අවධානය යොමුකරන ආකාරය උපහාසයට ලක්කර ඇත. උක්ත දක්වා ඇත්තේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ප්‍රතිපත්ති හා සම්බන්ධයෙන් ෆේස්බුක් නව සමාජ මාධ්‍යයක් ලෙස ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳවය. කෙසේවෙතත්, මේ උත්සාහය යම්තාක් දුරට සාර්තක වූ බව රවී කරුණානායක ඇමතිවරයා තාවකාලිකව ධුරයෙන් ඉවත්වීමෙන් පැහැදිළි වේ. නමුත් මෙම ඉවත්වීමේ ස්වභාවය සම්බන්ධයෙන් යම් යම් සදාචාරාත්මක ගැටලු පවතී.ශ්‍රී ලංකාවේ මැතිවරණ ආශ්‍රයෙන් වත්මන වන විට "ෆේස්බුක්" නම් සමාජ මාධ්‍යයේ බලපෑම ඉතා ප්‍රබලව දැකගත හැකිය. 2004 මැතිවරණයේ සිට වත්මන දක්වා මැතිවරණ සියල්ලේම පාහේ ෆේස්බුක් මඟින් මහජන මතය ගොඩනැංවීමට සක්‍රීය දායකත්වයක් ඉටු කරනු ලැබූ බව දක්නට ඇත. විශේෂයෙන් ගත් කළ 2010 ජනාධිපතිවරණයේ දී තරඟ කළ මහින්ද රාජපක්ෂයන් සිය ජයග්‍රහණය උදෙසා, යුද්ධය අවසන් කළ සේනාධිනායකයා ලෙස ඔහුගේ තත්ත්වය ඉතා ගැඹුරින් ජනතාව අතරට ගමන් කරන පරිදි ප්‍රචාරණ උපක්‍රම ෆේස්බුක් නිල පිටුව තුළ සංසරණය කරන්නට විය. එසේම එම සීමාව තුළ ඔහු විසින් සිදු කරන ලද සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව විශාල ප්‍රමාණයේ ජායාරූප මඟින් ෆේස්බුක් හරහා ව්‍යාප්ත කරන්නට විය. කෙසේවෙතත්, මෙම ඉදිරි පරිච්ඡේද තුළ සාකච්ඡාවට බඳුන් වන්නේ 2015 ජනාධිපතිවරණ කාලපරිච්ඡේදය තුළ නව සමාජ මාධ්‍යයක් ලෙස "ෆේස්බුක්" මහජන මතය නිර්මාණය කිරීමට කටයුතු කළ ආකාරය පිළිබඳවය.

3.0 ශ්‍රී ලංකාවේ 2015 ජනාධිපතිවරණයේදී මහජන මතය ගොඩනැංවීම සඳහා මුහුණු පොතේ බලපෑම

3.1 2015 ජනාධිපතිවරණය පැවැත්වීමේ පසුබිම

2015 වර්ෂය එළඹෙන විට මහින්ද රාජපක්ෂයන් ජනාධිපතිවරණයක් කැඳවීමට තීරණය කරන ලදී. එහෙත්, ඒ වන විට ව්‍යවස්ථාමය සීමා 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 31(1) වගන්තිය තුළින්ම සම්පාදනය වී තිබිණ.

"ජනතාව විසින් දෙවරක් ජනාධිපති ධුරයට තෝරා පත් කරන ගනු ලැබූ කිසිම තැනැත්තෙකු ඉන් පසු එම ධූරයට ජනතාව විසින් තෝරා පත් කර ගැනීමට සුදුස්සෙකු නොවන්නේ ය".

කෙසේවෙතත් ජනාධිපතිවරණයට මහින්ද රාජපක්ෂයන් තෙවන වරටත් අපේක්ෂකයෙකු ලෙස ඉල්ලීම උදෙසා 18 වැනි සංශෝධනය ආණ්ඩු ක්‍රම ව්‍යවස්තාවට ගෙන එනු ලැබූ අතර, ඒ අනුව ජනාධිපතිවරයෙකු ලෙස තෙවරක් තේරී පත් වීම සඳහා අවශ්‍ය විධිවිධාන සකස් විණ. මහින්ද රාජපක්ෂයන් එය පදනම් කර ගනිමින් සිය ධූර කාලයෙන් වසර දෙකක් ඉතිරිව තිබියදී නැවත ජනාධිපතිරණයක් කැඳවන ලදී. 2014 ඔක්තෝම්බර් 20 වන දින ජනමාධ්‍ය ඇමති "කෙහෙලිය රඹුක්වැල්ල මහතා" විසින් ඒ බව සියලු ලාංකිකයන්ට දැනුම් දෙන ලදී. එදිනම මැතිවරණ කොමසාරිස් "මහින්ද දේශප්‍රිය මහතා" විසින් 2014 දෙසැම්බර් 8 වෙනි දින නාමයෝජනා බාරගන්නා බවට ජනමාධ්‍ය වෙත දැනුම් දෙන ලද අතරම ජනාධිපතිවරණය 2015 ජනවාරි 8 වෙනිදිනට පවත්වන බවටද නිල මට්ටමින් දැනුම් දෙන ලදී. මෙහිදී විරුද්ධ පාර්ශවයේ පොදු අපේක්ෂකයා ලෙස ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු වූ "මෛත්‍රීපාල සිරිසේන" නාම යෝජනා භාරදෙන ලදී.උක්ත ප්‍රධාන අපේක්ෂකයින් දෙදෙනාට අමතරව තවත් අපේක්ෂකයින් දහහත්දෙනෙකු (17) මෙරට පවත්වන හත්වන ජනාධිපතිවරණයට නාම යෝජනා බාරදෙන ලදී (පෙරේරා, 2015: පි 1).

3.2 මුහුණු පැතිකඩ/ෆේස්බුක් හරහා ප්‍රධාන අපේක්ෂකයින් දෙදෙන මහජන මතයක් ගොඩනැංවීමට උත්සාහ කළ ආකාරය

3.2.1 මහජන මතයක් ගොඩනැඟීමට මහින්ද රාජපක්ෂ මහතා මුහුණු පැතිකඩ භාවිතා කර ඇති ආකාරය

විශේෂයෙන්ම කිවයුතු ප්‍රධාන කාරණාව නම්, මේ මැතිවරණ කාලපරිච්ඡේදය තුළ මහින්ද රාජපක්ෂයන්ගේ යැයි නිශ්චිතව කිව හැකි ෆේස්බුක් පිටුවක් නොමැති බවයි. නමුත් mahinda.rajapaksha.7739?ref=br_rs යන ෆේස්බුක් පිටුව යම්තාක් දුරකට මහින්ද රාජපක්ෂයන්ගේ යැයි නිර්ණය කළ හැකිය.විශේෂයෙන්ම මේ කාලය තුළ යුද්ධය අවසන් වී සැළකිය හැකි කාලයක් ගතව තිබුණ හෙයින් යුද්ධය අවසන් කරන ලද්දේ තමන් බව නැවත ජනතාව වෙත පසන් කිරීමට මෙන්ම, අනෙක් අතින් මේ කාලය තුළ යුධ අපරාධ සම්බන්ධයෙන් රණවිරුවන් ජාත්‍යන්තර අධිකරණය ඉදිරියට ගෙන ඒම සම්බන්ධයෙන් ද, මතවාද පැනනැගුණු හෙයින් තමන් එහිදී රණවිරුවන් තවදුරටත් ආරක්ෂාව සපයන බවට මතයක් ගොඩනැඟීමට මහින්දයන් 2015 ජනවාරි 01 වන දින ප්‍රදර්ශණයක්(Post)කර ඇත.එහි දක්වා ඇත්තේ මෙසේය.

"බෙලිඅත්තේ පොඩි පුතුනි!

එක්සේසත් කළ දේශයේ, අනාගත භාරකරුවා ඔබයි !" (රාජපක්ෂ මුහුණු පැතිකඩ, 2015)

සැබවින්ම මෙම වදන් 1970දී ප්‍රදර්ශණය කළ මැතිවරණ දැන්වීමක් පදනම් කරගනිමින් මෙය ඉදිරිපත් කර ඇත. කෙසේවෙතත් 24කට ආසන්න ප්‍රමාණයක් මෙය (Share)හුවමාරු කර ඇති අතර එහිදී ෆේස්බුක් සාමාජිකයින්ගේ ප්‍රතිචාර (Comments) තුළින් මහින්ද රාජපක්ෂයන් සම්බන්ධයෙන් ජනතා මතවාදය පිළිබඳ යම් අවබෝධයක් ගැනීමට හැක.

"මේ සොඳුරු මිනිසා බලය සමඟ විනාශ වුයේ ද?, අසල සිටියවුන් විනාශ කළාද යන්න ජනවාරි 08 වන දින පෙනී යනු ඇත"."ජනතාව මෙවර 60%ක් ඔබ සමගයි. පනින රිල්වුන්ට තිත තියන නීතිය ජනාධිපතිවරණයෙන් පසුව ගේන්න"(රාජපක්ෂ මුහුණු පැතිකඩේ මහජන ප්‍රතිචාර, 2015)

මෙම ජනතා ප්‍රතිචාරවලින් එක අතකින් මහින්දයන් අවට සිටි පිරිස් ඉතා ඉහළ මට්ටමින් වංචා, දූෂණ සිදුකරන ලද බවත් එය එක් අතකින් මහින්දයන්ගේ විනාශයට හේතු වන බවට ජනතාව අතර මතයක් ගොඩනැඟීමට මෙන් ම, මේ වන විටත් එවැන්නක් සිදු වී ඇති බවට අනතුරු අඟවයි. දෙවැන්න තුළ "පනින රිළවුන්" ලෙසින් එක් අතකින් විග්‍රහා කර ඇත්තේ මෛත්‍රීපාල සිරිසේන මහතා මහින්ද පිළෙන් ඉවත් වී "පොදු අපේක්ෂකයා" ලෙස ජනාධිපතිවරණයට ඉදිරිපත් වීමේ සිදු වීම විය හැකිය. එසේම ජන්ද 60%ක් මහින්දයන්ට හිමිවන බව අඳාළ ප්‍රතිචාරකයා දැක්වීම තුළින් එතුමාට විපක්ෂව සිටින ජන්දදායකයින්ට පවා මහින්දයන් හට පක්ෂව ජන්දය භාවිතා කිරීමට මනෝමය පෙළඹීමක් සිදු වනු ඇත.එමඟින් ජනතාව අතර සිරිසේන මහතා කෙරෙහි පිළිකුලක් ඇතිකොට සෘණාත්මක මහජන මතයක් ගොඩනැඟීමට උත්සාහ කරනු ලැබේ. එසේම මේ කාලය තුළ "ටොයියා" සහ "බයියා" යන වදන් දෙක ඉතා ප්‍රභලව භාවිතා කරන්නට වූ අතර, මෙහිදී "බයියා"යනුවෙන් හැඳින්වුයේ මහින්දයන් හට ඡන්දය භාවිතා කරන ගම්බදව ජීවත්වන අය වන අතර "ටොයියන්" යනු, සිරිසේනයන්ට ඡන්දය භාවිතා කරන නාගරික කොටස්ය. ඒ තුළින් එක්තරා ආකාරයකට මහින්දයන් හට ඡන්දය භාවිතා කරනු ලබන ජන්දායකයින්ව උපහාසයට ලක් කිරීමට උත්සුක වේ. එසේම මහින්ද රාජපක්ෂයන්ගේ නාමයෙන් පවතින ෆේස්බුක්/මුහුණු පැතිකඩ පිටුවක් තුළ දැකගත හැකි ප්‍රධාන කරුණක් නම් එතුමා සම්බන්ධයෙන් ධනාත්මක මහජන මතයක් ගොඩනැඟීම සඳහා මැතිවරණ පොරොන්දු ඒ හරහා ජනතාගත කිරීමයි. එය පහත දක්වා ඇති ෆේස්බුක් ප්‍රදර්ශණයෙන් ඔප්පු වේ.

"සෑම පවුලකටම හිසට වහලක්; ශ්‍රී ලංකාවේ කුලී නිවැසියන්, නව විවාහක පවුල් ඇතුලු නිවසක අයිතිය අහිමි සෑමදෙනාටම තම පළමු නිවස ඉදිකිරීමට හෝ මිලදී ගැනීම සඳහා සහන පොළියට රුපියල් මිලියන 4 දක්වා වූ නිවාස ණයක් ලබා දෙන්නෙමු"(රාජපක්ෂමුහුණු පැතිකඩ, 2015).

එසේම ජනාධිපතිවරණය ආසන්න කාලයේදී පැවති නත්තල් උත්සවය සඳහා මහින්දයන් සිය නත්තල් පණිවිඩය යු-ටියුබ් හරහා විඩියෝ පටයක් ෆේස්බුක් වෙත මුදාහරින්නට වූ අතර, මේ තුළින් එක්තරා ආකාරයෙන් විපක්ෂයේ නායකයා ඇතුලු අනෙක් පිරිස ක්‍රෝධයෙන්, වෛරයෙන් කටයුතු කරන බව ඇඟවීම සිදු කර ඇත. එසේම, තමන් කෙරෙහි කතෝලික පමණක් නොව වෙනත් ආගමිකයින්ගේ ද, අවධානය ලබා ගනිමින් ධනාත්මක මහජන් මතයක් ගොඩනැඟීමට උත්සාහ කර

ඇත. එය 2,184ක් හුවමාරු(Share) කර ඇති අතර, ලක්ෂ 8කට ආසන්න ප්‍රමාණයක් "කැමැත්ත (Like), සිය ප්‍රතිචාරය ලෙස ඉදිරිපත් කර ඇත. එසේම ඒ මඟින් මෛත්‍රීපාලයන් කෙරෙහි සෘණාත්මක මහජන මතයක් ගොඩනැඟීමට ද, උත්සුක කර ඇත.

එසේම එතුමා විසින් නිරන්තරයෙන්ම පාහේ තමා වෙත පුරවැසියන් ඒකරාශී කරගැනීමේ අරමුණින් ඔහු විසින් මෙහෙවන ලද ජනරැළි පිළිබඳ ෆේස්බුක් හරහා ජනතාව දැන්වත් කරන ලදි. එසේම, ජනාධිපතිවරණ කාලය තුළ"අප්පච්චි" යන නාමයෙන් මහින්ද රාජපක්ෂයන් ආමන්ත්‍රණය කිරීමේ යම් ප්‍රවනතාවක් සියලු මාධ්‍යයන්හී දැකගත හැකි විය. "අප්පච්චි" යන්නා මහා නුග රුකක් මෙන් පවුලක් රැකගැනීමට තැත් කරන, පෞරෂත්වය තුළින් උස් මුදුනක සිටින උත්තමයෙකි. මහින්දයන් හට "අප්පච්චි" යන අන්වර්ථ නාමයෙන් හැඳින්වීම තුළ එම ගුණාංග එතුමා තුළ ඇතුවාසේම, ඔහු සමස්ත රට ජාතියේම "අප්පච්චි" යන්න හැඟවීමට උත්සාහ කර ඇත. එය ප්‍රකට කිරීමට ජායාරූපයක් මුහුණුපොතේ දැකගත හැකිවිය. එසේම, එය තුළ මහින්ද රාජපක්ෂයන්ගේ ඡායාරූපය සමඟ සිංහයෙකුගේ රුවක් සටහන් කිරීම තුළ එතුමා සිංහයෙකු මෙන්, එඩිතර, පෞරෂයකින් සමන්විත බව ගම්‍ය කරවයි. පහත දක්වා ඇත්තේ එයට නිදසුනකි.

"කොතේ නිලයි, ගහවැලේ මලයි, අප්පච්චී
තිස්තුන් කෝටියක් දෙවියෝ"(රාජපක්ෂමුහුණු පැතිකඩ, 2014)

කෙසේවෙතත්, මේ අනුව මහින්ද රාජපක්ෂට පක්ෂව ව්‍යාංජ මෙන් ම, ව්‍යාංජ නොවන ගිණුම් රැසක් ක්‍රියාත්මක වන්නට වූ අතර ඒ හරහා මහජනතාව තුළ තමන්ට පක්ෂ මහජන මතයක් ගොඩනැඟීමට උත්සුක වන්නට විය.

3.2.2 මහජන මතයක් ගොඩනැඟීමට මෛත්‍රීපාල සිරිසේන මහතා මුහුණු පැතිකඩ භාවිතා කර ඇති ආකාරය

සිරිසේන මහතා පෞද්ගලික මට්ටමින් කෙසේවුව ද, ඔහුට පක්ෂග්‍රාහීව මුහුණුපැතිකඩ තුළ ගිණුම් රාශියක් නිර්මාණය වී තිබූ ආකාරය දැකගත හැකිය. එසේම මහින්ද රාජපක්ෂයන් බොහෝ දුරට බියට ආමන්ත්‍රණය කිරීමේ උපක්‍රමය මත කටයුතු කරන්නට වුව ද, මෛත්‍රීපාල සිරිසේන මහතා නිරන්තරයෙන්ම සාමකාමීත්වය, කරුණාව වැනි ගුණාංග ෆේස්බුක් මැතිවරණ ව්‍යාපාරය පුරාම උපක්‍රමිකව භාවිතා කරන්නට විය.

එසේම, මෙහිදී කිවයුතු වැදගත් කාරණාව නම් එතුමාගේ දැන්වීම් තුළ පසුබිමින් දේදුන්නක ස්වරූපයක් ඉදිරිපත් කිරීමයි. දේදුන්නක් පායන්නේ වර්ෂාවක් අවසන් වූ බවට ඇඟවීමටයි. ඒ මඟින් ඒ අනුව, ගම්‍ය කරන්නට උත්සුක වන්නේ මහා වර්ෂාවක් හා සමාන මහින්ද පාලනයේ අවසානය විය හැකිය. එසේම ජනාධිපතිවරණ කාලසීමාව තුළ ගංවතුර තත්ත්වයක් ඇති වූ අතර එහිදී මහින්ද රාජපක්ෂයන් සල්මන් ඛාන්, ජැක්ලින් ෆර්ඩිනන්ඩස් තමන් සම්බන්ධයෙන් ධනාත්මක මහජන මතයක් ගොඩනැඟීමට සිය මැතිවරණ වේදිකාවට ගෙන එන ලදි. මෙහිදී සැලකිය හැකි මුදලක් ඒ සම්බන්ධයෙන් වියදම් කරන්නට වූ අතර, එය එක් අතකින් අනවශ්‍ය වියදමකි. ඒ පිළිබඳව මෛත්‍රීපාල සිරිසේන මහතාගේ පාක්ෂිකයින් සිය අප්‍රසාදය ප්‍රකාශ කරන්නට වූ අතරම, ඒ පිළිබඳව ජනතාව අතර සෘණාත්මක මහජන මතයක් මහින්දයන් කෙරෙහි ඇති කිරීමට ෆේස්බුක් හරහා ව්‍යාප්ත කරන්නට විය. ඒ පිළිබඳව ගුණවර්ධන නමැති පර්යේෂකයා ඉදිරිපත් කර ඇත. එම දැන්වීම පහතින් දක්වා ඇත.

"රට වෙනුවෙන් සල්මාන්!

ගංවතුරෙන් 30ක් මියගොස් සිටියදී, ලක්ෂ 11ක් අවතැන්ව සිටියදී, රුපියල් කෝටි 70කට රට වෙනුවෙන්

මෙරටට පැමිණි ඔබට ජනතා ආචාරය ! (ගුණවර්ධන, 2015)

මෙහිදී මහින්ද රාජපක්ෂයන්ගේ යටිකොටසේ ඡායාරූපයකට සල්මන් ඛාන්ගේ මුහුණ සම්බන්ධකොට ඉතා ප්‍රභල ආකාරයෙන් මහින්දයන් උපහාසයකට ලක්කර ඇත. මෙය එක් අතකින් මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ස්වරූපයට සමාන පුද්ගලයෙක් ජනාධිපතිවරණයට ඉදිරිපත් කිරීම තුළ මහින්දයන් විසින් මෛත්‍රීපාල සිරිසේන උපහාසයට ලක් කිරීමට උත්සාහ කිරීමට එරෙහිව දැක් වූ ප්‍රතිචාරයක් විය හැකිය. එසේම, ෆේස්බුක් පිටු තුළඉතා ප්‍රභල මට්ටමින් මහින්ද රාජපක්ෂ පවුල් දේශපාලන තුළ සිදු කරන ලද වංචා, දූෂණ පිළිබඳ හෙළිදරවු කිරීමක් සිදු කරනු ලබයි. තව ද, පවතින මහින්ද යුගය තුළ ශ්‍රී ලංකාවේ සමස්ත සමාජ ක්‍රමය පිළිබඳව විඩියෝ හරහා ජනතාගත කිරීමට මෛත්‍රීපාල සිරිසේන මහතා උත්සාහ කරනු ලැබේ. එක් අතකින් මේ තුළින් ප්‍රචාරණේ එන "බියට ආමන්ත්‍රණය කිරීමේ උපක්‍රමය" භාවිතා කරනු ලබන බව පෙනී යයි. එය පහත දක්වා ඇති උපුටාගන්නා ලද විඩියෝවේ වදන්වලින් හඳුනා ගත හැකිය.

"තමන්ගේ දරුවෝ කුඩු, ගංජා ගහනවාට හරි,.....කැසිනෝකාරයින්ගේ ගණිකාවක් වෙනවාට මොන අම්මා ද කැමති? ..... ඉවසුවා ඇති වෙනසකට ඉඩ දෙමු...ආයේ ආයේ නැහැ ඉවසන්නේ....."

එසේම, මෛත්‍රීපාල සිරිසේන මහතා හට පක්ෂ දීපානි සිල්වා, සමනළී ෆොන්සේකා වැනි කලාකරුවන් මහජනතාව අතර ධනාත්මක මහජන මතයක් ගොඩනැඟීමට විවිධ වීඩියෝ පට ෆේස්බුක් පිටුව තුළ ප්‍රදර්ශණය කර ඇත.**"My3 ජනපති කරන මැතිවරණ මෙහෙයුම් කාර්යාලය"** නම් ෆේස්බුක් පිටුවේ මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ජනාධිපතිවරණ රැස්වීම්හි කථාවන් ජනතාගත කරනු ලැබේ. ඒ මඟින් එක්තරා ආකරයකට එම රැස්වීම සඳහා සහභාගීවීමට නොහැකි වූ ජනතාව සඳහා ද, ඒ පිළිබඳව දැනුවත්වීමට අවස්තාව සැලසේ. ඒ මඟින් ජනතාව අතර එතුමා සම්බන්ධයෙන් ධනාත්මක මහජන මතයක් ගොඩනැංවීමට හැකි වේ. එසේම, එතුමාගේ දින 100 වැඩසටහන **"Maithreepala Sirisena - 6th President in Sri Lanka"**ෆේස්බුක් පිටුව ඔස්සේ 2014 දෙසැම්බර් 19 වන දින ප්‍රචාරණය කර ඇත.කෙසේවෙතත්, මෛත්‍රීපාල සිරිසේන මහතාට පක්ෂව වඩාත් විධිමත් ආකාරයට ෆේස්බුක් විප්ලවයක් ගෙන ගිය ද, ඒ තුළ හුවමාරු කිරීම්(Share), ප්‍රතිචාර(Comments), කැමැත්ත (Like) දැක්වීම් තරමක් අවම මට්ටමක දැකගත හැකි විය.

3.3 අවශේෂ දේශපාලන හා දේශපාලන නොවන ප්‍රභූන් මුහුණු පැතිකඩ 2015 ජනාධිපතිවරණයේදී භාවිතා කර ඇති ආකාරය

විශේෂයෙන් ගත් කළ රංජන් රාමනායක මහතා විසින් මිනුවන්ගොඩ රැලියකදී සිදු කරන ලද කථාවක් 2014 දෙසැම්බර් 14 වන දින "රිදෙන අයට රිදෙයි" යන තේමා පාඨය ඔස්සේ රංජන රාමනායක ෆේස්බුක් පිටුවට අන්තර්ගත කර ඇත. එහි ප්‍රධාන වශයෙන්ම මහින්ද රාජපක්ෂයන් විසින් සිය දේශපාලන බලය පදනම් කරගනිමින් අනිසි ලෙස ශ්‍රී ලංකාවේ මුදල් සුරාකමින් සිය දරුවන්ගේ සුඛවිහරණය උදෙසා කටයුතු කරනු ලබන ආකාරය සිය මුහුණු පැතිකඩෙහි විග්‍රහ කර ඇත (රාමනායක මුහුණු පැතිකඩ, 2014).

එතුළින් එදින මහජන රැලියට පමණක් නොව සමස්ත මුහුණු පොත පරිහරණය කරන්නන් හට සෘණාත්මක මහජන මතයක් මහින්ද රාජපක්ෂයන් කෙරෙහි ගොඩනැඟීමට හේතු වී ඇත. එය වඩාත් හොඳින් පැහැදිළි වනුයේ, මෙම විඩියෝව 77,324ක් නරඹා (Views) තිබීම හා 2400කට ආසන්න ප්‍රතිචාරයින් පිරිසක් සිය කැමැත්ත (Like) ප්‍රකාශ කර තිබීමයි. එසේම මෙය මිතුරන් අතරේ 1941ක් වතාවක් හුවමාරු (Share)වී ඇත. එසේම මෙයට 170ක් ප්‍රතිචාර (Comments)දක්වා ඇත. එමෙන්ම චතුර සේනාරත්නගේ නමින් පවතින මුහුණු පැතිකඩ පිටු තුළ ද, ඉතා ප්‍රභල මට්ටමින් මෛත්‍රීපාල සිරිසේන මහතා හට පක්ෂපාතීත්වය දක්වන ආකාරයට "යහපාලනය" නමැති සංකල්පය ඉස්මතු කරමින් ජනතාව තුළ එතුමා පිළිබඳ ධනාත්මක මහජන මතයක් ගොඩනැඟීමට උත්සාහ කරන්නට විය.

එසේම, පාඨලී චම්පික රණවක "Ask Champika" යනුවෙන් වැඩසටහනක් 2014 දෙසැම්බර් 26 වන දින මුහුණු පැතිකඩ හරහා මෙහෙයවන්නට වී ඇත. ඒ මඟින් පවත්වන්නට නියමිත ජනාධිපතිවරණ සම්බන්ධයෙන් මෛත්‍රීපාල සිරිසේන මහතා සම්බන්ධයෙන් ධනාත්මක මහජන මතයක් ගොඩනැංවීමට එතුමා උත්සාහ කර ඇත (රණවක මුහුණු පැතිකඩ, 2014). තව ද, එතුමා විසින් සිරිසේන මහතාගේ මුලිකත්වයෙන් පවත්වන ලද මැතිවරණ ප්‍රචාරණ රැලි සඳහා ජනතාව සංවිධානය කිරීම ද, සිය මුහුණු පැතිකඩ හරහා සිදු කරන්නට විය. මෙය 401දෙනෙක් අතර හුවමාරු වී ඇත. එහි මෙසේ දක්වා ඇත:

"අවනීතිය යුක්ති ධර්මයෙන් ද, අශීලාචාර බව ආචාරශීලීත්වයෙන් ද, මුග්ධ පවුල්කාමය උතුම් ප්‍රඥාවෙන් ද,වෛරය මෛත්‍රීයෙන් ද, ජය ගන්නට.....මෛත්‍රී පාලනයක් උදෙසා, මහ සඟ රුවන සමඟ අපි හැමෝම එක්වෙමු ! දෙසැම්බර් 23, සවස 2.30ට"(රණවක මුහුණු පැතිකඩ, 2014).

තව ද, උදය ගම්මන්පිල විසින් සිය මුහුණු පැතිකඩ හරහා ජනතාව තුළ " බියට ආමන්ත්‍රණය කිරීමේ උපක්‍රමය" භාවිතා කරමින් මහින්ද රාජපක්ෂයන් කෙරෙහි ධනාත්මක මහජන මතයක් ගොඩනැඟීමට උත්සාහ කරනු ලැබේ.ඒ බව ඔහුගේ මුහුණු පොතේ පළ කර තිබූ විඩියෝ පටයෙන් හෙළි වේ.

"ජනවාරි 08වෙනිදාට සිදුවන්නේ යහපාලනය පිළිබඳ සංවාදයක් නෙවෙයි. මේ රටේ ජනාධිපති ක්‍රමය අහෝසි මේ රට අස්ථාවර කරන්න ඉඩ දෙනවා ද, නැද්ද කියන ප්‍රශ්නයට ජනතාව උත්තර බඳින ජනමත විචාරණයක්"
(ගම්මන්පිල මුහුණු පැතිකඩ, 2014)

එසේම විමල් වීරවංශ "හිටං" වචනය භාවිතා කරමින් පළ කළ මුහුණු පොතේ යම් යම් ප්‍රදර්ශණ තුළින් සිරිසේන මහතා උපහාසයට ලක්කරන්නට විය. තවද, ශ්‍රී ලංකාවේ මාධ්‍යවේදීන් මඟින් ද, යම් ආකාරයකින් 2015 ජනාධිපතිවරණය සම්බන්ධයෙන් මහජන මතයක් ගොඩනැංවීමට උත්සාහ කරන්නට විය. කෙසේවෙතත්, ජනමාධ්‍ය යනු මහජන මතය ගොඩනැංවීමේ ප්‍රධාන තවත් කාරකයෙකි. නිදසුන් ලෙස ගත් කළ, ලේක්හවුස්හී 2015 වසර අවසානයේ හිටපු සභාපති බන්දුල පද්මකුමාර මහතා විසින් සිය "මුල් පිටුව" වැඩසටහන හරහා ප්‍රභල සහයෝගයක් මහින්ද රාජපක්ෂයන් හට ලබාදෙමින් එතුමා සම්බන්ධයෙන් ධනාත්මක මහජන මතයක් ගොඩනැඟීමට උත්සුක කරන්නට විය. එසේම ඔහු විසින් සිය නිල ෆේස්බුක් පිටුව හරහා 2014 නොවැම්බර් 14 වන දින "නායකත්වයේ සිරස්ත" යනුවෙන් කෘතියක් මහින්ද රාජපක්ෂයන් හට පිළිගැන්වීමේ ඡායාරූපයක් පළ කරන්නට විය. ඒ මඟින් මහින්ද රාජපක්ෂයන්ගේ ප්‍රතිරූපය වර්ධනය කිරීමට එතුමා උත්සුක වී ඇති බව පෙනේ. කෙසේවෙතත් මහින්ද රාජක්ෂයන් පරාජයවීමත් සමඟ එතුමාට කිසිදු දැනුම්දීමකින් තොරව "මුල් පිටුව" වැඩසටහන ස්වර්ණවාහිනියෙන් ඉවත් කරන ලදි (පද්මකුමාර මුහුණු පොත, 2015). සුධර්මන් රදළියගොඩ ද, මේ හා සමානව මහින්ද රාජපක්ෂයන් හට සහයෝගය දීමට මුහුණු පැතිකඩ හරහා කටයුතු කරන ලදි.

එමෙන්ම, "පුරවැසි බලය" වැනි සිවිල් සංවිධාන සෘජුවම මේ කාලය තුළ ප්‍රධාන අපේක්ෂකයින් සම්බන්ධයෙන් මහජන මතයක් ගොඩනැංවීමට උත්සුක වී ඇති බව සමර සිවිල් වැසියන්ගේ මුහුණු පැතිකඩයන්ගෙන් හෙළි විය. කෙසේවෙතත්, මෙම ජනාධිපතිවරණ ව්‍යාපාරය තුළ අනෙකුත් අපේක්ෂකයින් මුහුණු පැතිකඩ හෝ වෙනයම් ජනමාධ්‍ය විධික්‍රමයක් භාවිතා කිරීමක් දැකගත නොහැකි විය (හසන්ත මුහුණු පිටුව, 2015).

4.0 නිගමන හා යෝජනා

4.1 නිගමන

මේ අනුව බලන කළ මුහුණු පැතිකඩ තුළින් 2015 ජනාධිපතිවරණ ප්‍රබල මට්ටමින් ආවරණය කිරීමක් සිදු කර ඇත. මෙහිදී ඉතාමත් ප්‍රබල මට්ටමින් මුහුණු පැතිකඩ භාවිතා කර ඇත්තේ ප්‍රධාන අපේක්ෂකයින් දෙදෙනා වන මහින්ද රාජපක්ෂයන් හා මෛත්‍රීපාල සිරිසේන මහතා විසිණි. එසේම මහින්ද රාජපක්ෂයන්ගේ පාර්ශවයේ සිටින සහයෝගය දෙන්නන්ට සමගාමීව මෛත්‍රීපාල සිරිසේන මහතාගේ පාර්ශවයේ පිරිස් වඩාත් උපක්‍රමශීලීව මුහුණු පැතිකඩ ජනාධිපතිවරණ ව්‍යාපාරය සඳහා භාවිතා කර ඇති බව පෙනී යයි. මෙහිදී අධීක්ෂණයට ලක් වූ ප්‍රධාන කරුණාව නම්, මහින්ද රාජපක්ෂයන් රූපවාහිනිය, ගුවන්විදුලිය හා පුවත්පත් යන මාධ්‍යයන් ඉතා ඉහළ මට්ටමින් භාවිතා කළ ද, මෛත්‍රීපාල සිරිසේන මහතා එම ජනමාධ්‍ය විධික්‍රමයන්ට සාපේක්ෂව මුහුණු පැතිකඩ ඉහළ මට්ටමින් භාවිතා කර ඇත. මෙය එක් අතකින් මෛත්‍රීපාල සිරිසේන මහතා වටා තරුණ ඡන්ද ඒකරාශීවීමට හේතු වී ඇත. එසේම මහින්ද රාජපක්ෂයන් නිරන්තරයෙන්ම "බියට ආමන්ත්‍රණය කිරීමේ උපක්‍රමය" භාවිතා කරන්නට වුව ද, සිරිසේන මහතා කරුණාව, මෛත්‍රීය වැනි බෞද්ධ සංකල්ප සිය මුහුණු පැතිකඩේ ප්‍රචාරණ කටයුතු සඳහා භාවිතා කරන්නට වී ඇත. එසේම, මහින්ද රාජපක්ෂයන්ගේ ආධාරකරුවන්ට සාපේක්ෂව සිරිසේන මහතාගේ ආධාරකරුවන් වන රංජන් රාමනායක, පාඨලී චම්පික රණවක, රාජිත සේනාරත්න, චතුර සේනාරත්න වැන්නවුන් හුදෙක් පුහු අතාර්තීක පෞර්ෂත්ව උපහාසයෙන් ඔබ්බට ගොස් තාර්කික ලෙස මහින්ද රාජපක්ෂයන් පරාජය කිරීමට හැකිවන ආකාරයට මුහුණු පැතිකඩ භාවිතා කරන්නට විය. මෙම තත්ත්වයන් එක් අතකින් අවසානයේ පැවති පාවෙන ඡන්ද මෙන් ම, තරුණ ඡන්ද තමන් වෙත දිනා ගැනීමට මෛත්‍රීපාල සිරිසේන මහතාට අවස්තාව සළසන්නට විය. 2017 වර්ෂයේ මාර්තු මාසයේ මා විසින් සිදු කරන ලද අන්තර්ජාල පර්යේෂණයේදී හෙළි වූ ආකාරයට රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය තුළ ට්විටර්, ඉන්ස්ටර්ග්‍රෑම්, ගූගල් ප්ලස් යන මාධ්‍යයන්ට වඩා මුහුණු පැතිකඩේ බලපෑම ඉතා ප්‍රභලය. එය ආසන්න වශයෙන් 83.2%කි. ඒ අනුව එක්තරා ආකාරයකට මේ හා සමාන බලපෑමක් ජනාධිපතිවරණ ප්‍රචාරණ ව්‍යාපාරය තුළ මුහුණු පැතිකඩ හරහා පවතින්නට විය යන්න මාගේ මතයයි.

4.2 යෝජනා

1. නව සමාජ මාධ්‍යයක් ලෙස මැතිවරණ ව්‍යාපාරයක් මෙහෙයවීමට මුහුණු පැතිකඩ ඉතා ප්‍රභලව භාවිතා කළ යුතු එකකි.
2. සමාජ මාධ්‍ය බොහෝ පිරිස් ඇසුරට ලක්වන හෙයින් වෛරය, ක්‍රෝධය යන්නෙන් බැහැරව ශික්ෂණයෙන් යුතුව මෙහෙයවීමට දේශපාලන නායකයින් උත්සුක විය යුතු ය.
3. මැතිවරණ ප්‍රචාරණ සඳහා ප්‍රතිචාර දැක්වීමේදී ජනතාව ද, ශික්ෂණයෙන් යුතුව භාෂාව හැසිරවිය යුතු ය.
4. පළිගැනීම් මුල්කොටගෙන දේශපාලකයින්ගේ නම්වලින් ව්‍යාජ ගිණුම් සකස් කරගනිමින් චරිත ඝාතනයට යොමු නොවිය යුතුය. එසේම, ඒවාට එරෙහිව නීතිමය කටයුතු කළ යුතුය.

5.0 ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

ග්‍රන්ථ සහ අනෙකුත් ලිපි

ගමගේ, ඩී. (2015). විශ්ව සන්නිවේදනය, නව මාධ්‍යය හා දේශපාලනය. *සංජනනී*, 77.

ජිනදාස, එම්.පී. (2015). *සන්නිවේදන මූලධර්ම*, කර්තෘ ප්‍රකාශනයකි.

පෙරේරා, යූ.එල්.එච්.ඩී. (2015). ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රමය තුළ ප්‍රචාරය සංකල්පයේ භාවිතාව: 2015 ජනාධිපතිවරණය ආශ්‍රිතව විශ්ලේෂණාත්මක විග්‍රහයක්. *දේශපාලන විද්‍යා ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය*, 1.

සූරවීර, එන්. (2011). *සන්නිවේදන මූලධර්ම*, නුගේගොඩ: නැණිල පබ්ලිකේෂන්.

සොයිසා, එම්. ඕ. ඒ.ද. (2009). *දේශපාලන විද්‍යාවේ මූලික සිද්ධාන්ත*, ගම්පහ: සංඛ ප්‍රකාශකයෝ.

අන්තර්ජාල මූලාශ්‍ර

ගම්මන්පිල, යූ. (2014). In *Facebook*[Fan Page]. නොවැම්බර් 18, 2017, පිවිසීම https://www.facebook.com/UdayaGammanpilaFanPage/videos/10152984642089253/

පද්මකුමාර, බී. (2015). *Facebook*[Fan Page]. නොවැම්බර් 28, 2017, පිවිසීම https://www.facebook.com/photo.php?fbid=10152952838912259&set=pb.811447258.2207520000.1507346090.&type=3&theater

සයිටම් විරෝධී සිසු ජන ව්‍යාපාරය. (2017). [Fan Page]. ඔක්තෝබර් 08, 2017, පිවිසීම https://www.facebook.com/AbolishSAITM/

රණවක. (2014), *Facebook*[Fan Page]. සැප්තැම්බර් 28, 2017, පිවිසීම https://www.facebook.com/PataliChampika/posts/1515442022070644

රාමනායක. (2014), *Facebook*[Fan Page]. දෙසැම්බර් 14, 2014, පිවිසීම https://www.facebook.com/pg/real.rr/videos/?ref=page_internal

හසන්ත ආර්. (2015), *Facebook*[Group Page]. සැප්තැම්බර් 28, 2017, පිවිසීම https://www.facebook.com/randeni.hasantha/videos/871554199572961/

අචාර්ය ධර්මීය න්‍යායන් සහ නිර්දේශයන් විශ්වාසාධරණකරණීය විය යුතුයි

නාමලි කුමාරි හඳගම

අචාරධර්ම න්‍යායන් ගොඩනැගීම සහ නිර්දේශයන් සිදුකිරීම සාදාචාර දාර්ශනිකයන් විසින් සිදුකළ සුවිශේෂ දාර්ශනික කාර්යකි. පසුගිය සියවස් ගණනාවක සිට විවිධ දාර්ශනිකයන් විසින් ජීවිතයේ පැවැත්ම පිළිබඳවත් අර්ථය පිළිබඳවත් සිදුකළ විමර්ශයන් ඒ සඳහා පදනම් වී ඇත. නොයෙකුත් සමාජ, දේශපාලන, ආගමික සංස්කෘතික පසුබිම් තුළ ගොඩනැගී සංවර්ධනය වී ඇති මෙම න්‍යායන් සහ නිර්දේශයන් අචාරධර්ඹීය විනිශ්චයන් සිදුකිරීමේදී පදනම ලෙස භාවිත කෙරේ. එසේ භාවිත කරන න්‍යායන් අතර ජී. ඊ. මුවර් (G. E. Moore 1873-1958) හඳුන්වාදෙන ලද ප්‍රතිභානවාදය (Intuitionism), ඒ ජේ. එයර් (A.J. Ayer 1919-1989) විසින් හඳුන්වා දෙන ලද චිත්තවේගවාදය (Emotivism), ජෙරමි බෙන්තම් (Jeremy Benthom 1848 - 1832) සහ ජේ. එස්. මිල්. (J. S. Mill 1806-1873) විසින් හඳුන්වාදෙන ලද උපයෝගීතාවාදය (Utilitarianism), ඉමානුවෙල් කාන්ට් (Immanuel Kant 1724-1804) විසින් හඳුන්වාදෙන ලද යුක්ත්‍යාත්මාවාදය (Deontological Theory), ආර්. එම් හෙයර් (R. M. Hare 1919 - 2002), විසින් හඳුන්වාදෙන ලද විධනාවාදය (Prescriptivism) සහ ආර්. බී. පේරී (R. B. Perry 1876-1959) විසින් හඳුන්වාදෙන ලද ස්භාවවාදය (Naturalism) විශේෂයෙන් සඳහන් කළ හැකිය.

මෙම න්‍යායන් සහ නිර්දේශයන් ගොඩගැනීමේදීත් ඒවා පදනම් කරගෙන විනිශ්චයන් සිදුකිරීමේදී අප ප්‍රධාන වශයෙන් සැලකිලිමත් විය යුත්තේ මිනිසා සහ මිනිස් සමාජය පිළිබඳව බව දාර්ශනික පිළිගැනීමකි. එනම් එම න්‍යායන් සහ නිර්දේශයන් මිනිසුන්ට පිළිගත හැකිද? ඒවා මිනිසාට සහ මිනිස් සමාජයට හිත සුව පිණිස වේද, අහිතකර බලපෑමක් වේ ද යන්න පිළිබඳව සදාචාර දාර්ශනිකයන්ගේ අවධානය යොමුව ඇත. ඒ නිසා අචාර ධර්මීය න්‍යායන් සහ නිර්දේශයන් ගොඩනැගීමේදී සැලකිලිමත් විය යුතු වැදගත්ම කරුණක් ලෙස එම න්‍යායෙන් හෝ නිර්දේශයන් විශ්වසාධාරණීයකරණයට (Universalisable) ලක් කළ හැකි නිර්දේශයන් හෝ න්‍යායන් විය යුතු වීම යන්න එසේ විමර්ශයනක් සිදුකළ

දාර්ශනිකයන් ගොඩනගාගත් ප්‍රබල මතයකි. එනම්, තමා පනවා ගන්නා නියමය අවස්ථාවාදී හෝ අත්තනෝමතික තීරණයක් නොම වීමයි. විශේෂයෙන්ම එම නියමය හෝ නිර්දේශය පොදුවේ සාධාරණීයකරණයට ලක් කළ හැකි වීමත්, සෑම සමාන අවස්ථාවකදී ම තමා ද ඊට අවනත වීමට බැඳී සිටීමත් යන්න මෙහිදී අවධාරණය කෙරේ.

මෙම කරුණ පිළිබඳ විශේෂයෙන්ම සැලකිළිමත් වූ සදාචාර දාර්ශනිකයෙක් ලෙස ආර්. එම්. හෙයාර් (R. M. Hare 1919-2002) සඳහන් කළ හැකිය. සමකාලීන සදාචාර දාර්ශනිකයෙකු ලෙස පිළිගන්නා ආර්. එම්. හෙයාර් විසින් රචනා කරන්නට යෙදුන සාදාචාරයේ භාෂාව The Language of Morals – 1952) සහ නිදහස සහ බුද්ධිමය තර්කණය, (Freedom and Reason - 1963) යන කෘතීන්හි අවධාරණය කරන පදිරි අචාරධර්මීය ප්‍රකාශනයන් යනු විධානයන් හෝ නිර්දේශයන් ය. මේ නිසාම ඔහු විසින් ඉදිරිපත් කළ සදාචාර න්‍යාය නිර්දේශාත්මකවාදය හෙවත් විධානවාදය (Prescriptivism) ලෙසින් ප්‍රකටව ඇත. මේ සම්බන්ධව කරුණු දක්වන හෙයාර්

"සදාචාරාත්මක ප්‍රකාශනයක් යුන සුවිශේෂි ක්‍රියාදාමයක් නිර්දේශ කිරීමකි. සදාචාරාත්මක ක්‍රියාදාමයක් යම් හැඟීමක් ප්‍රකාශ කිරීමට සීමා වූවක් නොව කළ යුතු යමක් නිර්දේශ කිරීමකි."..... යනුවෙන් දක්වයි.

(Moral statement is to prescribe a particular course of action, Moral statement is prescribing a course of action, recommending that something should be done, not just expressing a feeling)

R. M. Hare

(The Language of Morals 1952)

මෙසේ නිර්දේශාත්මක වාදය හෙවත් විධානවාදය ඉදිරිපත් කරමින් ආර්.එම්. හෙයාර් අවධාරණය කරන පරිදි අචාර ධර්ම ක්ෂේත්‍රයේ කෙරෙන නිර්දේශයන්ට විධානයන්ට අයත් වැදගත් තාර්කික ලක්ෂණයකි. ඒවා විශ්ව සාධාරරණකරණයට (Universalizable) ලක්කල හැකි වීම. එමගින් ඔහු අපේක්ෂා කර ඇත්තේ සදාචාර නිර්දේශ සිදුකිරීමේදී පුද්ගලයින් අන්තගාමී නොවීම සහ අසාධාරණ තීරණවලට නිර්දේශවලට එළඹීම වැලැක්වීම විය හැකිය. හෙයාර් අදහස් කළ

විශ්වසාධාරණකරණීය නිර්දේශයෙන් ගම්‍ය වන්නේ යම් තත්ත්වයක් යටතේ ආචාර ධර්ම විනිශ්යන් හෝ නිර්දේශයකි කිරීමෙන් නිර්දේශ කරන්නා ඇතුළු සියළු බුද්ධිමත් සත්ත්වයින් ඊට සමාන තත්ත්වයන් යටතේ ඒ විධානයට අනුව කටයුතු කළ යුතු බව ය. ඊට යටත් විය යුතු බව ය. එනම්,

"ඔබ මේ දෙය කළ යුතුමය යනු විශ්වීය නිර්දේශයකි. (සත්‍ය කියමනක නොවේය.) මෙහි අදහස නම් එක හා සමාන අවස්ථාවන්හිදී එය කරන්න. එසේම අන් සියල්ලට ද එසේ කිරීමට ඉඩ දෙන්න"

"You ought to do this "is universalizable prescribtion, (not truth claim) it means "Do this and let everyone do the same in similar cases"

R.M. Hare

(The Language of Morals 1952)

මෙබඳු ගම්‍යතාවන් බොහෝ දුරට අචාර ධර්ම නිර්දේශ වල ඇත. එහි එන නිර්දේශයන්, විධානයන්, බලසම්පන්න කෙනෙක් තමන්ට අවශ්‍ය කාර්යය තව කෙනෙකු ලවා ඉටුකරවා ගැනීමට කරන ආඥවකට විධානයකට සමාන නැත. විශේෂයෙන්ම ආචාරාත්මක විධානයකින් ආචාරාත්මක නොවන විධානයන් වෙනස් ය. එසේ වන්නේ ආචාරත්මක සන්දර්භයක කෙරෙන විධාන නිර්දේශ විශ්ව සාධාරණකරණීය විධානයක් වන නිසා ය.

නිදසුනක් ලෙස,

දොර වසන්න - සේවකයෙකුට දෙන විධානයක්, එය විශේෂ අවස්ථාවකට පමණක් සීමා වේ.

වෙඩි තබන්න - යුධ සේනාංකයක් හෝ එවැනි විශේෂ අවස්ථාවකට සීමා වේ.

බොරු කීමෙන් වලකින්න - ඕනෑම අවස්ථාවකට, යහපත් සමාජ පැවැත්මකට අදාළය. (එබඳු විනිශ්චයන් අචාරධර්මීය විනිශ්චයන් ය.)

මෙබඳු විනිශ්චයන් විශ්ව සාධාරණකරණීය විනිශ්චයන් ය. විශේෂයෙන් ඉහත ආකාරයේ සෙන්පතියකු සොල්දාදුවන්ට වෙඩි තැබීමට දෙන අණක්, ස්වාමියා සේවකයෙකුට දොර වැසීමට දෙන අණක්, කෙනෙකු තවත් කෙනෙකු ලවා යම් කාර්යයක් ඉටුකරගැනීමට කරන ඉල්ලීමකට හෝ අඥාවකට සමාන ය. එවන්

නිර්දේශයකදී අදාළ නිර්දේශය හෝ විධානය නිකුත් කරන්නා එම කාර්ය ඉටුකිරීමට බැඳී නැත. ආඥාව හෝ නිර්දේශය සිදුකරන්නාට අදාල ස්ථානයේම සිට හෝ වෙනත් ස්ථානයක සිට හෝ එම නිර්දේශය නිකුත් කළ හැකිය. නමුත් ඔහු හෝ ඇය එම නිර්දේශයට යටත් වන්නේ නැත.

නිදසුනක් ලෙස, යුධ සේනාංකාධිපතියෙකු කිසියම් යුධ කදවුරක හෝ ආරක්ෂිත ස්ථානයක සිටිමින් සතුරු යුධ කදවුරක් වටලාගෙන සිටින සෙබල පිරිසකට, මෙහෙයුම් ආරම්භ කිරීමට, වෙඩි තැබීමටදෙන අණක්, විධානයක් එවැනි විධානයකි.

නමුත් විශ්ව සාධාරණකරණීය සදාචාර නිර්දේශයන්ට විධානයන්ට අනුව එම නිර්දේශය නිකුත් කරන්නා ද අදාල නිර්දේශය පිළිපැදීමට, ඉටුකිරීමටඅනිවාර්යෙන් බැඳී සිටී. බොරු නොකිය යුතු බවට අප නිර්දේශ කරයි නම් එම නිර්දේශයට අප ද අවනත විය යුතුය. අප ද බොරු කීමෙන් වැළකී සිටිය යුතුය.

"මා යමක් කළ යුතු නම් වෙනත් අයෙකුද එබඳුම අවස්ථාවකදී පෙරලා මා හට ද එලෙසම එය කළ යුතුයි. එනම් සමාන වාතාවරණයකදී අවස්ථාවකදී, වෙනත් අයෙක් පෙරළා මා හටද එසේ කිරීම නිර්දේශ කිරීමට මම (තමා) සූදානම්ද"

("If I ought to do this, then somebody else ought to do it to me in precisely similar circumstances, so I have to ask myself, am I prepared to prescribe that somebody else should do it to me in like circumstances")

R. M. Hare

(Men of Ideas, 1978)

සදාචාර දාර්ශනිකයන් සඳහන් කරන පරිදි ආචාරධර්ම හා සම්බන්ධ නිර්දේශයන් සිදුකිරීමේදී අප සැලකිලිමත්විය යුතු වැදගත්ම කරුණ වන්නේ මෙයයි. එනම් අප කරන සදාචාර නිර්දේශයට පනවන විධානයට සමාන තත්වයන් හා සීමාවන් යටතේ මා මෙන්ම සියළු බුද්ධිමත් මිනිසුන්ට අවනත වියහැකි විය යුතු වීමය. ඊට අනුකූලව කටයුතු කළහැකි විය යුතු වීමය.

විශේෂයෙන්ම ආර්. එම්. හෙයාර් පෙන්වා දෙන පරිදි ආචාරධර්ම ක්ෂේත්‍රයේ එකඟතාවන් වූකලී සමාන රුචිකම් මානසික නැඹුරුකම් ඇති මිනිස් වර්ගයා අතර

ඇතිවන්නකි. යම් නියමයක් නිර්දේශයක් පනවාගන්නා විට නිකුත්කරන විට එය ඉටු කිරීමට තමාද බැඳී සිටින නිසා තමාටද එකඟවිය හැකි ඉටුකළ හැකි නිර්දේශයන් නියමයන් පනවා ගන්නට අප ප්‍රවේශම් වීම ස්වභායයෙන්ම සිදුවන්නකි. නමුත් මිළ මුදලින් සම්පූර්ණව සතුටින් සිටින අවස්ථාවක කරන නියමයන් මුදල් හිඟකමින් අසරණ පීඩාවෙන් සිටින විට කරන නිර්දේශයන්ගෙන් වෙනස් විය හැකිය. මා කිසියම් නියමයක් පිළිගත යුත්තේ ජීවන ප්‍රතිපත්තියක් ලෙසය. (Principle of living) එනිසාම සියල්ලෝම අනුමත කරන මාද අනුමත කරන අවශ්‍ය විටක එය ඉටු කිරීමට බැඳි සිටින ප්‍රතිපත්ති මා තෝරාගත යුතුය. එසේම එම ප්‍රතිපත්තියේ නිර්දේශයේ ප්‍රතිඵල අන්අයට බලපාන අයුරින් මටද බලපාන බවත් එවන් බලපෑමක් සිදුවුව හොත් මා ඊට අවනත වන බවත් ඊට යටත් වන බවත් තීරණය කළ යුතුය. ඉහත එක ඉහත එකඟතාවන්ට යටත් නොවුනහොත් සදාචාර ජීවිතයේදී නිර්දේශයන් පැනවීමෙන් මා වැලකී සිටිය යුතුය. එවන් විධානයන් අනුමත නොකළ යුතුය. විශේෂයෙන්ම සදාචාර නිර්දේශයන් සිදුකිරීමේදී අන් පුද්ගලයින්ගේ පසුබිමින්ද ඒ දෙස බැලිය යුතුය යන්න මෙහිදී අපේක්ෂා කෙරේ. පොදු දෘෂ්ඨියකින් අදාල නිර්දේශය දෙස බැලීම යන්න මෙහිදී අවධාරණය කරන්නකි. විශේෂයෙන්ම ස්වභාවික විද්‍යා ක්ෂේත්‍රයේ විද්‍යාත්මක උපන්‍යාසය ගොඩනැගීමකට මෙය සමානය.

නිදසුන් ලෙස,

> උපන්‍යාසය සත්‍ය වේනම්, අනාවැකි සත්‍ය වේ.
> අනුභූතිමය කරුණු අනුව අනාවැකිය සත්‍ය වේ.
> එම නිසා උපන්‍යාසය සත්‍ය වේ, යැයි පිළිගත හැකිය.

සදාචාර දර්ශන ක්ෂත්‍රයේ පිළිගත යුත්තේද මෙයයි. අප පනවාගන්නා ආචාරධර්ම ප්‍රතිපත්තිය එළඹෙන නිර්දේශය අන්‍ය මිනිස් හැඟීම් ගැන අවබෝධයකින් යුත්කව ඒ ගැන සලකා බැලීමෙන් අනුරුව අපටත් පිලිගත හැකිනම් පමණක් එය සදාචාරාත්මක ප්‍රතිපත්තියක් ලෙස අනුමත කළ යුතුය.

සදාචාර දර්ශන ක්ෂේත්‍රයේ තවත් සුවිශේෂ මතවාදයක් වූ යුත්ත්‍යාත්මවාදය (Deontological theory) හෙවත් යුතුකම උදෙසා "යුතුකම ඉටුකිරීමෙන් සදාචාරය උපදී" යන අදහස ඉදිරිපත් කළ ඉමැනුවෙල් කාන්ට් (Immanuel Kant 1724-1804) විසින් ඉදිරිපත් කළ අදහස් මූලික වශයෙන් අඩංගු වන්නේ ශුද්ධ විචාරයේ පරීක්ෂාව (Critique of pure reason-1785) නම් ඔහුගේ දාර්ශනික කෘතිය තුළය. නමුත් ඔහුගේ සදාචාර සංකල්පනාවන් පිළිබඳ සවිස්තරාත්මක කරුණු අන්තර්ගත වන්නේ

ප්‍රායෝගික විචාරයේ පරීක්ෂාව (Critique of practical reason-1785) සහ සදාචාරය පිළිබඳ පාරභෞතික විද්‍යාවේ පදනම - හෙවත් මූලධර්ම (Ground work or) තුළය. ඉමෑනුවෙල් කාන්ට්ගේ සදාචාර විග්‍රහයන් තුළින් මතුකරන්නට උත්සහ කර ඇත්තේ සදාචාරය මුල් කරගත් ප්‍රායෝගික ජීවිතයක් පිළිබඳ අදහසකි. විශේෂයෙන් සදාචාරය පිළිබඳ පාරභෞතික විද්‍යාවේ පදනම කෘතියේ සඳහන් පරිදි,

"යහපත් අධිෂ්ඨානයක් නැතහොත් පවිත්‍ර චේතනාවක් හා සමාන නිරූපාධික යහපතක් මුළු ලොවෙහි හෝ ඉන් පිටත හෝ නැත."

(Nothing can possibly be conceived in the world or even out of it, which can be called good without qualification except a good will.....)

Immanuel Kant

(Ground work or fundamental Pricipal of Metaphysics of Morals)

සදාචාරය උපදින්නේත්, ආරක්ෂාවන්නේත් යහපත් චේතනාවෙන් යුතුව අප ක්‍රියාකරන්නේ නම් පමණි, වැනි අදහසක් මෙයින් ගම්‍ය වන බව කිව හැකිය. බුදු සමයේ ඉගැන්වෙන "අපගේ චේතනාවම කර්මය වේය" යන අදහසට සමාන " යුතුකම ඉටුකිරීමට ඇතිකරගන්නා අධිෂ්ඨානයම යහපත් වේ." යන (For the sake of the duty) අදහස මෙහි සුවිශේෂී වේ. කාන්ට්ගේ සදාචාර දර්ශනයේ මතුකෙරෙන විශ්වසාධාරණ ස්වරූපය "හැසිරීම පිළිබඳ දැක්විය හැකි ප්‍රතිපත්ති කෙසේ විය යුතු ද? තමන්ගේ හැසිරීම පිළිබඳ යුක්ත්‍යාත්මවාදී ප්‍රතිපත්තිය සදාචාරය ලෙස පිළිගන්නා කෙනෙකුට එය අන් සෑම කෙනෙකු විසිනුත් හැසිරීම පිළිබඳ ප්‍රතිපත්තිය බවට පත්කරගෙන ඒ අනුව ක්‍රියා කළ යුතුය" වැනි අදහස්වලින් වැඩිදුරටත් තහවුරු වේ.

කාන්ට් මෙහිදී අවධාරණය කර තිබුණේ සදාචාරාත්මක ක්‍රියාවන් කරන විට එහි ප්‍රතිඵලය ගැන නොසලකා කටයුතු කළ යුතු බවයි. විශේෂයෙන්ම අන් අයද තමා මෙන්ම සලකා ක්‍රියා කිරීම දෙහිදී වැදගත් ය. සදාචාරය උපදින්නේ ද එවිට ය. කාන්ට්යානු සදාචාර දර්ශනයේ පදනම දරා සිටින යුතුකම උදෙසා යුතුකම ඉටුකරන්න යන සුවිශේෂ ප්‍රස්තුතය තේමා කරගනිමින් ඒ ඔස්සේ ගම්‍ය කරගත් තවත් උප ප්‍රමේයන් තුනක් සලකා බැලීම මගින් ඔහුගේ එම අදහස තව දුරටත් තයවුරු වන ආකාරය පැහැදිලි කරගත හැකිය. එනම්,

I. සර්ව සාධාරණත්වය නැමති අප්තය යටතේ පමණක් ක්‍රියා කිරීම තමා විශේෂයක් කර නොගැනීම.

(Act only on a maxim through which you can at the same time will that it should become a universal law.)

II. මනුෂ්‍ය වර්ගයා නිෂ්ඨාවක් වශයෙන් මිස උපාය මාර්ගයක් වශයෙන් භාවිතා නොකිරීම, විශේෂයෙන්හ බාහිරව වෙනස්කම් ඇතත් අධ්‍යාත්මිකව සමාන මිනිසා වහලෙකු හෝ වෙළඳ භාණ්ඩයක් නොවිය යුතු ය.

(So act as to treat humanity whether in your own person or in that of any other never as means only, but in every case an end also)

III. යහපත් අධිෂ්ඨානය පමණක් අගය කළ යුතු වීම. අධිෂ්ඨානයේ ස්වාධීනත්වය ගරු කළ කාන්ට් යහපත් අධිෂ්ඨානයට මුල්තැනක් දී කටයුතු කිරීම සදාචාර ජීවිතයේ වැදගත් අංගයක් සේ සළකයි.

(So act that the maxim of your will could always at the same time be valid as a principle making universal law.)

කාන්ට් විසින් ඔහුගේ සදාචාරය පිළිබඳ පාරභෞතික විද්‍යාවේ පදනම හෙවත් මූලධර්ම කෘතියේ මෙවන් අදහස් දැක්වීමක් කර ඇති බව එෆ්. කොපල්ස්ටන් නම් දාර්ශනික විචාරකයා තම දර්ශනයේ ඉතිහාසය (History of Philosophy -1960) කෘතියේ සඳහන් කර ඇත. මෙවන් පැහැදිළි කිරීමක් තුළින් කාන්ට් අවධාරණය කරන්නට උත්සාහ ගෙන ඇත්තේ අප කිසියම් සාදාචාර නියමයකට අවනත වේ නම් "කොන්දේසි විරහිතව" ඊට අවනත විය යුතු බවය. එනම්, මා පනවා ගන්නා නියමයට මා සැබවින්ම යටත්විය යුතුය. අප මුහුණ දෙන නොයෙකුත් අවශ්‍යතාවන් හා තත්ත්වයන් යටතේ අදාල නියමයට එකඟ නොවී සිටීමට ඉල්ලීම් නොකළ යුතුය. කිසියම් සාදාචාරවේදියෙකු මනුෂ්‍ය ඝාතනය බරපතල වරදක් බව තීරණය කරමින් එවන් ඝාතනයක් සිදුකළ අයෙකුට මරණ දඬුවම් දිය යුතු යැයි නිර්දේශ කරයි නම්, යම් කිසි අවස්ථාවක තමාට එවන් සිදුවීමකට මුහුණ දීමට සිදු වූ විටක හෝ තම ඥාතියෙකු, හිතවතෙකු එවන් වරදකට හසු වූ විට ද, අදාල වරදකරුට මරණ අඬුවම් දීමට අප එකඟ විය යුතුය. තම බැඳීම් හෝ හිතවත්කම් පදනම් කරගෙන තමා පනවා ගත් සදාචාර නියමය හෝ නිර්දේශය ලිහිල් කිරීමට හෝ වෙනස් කිරීමට (මරණ දඬුවම) උත්සාහ නොකළ යුතුය. ඉමැනුවෙල් කාන්ට් පැහැදිළි කරන පරිදි අප පනවා

ගන්නා අචාර ධර්මීය නියමයන් නිරුපාධිත නියමයන් ය. (Categorigical Imperative), සදාචාරය පිළිබඳ අපේ චේතනාවට මූලාධාර වන ස්වසිද්ධාන්තය සර්වත්‍රික නියමයට (Universality) අනුකූල විය යුතු බව ඉන් පිළිගැනේ.

මේ ආකාරයට සාදාචර න්‍යායන් සහ නිර්දේශයන් පනවා ගැනීමේදී අප සර්වසාධාරණ විය යුතුය යන මතවාදය ඉදිරිපත් කිරීමෙන් ඉහත දාර්ශනිකයින් අවධාරණය කිරීමට අත්සාහ ගෙන ඇත්තේ කිසිදු අවස්ථාවක තමා විශේෂයක් කොට ක්‍රියා කිරීමෙන් වලකින ලෙස ය. අප සමාජයේ සිදුවන බොහෝ අසාධාරණ ක්‍රියා වලට මෙන්ම වැරදි ක්‍රියාවලට හේතුවක් වී ඇත්තේ තමා විශේෂ කොට සැලකීම මිනිසාගේ සාමාන්‍යය පුරුද්දක් වී ඇති නිසා ය. තමා ගැන පමණක් සිතීමට පුරුදු වීම නිසාම මිනිසා අත්තනෝමතිකව ක්‍රියා කිරීමට පෙළඹී ඇත. විශේෂයෙන්ම තමා අතින් වරදක් සිදුවන බව පිළිගැනීම හෝ අන්‍යයන්ට තමා නිසා හානියක් සිදුවන බව අවබෝධ කර ගැනීමට හෝ ඒ පිළිබඳ සිත යොමුකිරීමට මිනිසා අසමත්ව ඇත. එසේම අන්‍යයන් අතින් සිදුවන සුළු හෝ වරදක් විශාල කොට දකින මිනිසා ඊට එරෙහිව ක්‍රියා කිරීමට ද පෙළඹේ. නමුත් තමා අතින් සිදුවන හානිය හෝ වරද පිළිගැනීමට හෝ එය අවම කරගැනීමට හෝ අත්සහ නොගැනීම ද සිදුවන්නකි. මේ සියළු කාරණා නියාම සදාචාර දර්ශනිකයින් තමා විශේෂයක් කොට නොගැනීම යන්නට වැඩි අවධානයක් යොමුකර ඇත. ඒ නිසාම අපගේ පැවැත්ම සඳහා ආචාරධර්ඹීය නියමයන් පනවා ගැනීමේදීත් නිර්දේශයන් සිදුකිරීමේ දී ත් අප අන් අය ද තමාගේම තත්ත්වයේ තබා සැලමිය යුතු බව අවධාරණය කරන විශ්වසාධාරණ නියමයන් පනවා ගැනීම සුදුසු බව ඉහත දාර්ශනික මතවාදයන් ඇසුරින් තීර්ණය කළ හැකිය.

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

1. Ayer, A.J. Language, Truth and Logic, Vitor Gollannz Ltd, London, 1936.
2. Broad, C.D., Ethics and the History of Philosophy: Selected Essays, 1952.
3. Broad, C.D., Five Types of Ethical Theory, Kegan Paul, 1950.
4. Copleston, F., History of Philosophy, Paulist Press, U.S.A, 1958.
5. Frankena, W.K., Ethics, prentice Hall, U.S.A.1963.
6. Fromm Erich: Man for Himself, An Inquiry into the Psychology of Ethic, New York, 1990.
7. Hare, R.M., Freedom and Reason, Oxford University Press, 1963.
8. Hare, R.M., The Language of Moral, Oxford University Press, 1952.
9. Kilby Richard, The Study of Human Values, University press of America, 1993.
10. Moor, G.E., Principia Ethica, Cambridge University Press, 1903.
11. Stevenson, C.L., Facts and Values: Studies in Ethical Analysis, Praeger 1975.
12. Thompson, M., An Introduction to Philosophy & Ethics, Hodder Education, London, 2003.
13. Thompson, M., Ethical Theory, Hodder Education, London, 2008.
14. බ්‍රෝඩ්, සී. ඩී. ආචාර ධර්මයේ පංචවිධ ප්‍රභේද, කොළඹ; රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව 1966.
15. මැකන්සි, ජේ. එස්., ආචාර ධර්මයේ අත්පොත, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 1969.
16. ප්‍රේමසිරිල පී. ඩී., අචාර විද්‍යාවල චතුර මුද්‍රණාලයල වැල්ලම්පිටියල 1988.

ගල්ඔය සංවර්ධන යෝජනා ක්‍රමයේ ආරම්භය හා ජනපද ව්‍යාප්තිය

ආර්.කේ.එම්. ට්‍රිලිෂියා ඉන්ද්‍රාණි

ගල්ඔය නිමින සංවර්ධන ව්‍යාපාරයෙහි මූලාරම්භක අවස්ථාව පිළිබඳව අධ්‍යයනය කරන විට ක්‍රි.ව 1930 දී එවකට මඩකලපුව කොට්ඨාසයේ වාරිමාර්ග ඉංජිනේරු වශයෙන් සේවය කළ ජේ.එස් කෙනඩිගේ නම මුලින්ම සිහිපත් වේ. ඔහු ඉගිනියාගල කඳු මුදුනෙහි වාඩි වී පට්ටිපොළ ආරු ප්‍රදේශය දෙස බලාගෙන සිටින විට ඔහුගේ මනසෙහි ඇදි ගිය සිතුවමක් මල්ඵල ගැන්වීමක් ලෙස මෙම කාර්යය ඇරඹී බව ගෞරවයෙන් සිහිපත් කළ යුතුයි. (සේනානායක, රුක්මන්, 1999, පිටුව 1) වාරිමාර්ග අධ්‍යක්ෂක වශයෙන් ක්‍රි.ව 1935-1939 දක්වා කාලය තුළ සේවය කළ බ්‍රිතාන්‍ය ජාතික ජේ.එස් කෙනඩි තම හදවතේ ඇදී ගිය සිතුවිලි එවකට කෘෂිකර්ම ඇමති පදවිය දැරූ ඩී.එස් සේනානායකට ඉදිරිපත් කර තිබේ. එය මෙසේය,

> *"මම දින ගණනක් තිස්සේ වන ලැහැබ මැදින් ගමන් කොට මෙහි පැමිණියෙමි..... ඉගිනියාගල ගල් පොත්ත මත නැඟී සිටින මට අනාගතයේ දී වැව් බැම්ම ඉදි කළ හැකි ස්ථානයක් දිස්විණ. යම් හෙයකින් එවැනි දෙයක් සිදු වුවහොත් ඉදිරිකාලය තුළ ඇති විය හැකි රජයකින් මා ඉල්ලා සිටින්නේ එම කාරණයට අදාළ ප්‍රශ්න මානුෂික දෘෂ්ටිකෝණයකින් ආලෝකනය කරන ලෙසටය. මෙහි ඉදිරියෙන් පෙනෙන පට්ටිපොළ ආරු යෝජනා ක්‍රමයෙහි පහළ අඩවියට අයත් ගැමියන් දහඩිය වගුරවමින් ගොවිතැනෙහි යෙදෙන්නේ අර්ධ වහල් තත්ත්වයක ජීවත් වීමට ඔවුන් විසින් කරනු ලබන දුක්බර සේවාවන්ට වන්දි වශයෙන් ඔවුන්ට ලැබෙන්නේ ජීවිතය ගැට ගසා ගැනීමට ප්‍රමාණවත් වන සුලු ආදායමකි." (සේනානායක, රුක්මන්, 1999, පිටුව 1)*

කෙනඩි විසින් යෝජනා කරන ලද ක්‍රමය හරහා ඉටු කර ගත හැකි අරමුණු හා පරමාර්ථ කිහිපයක් ද පෙන්වා දී තිබේ. (Farmer, B.H. 1957, Page 152)

1. රටේ අවශ්‍යතාවය උදෙසා විශාල වශයෙන් වී නිෂ්පාදනය සඳහා ඉඩම් සකස් කර දී ජලය හසුරුවා දිය හැකි බව.
2. වර්ෂයක් පාසා සිදුවන ජල ගැලීම් නිසා සිදුවන විනාශය අවම කළ හැකි බව.
3. දේශීය අමුද්‍රව්‍ය යොදා ගනිමින් කර්මාන්ත ආරම්භ කළ හැකි වීම.

කෙනඩි විසින් ඉදිරිපත් කරන ලද ගල් ඔය සංවර්ධන ව්‍යාපාරය පිළිබඳ වූ යෝජනාව ක්‍රියාවට නංවමින් 1949 ජනවාරි මාසයේ දී ආරම්භ කළ ගල් ඔය

බහුකාර්ය සංවර්ධන ව්‍යාපාරයේ පුරෝගාමියා ලෙස ක්‍රියාකරන ලද්දේ නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රථම අගමැතිවරයා වූ ගරු ඩී.එස් සේනානායකය.

ජේ.එස් කෙනඩි විසින් ගල් ඔය සංවර්ධන ව්‍යාපාරය පිළිබඳ ඉදිරිපත් කළ යෝජනාව ක්‍රි.ව 1942 වර්ෂයේ දී ඩී.එස් සේනානායක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට ගල් ඔය සංවර්ධන පනත වශයෙන් සම්මත කර ගැනීම නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රථම බහුකාර්ය සංවර්ධන ව්‍යාපාරයේ ආරම්භය සනිටුහන් කරයි. (Administration Report,1951, p 209) මෙම යොජනා ක්‍රමය තුළින් පැරණි වාරිමාර්ග පද්ධතියට පුනර්ජීවනයක් ලබා දීමට මෙන්ම මේ යටතේ විශාල ඉඩම් ප්‍රමාණයක් අස්වැද්දිය හැකි විශාල යෝජනා ක්‍රමයක පහළ වීම පිළිබඳ සතුට පළ කළ වාරිමාර්ග දෙපාර්තමේන්තුව ගල්ඔය ව්‍යාපාරය පිළිබඳ ජල මිනුම්, භූ විමර්ශණ, මැනීම් කටයුතු හා ඒ පිළිබඳ යෝග්‍යතා සමීක්ෂණ ආදිය සමඟින් සැලසුම් සකස් කිරීමෙහි ලා උනන්දු වී ඇත. මෙහි මිනුම් කටයුතුවල දී මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ද, පස් සමීක්ෂණවල දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ද, වේල්ල පිළිබඳ පරීක්ෂණවල දී භූ විද්‍යා දෙපාර්තමේන්තුවේ ද සහයෝගය ලැබී ඇත. තව ද මුල් සැකසුම් සකස් කරමින් තිබිය දී ලංකාවට පැමිණ ඇති බහුකාර්ය යෝජනා සඳහා විශාල වේලි ඉදි කිරීම් පිළිබඳව ජාත්‍යන්තර කීර්තියක් උසුලන ලද ආචාර්ය සැවේජ් නම් විශේෂඥයෙකුගේ උපදෙස් ලබා ගනිමින් සැලසුම් කටයුතු සම්පූර්ණ කළ බව සඳහන් වේ. (විශ්ව කෝෂය,1961,63)

විශේෂයෙන් වාරිමාර්ග, ජල විදුලිය, ජනාවාස, ගංවතුර පාලනය, මසුන් ඇති කිරීම, ජලාප්‍රවාහනය, යාත්‍රා කිරීම, පානීය ජලය, විනෝදාස්වාදය වැනි විවිධාංග අරමුණු කරගෙන යෝග්‍ය විශාල ජලාශයක් ඉඟිනියාගල ඉදිකොට එමඟින් ගල්ඔය නිම්නයේ අනාගත සංවර්ධනය මෙහෙයවීම මෙම බහුකාර්ය යෝජනා ක්‍රමයේ ප්‍රධාන අරමුණ වේ.

ඩී.එස්. සේනානායක විසින් ගනු ලැබූ ඉතා උත්කෘෂ්ට වැදගත් පියවරක් ලෙස 1949 ජනවාරි මාසයේ දී ආරම්භ කළා වූ ගල් ඔය බහුකාර්යය සංවර්ධන ව්‍යාපාරය යටතේ ජනපද පිහිටුවීම ඉතිහාසයේ අනබිබවනීය සන්ධිස්ථානයක් සනිටුහන් කරයි. 1949 නොවැම්බර් 24 වැනි දින සම්මත කළ ගල් ඔය සංවර්ධන මණ්ඩල පණතට අනුව මෙම සංවර්ධන ව්‍යාපාරය ආරම්භ කර ඇත්තේ ගල්ඔය අවට අක්කර දෙලක්ෂ පනස්දහසකට පමණ ආසන්න ප්‍රමාණයක සංවර්ධනය කිරීසෙම් මූලික

පරමාර්ථයෙනි. (Administration Report. 1951, p.209) ගල්ඔය නිම්නය ආශ්‍රිතව ජල සම්පාදන ව්‍යාපාර ආරම්භ කර කෘෂිකර්මාන්තය දියුණු කර ජනාවාස පිහිටුවීම ආරම්භය ක්‍රි.පූ. අවධියට දිවයයි. 19 වන ශතවර්ෂය පමණ වනවිට මෙම ප්‍රදේශය ආහ්‍රිතව පැවති වාරිමාර්ග පද්ධතිය පරිහානියට ගොස් තිබුණි. මේ ප්‍රදේශ ආශ්‍රිතව ක්‍රමානුකූල වූත් විධිමත් වූත් නවීන ජල සම්පාදන ක්‍රමයක් බිහිවන්නේ ගල්ඔය නිම්න සංවර්ධන යෝජනා ක්‍රමයේ ආරම්භයත් සමඟය. ඊට අනුව සේනානායක සමුද්‍රයේ ඉදිකිරීම් කටයුතු අවසන් වීමත් සමඟ ක්‍රි.ව 1950 වසරේ සිට ඒ ආශ්‍රිතව පිහිටුවන ලද ගොවිජනපදවල ජනතාව පදිංචි කිරීමේ කටයුතු අරඹා ඇත. (Brohier R.L. 1951, p.21)

ගල් ඔය සංවර්ධන ව්‍යාපාරය යටතේ ඉදිකරන ලද ගොවිජනපද වර්තමානයේ අම්පාර සහ මඩකලපු දිස්ත්‍රික්කයන්ට අයත් වේ. මෙම සංවර්ධන යෝජනා ක්‍රමය ආරම්භවීමට පෙර පැවති එම ප්‍රදේශයේ ඉතිහාසය පිළිබඳ විමසා බැලීමේ දී කරුණු රැසක් හමු වේ.

ගල් ඔයෙහි ශාඛාවන් මඟින් වෙල්ලස්ස ප්‍රදේශයේ ජනතාවට මහඟු කාර්යයක් ඉෂ්ඨ කරනු ලැබේ. ඊතණවත්ත තානායම් ගම ප්‍රදේශයේ දී ගල් ඔය කුඩා ඇළක් බඳු දියපාරක් ලෙස ආරම්භ වී ඉන් ඉහළ ප්‍රදේශවල දී මෙහි ජලය වාරිමාර්ගවලට හරවනු ලැබේ. වෙල්ලස්සේ බොහෝ කුඹුරු තිබුණ ද වැව් විරලය. ගල් ඔයේ ශාඛාවන ඇළ දොළ ගංගාවලින් කෙලින් ම වාරිමාර්ගවලට ජලය හරවා යවා ගොවිතැන් කටයුතු සිදුකරයි. ගල් ඔය ඉහළ අතුගංගා නිසා ම වෙල්ලස්ස ජනාකීර්ණ වූයේ ය. ක්‍රි.පූ 3 වෙනි සියවසේ දී පමණ වැව් හා වාර්මාර්ග තැනීම ඇරඹී තිබේ. එකල මෙම ප්‍රදේශය දිසාමඩුල්ල යන නමින් හැඳින් වී ඇත. මේ ප්‍රදේශය කෘෂිකාර්මික ප්‍රදේශයකි. එසේ ම මුල් ආර්යයන් විසින් ජනපද පිහිට වූ ප්‍රධාන ප්‍රදේශ අතරට ගල් ඔය නිම්නයේ දීඝවාපිය ද ඇතුළත් ය. (මහවංශය,99) එසේ ම දීඝායු ග්‍රාමය ගල් ඔය ගංඟා නිම්නයේ පිහිටි ජනපදයක් වේ.

පසු කලෙක ලන්දේසි සමයේ ද මෙම ප්‍රදේශය ප්‍රතිසංස්කරණය කරන ලදී. ලන්දේසි අවධියේ සිටි බර්තොන්ඩි විසින් වැවක් අළුත්වැඩියා කොට තිබූ බව සඳහන්විය. (බ්‍රෝහියර්,2001:55) එමෙන් ම බ්‍රිතාන්‍ය යුගයේ දී ඉරක්කට්ටම් වැවේ ප්‍රතිසංස්කරණ කටයුතු නිම කර තිබේ. බ්‍රිතාන්‍ය යුගයේ සර් හෙන්රි වෝඩ්, උප

ඒජන්ත ධූරය දැරූ ජේ. වුඩ්ගාර්ඩ් සහ සර්වෙයර් ජෙනරාල් ධූරන්දර, කැප්ටන් ගොසට් යන්නන් ප්‍රතිසංස්කරණ සම්බන්ධව උනන්දුව මැනවින් පැහැදිළිව පෙනේ.

මෙම මිටියාවතේ දර්ශනීය බව මැනවින් දුටු 1857 දී ආණ්ඩුකාරතුමා, ගල් ඔය මඟ දිගේ, බිබිල සහ නිල්ගල මැදින් යන අතුරු පාරකින් යනවිට ගංඟා මිටියාවත ඔහු දුටුවේ,

> *''රටට ආලයක් ඉපදවීමට අවශ්‍ය ස්වභාව ධර්මය විසින් සිදු කළ යුතු සියලු දේම නොමසුරු හස්තයකින් විසුරුවා හරින ලද අති ප්‍රිය දර්ශනීය වූ කඳු මාලා, වනපෙත්, නදී, ස්වර මිටියාවත් සන කඳු මත්තෙහි සන සැරේට වැඩුණු තණ බිම්වලින් ද හෙබියා වූ උදාහන යයි කියනු ලබන රට කොටසක් වන හැතැප්ම 70ක් දුර පැතිර සිටි භූමියක් ලැබේ. '' (බ්‍රෝහියර්, 1995:55)*

යනුවෙනි. මේ ව්‍යාපාරයට ගල්ඔය පමණක් නොව එය ආසන්නයේ පිහිටි පන්නල් ඔය, පොතාන ඔය, අම්බලන්කුලම් හා රතුපස්කුලම් ආරුව වැනි කුඩා ගංඟාවල ජලය හා නිම්න ද ඒ ආශ්‍රිතව එවකට තනවා තිබූ වැව් හා වාරි මාර්ග ද ඇතුලත් විය. (විශ්ව කෝෂය,1961,337)

තවද පුරාණයේ ඉදිකළ වැව් හා අලුතින් ඉදිකරන ලද වැව් රාශියක් සේනානායක සමුද්‍රයට ඒකාබද්ධ කොට තිබේ. පුරාණයේ වැව් අතරට අලිගල්ගේ වැව, හිමිදුරාව වැව, ඉරක්කාමම් වැව, නාමල් ඔය වැව, කොණ්ඩවට්වානා වැව, වඩයම්තලාව වැව, වීරගොඩ වැව, වලකාපිටිය වැව අයත්ය. අලුතින් ඉදිකළ වැව් අතර පල්ලන්ඔය ජලාශය, ඉන්ගල්ආරු ජලාශය, ආලහේන වැව, මලයඩි වැව වේ. මෙම වැව් සියල්ල ඒකාබද්ධ කොට දැවැන්ත වාරි මාර්ග පද්ධතියක් ලෙස ගල්ඔය ආශ්‍රිතව මේ යෝජනා ක්‍රමය හඳුනාගත හැකිය. බ්‍රිතාන්‍ය යුගයේ සිටි සර් හෙන්රි වෝර්ඩ් පවා පෙන්වා දී ඇත්තේ මෙම ප්‍රදේශය වී ගොවිතැන සඳහා ඉතාමත් සරුසාර බවත් නොතකා හැරිය හැකි දිස්ත්‍රික්කයක් නොවන බවත් ය. (බ්‍රෝහියර්,1999:55)

සේනානායක සමුද්‍රය උතුරින් ආදල් ඔය, දකුණින් කෝමාරි තුඩුව බස්නාහිරට ගල් ඔය ජලධාරා ප්‍රදේශය හා නැගෙනහිරින් මුහුදින් ද වට වී තිබේ. මෙහි වේල්ලේ උතුරු කෙළවරින් ජල විදුලි බලාගාරය පිහිටුවා ඇත. ක්‍රි.ව. 1952 වන විට සිංහල ජනපද 25ක්, දමිළ මුස්ලිම් ජනපද 15ක්, මධ්‍යම පාංතිකයන් සඳහා ජනපද 02ක් ද ලෙස මුළු ජනපද 42ක් ගොඩනංවා ඇත. (අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංඛ්‍යා ලේඛනය, 1952)

මෙම ජනපදවලට ජනපදිකයන් තෝරා ගැනීමේ දී ප්‍රධාන ලෙස පවුලේ සිටින සාමාජිකයන් සංඛ්‍යාව, ඉඩම් නොමැතිකම, සේවා වියුක්තිය යන සාධකයන්ට ප්‍රධාන තැනක් දී ඇත. (Farmer,1957,45) මෙම නිර්ණායක පසු කලෙක වෙනස් වෙමින් වගාව පිළිබඳ පළපුරුදු ඇති ගොවියෙකු වීම, කුඩා පවුල් සහිත කෘෂිකාර්මික කටයුතු පිළිබඳ අධ්‍යාපන සුදුසුකම් ඇති අය, වී වගාව ගෙවතු වගාව හා සත්ත්ව පාලනය පිළිබඳ දැනීම උනන්දුව ඇති ඉල්ලුම්කරුවන්ට ප්‍රධාන තැනක් දී ඇත. (අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාල වාර්තා, 1952) විශේෂයෙන් බදුල්ල, පුත්තලම, හලාවත, ගාල්ල, හම්බන්තොට, කුරුණෑගල, කළුතර, කෑගල්ල, මහනුවර, නුවරඑළිය, රත්නපුර යන දිස්ත්‍රික්කවලින් තෝරාගත් ගොවිපවුල් පදිංචි කර ඇත.

වම් ඉවුරේ ජනපදවල මුලින්ම ජනයා පදිංචි කිරීමෙන් පසුව දකුණු ඉවුර සංවර්ධන කටයුතු ආරම්භ කර තිබේ. වම් ඉවුරේ පදිංචිකරුවන්ගෙන් යැපෙන්නන් හා දෙවන පරම්පරාවේ ජනතාව පදිංචි කරවන ලද අතර පහළ කොටස් ද්‍රවිඩ හා මුස්ලිම් ජනතාව පදංචි කර තිබේ. මෙසේ පදිංචි කළ එක් පවුලක් සඳහා ගොඩ ඉඩම් අක්කර දෙකක් සහ මඩ ඉඩම් අක්කර තුනක් ලබා දී ඇත. (Farmer,1957,154) පසුව වර්ෂ 1963 දී ලබාදුන් ගොඩ ඉඩම් අක්කර ප්‍රමාණය අක්කර භාගයක් සහ මඩ ඉඩම් අක්කර ප්‍රමාණය අක්කර දෙකක් දක්වා අඩු කර ඇත. (Farmer,1957,154)

තවද මේ ලබාදුන් ඉඩම්වලට අමතරව පහසුකම් රැසක් ලබා දී තිබුණි.

1. සෑම පවුලකටම නිවසක්
2. පළමු අස්වැන්න ලබාගන්නා තුරු යැපුම් දීමනාවක්
3. මී හරකුන් මිල දී ගැනීම සඳහා ණය ආධාර
4. ගෘහාශ්‍රිත ජල සම්පාදන පහසුකම්
5. මහාමාර්ග, පාසල් හා රෝහල් පහසුකම්
6. ජනපදවලට කාර්යාල පහසුකම්
7. කැත්ත, උදැල්ල, නඟුල ආදි මෙවලම්

මෙසේ දිවයින තුළ මේ අවධියේ ඉදි කළ අනෙකුත් ගොවි ජනපද සඳහා ද මේ ආකාරයේ පහසුකම් රජයෙන් ලබා දී තිබේ. (Farmer,1957,154) ලංකාවේ අභිවෘද්ධිය සඳහා ආරම්භ කළා වූ දැවැන්ත සංවර්ධන ක්‍රියාදාමයක් ලෙස ගල්ඔය සංවර්ධන යෝජනා ක්‍රමය හඳුනාගැනීමට පුළුවන.

ආශ්‍රේය ග්‍රන්ථ

අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාල ලේඛන, අම්පාර, 1952.

දේවරක්ෂිත පඬිතුමා බටුවන්තුඩාවේ, ශ්‍රී සුමංගල නායක මාහිමි, මහාවංශය, සිංහල (ප්‍රථම භාගය), එස්.ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 1996

සිංහල විශ්ව කෝෂය, 1 කාණ්ඩය, හෙට්ටිආරච්චි, ඩී.ඊ., සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තු ප්‍රකාශන, රජයේ මුද්‍රණාලය, 1963.

සේනානායක, රැක්මන්, මහාමාන්‍ය ඩී.එස්. සේනානායක. රජයේ මුද්‍රණාලය, 1999

Administration Report, Government Press, 1951.

Broheir, R.L, The Gal Oya Valley Project in Ceylon, Department of Information Ceylon, 1957.

Farmer, B.H., Pioneer Peasant Colonization in Ceylon, Oxford University Press, London, 1957.

Fonseka, H.N.C., Land use Problem in the Gal Oya Valley Peasant Colony, University of Ceylon Review, April - Oct, 1967, Vol xxv, Nos. 1 & 2, Peradeniya.

Hansard, Government Press, 1947-1952.

Hulugalle, H.A.J., Don Stephen Senanayake, First Prime Minister of Sri Lanka, Arjuna Hulugalle Dictionaries, Colombo, 2000.

Pereira, I.R., Gal Oya Farmer Organization Programme, Process and Prospects : Colombo, Agrarian Research and Training Institute, 1985.

State Commitee of Ceylon, Debates, Feb 23, 1939.

Some Social Groups and Ranks in Mid-Medieval Period of Sri Lanka

N. A. Wimalasena

The collapse of the dry zone hydraulic civilization is one of the major turning points in Sri Lanka's history that witnessed a paradigm shift resulted in conspicuous socio-cultural and political changes. The available historical and archaeological records reveal that the basic form and shape of the social structure had reached substantial development during this period. The collapse of the social and political hegemony of the old order created a vacuum in Sri Lankan society giving rise to new social values. The former agrarian economy based on irrigation, paddy cultivation as well as swidden cultivation witnessed changes with the increasing importance attached to cash crops such as coconut and cinnamon. Internal as well as foreign trade became more important. At the same time, the newly emerged social and political elite consisted of trading groups, craftsmen, guilds and even forest chieftains known as Vanniyars secured substantial political and economic power. This created an upper stratum of society hitherto unseen. Mukkuva, Lamäṇikula, Kaṇṇaḍi, Vannikula, Mēṇavara, Gaṇaväsi and Girivaṃsa, Irugalkula and Paṇikkarkula and Savulu were among the social ranks in this period. Many migrants from South India as merchant and professional kulas arrived in the Island and settled down chiefly in the littoral. This is the reason as to why the most of the kulas mentioned in the Janavaṃsa are similar to those of South India. They may have mixed with Sri Lankans. These reasons led to change social life of inhabitants of Sri Lanka.

Dāsas or slaves were donated to Gadaladeniya temple. Therefore, there was a group called vahal in the period under survey. Vahal is not used

in Sri Lanka like European slave or vahal system. In the earlier period there was a term *vaharala.* The term *vaharala* mentioned in some inscriptions has emphasized as *dāsas* or slaves.[40] There are some interpretations to the term *vaharala* which have been given by the scholars. According to Paranavitana, it means the slavery.[41] Wijayaratna says that *vaharala cidavi* gives meaning as cutting woods.[42] While Sugatapala de Silva is saying that it means supplying the Vihara *salāka,*[43] Vimalakitti and Ranawella say that removing the Vihara *salāka* as the meaning.[44]

Many scholars such as Chandajoti, Gunasekara, Karunaratna, Siddhartha, Benil Priyanka and Hettiaratchi give meaning as the temple shrine.[45] Malini Dias and Hettiaracchi interpret the word as freed from compulsory service.[46] Ellawala has acknowledged that the term *vaharala* as

---

[40] S. Paranavitana, (ed.), *Epigraphia Zeylanica,* Vol. V, Department of Archaeology, Colombo, 1955, p. 35, 65.

[41] S. Paranavitana, (ed.), *Epigraphia Zeylanica,* Vol. IV, Department of Archaeology, Colombo, 1934, pp. 134-
136; S. Paranavitana, (ed.), *Epigraphia Zeylanica,* Vol. V, Department of Archaeology, Colombo, 1955, pp. 35-
64.

[42] D. J. Wijayaratne, *University of Ceylon Review*, Vol. X, 1952, pp. 103-117.

[43] Sugatapala de Silva, Journal of the American Oriental Society, Vol. 85, no. 2, pp. 206-207.

[44] Medauyangoda Wimalakitti himi, *shila lekhana Sangrahaya,* Pt. 1, p. 127; Sirimal Ranawella, *Sri Lanka*
Puravidya Sanhita, Vol. 111, Sri Lanka Archaeological Society, Colombo, 2008, pp. 32-35.

[45] Kotaneluwe Chandajoti himi, *Sinhala Sangarava*, 1962, p. 24; Bandusena Gunasekare, "perani Sri Lankave
vihararamavala vahal meheyak pevatuneda?", *Silumina Shastriya atirekhaya*, Lake House, Colombo, 1989. Nov.
12, p. 18; Saddhamangala Karunaratne, " Uttimaduwa Rock Inscription", *Epigraphia Zeylanica*, Vol. VII,
Department of Archaeology, Colombo, 1984, pp. 117-118; Morawaka Siddhartha himi, "perani Sri Lankave
vihararamavala vahal meheyak pevatuneda?", *Silumina Shastriya atirekhaya*, Lake House, Colombo, 1989. Nov.
12, p. 18; Benil Priyanka, *vaharala saha matera majibaka*, S. Godage and Brothers, Colombo, 2012, pp. 11-36.

[46] Malini Dias, *Silumina Shastriya atirekhaya*, Lake House, Colombo, 1989. Dec. 3; Karunasena Hettiaracchi,

dāsas or Śudras.[47] According to the *Vinaya Piṭaka*, There are three categories of *dāsas* which were called *Antojāta* (those that are in the house), *Dhanakkhīta* (those that are bought with money), and *karamarānīta* (those that are captured in the war). *Manusmrti* mentions seven categories of ṣudras which were called *Dhajāhrta* (those that are captured in war), *Bhaktadāsa* (those who serve in return for maintenance), *Grhaja* (those who are borne in the house), *Krīta* (those who are bought), *dātrima* (those who are received as gifts), *Paitrika* (those who are inherited from the father and *Danda dāsa* (those who are made slaves by way of punishment).[48] According to the *Samantapāsādikā,* there were four catergories of dāsas in Sri Lanka. Those are *Antojāta*, *Dhanakkhīta*, *Karamarānīta* and *Sāmaṃdāsavyōpagata*.[49]

The first category consisted of slaves who had been born and bred in the same family for generations. The second category is those purchased from their parents or their masters. The third category is those stolen from a foreign country, captives taken in war by kings, and women who, having been expelled from their families for losing their caste, have become the property of the king. The fourth category consists of those who for their livelihood or for their protection, of their own accord, agree for a certain sum to become slaves; who steal the property of others; or burn the house or granary of others and cause damage; the person who borrows money is unable to pay

---

puratana shastriya lipi sangrahaya, 2005, p. 137.

[47] H. Ellawala, *Social History of Early Ceylon,* The Department of Cultural Affairs, Colombo, 1969, p. 56.

[48] F. Max Muller, (Tr.). *The Law of Manu, Sacred Books of the East,* Vol. XXV, Calcutta: Motilal Banarsidas, 1975,
VIII, v. 415.

[49] H. Ellawala, *Social History of Early Ceylon,* The Department of Cultural Affairs, Colombo, 1969, p.56.

the principal and the interest, and thus becomes the slave of the creditor as mentioned by Ellawala.[50]

Vijaya Patiraja donated three vahal persons (*vahal rū tunek*) to the Lankatilaka Monastery. The term *sarak rū* has been used when cattle were donated.[51] *Rasavāhini* mentions go rupake to cattle.[52] The suffix rū has been mentioned as svārtha. Nandirājavastuva of *Saddharmālamkāra* reveals that slaves earned cattle as wealth for their owner.[53] It mentions that *tamā venuven upayana vahalun hō gavayan nomäti pudgalayan visin duk vinda dhanaya ipäyiya yutu* which means the people who have niether slaves nor cattle, they should earn wealth on behalf of the owner. The *Rasavāhini* does not include this expression . But it indicates that they are equal and they have to earn much wealth for their man.

According to the Kitsirimevan Kelani Vihara inscription, it is evident that donations of slaves were not made to the temples but personally to the monks.[54] According to Buddhism, it is prohibited to accept dāsa dāsin,[55] and

---

[50] *Ibid*., p. 60.

[51] S. Paranavitana, S. (ed.), *Epigraphia Zeylanica,* Vol. IV, Oxford University Press, London, 1934, pp. 90-110; S.
Paranavitana, Lankatilaka Inscriptions, *University of Ceylon Review,* Vol. XVIII, Nos.1 and 2, (eds.), A.
Kanapathipillai, N. A. Jayawickrama, K. N. Jayatilake, The Ceylon University Press, Colombo, 1960, pp. 5-6.

[52] Ranjith Vanarathna, (ed.), *Rasavāhini* (*Laṃkādīpuppatti Kathā),* Samayawardhana Book Shop, Colombo,
2001, p. 242.

[53] Kiriälle Gñāṇawimala, (ed.), *Saddharmālaṃkāra,* Colombo: M. D. Gunasena and Compan y, Colombo, 1954, p.
190.

[54] H.C.P. Bell, and John M. Senaviratne, (ed.), *The Ceylon Antiquary and Register,*Vol. I, Part III, The Office of
the Times of Ceylon, Colombo, 1915, p. 153.

[55] Kirama Wimalajoti, Kirama (ed.), *Dīgha Nikāya,* Buddhist Cultural Center, Dehiwala, 2005, p. 8.

therefore commentators have suggested a strategy to accept them. It is suitable to accept dāsa dāsis, if they were given as *ārāmika* or *Kappiyakāraka*. (*ārāmikayek demi, käpakaruvek demi*. I offer a *kappiyakāraka,* I offer a *ārāmika)*. (*Papañcasudani*, 1922: 404). From a passage in the *Samantapāsādikā,* it becomes clear that *dāsa* were offered to the monasteries by kings and these *dāsas* were known as *āramika dāsas* as cited by Hettiaratchi.[56]

According to the Kitsirimevan Kelani Vihara inscription, the king donated slaves to the Vilgammula Thera and that Vilgammula thera donated slaves to the Bodhi of Kitsirimevan Kelani Vihara. Therefore, it seems that slaves could have been donated according to the wish of the owner.

According to the inscription, Sēnālamkādhikāra has donated to the Vihara not only normal slaves but also *ranvahalin*.[57] *Ran vahalin* means slaves that were bought. Another group of slaves were *mangul vahalin* who were given as dowry in marriage. It seems that there were large number of slaves for the elite. Sēnālamkādhikāra had donated two hundred slaves (*vahal rū*). Further there were slaves in temples. Both men and women could have been slaves. Alavala amuna[58] and Niyamgampaya inscriptions further give details about the donations of slaves.[59] Päpiliyāna impatraya tells us that many

---

[56] S. B. Hettiaratchi, *Social and Cultural History of Ancient Sri Lanka*, Sri Satguru Publications, Delhi, 1988, p. 234.

[57] S. Paranavitana, Lankatilaka Inscriptions, *University of Ceylon Review,* Vol. XVIII, Nos.1 and 2, (eds.), A. Kanapathipillai, N. A. Jayawickrama, K. N. Jayatilake, The Ceylon University Press, Colombo, 1960, pp. 14-16.

[58] *Ibid*., pp. 38-45.

[59] D. B. Jayathilake, *Prabhashodaya* II, No. 6, University of Kelaniya, Kelaniya, 1935 (June), pp. 188-189.

people were donated to the Päpiliyāna Vihara for the services of Vihara. Some of them were bought from the others. *paṇam sasiyakaṭa gat vaḍuvali araśakoḍu... paṇam sasiyakaṭa gat radavungen agampaḍi sūrasēnayāi... paṇam siyayakaṭa gat sunu elilliy... paṇam tunsiyayakaṭa gat sununilai...*[60]

Land donations which were given to religious places were done while the people were staying in those lands. (*gasakola valpiṭa minisā satā ätuḷu siyalla*)[61] It could be considered that earth and man cannot be separated from the environment. Evidence can be found about the donations of cattle keepers to Lankatilaka Vihara.[62] These were earlier mentioned as *gopallan*.[63] We can see many historical facts that there were not only donations of cattle, but also cattle farms (*gava paṭṭi*).[64] Therefore, the role of the herdsmen may have been the protection of cattle. Ellawala says that cattle keepers (*gopallan*) were considered as Ṣudras.[65] Therefore, these cattle keepers were also considered as Ṣudras. Lankatilaka inscription mentions village called *Paṭṭiye gam*.[66] Cattle keepers may have lived in these

---

[60] H. W. Codrington, *Vidyōdaya Dharma Shāstriya Saṃgrahaya,* Vidyodaya, Jayawardhanapura, 1926, pp. 374-377.

[61] S. Paranavitana, Lankatilaka Inscriptions, *University of Ceylon Review,* Vol. XVIII, Nos.1 and 2, (eds.), A. Kanapathipillai, N. A. Jayawickrama, K. N. Jayatilake, The Ceylon University Press, Colombo, 1960, pp. 14-16.

[62] *Ibid*, pp. 38-45.

[63] Ranjith Vanarathna, (ed.), *Rasavāhini* (*Laṃkādīpuppatti Kathā),* Samayawardhana Book Shop, Colombo, 2001, p. 259; Kiriälle Gñāṇawimala, (ed.), *Saddharmālaṃkāra,* M. D. Gunasena and Compan y, Colombo, 1954, p. 715.

[64] D. B. Jayathilake, *Prabhashodaya* II, No. 6, University of Kelaniya, Kelaniya, 1935 (June), pp. 188-189; Paranavitana, *op.cit*, 1960, pp. 4-14.

[65] H. Ellawala, *Social History of Early Ceylon,* The Department of Cultural Affairs, Colombo, 1969, p. 57.

[66] Paranavitana, *op.cit*, 1960, pp. 14-16.

categories of villages. *Saddharmālamkāra* also describes *gopalu* villages of contemporary society. [67] *Nikāya Samgrahaya* says that Mehenavara Virabahu Ā̃pā donated slaves and cattle to the Brāhmaṇas.[68] Dāsa, dāsis mentioned in *Nikāya Saṃgrahaya* may have been slaves. *Saddharmaratnākara* mentions also about dāsa and dāsis.[69] Hettiaratchi says that slavery existed in Sri Lanka but the corresponding term dāsa, had a totally different connotation from the slaves in Europe.[70] Dāsas in Sri Lanka were usually domestic servants with limited freedom. It was the same also our period.

The passages in our sources suggest that there were dāsas attached to the temple and well to do families. But there is no evidence to conclude that they were having identical status on position in social groups and ranking.

In addition to the social groups that have been discussed above, caṇḍālas also lived in this country. Sorata has given the similar terms säḍol, sänḍal, sänḍäl, sänḍul and sänḍol for the term caṇḍāla.[71] It is seen that they were considered to be the lowest in social stratification in India as well as in Sri Lanka. [72] Alavala Amuna inscription describes that the persons who destroy the donations of Lankatilaka Vihara will be born as a crow or a dog which is lower than the Panca caṇḍālas (*Panca Caṇḍālayaṇṭat antava*

---

[67] Kiriälle Gñāṇawimala, (ed.), *Saddharmālaṃkāra,* M. D. Gunasena and Compan y, Colombo, 1954, p. 446.
[68] L. Gunaratna, (ed.), *Nikāya Saṃgrahaya*, Ratna Books Publishers, Colombo, 1987, p. 23.
[69] Kalapaluvave Sugunasara, (ed.), *Saddharmaratnākara,* Ratnakara Press, Colombo, 1912, pp. 315-316.
[70] Hettiaratchi, *op.cit.*, 1988, p. 259.
[71] W. Sorata, (ed.) (1963). *Sri Sumangala Dictionary,* Anula Press, Colombo, 1963, p. 1035.
[72] Ellawala, *op.cit.*, 1969, p. 66.

kavuḍāṭa ballāṭa putvana).[73] This is a common curse that appear in many epigraphs.

Earlier caṇḍālas were assigned the duty of removing garbage and dead bodies.[74] There were specific villages as well as cemeteries for caṇḍālas during the period of King Pandukābhaya.[75] The lowest status of caṇḍālas in India may somewhat loosed in Sri Lanka. Prince Saliya who was the son of King Duṭṭhagāmaṇi Abhaya married Asōkamālā who was a woman of *caṇḍāla kula*. [76] King Buddhadāsa treated a caṇḍāla woman her womb ailment. (*mūlha gabbhini*).[77] However, it cannot be thought that caṇḍālas were not always treated softly. Ellawala says that sometimes the king had the power to degrade any person to the position of a caṇḍāla as a punishment in earlier.

> Mahāvaṃsa records that when king Ilanaga having found that the Lambakannas were not present on the occasion of his ceremonial bath at Tissa vāpi, he ordered them to work at the remaking of a road leading to the mahāthūpa, and set Caṇḍālas to supervise them. Such treatment would reduce them to Caṇḍāla status. They were presumably allowed after sometime to regain their old status by purification ceremonies. According to the Sammohavinodani king Bhatiya is said to have

---

[73] Paranavitana, *op.cit.*, 1960, p. 45.
[74] Wilhelm Geiger (ed.), *Mahāvaṃsa,* P. T. S., London, 1953, X, 91-92.
[75] *Ibid.,* X, 93-94
[76] *Ibid.*, XXXIII, 1-3; Ranjith Vanarathna,(ed.), *Rasavāhini* (*Laṃkādīpuppatti Kathā),* Samayawardhana Book
Shop, Colombo, 2001, pp. 218-226.
[77] Wilhelm Geiger (ed.), *Mahāvaṃsa,* P. T. S., London, 1953, XXXVII, 140-141.

degraded certain people who had eaten beef to the position of scavengers in his palace premises.[78]

Caṇḍālas were most contempt from the eating beef. According to the word *Panca caṇḍāla* of Alavala Amuna inscription as above mentioned, caṇḍālas were of five catgories. But these five categories cannot be detailed out. However Basham says that the name caṇḍāla was used for several Pancama groups.[79] According to this view, the five parts of Vēna, Nēsāda, Rathakāra, Pukkusa and Caṇḍāla were considered Pancama in India may have known as Panca Caṇḍālas. However, it is well known fact that caṇḍālas had the lowest status in the society according to the above mentioned inscriptions.

In addition to inscriptions, literary sources of Gampola period reveal about caṇḍālas. But it has to be noted that these facts are not mentioned directly but they emerge as incidents in a full story. However, those are supported to study contemporary social facts. Vessamitta Vastuva of *Saddharmālamkāra* mentions that enemy king put into the fire Vessamitta and king was very fear like a caṇḍāla saw a kṣatriya Kanyā.[80] This story is not mentioned in *Rasavahini*. Buddhavamma Vāṇija Vastuva also a similar statement. The statement *aňjalim paggaiha* of *Rasavāhini* [81] mentions in the *Saddharmālamkāraya* as like a caṇḍāla who had his hands on the head having seen a Kṣatriya kanyāva (*dohot mudunehi tabāgena kśatriya kanyāvaka duṭu*

---

[78] Ellawala, *op.cit*., 1969, p. 67.

[79] A. L. Basham, *The Wonder that was India,* Sigwick and Jackson, London, 1959, p. 145.

[80] Kiriälle Gñāṇawimala, (ed.), *Saddharmālaṃkāra,* M. D. Gunasena and Compan y, Colombo, 1954, p. 111.

[81] Ranjith Vanarathna,(ed.), *Rasavāhini* (*Laṃkādīpuppatti Kathā),* Samayawardhana Book Shop, Colombo, 2001, p. 23.

Canḍālayaku sē.).[82] These statements were not only literary sayings. They show that candalas did not know how to face prabhus or elite in the contemporary period.

